الجمعية العلمية السعودية للدراسات الإسلامية
Saudi Association for Islamic Studies

ආචාර්ය:අහ්මද් බින් අබ්දුර් රහ්මාන් අල් කාළී

# අභිමානවත් අල්කුර්ආනය හා පාරිශුද්ධ නබි වදන් ඇසුරින් ඉස්ලාමීය ප්‍රතිපත්ති විග්‍රහය

සිංහල අනුවාදය:
මුහම්මද් අකීල් මුහම්මද් අමීන්

විචාරය කිරීම:
මාහිර් රම්දීන්

العقيدة الميسرة
من الكتاب العزيز والسنة المطهرة

أ. د. أحمد بن عبدالرحمن القاضي

ح المكتب التعاوني للدعوة والإرشاد وتوعية الجاليات بالربوة، ١٤٣٩هـ
فهرسة مكتبة الملك فهد الوطنية أثناء النشر
مركز أصول العالمي
العقيدة الميسرة من الكتاب والسنة - سنهالي. / مركز أصول العالمي. -
الرياض ١٤٣٩هـ
١٣٦ ص، ١٦ x ٢٣ سم
ردمك: ٩-٦٩-٨٢٢٩-٦٠٣-٩٧٨
١- العقيدة الإسلامية أ. العنوان
ديوي ٢٤٠ ١٤٣٩/٥٧٣٠
رقم الايداع : ١٤٣٩/٥٧٣٠
ردمك: ٩-٦٩-٨٢٢٩-٦٠٣-٩٧٨

بسم الله الرحمن الرحيم

අපරිමිත දයාන්විත අසමසම
කරුණාන්විත අල්ලාහ්ගේ
නාමයෙන්

# පටුන


| | |
|---|---|
| හැඳින්වීම | 7 |
| පෙරවදන | 9 |
| ප්‍රවිශ්ඨය | 13 |
| අල්ලාහ් පිළිබඳ විශ්වාසය | 15 |
| දේවදූතයින් පිළිබඳ විශ්වාසය | 61 |
| වේද ග්‍රන්ථ විශ්වාස කිරීම | 71 |
| ධර්ම දූතයින් පිළිබඳ විශ්වාසය | 79 |
| අවසන් දිනය පිළිබඳ විශ්වාසය | 87 |
| දිව්‍යමය නියමයන් පිළිබඳ විශ්වාසය | 95 |
| අල්කුර්ආනය | 101 |
| දර්ශනය කිරීම | 105 |
| ඊමාන් හෙවත් විශ්වාසයෙහි යථාර්ථය | 107 |
| නායකත්වය සහ සමාජය | 115 |
| සහාබා වරුන් හෙවත් සහගාමීන් | 119 |
| අල්ලාහ්ගේ ස්නේහයට ලක් වූවන් | 127 |
| ඉස්ලාමීය ප්‍රධාන මූලාශ්‍රයන් | 129 |
| විශ්වාසය සර්ව සම්පූර්ණ  කරවන ක්‍රියාවන් | 131 |
| ආගම සහ මාර්ගය | 135 |

# හැඳින්වීම

අප සඳහා ආගම සහ සියළු අනුග්‍රහයන් සම්පූර්ණ කර දුන් උත්තරීතර අල්ලාහ්ට සියළු පැසසුම් හිමි වේවා. අල්ලාහ්ගේ කරුණාව හා දයාව ලෝ අවසානයට පෙර අනතුරු අඟවමින්,ශුභාරංචි දන්වමින් හා අල්ලාහ් වෙත ඇරයුම් කරමින් ආලෝකය විහිදුවන පහණක් මෙන් පැමිණි අපගේ වක්තෘවරයාණන් වන මුහම්මද් සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණන් හට අත් වේවා.

දාසයකු සඳහා සකළ ලෝහි අධිපතියාණන් විසින් පිරිනමන ලද දේව වරප්‍රසාද අතුරින් ඉමහත් වරප්‍රසාදය නම් හිදායා නම් නිවැරදි මාර්ගය වේ. එම නිවැරදි මාර්ගයෙන් ඉමහත් වන්නේ සැබෑ දහම වන එමෙන්ම එය හැර අන් කිසිවක් අල්ලාහ් පිළි නොගන්නා දහම වන ඉස්ලාම් දහම වෙත දාසයෙකු මග සොයා ගැනීම වේ. උත්තරීතර අල්ලාහ් තම දාසයන් වෙත සෑම සලාතයකදීම ඔහුගෙන් නිවැරදි මාර්ගය අසා සිටිනු මෙන් අණ කොට ඇත. ඒ අනුව ඉහ්දිනස් සිරාතල් මුස්තකීම් (අපට ඍජු මාර්ගය පෙන්වත්වා) යනුවෙන් ඔවුන් පවසති.

මුස්ලිම්වරුන් අතර ඇති විවිධ හේතූන් නිසා ඔවුන් මතභේද වී සිටීම අල්ලාහ්ගේ ප්‍රඥාවේ නියමයකි. විටෙක නොදැනුවත්කම එයට හේතුවකි. තම මනෝ ආශාවන් පිළිපැදීම තවත් හේතුවකි. මේ ආකාරයේ මතභේදයන් තම සමාජයේ සිදු වන බව නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණන් පවසා ඇත. එය පහත අයුරිනි: යුදෙව්වරුන් කණ්ඩායම් හැත්තෑ එකක් ලෙස බෙදී වෙන් වී ගියහ. එයින් ස්වර්ගයට අයත් වන්නේ එක් කණ්ඩායමකි. ඉන් කණ්ඩායම් හැත්තෑවක් අපායට අයත් වනු ඇත. එමෙන්ම කිතුනුවන් කණ්ඩායම් හැත්තෑ දෙකක් ලෙස බෙදී වෙන් වී ගියහ. එයින් කණ්ඩායම් හැත්තෑ එකක් අපායට අයත් වනු ඇති අතර ඉන් එකක් ස්වර්ගයට අයත් වනු ඇත. මාගේ ආත්මය කවරෙකු සතුව තිබෙන්නේද ඔහු මත දිවුරා පවසමි, නියත වශයෙන්ම මාගේ සමූහය කණ්ඩායම් හැත්තෑ තුනක් ලෙස බෙදී වෙන් වී යනු ඇත. එයින් එක් කණ්ඩායමක් ස්වර්ගයට අයත් වනු ඇති අතර ඉන් කණ්ඩායම් හැත්තෑ දෙකක් අපායට අයත් වනු ඇත. ස්වර්ගයට ඇතුල් වන කණ්ඩායම කවුරුන්ද යනුවෙන් විමසන ලදී. එවිට නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණන් ජමාආ යනුවෙන් පිළිතුරු දුන්හ. (ජමාආ යනු ධර්මය තුළ ජීවිතය රඳවා ගත් පිරිස වේ.) (මූලාශ්‍රය: සුනන් ඉබ්නු මාජාහ්: හදීස් අංක 3992)

මෙවැනි දහම තුළ ඇති වන මතභේදයන්හිදී සත්‍යයේ අනුකූලතාවට උත්සුක වන මුස්ලිම්වරයකුට අනිවාර්ය වන ක්‍රියාදාමය නම්, ක්‍රියාවන් හා දැනුම යන කාරණාවන් තුළ නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණන් හා ඔහුගේ කල්‍යාණ මිත්‍රයන් දැරූ ස්ථාවරය කුමක්ද යන්න සොයා බලා ඔවුන්ව අනුගමනය කිරීමයි.

මාගේ සහෝදරය,ඔබ ඉදිරියේ ඇත්තේ එක් සාරාංශගත කෘතියකි. එහි නබි සල්ලල්ලාහු අලය්හි වසල්ලම් තුමා කවර කරුණක් මත සිටියේද එය ඔබට දන්වා සිටීමට කතෘ විසින් වෙහෙස දරා ඇති අතර දහම තුළ ඇති වඩාත් වැදගත් මාතෘකාව වන විශ්වාස පද්ධතිය පිළිබඳ ඇති අවදානම කොතෙක්දැයි ඔහු විසින් පැහැදිලි කර ඇත. එමෙන්ම ව්‍යාජ ප්‍රකාශයන් අතුරින් එයට විරුද්ධව පවතින දෑද ඔහු විසින් පැහැදිලි කර ඇත. එය ඔබේ කරුණු පැහැදිලි සාධක මත පිහිටානු පිණිසය.

මෙම කෘතිය ලියූ මෙහි කතෘට නොමසුරු හා පූර්ණ ප්‍රතිඵල ලැබෙත්වා යැයිද මෙය පරිවර්තනය කිරීමේදීද එය පතුරුවාලීමෙහිදීද එය සංස්කරණය කිරීමේදීද දායකත්වය ලබා දුන් සැමටත් මහත් ප්‍රතිඵල හා පූර්ණ ප්‍රතිඵල ලැබෙත්වා යැයි ද මෙය ලබන අපගේ මුස්ලිම් සහෝදරයින්ටත් පූර්ණ ප්‍රයෝජන අත්වේවා යැයිද අපි අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කර සිටින්නෙමු.

කවරෙකුගේ අනුග්‍රහය මඟින් යහපත් කරුණු පූර්ණ වන්නේද ඔහුටම සියළු පැසසුම් හිමි වේවා.

**උසූල් සෙන්ටර්**

# පෙරවදන

අපරිමිත දයාන්විත අසමසම කරුණාන්විත අල්ලාහ්ගේ නාමයෙන්

සියලු පැසසුම් අල්ලාහ්ට ම හිමි ය. අපි ඔහු ප්‍රශංසා කරමු. උදව් උපකාර හා පාපක්ෂමාව අපි ඔහුගෙන් ම පතන අතර පාපයෙන් මිදී ඔහු වෙතට ම අපි සමීප වන්නෙමු. අපගේ ආත්මය මඟින් සිදු වන අයහපතින් ද අපගේ ක්‍රියාවන් වලින් සිදු වන අයහපතින් ද අපි අල්ලාහ්ගෙන් ආරක්ෂා පතමු. අල්ලාහ් කවරෙකු යහමඟට යොමු කරන්නේ ද ඔහු නොමඟ යැවීමට කිසිවෙකුටත් නොහැක. අල්ලාහ් කවරෙකු නොමඟ යවන්නේ ද ඔහු යහමඟ වෙත යොමු කිරීමට කිසිවෙකුටත් නොහැක. නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර අන් කිසිවෙකු නොමැති බව හා හවුල් කරුවෙකු නොමැති ඒකීයවන්තයා ඔහු බව මා සාක්ෂි දරමි. ඔහු මෙසේ පවසා සිටියි:

"ලිවීමට කියවීමට නොහැකි අයට තම වදන් ඔවුනට කියාපාන ඔවුන්ව සුවිශුද්ධ කරවන ඔවුනට පුස්තකය හා ප්‍රඥාව හදාරවන දූතයකු ඔවුන් අතරට එව්වේ ඔහුමය. ඔවුහු මීට පෙර නිශ්චිත වශයෙන්ම පැහැදිලි නොමගෙහි වූහ." (අල්කුර්ආන්:62:2)

තවද මුහම්මද් (සල්ලල්ලාහු අලෙය්හි වසල්ලම්) තුමාණන් අල්ලාහ්ගේ දූතයාණන් හා ඔහුගේ ගැත්තෙකු බව මා සාක්ෂි දරමි. එතුමාගේ සම්ප්‍රාප්තිය සර්ව බලධාරී අල්ලාහ් ඔහුගේ ගැත්තන් වෙත කළ ඉමහත් දායාදයකි. ඒ පිළිබඳ සර්ව බලධාරී අල්ලාහ් මෙසේ ප්‍රකාශ කොට ඇත.

"මීට පෙර ඔවුන් (මෙම ජනයා) ප්‍රකට වැරදි මාර්ගයේ ගමන් කළ අය වුව ද, (දැන්) ඔහු(අල්ලාහ්)ගේ වදන් ඔවුනට පාරායනා කරන්නා වූ ද, ඔවුන්ගේ ජීවිත පවිත්‍ර කොට ඔවුනට ග්‍රන්ථය හා ප්‍රඥාව උගන්වන්නා වූ ද, රසූල්වරයෙකු ඔවුනතරින්ම නගා සිටුවීමෙන් නියත වශයෙන්ම අල්ලාහ් විශ්වාසකයින්ට මහා අනුග්‍රහයක් ලබා දුන්නේය. " (අල්කුර්ආන්: 3/164)

නියත වශයෙන්ම සර්ව බලධාරී අල්ලාහ් ඔහුගේ දූතයාණන් වන මුහම්මද් (සල්ලල්ලාහු අලය්හි වසල්ලම්) තුමාණන් හට සත්‍ය ආගම හා යහ මඟ ප්‍රදානය කර, අන්ධකාරයෙන් ආලෝකය වෙත හා පැහැදිලි නොමග යැවීමෙන් කුමන සාධකයක් මත සිත් සතන්හි සන්සුන්භාවය හා හෘදයන්හි විවරණය කේන්ද්‍ර ගත වී තිබේද එවැනි පරිපූර්ණමත් යහමඟ වෙත බැහැර කිරීම පිණිස එවන ලද්දේය. මන්දයත් (අල් හුදා) යහමඟ යනු ප්‍රයෝජනවත් දැනුම වන අතර (දීනුල් හක්) සත්‍ය ආගම යනු යහපත් ක්‍රියාවන් වේ. යහපත් ජීවතයක් කේන්ද්‍ර ගත වනුයේ මෙම ඉමහත් කුලුණු යුවල මතය.

සර්ව බලධාරී අල්ලාහ් තම අභිමානවත් අල්කුර්ආනයෙහි තම ගැත්තන් සඳහා ආචාර ධර්මයන්, ගනුදෙනු, වත්පිළිවෙත් හා ප්‍රතිපත්ති යනාදී කරුණු පිළිබඳ අවශ්‍ය

වන සියළු විග්‍රහයන් ඇතුළත් කොට ඇත. එමෙන්ම, පාරිශුද්ධ නබි වදන් එම අල්කුර්ආනයේ සඳහන් වන කරුණු අතුරින් සංෂිප්තව තිබෙන කරුණු සඳහා පැහැදිලි කිරීමක් වශයෙන් හා අපැහැදිලි කරුණු විග්‍රහ කිරීමක් වශයෙන් හා පොදුවේ සඳහන් වූ කරුණු විවරණය කිරීමක් වශයෙන් පිහිටා ඇත. ඒ හා සමානව නබි (සල්ලල්ලාහු අලය්හි වසල්ලම්)තුමාණන් මෙසේ වදාල ඇත:

'අහෝ දැනගනු! අල්කුර්ආනය හා එයත් සමඟ ඒහා සමාන කරුණක් මා හට ලැබී ඇත.' (ඉමාම් අබූ දාවූද් මෙය වාර්තා කොට ඇත)

ඉස්ලාමීය අකීදාව හෙවත් ඉස්ලාමීය ප්‍රතිපත්තීන් අද්විතීය ලක්ෂණ කිහිපයක් එහි අන්තර්ගත වන හේතුවෙන් ඒවා මෙම දහමෙහි ප්‍රධාන කුලුනක් හා මූල බීජයක් වනු ඇත. එමෙන්ම මෙම දහම ශක්තිමත් ලෙස රඳා පැවතීමේ අභිරහසද එය වන අතර එය දහම තුළ සම්පූර්ණ ලෙස බලපෑම් කරන්නෙකි.

එවන් වූ අද්විතීය ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ:

1. තව්හීද් හෙවත් ඒකදේව වාද සංකල්පය: එනම් අල්ලාහ්ට පමණක් නැමදුම් කිරීම මඟින් ඒකදේව වාද සංකල්පය නිරූපනය කිරීම හා නබි (සල්ලල්ලාහු අලය්හි වසල්ලම්) තුමාණන්ව අනුගමනය කිරීම වේ.
2. එය සීමා කරන ලද්දකි: එහි ප්‍රභවය දේවානුභාවයෙන් යුතු වූවකි. පාරිශුද්ධ අල්කුර්ආනය හා නබි (සල්ලල්ලාහු අලය්හි වසල්ලම්) තුමාණන්ගේ වදන් ඉක්මවා යා නොහැක. එමෙන්ම ඒවා මානව අදහස් උදහස් මඟින් හෝ සන්සන්දනය කිරීම මඟින් උපුටා ගත නොහැක.
3. ෂෙයිතාන්ගේ නොමඟ යැවීමට පෙර තිබූ සහජ හැඟීම් වලට ඒවා එකඟ වේ.
4. සැකයන් හා මනෝ ඉච්ඡාවන්ගෙන් තොර වූ බුද්ධි ගෝචරයට එකඟ වීමේ ස්වභාවය එහි ඇත.
5. සියළු කරුණු ආවරණය කිරීම. එනම් ඒවා විශ්වයේ, ජීවයේ හා මිනිසාගේ සෑම අංශයක් පිළිබඳ විස්තර කර මිස නැත.
6. සමානතාවය: එනම් ඒවායේ කරුණු කිහිපයක් ඒවායෙහිම වෙනත් කරුණු කිහිපයක් මඟින් තහවුරු කරනු ඇත. ඒවායෙහි තනි තනි කරුණු අතර ප්‍රතිවිරෝධතාවයක් හෝ අසමානතාවයක් දක්නට නොහැක.
7. මධ්‍යස්ථභාවය: ඒවා සීමාව ඉක්මවා යෑම හා සීමාවෙන් පහත්ව කටයුතු කිරීම යන කරුණු දෙක අතර තිබෙන සමබරතාවයෙහි තරාදිය වේ.

මෙම ලක්ෂණ කිහිපය පහත සඳහන් ඵල ප්‍රයෝජන ලබා දෙනු ඇත.

1. සකල ලෝහී අධිපතියාණන් සඳහා ගැතිකම තහවුරු කිරිම හා, මැවීම්වලට වහල්වීමෙන් නිදහස් වීම.

2. සකල ලෝභී අධිපතියාණන්ගේ ධර්ම දූතයාණන් අනුගමනය කිරීම යන සංකල්පය තහවුරු කිරීම. බිද්අත් හෙවත් නව කරුණු හා ඒවා සිදු කරන්නන්ගෙන් දුරස් වී සිටීම.

3. ප්‍රඥාවන්ත, පරිපාලක හා නිර්මාණකරු වන අල්ලාහ් සමඟ සමබන්ධතාව ඇති කිරීම මඟින් සිත් සතන්හි සන්සුන්භාවයක් හා මානසික සැනසුමක් සාක්ෂාත් කර ගැනීමට හැකි වීම.

4. බුද්ධිමය වශයෙන් තෘප්තිමත් භාවය හා චෛතසික ඒකාකාරිත්වයක් ලබා ගැනීම හා පරස්පර විරෝධතාවයන්ගෙන් ආරක්ෂාව ලැබීම සහ මිථ්‍යා විශ්වාස වලින් දුරස් ව සිටීමට හැකි වීම.

5. ආත්මික අවශ්‍යතා සහ ශාරීරික අවශ්‍යතා සපුරා ගැනීමට හැකි වීම. විශ්වාසය හා හැසිරීම් රටාව අතර තිබෙන ඒකීකරණය ග්‍රහණය කිරීමට හැකි වීම.

මුස්ලිම් විද්වතුන් ඉස්ලාමීය විශ්වාසයට හා ඇදහිල්ලට සැම විටම විශේෂ වැදගත්කමක් ලබා දීමට විශාල ලෙස උත්සහ කර තිබේ. එමෙන්ම ඔවුහු ඒවා ජනයාට ඉගැන්වූ අතර ඒ විෂය පිළිබඳ පුළුල් පරාසයක කෘතීන් ගොනු කර ඇත. ඇතැම් විද්වතුන් සමහරක් කෘතීන් සංක්ෂිප්තව ගොනු කර ඇති අතර අනෙකුත් විද්වතුන් සවිස්තරාත්මක පැහැදිලි කිරීම් සහ අදහස් දැක්වීම් සපයා ඇත. එහිදී ඔවුන් විසින් විටෙක අස් සලෆ් හෙවත් ආරම්භක දැහැමි මුස්ලිම්වරුන්ගේ විශ්වාසය විග්‍රහ කරනු ඇති අතර ඇතැම් විටෙක නිශ්චිත ගැටළුවක් පිළිබඳ කරුණු විග්‍රහ කොට ඇත. එමෙන්ම ඇතැම් අවස්ථාවන් වලදී නොමග ගියවුන්ගේ විශ්වාසයන් හා තර්ක නිෂ්ප්‍රභා කර ඇත.

මා මෙහිදී දේව දූත ජිබ්රීල් (අලෙය්හි) තුමාගේ හදීසයෙහි සඳහන් විශ්වාසයේ මූලික කරුණු සය නබි (සල්ලල්ලාහු අලෙය්හි වසල්ලම්) තුමා සඳහන් කළ අනුපිළිවලට අනුව විශ්වාසය පිළිබඳ ගැටළු අනුගත කිරීමට අපේක්ෂා කළෙමි. දිව්‍යමය හෙළිදරව් යුවල වන පාරිශුද්ධ අල්කුර්ආනය හා නබි වදන් අතුරින් පමණක් මා මෙහිදී තොරතුරු අනාවරණය කොට ඇත්තෙමි. සැම අත්‍යාවශ්‍ය මූලික කරුණු සඳහා විස්තර ඇතුළත් කළ පසු ඒ විෂයෙහි නොමඟ ගිය අයවලුන් පිළිබඳ කරුණු අනාවරණය කර, ඉන් පසු ඔවුන්ගේ තර්ක වැඩිය ගැඹුරින් නොයා නිශ්ප්‍රභා කර ඇත්තෙමි.

මෙය තනි පාඨකයකු උපරිම ලෙස ඵල නෙලා ගැනීම සඳහා සරල භාෂාවකින් හා නිසි පිළිවෙළකින් යුතුව මුල් දැහිමි මුස්ලිම්වරුන්ගේ විශ්වාස පද්ධතිය සංෂිප්තව ඉදිරිපත් කෙරෙන, පැහැදිලි හා සරල බවකින් යුත් මධ්‍යම ප්‍රමාණයේ පොතක් ලෙස සකස් වී ඇත. ඒ සඳහා ඉස්ලාමිය ප්‍රතිපත්ති විග්‍රහය: සරල ඉදිරිපත් කිරීමක් යනුවෙන් නම් කොට ඇත්තෙමි.

මාගේ මෙම මෙහෙවර අල්ලාහ්ගේ තෘප්තිය තකා අවංක සිතැතිව සිදු කළ ක්‍රියාවක් වශයෙන් හා ජනයා සඳහා එය ඵලදායී බවට පත් කරනු මෙන් මා සර්ව බලධාරී අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කර සිටිමි.

අල්ලාහ්ගේ ශාන්තිය හා සමාදානය මුහම්මද් (සල්ලල්ලාහු අලෙය්හි වසල්ලම්) තුමාණන් හට හා එතුමාණන්ගේ ඥාතීන් හා සහගාමිකයන් සියල්ලන් හට හිමි වේවා.

ආචාර්ය: අහ්මද් බින් අබ්දුර් රහ්මාන් අල් කාළී
ඉස්ලාමීය අධ්‍යන පීඨය
අල්කසීම් විශ්ව විද්‍යාලය
ඊ-මේල්: al-aqidah@al-aqidah.com
qadisa@yahoo. com
P. O. Box 246 Unaiza Saudi Arabia 51911

# ප්‍රවිශ්ඨය

ඉස්ලාමීය අකීදාවෙහි අඩිතාලම වනාහි අල්ලාහ් පිළිබඳව විශ්වාස කිරීම හා ඔහුගේ දේව දූතයින්, දේව ග්‍රන්ථ, ධර්ම දූතයින්, අවසන් දිනය හා යහපත හා අයහපත දෛවය අනුව පිහිටීම පිළිබඳ විශ්වාස කිරීම වේ.

උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි:

එහෙත් යහකම නම් අල්ලාහ් ගැනද අවසාන දිනය ගැනද මලක්වරුන් ගැනද ධර්ම ග්‍රන්ථ ගැනද නබිවරුන් ගැනද විශ්වාස කිරීමයි. (අල්කුර්ආන්:2:177)

තවද මෙසේ ප්‍රකාශ කරයි:

සිය රබ්(පරමාධිපති) වෙතින් තමා වෙත එවනු ලැබූ දෑ (මාර්ගෝපදේශය) පිළිබඳව ධර්මදූතයා විශ්වාස කරයි. තවද විශ්වාස කළ අයද (එය විශ්වාස කරති. ) ඔවුහු සියල්ලෝම අල්ලාහ්, ඔහුගේ මලක්වරුන් ඔහුගේ දේව ග්‍රන්ථ හා ඔහුගේ රසූල්වරුන් විශ්වාස කරන්නාහුය. (අල්කුර්ආන්:2:285)

තවද මෙසේ ප්‍රකාශ කරයි:

විශ්වාසවන්තයිනි! අල්ලාහ්ද ඔහුගේ රසූල්වරයාද ඔහුගේ රසූල්වරයා වෙත එවන ලද ධර්ම ග්‍රන්ථයද මීට පෙර අල්ලාහ් විසින් එවන ලද (සෑම) ග්‍රන්ථයක්මද විශ්වාස කරනු. අල්ලාහ්ද, ඔහුගේ මලක්වරු(සුරදූතයෝ)ද, ඔහුගේ ධර්ම ග්‍රන්ථද, ඔහුගේ රසූල්වරු හා පරමාත්ත දිනය කවරෙක් ප්‍රතික්ෂේප කරන්නේද, නියත වශයෙන්ම ඔහු ඈත් වූ දුර්මාර්ගයේ නොමඟ ගොස් සිටී. (අල්කුර්ආන්:4:136)

තවද:

නියතවශයෙන් අපි සෑම දෙයක්ම නියමයක් අනුව මැව්වේමු. (අල්කුර්ආන්:54:49)

විශ්වාසය පිළිබඳ ජිබ්රීල් (අලෙය්හි) තුමාණන් විමසා සිටියදී නබි (සල්ලල්ලාහු අලෙය්හි වසල්ලම්) තුමාණන් මෙසේ ප්‍රකාශ කොට ඇත: නුඹ අල්ලාහ් පිළිබඳව විශ්වාස කිරීම හා ඔහුගේ දේව දූතයින්, දේව ග්‍රන්ථ, ධර්ම දූතයින්, අවසන් දිනය හා යහපත් හා අයහපත් දෛවය යනාදී කරුණු පිළිබඳ විශ්වාස කිරීම වේ[1].

1. මූලාශ්‍රය: මුස්ලිම් හදීස් අංක 8.

# අල්ලාහ් පිළිබඳ විශ්වාසය

අල්ලාහ් පිළිබඳ විශ්වාසය යනු අල්ලාහ්ගේ පැවැත්ම පිළිබඳ ශක්තිමත් විශ්වාසයයි. එමෙන්ම සියලු වස්තූන්හි පරමාධිපති ඔහු බවත්, ඔහු හැර වන්දනාවට සුදුස්සෙකු නොමැති බවත් ඔහු සර්ව සම්පූර්ණ ගුණාංගයන්ගෙන් පිරිපුන් බවත් අසම්පූර්ණ ගුණාංගයන්ගෙන් ඔහු සුවිශුද්ධ බවත් විශ්වාස කිරීම වේ.

අල්ලාහ් පිළිබඳ විශ්වාසය තුළ අංග සතරක් ඇතුළත් වේ.

## 1: අල්ලාහ්ගේ පැවැත්ම පිළිබඳ විශ්වාසය.

අල්ලාහ්ගේ පැවැත්ම යනු ඒකාන්ත සත්‍යයකි. පාරිශුද්ධ අල්කුර්ආනයේ මෙසේ සඳහන් වේ:

මෙලෙසය, නියතවශයෙන් සත්‍යවන්තේ අල්ලාහ්ය. ඔහු හැර ඔවුන් අයැදින දෑ අසත්‍ය වන්නේය. තවද අල්ලාහ් උත්තරීතරය. පරමෝත්කෘෂ්ටය. (අල්කුර්ආන්:22:62)

ඔහුගේ පැවැත්ම පිළිබඳ සැකයෙන් පසුවීම යනු  අසත්‍ය ද්‍රෝෂාරෝපණයකි. පාරිශුද්ධ අල්කුර්ආනයේ මෙසේ සඳහන් වේ:

අහස් සහ මහපොළොවෙහි නිර්මාපක අල්ලාහ් ගැනද සැකය. නුඹලාගේ පව්වලට නුඹලාට සමාව දීමටත් නියමිත කාල සීමාවකට නුඹලාට අවකාශදීමටත් ඔහු නුඹලාට ඇරයුම් කරන්නේ යැයි ඔවුන්ගේ රසූල්වරු පැවසූහ. (අල්කුර්ආන්:14:10)

ඔහුගේ පැවැත්ම ප්‍රතික්ෂේප කිරීම යනු උඩඟුකමකි. එමෙන්ම එය මහා අසාධාරණයක් හා දේව ප්‍රතික්ෂේපයකි. පාරිශුද්ධ අල්කුර්ආනයේ මෙසේ සඳහන් වේ:

ප්‍රත්‍යක්ෂ සාධක ලෙස මේවා (සංඥා) අහස් සහ මහපොළොවෙහි රබ්(පරමාධිපති) හැර වෙනත් කිසිවකු පහළ නොකළ බව නියතවශයෙන් නුඹ දනී. ඕ! ෆිර්අවුන් නුඹ විනාශයට පත්වූවකු යැයි මම නියතවශයෙන් සිතන්නෙමි. ඔහු(මූසා) කීය. (අල්කුර්ආන්:17:102)

තවද උත්තරීතර අල්ලාහ් පහත අයුරින් සඳහන් කරයි:

අහස්වල සහ මහපොළොවේත් ඒ දෙක අතර ඇති දේවලත් රබ්(පරමාධිපති) ඔහු(අල්ලාහ්) වේ. නුඹලා තරයේ විශ්වාස කරන්නේ නම් යැයි ඔහු(මූසා) කීවේය. නුඹලාට නොඇසෙන්නේ දැයි ඔහු(ෆිර්අවුන්) අවට සිටි අයට කීය. (ඔහු) නුඹලාගේ රබ්(පරමාධිපති)ද පෙර සිටි නුඹලාගේ මුතුන් මිත්තන්ගේ රබ්(පරමාධිපති)ද වේ යැයි ඔහු(මූසා) කීවේය. නියතවශයෙන් නුඹලා වෙත එවනු ලැබ ඇති නුඹලාගේ රසූල්වරයා උන්මත්තකයකු’යි ඔහු(ෆිර්අවුන්) කීවේය. (ඔහු) නැගෙනහිරට සහ බස්නාහිරටද ඒ

දෙක අතර ඇති දෑටද රබ්(පරමාධිපති)ය. නුඹලා මෙනෙහි කරන්නෙහු නම් යැයි ඔහු(මූසා) කීවේය. නුඹ මා හැර වෙනත් දෙවියකු ගන්නේ නම් නියතවශයෙන්ම මම නුඹ සිරකරුවන්ගෙන් කෙනකු බවට පත් කරමියි ඔහු(ෆිර්අවුන්) කීවේය. (අල්කුර්ආන්:26:24-29)

කරුණු කිහිපයක් දෙවියන්ගේ පැවැත්ම පිළිබඳ ඔප්පු කරයි. ඒවා නම්:

### 1. යහපත් සහජ විශ්වාසය

කිසිඳු ඉගෙනුමකට යටත් නොවූ මානව ස්වභාවය මෙයින් අදහස් වේ. උත්තරීතර අල්ලාහ් පහත අයුරින් සඳහන් කරයි:

(නබිතුමණී!) ඔබ, ඔබගේ මුහුණ (ඉස්ලාමීය) ධර්මය දෙසටම සම්පූර්ණයෙන්ම (හරවා) ස්ථිරවත් කරනු මැනව! අල්ලාහ් මිනිසුන්ව උත්පාදනය කළ මාර්ගයම ඔහුගේ ස්වභාවික මාර්ගය වේ. අල්ලාහ්ගේ උත්පාදනයන්හි කිසිම වෙනසක් නැත. මෙයම (නිවැරදි) ස්ථිරවත් මාර්ගය වේ. එහෙත් මිනිසුන්ගෙන් වැඩි දෙනෙකු මෙය දැන ගන්නේ නැත. (අල්කුර්ආන්:30:30)

සෑම දරුවෙකුම ෆිත්රා නම් නිර්මාතෘට අවනත වීමේ සහජ හැඟීමෙන් උපත ලබන්නේය. එහෙත් යුදෙව්වරයෙකු හෝ කිතුනුවෙකු හෝ ගින්නට නමදින්නෙකු බවට ඔහුගේ දෙමාපියන් ඔහු ව පත් කරති. යැයි නබි (සල්) තුමාණන් පහදා දුන්හ[2].

මුස්ලිම්හි වාර්තා වන තවත් වාර්තාවක සෑම දරුවෙකුම මිල්ලත් නම් ස්වභා දහම මත උපත ලබන්නේය.

එබැවින්, මෙම මුල් සහජ හැඟීමත් සමඟ සිටින සියළු නිර්මාණයන් තුළ අල්ලාහ්ගේ පැවැත්ම පිළිබඳ විශ්වාසයක් තිබෙන බව දැක ගන්නට පුළුවණි. එනමුත් එම සහජ හැඟීම විකෘති කර දමන යම් කරුණක් ඇති වූයේ නම් එවැනි හැඟීමක් ඒවා තුළ දක්නට නොහැකි වේ. උත්තරීතර අල්ලාහ් ඔහුගේ වදනින් මෙසේ අවධාරණය කර ඇත:

පවිත්‍ර සිතින් අවනත වී අකලංකභාවයෙන් යුතුව මා මාගේ ගැත්තන් සියල්ල නිර්මාණය කළෙමි. එනමුත් ෂෙයිතාන්වරුන් ඔවුන් වෙත පැමිණ ඔවුන්ගේ එම දහමින් ඔවුන්ව ඉවත් කළහ[3].

ඇතැම් විට විවිධ වැරදි තේරුම් ගැනීම් සහ ආශාවන් වලින් යුත් බාධකයක් ඇති වීම හේතුවෙන් සහජ හැඟීම විකෘතියට පත් වීමට ඉඩ ඇත. එනමුත් දුෂ්කර හා අපහසු අවස්ථාවකදී සත්‍ය යථාර්ථය මතු වනු ඇත. උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කොට ඇත:

(මිනිසුන්) නැවට නැග (විපතෙහි පැටළී) ගියහොත් ඔවුන් සම්පූර්ණයෙන්ම අල්ලාහ්ට අවනත වී පරිශුද්ධ වූ මනසින් ඔහුව ආරාධනා (කර ප්‍රාර්ථනා) කරන්නාහ. ඔහු

2. මූලාශ්‍රය: බුහාරි හදීස් අංක 8:597.

3. මූලාශ්‍රය: මුස්ලිම් හදීස් අංක 2865.

ඔවුන්ව වෙරළට (ගෙන ගොස්) බේරා ගත් පසු ඔහුටම ඔවුන් (බොහොමයක් දෙනාව) සමානයන් බවට පත් කරන්නාහ. (අල්කුර්ආන්:29:65)

## 2. විවෘත බුද්ධි ගෝචරය

එනම් තෘෂ්ණාවන් හා සැකවලින් නීරෝගී වූ බුද්ධි ගෝචරයයි. විවෘත බුද්ධි ගෝචරය නිර්මාණයන් හා නිෂ්පාදනයන් සියල්ල සඳහා නිර්මාපකයකු සිටිය යුතු බව තරයේ විශ්වාස කරයි. මන්දයත් නිර්මාපකයකු නොමැතිව කිසිවක් අහඹු ලෙස බිහි වීමට නොහැකිය. කිසිම මැවීමක් තමන් විසින් තමා ව මවා ගත නොහැකි අතර, තම පැවැත්මට පෙර එය කිසිවක් නොවූ හෙයින්, එය විසින් යමක් සිදු කරන්නටද නොහැකිය. එසේ නම් යමක් සිදු කරන නිර්මාපකයකු සිටිය යුතුයි යන්න මෙයින් පැහැදිලි වේ. ඔහු උත්තරීතර අල්ලාහ් වේ.

ජුබෙයිර් බින් මුත්ඉම් (රළි) තුමාණන් බද්ර් සටනෙහිදි අත්අඩංගුවට ගත් සිරකරුවෙකු ලෙස නබි (සල්) තුමාණන් වෙත රැගෙන එනු ලැබුවේය. එවිට නබි (සල්) තුමාණන් මග්රිබ් සලාතයේදී අත් තූර් නම් සූරාවෙන් "ඔවුහු නිර්මාතෘවරයෙක් නොමැති ව නිර්මාණය කරනු ලැබුවාද? නැතහොත් ඔවුහුම නිර්මාතෘ වරුන්ද? හෝ ඔවුහු අහස්ද පොළොවද නිර්මාණය කළාද? නැත. ඔවුහු ස්ථිර විශ්වාසය නැත්තෝය. හෝ ඔබේ හිමිගේ නිධාන ඔවුන්ගේ අතෙහිද? ඔවුහු තමා කැමති දේ එහි කරන්නට බලය ඇත්තෝද? (අල් කුර්ආන් 52: 35 සිට 37 දක්වා) වැනි පාරායනය කළ විට, එම වාක්‍යයන් වෙත ජුබෙයිර් ඉබ්නු මුත්ඉම් (රළි) තුමා සවන් දුන්නේය. එම අවස්ථාවේ දී ඔහු බහු දේව වාදියෙකි. ඔහු මෙසේ පැවසුවේය. "(මෙම තර්කයට සවන් දුන්) මගේ හදවත පියාඹා යන්නට පටන් ගත්තේය. ඊමානය (නම් දේව විශ්වාසය) ඔහුගේ හදවතේ ප්‍රථම වරට හට ගත්තේ එම මොහොතේය.[4]

අඥාන යුගයේ සිටි අරාබි දේශකයකු වන කිස් බින් සාඉදා අල් ඉයාදී නැමැති පුද්ගලයා තම විවෘත බුද්ධි ගෝචරය මඟින් සසඳා මෙසේ ප්‍රකාශ කර සිටියහ:

ඔටුවෙකුගේ බෙටි, ඔටුවකු සිටි බවට හඟවයි. පාද සලකුණු, කවරෙකු හෝ ගමන් කළ බව හඟවයි. එසේ නම් තාරකා ග්‍රහමණ්ඩලවලින් යුත් අහස කඳුවලින් යුත් මහපොළොව සියළු දෑ පිළිබඳ ප්‍රඥාවන්ත නිර්මාණකරුවෙකු වෙත හඟවන්නේ නැතිද?

## 3.බාහිර සාධක

උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි:

නියත වශයෙන්ම (කුර්ආනය වන) මෙය සත්‍යයකි යයි ඔවුන්ට පැහැදිලි වන තුරු අපගේ සාධකයන් ඔවුන් ඇතුළුව (ලොවෙහි) පුළුල් ක්ෂිතිජයන්හිද අපි ඔවුන්ට මතුව පෙන්වන්නෙමු. (නබිතුමණි!) ඔබගේ දෙවියන් නියත වශයෙන්ම සියල්ල බලමින් සිටින්නේය යන්න ඔබව සෑහීමට පත් නොකළේද? (අල්කුර්ආන්: 41:53)

4. මූලාශ්‍රය: බුහාරි හදීස් අංක 3050/4023/4854

මෙම බාහිර සාධක විවිධය. ධර්ම දූතයින්ගේ ප්‍රාතිහාර්යයන්, දැහැමි පුද්ගලයින්ගේ විශ්මයජනක සිදු වීම් හා අල්ලාහ්ගෙන් අයදින්නා හට ඔහු පිළිතුරු ලබා දීම වැනි කරුණු ඒ සඳහා කදිම නිදසුන් වේ.

නූහ් (අලෙය්හි) තුමාණන්ගේ ඇරයුමට අල්ලාහ් පිළිතුරු දුන් ආකාරය අල්කුර්ආනයේ මෙසේ සඳහන් වේ:

(එවිට ඔහු) මම පරාජිතයෙක්මි. මට උදව් කරනු මැනවයි තම රබ්(පරමාධිපති)ට ප්‍රාර්ථනා කළේය. එහෙයින් අපි ධාරානිපාත වැසි සහිතව අහසේ දෙරටු විවෘත කළෙමු. තවද ලෑලි වලින් සහ ඇණවලින් සාදන ලද දැය මත අපි ඔහු ඉසුලුවෙමු. එය අපගේ ඇස් ඉදිරියේම (වල්ලමේ පාවී) ගියේය. (අන් අය නම්, ගිලී මැරී ගියහ. මොහු විසින්) ප්‍රතික්ෂේප කරනු ලැබූ අයට එලවිපාක වශයෙන් (මෙසේ දඬුවම් කරන ලදී). (අල්කුර්ආන්: 54:10-14)

මූසා (අලෙය්හි) තුමාණන් පිළිබඳ උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි:
එවිට නුඹ නුඹගේ සැරයටියෙන් මුහුදට ගසනුයි අපි මූසාට දිව්‍ය ඥානය දුන්නෙමු. එ(සේ කළ)විට එය(මුහුද) බෙදී එක් එක් කොටස මහත් පර්වතයක් බඳු විය. අපි අනෙක් සේනාවද එතැනටම සමීප කරවීමු. තවද අපි මූසා සහ ඔහු සමග සිටි සියලු දෙනා බේරා ගතිමු. පසුව අනෙක් සේනා දියෙහි ගිල්වීමු. නියතවශයෙන් මෙහි සංඥාවක් ඇත. නමුත් ඔවුන්ගෙන් වැඩි දෙනා විශ්වාස කරන්නෝ නොවෙති. (අල්කුර්ආන්: 26:63-67)

ඊසා (අලෙය්හි) තුමාණන් පිළිබඳ උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි:
තවද, ඉස්රාඊල්ගේ පුත්‍රයින් සඳහා රසූල්වරයා වශයෙන්ද (ඔහු පත් කරනු ඇතැයි මලක්වරයා) කීය. (ඉක්බිති ඊසා රසූල්වරයකු වශයෙන් ඉස්රාඊල්ගේ පුත්‍රයින් වෙත පැමිණි කළ) මම නුඹලාගේ රබ්(පරමාධිපති)ගෙන් පැහැදිලි සංඥාවක් ඇතිව නුඹලා වෙත පැමිණියෙමි. නියත වශයෙන්ම මම නුඹලාට මැටියෙන් කුරුල්ලකුගේ අනුරුවක් තනා ඌට ස්වාසය පිඹිමි. එවිට ඌ අල්ලාහ්ගේ අණින් කුරුල්ලෙක් වෙයි. තවද, මම ජන්මයෙන් අන්ධවූවන් හා ලාදුරු රෝගීන් සුවපත් කරමි. තවද, මළවුන්ට මම අල්ලාහ්ගේ අණින් ප්‍රාණය දෙමි. තවද නුඹලා අනුභව කරන්නේ කුමක්ද? නුඹලා සිය නිවෙස්වල ගබඩා කර ඇත්තේ කුමක්ද? යන්න මම නුඹලාට දැනුම් දෙමි. නුඹලා විශ්වාස කරන්නහු නම් නියත වශයෙන්ම මෙහි නුඹලාට සංඥාවක් ඇත. (අල්කුර්ආන්: 03:49)

මෙවැනිම දෑ නබි මුහම්මද් (සල්) තුමාණන්ට ද සිදු විය. පහත සඳහන් සිදුවීම් එය පැහැදිලි කරයි.

අනස් ඉබ්නු මාලික් (රළි) තුමාණන් මෙසේ දන්වයි. නබි (සල්) තුමාණෝ සිකුරාදා දවසක් කුත්බා දේශනාව පවත්වමින් සිටිය දී, ගම්බද අරාබි වරයෙක් නැගිට අල්ලාහ්ගේ රසූල් (සල්) තුමාණනි! අපේ දේපළ විනාශ වී සියළු මාර්ගයන් විසංධි

වී ඇත. කරුණාකර අල්ලාහ්ගෙන් (වර්ෂාව සඳහා) යාච්ඤා කරන්න.' යැයි පවසා සිටියේය. එවිට නබි (සල්) තුමාණන් දෑස් ඔසවා අහෝ දෙවියනි, අප හට වර්ෂාව දෙනු මැනව යැයි තෙවරක් පවසා සිටියහ.

එම මොහොතේ දී අහසේ එක වළාකුලක් වුවද දක්නට නොතිබුණි. මගේ ප්‍රාණය කවරෙකුගේ අතෙහි තිබේද, (ඔහුගේ නාමයෙන් දිවුරා කියමි) විශාල පර්වත මෙන් වළාකුළු රැස් වී වර්ෂාව ඇති විය. සෙනසුරාදා දක්වා අප හිරු දුටුවේ නැත. සිකුරාදා දවසක ඒ ආකාරයෙන්ම නබි (සල්) තුමාණන් දේශනාව පවත්වමින් සිටියදී කෙනෙකු පැමිණ 'අල්ලාහ්ගේ රසූල් තුමණි! අපේ දේපළ විනාශ වී ඇත. කරුණාකර (වැස්ස නවත්වන ලෙස) අල්ලාහ්ගෙන් යාච්ඤා කරන්න. යැයි ඉල්ලා සිටීය. එවිට නබි (සල්) තුමාණන් තම දෑත ඔසවා, අල්ලාහ්! අප වටේට, අප මත නොවි. යැයි පැවසූහ. ඉන්පසු වර්ෂාව නැවතුනි. [5]

පොදුවේ අල්ලාහ් මෙසේ සඳහන් කරයි:
(විපතක පැටලී) දඟලමින් සිටින අය (ආරක්ෂාව පතා) ආරාධනා කළහොත් (ඔවුන්ට) පිළිතුරු දී, ඔවුන්ගේ අමාරුකම් පහ කරන්නේ කවරෙක්ද? භූමියෙහි ඔබව (තමන්ගේ) නියෝජිතයින් වශයෙන් පත් කළේ කවරෙක්ද? (මෙවැනි) අල්ලාහ් සමග නැමදුමට යුතු (වෙන කෙනෙකු) සිටින්නෙහිද? (ඇත්තේම නැත). ඔබ (මේ ගැන) සිතන්නේ ඉතාමත් අල්පයකි. (අල්කුර්ආන්: 27:62)

ධර්ම දූතයන් වෙත දෙන ලද ප්‍රාතිහාර්යයන්, ප්‍රාර්ථනාවන් සඳහා පිළිතුරු ලබා දීම, ආපාදාවන්ගෙන් මුදා ගැනීම යනාදී කරුණු අල්ලාහ්ගේ පැවත්ම පෙන්නුම් කරන බාහිර සාධක වේ. ඒ සඳහා මිනිසුන් අතුරින් ඇතැමුන් සාක්ෂි දරනු ඇත. මෙම දූතයින් එවා වදාළ තැනැත්තා හා ප්‍රාර්ථනාවන් සඳහා පිළිතුරු ලබා දෙන්නා හා ආපාදාවන්ගෙන් මුදවා ගන්නා දෙවියන් බව ඔවුන් පැහැදිලිවම වටහා ගනිති.

### 4.සැබෑ දිව්‍යමය හෙළිදරව්ව

මෙයින් අදහස් කරනු ලබන්නේ පාරිශුද්ධ අල්කුර්ආනය හා සම්මත නබි වදන් හෙවත් සහීහ් හදීස් වේ.

උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි:

ඔවුහු අල්කුර්ආනය පිළිබඳව කල්පනාව යොමු නොකරන්නහිද? එය (එවන ලද්දේ) අල්ලාහ් නොව වෙන කවරකුගෙන් නම්, ඔවුන් එහි පරස්පර විරෝධතා රාශියක් දකිනු ඇත. (අල්කුර්ආන්: 4:82)

තවද මෙසේ ප්‍රකාශ කරයි:
මිනිසුනි! සත්‍යය පිළිබඳව පැහැදිලි සාක්ෂියක් නුඹලාට නුඹලාගේ පරමාධිපතිගෙන් සැබැවින්ම පැමිණ ඇත. තවද (නුඹලාට මාර්ගය) පැහැදිලි ලෙස පෙන්වන ආලෝකයද අපි නුඹලාට පහළ කළෙමු. (අල්කුර්ආන්: 4:174)

5. මූලාශ්‍ර: බුහාරි හදීස් අංක 1014/ සහීහ් අල් මුස්ලිම් හදීස් අංක 797.

තවද මෙසේ ප්‍රකාශ කරයි:

මිනිසුනි! ඔබගේ දෙවියන්ගේ සන්නිධානයෙන් නියත වශයෙන්ම එක් හොඳ ඔවදනක් පැමිණ ඇත්තේය. (ඔබගේ) හෘදයන්හි ඇති රෝගවලට එය එක්තරා පිළියමකි. තවද (එය) විශ්වාසය තැබූවන්ට ඍජු මාර්ගය පෙන්වන්නක් වශයෙන්ද එක් වරප්‍රසාදයක් වශයෙන්ද ඇත්තේය. (අල්කුර්ආන්: 10:57)

තවද මෙසේ ප්‍රකාශ කරයි:

(නබි තුමණි!) ඔවුන්ට කියවා පෙන්වනු ලබන (මෙම) ධර්මය අපිම ඔබ වෙත පහළ කර ඇත්තෙමු යන්න (මෙයම) ඔවුන්ට ප්‍රමාණවත් (සාධකයක් වශයෙන් තිබෙනවා) නොවේද? (මන්දයත්) නියත වශයෙන්ම මෙහි (දෙවියන්ගේ) වරප්‍රසාදයද, විශ්වාසය තැබූ ජනයාට මෙනෙහි කිරීමද ඇත්තේය. (අල්කුර්ආන්: 29:51)

අල්කුර්ආනයේ සඳහන් වන ගුප්ත සිදු වීම්, නිවැරදි විශ්වාසයන්, විධිමත් නීති හා ඍජුමත් චර්යාවන් යනාදී කරුණු එම අල්කුර්ආනය උත්තරීතර අල්ලාහ්ගෙන් වූ බවට එක් සාධකයකි. ඔහු හැර කිසිදු මැවීමක් විසින් ඒවා නිකුත් විය නොහැකිය.

එබැවින්, ආදම්ගේ පුතුන් අතුරින් කෙනෙකු හෝ අල්ලාහ්ගේ පැවැත්ම යථාර්තවාදීව ප්‍රතික්ෂේප කර නොමැති නමුත් අදේව වාදී ඇතැම් නව සහ පැරණි කණ්ඩායම් කිහිපයක් එය අතාර්කික ලෙස ප්‍රතික්ෂේප කරති. ඔවුන් පිළිබඳ පහත විස්තර කරනු ලැබේ.

### 1.දහ්රියියුන් (සදාතනිකවාදීන්)

මොවුන්, විශ්වය වනාහි සදාකාලික බව පිළිගත් දාර්ශනිකයෝ ය. සමකාලීන අදේවවාදීන් යැයි කියනු ලබන්නන් මෙම දර්ශනයට සමාන වෙති. සදාතනික වාදීන් කවුරුන්ද යන්න පිළිබඳ උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි:

“මෙලොවෙහි අප ජීවත් වන ජීවිතය හැර වෙන (ජීවිතයක්) නැත” යයිද, “(මෙහිම) අපි ජීවත් වන්නෙමු. පසුව මරණයට පත් වන්නෙමු. කාලයා මිස, (වෙන කිසිවක්) අපව විනාශ කරන්නේ නැත” යැයිද ඔවුන් පවසන්නාහ. මේ ගැන මොවුන්ට කිසිම ඥානයක් නැත. මොවුන් අනුමාන කරන්නන් මිස, වෙන කිසිවක් නැත. (අල්කුර්ආන්: 45:24)

විශ්වය ස්වභාවිකව කටයුතු කරමින් සිටින බවත් එය සදාතනික බවත්, මිනිසුන් ඉපදී, ජීවත්වී, මිය යන බවත් කාලයා මිස අනෙකක් සියල්ල විනාශ නොකරන බවත් ඔවුහු විශ්වාස කරති. මෙබැවින් ඔවුහු මැවුම්කරුගෙන් මැවීමට ලක් වූවන් වෙන් කරමින් සිටින ආකාරය දැක ගන්නට පුළුවණි. මෙම විශ්වාසය හා තර්කය උත්තරීතර අල්ලාහ් ඉහත සඳහන් ආයතය තුළින් මෙලෙස බිඳ හෙළයි:

(මේ ගැන මොවුනට කිසිදු ඥානයක් නැත)

එනම්, නිසැකවම ඔවුන් සතුව පැහැදිලි තර්කනයන්, නිසි පර්යේෂණයන්, කායික

හෝ සහජ ආශ්‍රය සම්බන්ධ සාධක හෝ කිසිවක් නොමැත. ඒවා හුදෙක් කිසිදු පදනමක් නැති පුහු අනුමානයන් වේ. උත්තරීතර අල්ලාහ් ඉහත සඳහන් ආයතය තුළ මෙලෙස ප්‍රකාශ කරයි:

(මොවුන් අනුමාන කරන්නන් මිස, වෙන කිසිවක් නැත. )

## 2.ස්වභාධර්මය විශ්වාස කරන්නන්

මෙම විශ්වය ස්වාභාවිකව බිහි වූ බව මොවුන් පවසති. එනම් ශාක, සත්ත්ව හා අප්‍රාණික වස්තූන් තමා විසින්ම තමාව මවා ගත් බවත් තම ලක්ෂණයන් සහ චලනයන් තමන් විසින්ම නිර්මාණය කරන ලද බවත් විශ්වාස කරති. සරල තර්කයක් මගින් ඔවුන්ගේ ප්‍රකාශය බිඳ හෙළිය හැක. එය කෙසේදයත්, ඕනෑම කරුණක් එක්වරම නිර්මාතෘ ලෙස හා නිර්මාණයට ලක් වූවක් ලෙස විය නොහැක. උත්තරීතර අල්ලාහ් මෙසේ විමසයි:

නැතහොත් කිසිවෙක් නොමැතිව ඔවුන් මවනු ලැබුවේද? නැතහොත් ඔවුහු(ඔවුන්ගේ) ම මැවුම්කරුවෝ වෙත්ද? (අල්කුර්ආන්: 52:35)

ස්වභාවධර්මය විශ්වාස කරන්නන් යමක් බිහි කිරීමේ හැකියාව ස්වාභාවය සමඟ සම්බන්ධ කරති. එවැනි ස්වාභාවය, හැඟීම් හෝ ඉන්ද්‍රියයන් නොමැති හුදෙක් අප්‍රාණික ස්වභාවයකින් යුත්තකි යන්න ඉතා පැහැදිලිය. එවන් වූ ස්වභාවයක් ඇති යමක් සජීවී,හැඟීම් හා සංවේදීතාවන් ඇති විශේෂ නිර්මාණයක් නිපදවන්නේ කෙසේද යන්න ප්‍රශ්නාර්ථයකි. එමෙන්ම කිසිවෙකු සතුව නොමැති යම් දෙයක් අනෙකාට ලබා දිය නොහැක යන්න තාර්කිකයි.

## 3.අහඹු ලෙස සිදුවන්නක් යැයි විශ්වාස කරන්නන්

සියළු වස්තූන් හුදු අහම්බෙන් සිදු වූ බව තර්ක කරන්නන් මෙමගින් අදහස් වේ. එනම්, පරමාණු හා අංශු එක් වරම එකට එකතු වී මුල් සැලසුම් කිරීමකින් තොරව ජීවිතය මතුවීමට හා කාලයත් සමග විවිධාකාර වස්තූන් බිහි වීමට හේතු වූ බව ඔවුන්ගේ තර්කයයි. මෙවැනි ප්‍රකාශයන් ගැන පුළුල් ලෙස අදහස් දැක්වීමට අවශ්‍ය නැත. සරල ලෙස මෙම තර්කය දර්ශනය කිරීම මගින් එය ප්‍රතික්ෂේප කිරීමට හැක. කෙසේදයත්, නිර්මාණයන්හි සියුම්භාවය, එහි පරිපූර්ණ පද්ධතිය, සංකීර්ණ නීතිවලට අනුව එහි අඛණ්ඩතාවය හා එහි සමබරතාවය යනාදී කරුණු, ඒවා අහඹු ලෙස සිදු වූ බව කියන පටු මත වාදයන් සියල්ල සැකයකින් තොරව හෙළා දකිනු ඇත.

උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි:

සෑම වස්තුවක්ම (උත්පාදනය කර), ස්ථිර වශයෙන් පිළිවෙලකට තැබූ අල්ලාහ්ගේ කලාවට අනුව (එසේ සිදු වනු ඇත). (අල්කුර්ආන්: 27:88)

තවද මෙසේ ප්‍රකාශ කරයි:

අහස් හතක්ද, ඒවා මෙන් භූමියද අල්ලාහ්ම උත්පාදනය කළේය. ඒවා අතර (දිනපතා සිදු විය හැකි සියලූ කාරණාවන් ගැන වූ) නියෝගයන් පහළ කරමින්ම සිටින්නේය. (එබැවින් විශ්වාසවන්තයිනි!) නියත වශයෙන්ම අල්ලාහ් සියල්ල කෙරෙහි බලසම්පන්නයෙකු යනුවෙන්ද, නියත වශයෙන්ම අල්ලාහ් තම ඥානයෙන් සියල්ල වටකරගෙන සිටින්නේය යනුවෙන්ද, ඔබ (නියත වශයෙන්ම) දැන ගනු! (අල්කුර්ආන්: 65:12)

## 4.මාක්සිවාදීන්

කාර්ල් මාක්ස් නැමැති දර්ශන වාදියාගේ අනුගාමිකයින්. දෙවියෙකු යනුවෙන් කිසිවෙකු නොමැති බවත් ජීවිතය යනු භෞතික මාධ්‍යයක් බවත් මොවුන් ප්‍රකාශ කරති. මෙම විශ්වාසයට අනුව ඔවුන් සෝවියට් සමූහාණ්ඩුව යනුවෙන් බලවත් රාජ්‍යයක් ගොඩ නඟා ගත්හ. පසුව එය දිගු කලක් නොරැඳුණු අතර බොහෝ කුඩා ප්‍රාන්ත වශයෙන් කැඩී විසිරී ගියේය.

## 5.ඉතිහාසය පුරා අදේවවාදී තනි පුද්ගලයින්

ඒ සඳහා අල්කුර්ආනය උදාහරණ කිහිපයක් ඉදිරිපත් කරයි. නිදසුනක් වශයෙන් දේව විශ්වාසය ප්‍රතික්ෂේප කළ ෆිර්අවුන් නැමැති පාරාවෝ මෙසේ ප්‍රකාශ කර සිටියහ:

විශ්වයේ පරමාධිපති යන්න කුමක්? (අල්කුර්ආන්: 26:23)

එසේ විමසා, පසුව එම විශ්වයේ අධිපති තමන් බව ඔහු වාද කළේය. ඒ පිළිබඳ අල්කුර්ආනයේ මෙසේ සඳහන් වේ:

“ඔබලාගේ උසස් පරමාධිපති” මා වෙමි යැයි පැවසුවේය. (අල්කුර්ආන්: 79:24)

එම ස්ථාවරයෙන් ඔබ්බට ගොස් තමන් දෙවියෙකු ලෙස ඔහු වාද කළේය:

නුඹලාට මා හැර වෙනත් දෙවියකු (සිටින බව) මම නොදනිමි යනුවෙන් ෆිර්අවුන් ප්‍රකාශ කළේය. (අල්කුර්ආන්: 28:38)

මූසා (අලෛයිහි) තුමාණන්ට ඔහු මෙසේ අනතුරු ඇඟවීය:

නුඹ මා හැර වෙනත් දෙවියකු ගත්තේ නම් නියතවශයෙන්ම මම නුඹ සිරකරුවන්ගෙන් කෙනකු බවට පත් කරමි’යි ඔහු(ෆිර්අවුන්) කීවේය. (අල්කුර්ආන්: 26:29)

දෙවියෙකුගේ පැවැත්ම ප්‍රතික්ෂේප කළ උදවිය අතුරින් ඉතිහාස ගත වන තවත් චරිතයක් නම් නුම්රූද් ය. ඔහු ඉබ්රාහීම් (අලෛයිහි) තුමාණන් සමඟ දෙවියන් පිළිබඳ වාදයක නිරත වූ අවස්ථාව උත්තරීතර අල්ලාහ් පාරිශුද්ධ අල්කුර්ආනයේ මෙසේ සඳහන් කරයි:

තමාගේ රබ්(පරමාධිපති) සම්බන්ධයෙන් ඉබ්‍රාහීම් සමඟ වාද කළ පුද්ගලයාට (සිදු වූ දේ) ගැන නුඹ (මුහම්මද්!) මෙනෙහි නොකෙළෙහිද? ජීවය දෙන්නේද මරණය සිදු කරන්නේද මාගේ රබ්(පරමාධිපති) යැයි ඉබ්‍රාහීම් පැවසූ විට ජීවය දෙන්නේත් මරණය සිදු කරන්නේත් මා යැයි ඔහු කීවේය. එයට ඉබ්‍රාහීම් "නියත වශයෙන්ම අල්ලාහ් සූර්යයා නැගෙනහිරින් නංවන්නේය. (හැකි නම්) නුඹ එය බස්නාහිරින් නංවනු"යි පැවසූවේය. ප්‍රතික්ෂේප කළ ඔහු මෙය ඇසූ විගසින් වික්ෂිප්ත විය. අල්ලාහ් අපරාධ කරුවන් සඳහා යහමඟ නොපෙන්වයි. (අල්කුර්ආන්: 2:258)

මෙවන් අය සියල්ල තම ආත්මයට විරුද්ධව හා තම සහජ හැඟීම ප්‍රතික්ෂේප කරමින් කටයුතු කරන්නන් වෙති. උත්තරීතර අල්ලාහ් ඔවුනට විරුද්ධව සාක්ෂි දරමින් සිටී.

ඔවුන්ගේ හෘදයන් එය (සත්‍යය යයි) ස්ථිරවත් වුවද, උඩඟු වී අපරාධයක් වශයෙන් එය ප්‍රතික්ෂේප කළහ. එබැවින් මෙම අපරාධකරුවන්ගේ අවසානය කෙසේ වූවේදැ?යි යන්න (නබිවරය!) ඔබ අවධානය කර බලනු.

එබැවින් ඔවුන් සියල්ල කිසිම සලකුණක් ඉතිරි නොකර අතුරුදහන් වී විනාශ වී ගියහ.

## 2.අල්ලාහ්ගේ ආධිපත්‍ය පිළිබඳ විශ්වාසය

මෙයින් අදහස් කරනු ලබන්නේ උත්තරීතර ඒකීය දෙවියන් වූ අල්ලාහ් ඔහු පරමාධිපති බවත් ඔහු නිර්මාණකරු බවත් සියළු දැහි හිමිකරු ඔහු බවත් සියල්ල අණ කරන්නා ඔහු බවත් ස්ථිර ලෙස විශ්වාස කිරීමයි.

පරමාධිපති යනුවෙන් සිංහල බසට පරිවර්තනය කරන ලද රබ් යන අරාබි පදයෙහි අර්ථය නම්: හිමිපාණන්, සියළු අධිකාරිය දරන හිමිකරු, සකළ ලොවෙහි සියල්ල පෝෂණය කරන්නා යන්න වේ. ඒ සම්බන්ධයෙන් පාරිශුද්ධ අල්කුර්ආනයේ උත්තරීතර අල්ලාහ් මෙසේ සඳහන් කරයි:

ඕ! මූසා නුඹලා දෙදෙනාගේ රබ්(පරමාධිපති) කවරකු දැයි ඔහු (ෆිර්අවුන්) කීවේය. අපගේ රබ්(පරමාධිපති) ඔහුගේ සකල නිර්මාණයට සෑම දෙයක්ම ලබාදී ඔවුන් නිවැරදි මඟට යොමු කළ ඔහු (අල්ලාහ්) යැයි ඔහු(මූසා) කීවේය. (අල්කුර්ආන්:20:49:50)

දෙවියන් අල්ලාහ්ගේ ආධිපත්‍යය ප්‍රධාන අංග තුනක් මත පදනම් වේ:

### 1.නිර්මාණය කිරීම

සියළු වස්තූන්හි මැවුම්කරු අල්ලාහ් වන අතර ඔහු හැර අන් සියල්ලක්ම මැවීමට ලක් වූවකි. පාරිශුද්ධ අල්කුර්ආනයේ උත්තරීතර අල්ලාහ් මෙසේ සඳහන් කරයි:

අල්ලාහ්ම සියලූ වස්තූන් උත්පාදනය කළේය. ඔහුම සියල්ලෙහි ආරක්ෂකයාය. (අල්කුර්ආන්: 39:62)

තවද මෙසේ ප්‍රකාශ කරයි:

ඔහු කවරකු නම්, අහස්වල සහ මහපොළොවෙහි පරමාධිපත්‍යය හිමිවන්නේ ඔහුටය. ඔහු පුතකු නොගත්තේය. තවද රාජ්‍යයෙහි ඔහුට කොටස්කරුවකු නැත. සෑම දෙයක්ම මවා ඊට ඉරණම නියම කළේ ඔහුය. (අල්කුර්ආන්: 25: 2)

දෙවියන් අල්ලාහ් හැර වෙනත් කෙනෙකු වෙත යමක් නිර්මාණය කිරීම යන සංකල්පය සම්බන්ධ කෙරුණේ නම්, එම නිර්මාණය හැඩ ගැස්වීම, ප්‍රතිසංශෝදනය කිරීම, සමානුපාතනය කිරීම යනාදී අර්ථ එමගින් අදහස් වනවා මිස එමගින් නැත යන ස්ථාවරයේ සිට යමක් අලුතින් බිහි කළ බවට අදහස් නොකෙරේ.

නිර්මාණය කිරීම යන වචනය අල්කුර්ආනය භාවිතා කරන්නේ (නැත යන ස්ථාවරයේ සිට යමක් අලුතින් බිහි කිරීම යන) මේ අර්ථයෙනි. නිදසුනක් ලෙස අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි:

නිර්මාපකයන්ගෙන් ඉතා ලස්සන (නිර්මාපකයාවූ) අල්ලාහ් අති ශ්‍රේෂ්ඨය. (අල්කුර්ආන්: 23:14)

## 2.පරමාධිපත්‍ය හා අධිකාරිය

දෙවියන් අල්ලාහ් සියල්ලෙහිම අයිතිකරු වූ පරමාධිපතියාය. ඔහු හැර අන් සියල්ල ඔහු යටතේය. ඒ පිළිබඳව අල්ලාහ් මෙසේ ප්‍රකාශ කොට ඇත:

අහස්වල ද මහපොළොවෙහි ද පරමාධිපත්‍යය නියත වශයෙන්ම අල්ලාහ්ටම යැයි නුඹ නොදන්නෙහිද? තවද නුඹලාට අල්ලාහ් හැර ආරක්ෂකයකු හෝ ආධාරකරුවකු හෝ නැත. (අල්කුර්ආන්: 2:107)

තවද මෙසේ ප්‍රකාශ කරයි:

මහපොළොවෙහි ද අහස්වල ද ආධිපත්‍යය අල්ලාහ් සතුය. සියලු දෑ කෙරෙහි අල්ලාහ් බල සම්පන්නය. (අල්කුර්ආන්: 3:189)

තවද මෙසේ සඳහන් කරයි:

(නබි තුමණි!) මෙසේ පවසනු, අල්ලාහ්! සියලු රාජ්‍යයේ පරමාධිපතිවරයාණනි, ඔබ රිසි කෙනකුට රාජ්‍ය පුදන්නෙහිය. තවද ඔබ රිසි පරිදි (තව කෙනකුගෙන්) රාජ්‍යය ඉවත් කර ගන්නෙහිය. (අල්කුර්ආන්: 3:26)

තවද මෙසේ සඳහන් වේ:

රාජ්‍යයෙහි ඔහුට කොටස්කරුවෙකු නැත. (අල්කුර්ආන්: 17:111)

තවද මෙසේ සඳහන් වේ:

(මේ සියල්ල සිදු කරන) අල්ලාහ්ම නුඹලාගේ රබ්(පරමාධිපති) වෙයි. පරමාධිපත්‍යය

ඔහුගේය. ඔහු හැර නුඹලා යදින අය ඉඳි ඇට සිවියක පවා හිමිකම් නොලබන්නෝය. (අල්කුර්ආන්: 35:13)

දෙවියන් අල්ලාහ් හැර වෙනත් කෙනෙකු වෙත පරමාධිපත්‍යය යන සංකල්පය සම්බන්ධ කෙරුණේ නම් එය සාපේක්ෂිත, තාවකාලික හා අර්ධ වශයෙන් වූ පරමාධිප්‍යයකි. එවැනි අර්ථයෙන් යුතු අල්කුර්ආන් වැකි කිහිපයක් පහත සඳහන් වේ:

(තවද) මාගේ ජනයිනි, අද දින රාජ්‍යය ඔබ වෙතම ඇත්තේය. මහපොළොවේ (ඔබම) බලසම්පන්නයෙකු වශයෙන්ද සිටින්නෙහිය. (අල්කුර්ආන්: 40:29).

තවද:

නැතහොත් නුඹලාගේ දකුණු අතට පත්වූ ස්ත්‍රීන්. (අල්කුර්ආන්: 4:3).

එසේ නොමැතිව, පොදු සර්ව සම්පූර්ණ ආධිපත්‍යය හා රාජ්‍යය අල්ලාහ්ට පමණක් හිමිය. උත්තරීතර අල්ලාහ් ඒ ගැන පහත අයුරින් පැහැදිලි කරයි:

මහපොළොව සහ ඒ මත ඇති සියලු දෑ නියතවශයෙන් අපි උරුමකර ගන්නෙමු. තවද ඔවුන් ආපසු ගෙන එනු ලබන්නේ අප වෙතය. (අල්කුර්ආන්: 19:40).

### 3.නියෝග කිරීම

නියෝග නිකුත් කරන්නා අල්ලාහ්ය. ඔහු හැර අන් සියල්ලන් එම නියෝගයට යටත් වන අයවලුන් වෙති. උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි:

(නබි මුහම්මද්!) නියෝගය සම්පූර්ණයෙන්ම අල්ලාහ්ට යැයි පවසනු. (අල්කුර්ආන්: 3:154).

තවද:

නිර්මාණ කිරීම හා අණ කිරීම, ඔහු සතුය. සකල ලෝකයේම රබ්(පරමාධිපති) වූ අල්ලාහ් ආශිර්වාදයෙන් පරිපූර්ණය. (අල්කුර්ආන්: 7: 54).

තවද:

අවසානයේදී (විනිශ්චය සඳහා) සෑම දෙයක්ම අල්ලාහ් වෙත ඉදිරිපත් කරනු ඇත. (අල්කුර්ආන්: 2:210).

නබි මුහම්මද් (සල්) තුමාණන් දෙස බලාද අල්ලාහ් මෙසේ පවසයි:

තීරණය කිරීමට නුඹට කිසිම බලයක් නැත. (අල්කුර්ආන්: 3:128).

අල්ලාහ් ඉදිරියේ නබි මුහම්මද් (සල්) තුමාණන්ගේ ස්ථාවරයම එසේ නම්, එතුමාණන් හැර අන් අයගේ ස්ථාවරය කුමක් විය හැකිද? උත්තරීතර අල්ලාහ් මෙසේ සඳහන් කරයි:

බලය මීට පෙරත් පසුවත් අල්ලාහ්ටම අයත්ය. (අල්කුර්ආන්: 30:4).

තම නිර්මාණයන් කෙරෙහි නියෝගය නිකුත් කරන්නා අල්ලාහ් පමණකි. ඔහු හැර අන් කිසිවෙකු වෙත හෝ එම ගුණාංගය සම්බන්ධ කරනු ලැබුවේ නම්, නිදසුනක් වශයෙන්:

නමුත් ඔවුහු ෆිර්අවුන්ගේ අණ පිළිපැදූහ. ෆිර්අවුන්ගේ අණ නිවැරදි නොවේ. (අල්කුර්ආන්: 11:97).

එය අල්ලාහ්ගේ අභිමතයට යටත් වූ සාපේක්ෂිත නියෝගයකි. එය නිකුත් කිරීම හෝ නිකුත් නොකිරීම ඔහුගේ අභිමතයට අනුව සිදු වේ.

උත්තරීතර අල්ලාහ්ගේ නියෝග අල් කව්නී (විශ්වයට අදාල නියෝග) සහ අෂ් ෂරඊ (ජනතාව තුළ නීතිය ක්‍රියාත්මක කිරීම සමඟ අදාල වන නියෝග) යන කරුණු දෙකකින් සමන්විතයි.

ඔහුගේ විශ්වයට අදාල නියෝග එසේත් නැතිනම් විශ්වීය ආඥාව නිසැකවම සිදු වේ. මෙය ඔහුගේ අභිමතය යන ගුණාංගය සමඟ සමාන වේ. පාරිශුද්ධ අල්කුර්ආනයේ මෙසේ සඳහන් වේ:

නියත වශයෙන්ම ඔහුගේ නියෝගය කෙසේදයත්, ඔහු යමක් සිතුවේ නම් එයට සිදු වනු යැයි කී පමණින් එය සිදු වන්නේය. (අල්කුර්ආන්: 36:82).

එනමුත්, අෂ් ෂරඊ (ජනතාව තුළ නීතිය ක්‍රියාත්මක කිරීම සමඟ අදාල වන නියෝග) ගත් කළ එය ඇතැම් අවස්ථාවක සිදු වී වෙනත් අවස්ථාවක සිදු නොවීද තිබිය හැක. මෙම නියෝගය ඔහුගේ ප්‍රේමය යන ගුණාංගය සමඟ මනාව සැසඳේ. ඒ පිළිබඳ පාරිශුද්ධ අල්කුර්ආනයේ මෙසේ සඳහන් වේ:

ඔබගෙන් කවුරුන් හෝ අභිමත කරන්නේ නම් ඔහුට ඍජු මාර්ගයෙහි යාමට හැකිය. එහෙත් ලෝකයන්ගේ දෙවියන් වන අල්ලාහ් අදහස් කළහොත් මිස, ඔබ (හොඳ වැටහීමක් ලබා ගැනීමට) කැමති නොවන්නෙහුය. (අල්කුර්ආන්: 81:28).

උත්තරීතර අල්ලාහ්ගේ ආධිපත්‍යය හා සම්බන්ධ අනෙකුත් ගුණාංග හා ලක්ෂණ සියල්ල ඉහත සඳහන් නිර්මාණය කිරීම, ආධිපත්‍යය හා නියෝගය කිරීම යන මෙම මූලික ලක්ෂණ තුණ යටතේ එක්රැස් වනු ඇත. එම ගුණාංග හා ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ:

ජීවත් කර වීම, මරණයට පත් කිරීම, වර්ෂාව පහළ කිරීම, වෘක්ෂලතා වර්ධනය කිරීම, සුළඟ යැවීම, නෞකා යාත්‍රා කරවීම, රාත්‍රිය හා දවාලෙහි අනුප්‍රාප්තිකය ඇති කරවීම, පිළිසිඳ ගැනීම සහ ගර්භණීභාවය ඇති කිරීම, රෝගී හා සෞඛ්‍ය තත්ත්වයක් ඇති කිරීම, කෙනෙකු උසස් කිරීම හෝ අපහස කිරීම යනාදී ගුණාංග ඒවාට අදාල වේ.

උත්තරීතර අල්ලාහ්ගේ මෙම ආධිපත්‍යය හා බැඳුනු විශ්වාසය වනාහි මානව

ස්වභාවය තුළ සහජයෙන් කේන්ද්‍ර ගත වී ඇත. එමෙන්ම එය තාර්කික හේතු සාධක මඟින් ස්වභාවිකව තහවුරු වී ඇති අතරම දිව්‍යමය හෙළිදරව්වෙහි ඒ පිළිබඳ කරුණු සඳහන් වීද ඇත. ඒ පිළිබඳ අල්කුර්ආනීය වාක්‍ය කිහිපයක් පහත සඳහන් වේ:

1. අහස්වල හා මහපොළොවේ නිර්මාණයෙහිද දිවා රාත්‍රී මාරුවීමෙහිද මනුෂ්‍ය වර්ගයාගේ යහපත සඳහා (බඩුබාහිරාදිය පුරවාගත්) සමුද්‍ර තරණයෙහි යෙදෙන යාත්‍රාවලද අල්ලාහ් (විසින්) අහසින් පහළ කරන ජලයෙහිද (මහපොළොව වියළී) මළ පසු එමගින් (වැසි ජලයෙන්) යළි පණ ගැන්වීමෙන් ද තවද, එහි විසුරුවා හැර ඇති සියලුම සතුන් කෙරෙහිද සුළඟ ඔබ මොබ යැවීමෙහිදීද අහස හා මහපොළොව අතර (අල්ලාහ්ගේ ආඥාවට යටත්ව ක්‍රියාකාරී වීමට) සූදානම් කරන ලද මේඝයන්හිද නියත වශයෙන්ම බුද්ධිමත් අයට සංඥාවන් ඇත. (අල්කුර්ආන්: 2:164).

2. රෑස් දවාලයෙහි ඔබ ඇතුලූ කරන්නෙහිය. තවද, දහවල රෑයෙහි ඇතුලූ කරන්නෙහිය. අප්‍රාණික දැයින් ප්‍රාණික දැය හෙළි කරන්නෙහිය. ප්‍රාණික දැයින් අප්‍රාණික දැය හෙළි කරන්නෙහිය. තවද, ඔබ අභිමත වූ කෙනෙකුට අප්‍රමාණව පෝෂණය සපයන්නෙහිය. (අල්කුර්ආන්: 3:27).

3. නියතවශයෙන්ම ධාන්‍ය බීජ හා පළතුරු ඇට අංකුරලන්නේ අල්ලාහ්ය. ඔහු අජීවයෙන් ජීවය බිහි කරයි. තවද ජීවයෙන් අජීවය බිහිකරන්නාද වේ. මේ (සියල්ලක්ම කරන්නේ) අල්ලාහ්ය. (එසේනම්) නුඹලා මං මුළා කරවනු ලබන්නේ කෙසේද? (රාත්‍රියේ තිරය තුළින්) අරුණාලෝකය දිස්වීමට සළස්වන්නා ඔහුය. ඔහු රාත්‍රිය විවේකය සඳහාද, ඉර හඳ (උදාවීම හා බැස යාම) වේලාව නිර්ණය කිරීම සඳහාද නියම කර ඇත. මේ (සියලු දේ) සර්ව බලධාරී හා සර්වප්‍රාඥයන්ගේ නියමය වේ. ගොඩබිම හා මුහුදේ (පවතින නොයෙක් අන්දමේ) අඳුරින් නුඹලාට මාර්ගය සොයා ගැනීම පිණිස නුඹලාට තාරකාවන් බිහි කළේ ඔහුමය. නියත වශයෙන්ම දැනුමැති පිරිසට අපගේ සංඥා අපි පැහැදිලි කළෙමු. එක් ජීවයකින් නුඹලා ඇති කළේ ඔහුමය. ඉන්පසු නැවතුම් තැනක් හා සුරුකුම් තැනක් (නුඹලා එකිනෙකාට) ඇත. අවබෝධය ඇති ජනයාට නියත වශයෙන්ම අපි (අපගේ) ආයාත් (සංඥාවන්) පැහැදිලි කළෙමු. අහසින් (වැසි) දිය පහළ කළේ ඔහුමය. එමගින් සෑම වර්ගයකම පැළෑටි අපි හෙළි කරන්නෙමු. පසුව එයින් හරිත (කෙත්වතු) අපි හෙළි කරන්නෙමු. එමගින් ඝණව වැඩෙන ධාන්‍ය (විශේෂයන්) උත්පාදනය කරන්නෙමු. තවද පොකුරු පොකුරු ලෙස සමීපයෙන් එල්ලෙන එහි කෝෂයන්ගෙන් යුත් රට ඉඳි කෙත්ද මිදි වතුද ඔලිව්ද දෙළුම්ද අපි හෙළි කරන්නෙමු. (පෙනුමෙන් එකිනෙකට) සමාන වුත් (රසයෙන්) වෙනස් වුත්, එල දරන විට එල දරන සැටිද එම පළතුරු පැසී මුහුකුරා යන සැටිද බලනු. විශ්වාස කරන ජනයාට නියත වශයෙන්ම මෙහි ආයාත් (සංඥාවන්) ඇත. (අල්කුර්ආන්: 6: 95-99).

4. නුඹලාට එය පෙනෙන පරිදි කුළුණු නොමැතිව අහස් එසෙව්වේ අල්ලාහ්ය. ඉන් පසුව ඔහු (අර්ෂ්) රාජාසනයෙහි අසුන් ගත්තේය. තවද ඔහු ඉරත් සඳත් (පාලනයට) යටත් කළේය. (විශ්වයේ පවතින) සෑම දෙයක්ම (තම කටයුතු පවත්වාගෙන යන්නේ) නියමිත කාලයකටය. ඔහු පාලනය විධානය කරන්නේය. නුඹලා නුඹලාගේ රබ්(පරමාධිපති පරලොවදී) සම්මුඛ වීම ගැන ස්ථිර ලෙසින් දැනගනු පිණිස ඔහු(ඔහුගේ) ආයාත්(වදන්-සංඥා) පැහැදිළි කරන්නේය. මහපොළොව දිග හැර ඒ තුළ නොසැලෙන කඳුද (ඒ මත) ගංගාද (ගලා යෑමට) සැලස්වූයේ ඔහුය. තවද සියලු පළතුරු(ගෙඩි) ජෝඩු දෙක බැගින් සැලස්වූයේය. ඔහු දහවල රාත්‍රියෙන් වසන්නේය. නියත වශයෙන්ම වටහා ගන්නා පිරිසට මේවායෙහි (වැදගත්) සංඥා තිබේ. මිහිපිට එකිනෙකට ළංව වෙනස් වෙනස් කලාප තිබේ. තවද මිදිවලින් පිරි වතුද කෙත්වතුද තනි කඳ ඇති සහ තනි කඳ නැති රට ඉඳි(රුක්ගොමු) තිබේ. මේ සියල්ල එකම ජලයෙන් පෝෂණය කරනු ලබයි. නමුත් අපි එයින් ඇතැම් ඒවා අනිකුත් ඒවාට වඩා අනුභවයෙන් විශිෂ්ඨ බවට පත් කරමු. නුවණැති ජනතාවට මෙහි සංඥා තිබේ. (අල්කුර්ආන්: 13:2-4).

5. සත්‍යයේ පදනම මත ඔහු(අල්ලාහ්) අහස් හා මහපොළොව මැව්වේය. ඔවුන් සමානයන් තබන දෑට වඩා ඔහු ඉතා උසස්ය. ඔහු(අල්ලාහ්) ශුක්‍රාණු බිඳකින් මිනිසා මැවීය. දැන් ඔහු(මිනිසා) පැහැදිලිවම (අල්ලාහ්ට එරෙහිව) තර්ක කරන්නකු බවට පත්වී ඇත. ඔහු ගවමහේෂාදීන්ද නිර්මාණය කළේය. එයින් නුඹලාට උණුසුම් වස්ත්‍රද (වෙනත්) ප්‍රයෝජනද ඇත. තවද එයින් නුඹලා අනුභව කරන්නෙහුය. නුඹලා සවස ඔවුන් (නිවෙසට) දක්කාගෙන එන විටද උදෑසන (ඔවුන් තණ බිමට) දක්කාගෙන යන විටද නුඹලාට එයින් අලංකාරය තිබේ. වෙහෙස මහන්සියෙන් තොරව නුඹලාට ළඟාවිය නොහැකි (දුර බැහැර) රටවලට ඔවුහු නුඹලාගේ බර උසුලාගෙන යති. නියතවශයෙන්ම නුඹලාගේ රබ්(පරමාධිපති) අති සානුකම්පිතය. අසමසම කරුණාන්විතය. අශ්වයින්ද, කොටළුවන්ද, බූරුවන්ද නුඹලාට පිට උඩ නැගී යා හැකි පරිදිද අලංකාරය සදහාද (ඔහු මවා ඇත. ) තවද නුඹලා නොදන්නා බොහෝ දෑද ඔහු නිර්මාණය කරන්නේය. ඍජු මාර්ගය පැහැදිලි කිරීම අල්ලාහ් කෙරෙහිමය. එහෙත් වක්‍ර මාර්ගද ඇත. ඔහු අභිමත වූයේ නම් නුඹලා සියලු දෙනාට යහ මඟ පෙන්වනු ඇත. අහසින් ජලය පහළ කළේ ඔහුමය. නුඹලාට එයින් පානයද නුඹලා (නුඹලාගේ ගව ආදී සතුන්ට) කවන ගහ කොළද එයින්(හටගන්නේ)ය. එසේම ඔහු ධාන්‍ය වර්ගද රට වෙරළුද, රටඉඳි ගස්ද, මිදිද තවත් විවිධ වර්ගවල පළතුරුද එයින් නුඹලාට හටගන්වන්නේය. මෙනෙහි කරන අයට නියතවශයෙන්ම එහි සංඥා ඇත. ඔහු නුඹලාට රාත්‍රියද, දහවලද, ඉරද, සඳුද වසඟ කළේය. තවද (සියලුම) තාරකා ඔහුගේ අණසකට යටත් වෙයි. වටහාගන්නා අයට නියතවශයෙන් එහි සංඥා ඇත.

තවද මහපොළොවෙහි නුඹලා සඳහා ඔහු මවා ඇති විවිධ වර්ණවලින් යුත් දෑද

සිහිපත්කරන අයට එහි සංඥා ඇත. එයින් නුඹලා අලුත් මස් අනුභව කිරීම පිණිසද, තවද එයින් නුඹලා පළඳින ආභරණ උකහාගනු පිණිසද මහ මුහුද වසග කළේ ඔහුමය. රළ හාන නැව් නුඹ එහි දකින්නේය. තවද, නුඹලා ඔහුගේ පරිත්‍යාගශීලීභාවය ලබා ගැනීම පිණිසද, තවද නුඹලා කෘතඥවනු පිණිසද. නුඹලා සමග කම්පා නොවනු පිණිස මහපොළොවෙහි තිරසාර පර්වත ඔහු පිහිටුවේය. තවද ගංගාවන්ද, මාර්ගයන්ද (ඔහු පිහිටුවේය.) නුඹලා නිසිමඟ දැන ගනු පිණිස. තවද සලකුණුද (නුඹලාට මඟ දැනගනු පිණිස ඔහු පිහිටුවේය.) තවද තාරකාවන්ගෙන් ඔවුහු මඟ දැන ගනිති. තවද නිර්මාණය කරන තැනැත්තා, නිර්මාණය නොකරන තැනැත්තා වැනිද? නුඹලා අවබෝධකර නොගන්නෙහිද? අල්ලාහ්ගේ අනුග්‍රහය නුඹලා ගණන් කරන්නහු නම්, නුඹලාට එය නිමකළ නොහැකිය. නියතවශයෙන් අල්ලාහ් අධික ක්ෂමාශීලීය. අසමසම කරුණාන්විතය. (අල්කුර්ආන්: 16:3-18).

6. ඔවුහු කවුරුන්ද යත් ෆිර්දවුසය (ස්වර්ගය) උරුමකරගන්නන් ද වෙති. ඔවුහු එහි සදාකල් වෙසෙති. කිරි මැටියෙහි(වූ) සාරයෙන් මිනිසා අපි නියතවශයෙන් මැව්වෙමු. පසුව අපි ඔහු සුරක්ෂිත ස්ථානයක ශුක්‍රාණු බිඳුවක් ලෙසින් (තැන්) පත් කළෙමු. පසුව අපි ශුක්‍රාණු බිඳුව ලේ කැටියක් කළෙමු. ඉන්පසුව ලේ කැටිය මස් කැබැල්ලක් බවට පත් කළෙමු. අනතුරුව මස් කැබැල්ල ඇටකටු බවට පත් කළෙමු. පසුව ඇට කටු මසින් ආවරණය කළෙමු. ඉන්පසු එය(එම කලලය) අපි වෙනස් නිර්මාණයක් කළෙමු. නිර්මාපකයන්ගෙන් ඉතා අලංකාරමත් (නිර්මාපකයාවූ) අල්ලාහ් අති ශ්‍රේෂ්ඨය. පසුව නුඹලා (සියලු දෙනා) නියතවශයෙන් මරණයට පත්වන්නේමය. පසුව කියාමත්(මළවුන් කෙරෙන් නැගිටුවන) දිනයේ නියතවශයෙන් නුඹලා නැගිටුවනු ලබන්නෙහුය. තවද, අපි නුඹලාට ඉහළින් මාවත් සතක් සාදා ඇත්තෙමු. අපි නිර්මාණයේ නොසැලකිලිමත් නොවීමු. තවද අපි නියමිත ප්‍රමාණයට අහසින් දිය පහළ කළෙමු. පසුව එය භූමියෙහි අපි තැන්පත් කළෙමු. තවද (අපට අභිමත වී නම්) එය නැති කිරීමටද නියතවශයෙන් අපි ශක්තිසම්පන්න වෙමු. ඉන්පසුව එයින්(එම දියෙන්) අපි නුඹලාට මිදිවතු සහ රුක් ගොමු හටගැන්වීමු. නුඹලාට එහි බොහෝ පළතුරුය. එයින් නුඹලා අනුභව කරන්නෙහුය. තෙල් ලබා දෙන හා අනුභව කරන්නවුනට අභිරුචියදවූ ගසක් තූර් සයිනායි(කන්දෙ)හි (අපි) බිහි කළෙමු. තවද ගව ඔටු මහීෂාදී(සතු)න්ගෙන් නියතවශයෙන් නුඹලාට උගත හැකි පාඩමක් තිබේ. ඔවුන්ගේ කුස තුළ ඇති දැයින් නුඹලාට පානය ලබා දෙන්නෙමු. තවද නුඹලාට ඔවුන්ගෙන් බොහෝ ප්‍රයෝජනද ඇත. තවද නුඹලා එයින් (මස්) අනුභව කරන්නෙහුය. (අල්කුර්ආන්: 23:11-21).

7. නියතවශයෙන්ම අල්ලාහ් වලාකුළු සෙමින් පාවී යෑමට සලස්වන බවද පසුව ඒවායේ කැබිලි එකට අමුණා අනතුරුව එය ඝන වලාකුළු ගොඩක් බවට පත් කරන බව නුඹ නොදකින්නෙහිද? එවිට ඒ(වලාකුළු) අතුරින් වැසි වැටෙන්නේ

යැයි නුඹ දකින්නේය. තවද අහස්හි (වලා) කඳුවලින් පාන හිමකැට පහළ කරන්නේය. තමාට අභිමත අයට එයින් පහර දෙන්නේය. ඔහු තමාට අභිමත අයගෙන් එය වළක්වන්නේය. තවද එම විදුලි එළිය ඇස් නීලංකාර කරනු ඇත. අල්ලාහ් රාත්‍රිය සහ දහවල පරිවර්තනය කරන්නේය. (නිරීක්ෂණාත්මක) නුවණ ඇති අයට නියතවශයෙන් එහි පාඩමක් ඇත. අල්ලාහ් සෑම ප්‍රාණියකුම ජලයෙන් මැව්වේය. බඩගා යන්නන් ඔවුන් අතුරින්ය. තවද දෙපයින් ගමන් කරන්නන්ද ඔවුන් අතුරින්ය. තවද සතර(පයින්) යන්නන්ද ඔවුන් අතුරින්ය. අල්ලාහ් තමාට අභිමත දෑ නිර්මාණය කරන්නේය. නියතවශයෙන් අල්ලාහ් සියලු දෑ කෙරෙහි බලසම්පන්නය. (අල්කුර්ආන්: 24:43-45).

8. නුඹගේ රබ් (පරමාධිපති) සෙවනැල්ල කෙසේ දික් කරන්නේ දැයි නුඹ නොදක්නෙහිද? ඔහුට අභිමත නම් ඔහු එය නිසල කරන්නේය. පසුව අපි සූර්යයා ඒ පිළිබඳ නියමුවා බවට පත් කළෙමු. පසුව (සූර්යයා ඉහළ නඟින විට) අපි එය ටිකින් ටික අප වෙතට හකුලුවන්නෙමු. එමෙන්ම රාත්‍රිය නුඹලාට සළු පිළිවක් ලෙසත් නින්ද විවේකයක් ලෙසත් දිවා කාලය නැවත ජීවය ලැබීමක් ලෙසත් නුඹලාට නියම කර ඇත්තේ ඔහු(අල්ලාහ්)මය. ඔහුගේ දයාලුභාවයට පෙර ශුභාරංචියක් ලෙස සුළං මෙහෙයවන්නේ ඔහුය. තවද පිරිසිදු ජලය අහසින් අපි පහළ කළෙමු. මළ භූමියක් එයින් පණ ගන්වනු පිණිසත් අප නිර්මාණය කළ ගවමහීෂාදීන් හා මිනිසුන් බොහෝමයක පිපාසය එමගින් සංසිඳු වීම පිණිසත්, ඔවුන් මෙනෙහි කරනු පිණිස අප ඔවුන් අතර එය බෙදා හැරියෙමු. නමුත් මනුෂ්‍යයින්ගෙන් බොහෝ දෙනකු අකෘතඥ මිස නැත. අපට අභිමතවී නම් සෑම ජනාවාසයකටම අනතුරු අඟවන්නකු පහළ කරන්නේමු. එනිසා (නබි මුහම්මද්!) අවිශ්වාසිකයින්ට අවනත නොවනු. එය (කුර්ආනය) මගින් (ඔවුනට විරුද්ධව) දැඩි ජිහාදයෙහි(සටනෙහි) යෙදෙනු. මුහුදු දෙක වෙන් කළේ ඔහු(අල්ලාහ්)මය. මෙය රසවත්ය. මිහිරිය. එය තිත්ත සහ ලාවණ්‍යය. තවද ඔහු ඒ දෙක අතර සම්බාධයක්ද අනභිබවනීය බාධකයක්ද ඇති කළේය. ජලයෙන් මිනිසා මැව්වේද ඔහුය. ඉන්පසු ලේ නෑකම්ද විවාහා නෑකම්ද ඇති කළේය. නුඹගේ රබ්(පරමාධිපති) සර්වබලධාරිය. (අල්කුර්ආන්: 25:45-54).

9. එබැවින් (විශ්වාසවන්තයිනි!) ඔබ සූර්යයා උදා වන විටද, සූර්යයා බසින විටද අල්ලාහ්ව සුවිශුද්ධ කරමින් සිටිනු. ඉදිරි රාත්‍රියේද, මධ්‍යාහ්නයේද, අහස්හිද, භූමියෙහිද (ඇති සියල්ල සුවිශුද්ධ කර ප්‍රශංසා කරන) ප්‍රශංසා සියල්ල අල්ලාහ්ටමය අයත්ය! ඔහුම මළ දැයෙන් පණ ඇති දැය ඉකුත් කරන්නේය. ඔහුම පණ ඇති දැයෙන් මළ දැය ඉකුත් කරන්නේය. ඔහුම මිය ගිය පොළොවද සශ්‍රීක කරන්නේය. මෙසේම (මරණයට පත් වූ පසු පරලොවදී) ඔබව ඉකුත් කරනු ලබන්නෙහුය. ඔහු ඔබව පස්වලින් උත්පාදනය කළේය. පසුව ඔබ මිනිසුන් බවට පත් වී (භූමියෙහි විවිධ ප්‍රදේශයන්හි) විසිරී යාමට හැරීමද, ඔහුගේ සාධකයන්ගෙන් ඇති දැයයි. (ඔබ එක්කාසු වී ජීවත් විය හැකි ඔබගේ)

භාර්යයාවන්ව ඔබ ඔවුන් වෙත හිත සුව ලැබීම පිණිස ඔබගෙන්ම ඔහු නිර්මාණය කර, ඔබ අතරේ ආදරයද කරුණාවද ඇති කර තිබීමද, ඔහුගේ සාධකයන්ගෙන් ඇති දැයයි. සිතා වටහා ගත හැකි ජනතාවට මෙහිද නියත වශයෙන්ම (එකක් නොව, බොහොමයක්) සාධකයන් ඇත. අහස්ද භූමියද උත්පාදනය කර තිබීමද, ඔබගේ භාෂාවන්ද, වර්ණයන්ද වෙනස් වී තිබීමද, ඔහුගේ සාධකයන්ගෙන් ඇති දැයයි. මෙහිද බුද්ධිමත් අයට නියත වශයෙන්ම (බොහොමයක්) සාධකයන් ඇත්තේය. රාත්‍රියේද, දහවලේද, නිදාගෙන (විඩාව නිවා ගැනීම)ද, (භූමියෙහි විවිධ ප්‍රදේශයන්ට ගොස්) ඔබ ඔහුගේ වරප්‍රසාදයන් සොයා ගැනීමද, ඔහුගේ සාධකයන්ගෙන් ඇති දැයයි. සවන් දෙන ජනතාවට මෙහිද නියත වශයෙන්ම (බොහොමයක්) සාධකයන් ඇත. ලාභයද, බියද ලබා දිය හැකි සේ විදුලිය ඔහු ඔබට පෙන්වීමද, වලාකුළෙන් වර්ෂාව වැසීමට සලස්වා එමගින් මිය ගිය පොළොව සශ්‍රීක කිරීමද, ඔහුගේ සාධකයන්ගෙන් ඇති දැයයි. බුද්ධිමත් ජනතාවට නියත වශයෙන්ම මෙහි (එකක් නොව, බොහොමයක්) සාධකයන් ඇත්තේය. අහස්ද, භූමියද, ඔහුගේ නියෝගයට අනුව ස්ථිරව තිබීමද, ඔහුගේ සාධකයන්ගෙන් ඇති දැයයි. (ඔබට නියම කරනු ලැබූ කාලය දක්වා ඔබ එහි ජීවත් වී මරණයට පත් වූ පසු භූමියෙහි භූමදානය කරනු ලැබීමෙන්) පසුද ඔහු ඔබව කැඳවුවහොත් එකම එක ශබ්දයකින් එවෙලේම ඔබ භූමියෙන් ඉකුත් වනු ලබන්නෙහුය. අහස්හිද, භූමියෙහිද ඇති සියල්ල ඔහුට අයත් දැයයි! මේවා සියල්ල ඔහුට අවනත වී කටයුතු කරන්නේය. ඔහුම උත්පාදනයන් (පෙර නිදසුණක් නොමැතිවම ආරම්භයේදී) නිර්මාණය කරන්නේය. ඔහුම (ඒවා මරණයට පත් වූ පසුද, පණ දී) ඒවා පුනරුත්ථාපනය කරන්නේය. මෙය ඔහුට ඉතාමත් පහසුය. අහස්හිද, භූමියෙහිද ඉතාමත් උසස් උපමාවන් ඔහුටම අයිතිය. ඔහු (සියල්ලට) බලසම්පන්නයෙකු හා ඥානවන්තයෙකු වශයෙන් සිටින්නේය. (අල්කුර්ආන්: 30:17-27).

10. (නබිවරය! ඔහු) අප්‍රමාණ දයාබරවන්තයෙකි. මෙම කුර්ආනය (ඔහු ඔබට) උගන්වා දුන්නේය. ඔහුම මිනිසාව උත්පාදනය කළේය. ඔහුම මිනිසාට (පැහැදිලිව) කතා කිරීමටද ඉගැන්වූවේය. සූර්යයාද, චන්ද්‍රයාද, (ඒවා නිර්මාණය කරන ලද) සීමාවන් ප්‍රකාරම (ගමන් කරන්නේය). පැළෑටි, ගස් කොළන් (වැල් ආදී සියල්ල අල්ලාහ්ට අවනත වී) සුජූද් කරන්නේය. ඔහුම අහස ඔසවා සමතුලනය කර ස්ථාවරවත් කළේය. එබැවින් ඔබ කිරුමෙහි සීමාව ඉක්මවා නොයා සිටිනු පිණිස ඔබ සාධාරණ ලෙස කිරනු. බර අඩු කර නොහරිනු.

භූමිය ජීවීන් වාසය කිරීමට පහසු වන අන්දමට එය ඔහුම නිර්මාණය කළේය. (තවද) එහි (විවිධ වර්ගයේ) පලතුරු වර්ගද, (වළු වලින් පිරි) අතුවලින් යුත් ඉඳි ගස්ද වැඩෙන්නේය. දහයියා වලින් වසන ලද ධාන්‍යද, සුවඳ පැළෑටි ගස් වැල්ද පැළවෙන්නේය. එබැවින් (මිනිසුන්, ජින්වරුන් වන) ඔබ සමූහයන් දෙකම ඔබ දෙවියන්ගේ වරප්‍රසාදයන්ගෙන් කුමක් නම් බොරු කරන්නෙහුද?

පුළුස්සන ලද බඳුන් මෙන් (තට්ටු කළහොත් ටං ටං ගාන) ශබ්දයක් ගෙන දෙන කිරි මැටියෙන් ඔහු (පළමු) මිනිසාව උත්පාදනය කළේය. ගිනි දැල්වලින් ඔහු ජින්වරුන්ව උත්පාදනය කළේය. එබැවින් ඔබ සමූහයන් දෙකම ඔබ දෙවියන්ගේ වරප්‍රසාදයන්ගෙන් කුමක් නම් බොරු කරන්නෙහුද? නැගෙනහිර දිසාවන් දෙකටම ඔහුම අයිතිකරුය. බටහිර දිසාවන් දෙකටම ඔහුම අයිතිකරුය. එබැවින් ඔබ සමූහයන් දෙකම ඔබ දෙවියන්ගේ වරප්‍රසාදයන්ගෙන් කුමක් නම් බොරු කරන්නෙහුද? එකට එකතු වන සමුද්‍රයන් දෙකම ඔහුම හමු වීමට සැලැස්සුවේය. එහෙත් ඒවා අතර බාධකයක් ඇත. (එම බාධකය) ඒ දෙක, කඩ කරන්නේ නැත. එබැවින් ඔබ සමූහයන් දෙකම ඔබ දෙවියන්ගේ වරප්‍රසාදයන්ගෙන් කුමක් නම් බොරු කරන්නෙහුද? ඒ දෙකෙන්ම මුතු, පබළු (ආදිය) ඉකුත් වන්නේය. එබැවින් ඔබ සමූහයන් දෙකම ඔබ දෙවියන්ගේ වරප්‍රසාදයන්ගෙන් කුමක් නම් බොරු කරන්නෙහුද? කඳු මෙන් උස් වූ මුහුදෙහි යාත්‍රා කරන නැව්ද ඔහුට අයත්ය. එබැවින් ඔබ සමූහයන් දෙකම ඔබ දෙවියන්ගේ වරප්‍රසාදයන්ගෙන් කුමක් නම් බොරු කරන්නෙහුද? (අල්කුර්ආන්:55:01)

11. (මෙතරම් විශාල) භූමිය අපි (ඔබට) තොටිල්ලක් වශයෙන්ද, කඳු, සවි කරන ලද ඇණ වශයෙන්ද නිර්මාණය කළේ නැද්ද? අපිම ඔබගේ නින්ද, (ඔබට) විරාමයක් බවට පත් කළෙමු. ජෝඩු ජෝඩු වශයෙන් ඔබව අපිම උත්පාදනය කර ඇත්තෙමු. අපිම රාත්‍රිය (ඔබට) පොරවණයක් බවට පත් කළෙමු. අපිම දහවල (ඔබගේ) ජීවනෝපාය (සොයා ගන්නා කාලය) බවට පත් කළෙමු. ඔබට ඉහළින් ඇති ශක්තිමත් අහස් හතද අපිම නිර්මාණය කළෙමු. එහි (සූර්යයා) ආලෝකය විහිදුවන (මිණි) පහනක් වශයෙන්ද නිර්මාණය කළෙමු. ඝන වලාකුළෙන් ඉමහත් වර්ෂාව වසින්නට සලස්වන්නෙමු. එමගින් ධාන්‍යයද, පැළෑටිද, ගස් කොළන්ද පැළවෙන්නට සලස්වන්නෙමු. අතුවලින් ගහණ වූ උයන් වතුද (උත්පාදනය කරන්නෙමු). (අල්කුර්ආන්:78:06-16)

12. (මිනිසුනි! හැඩරුව) නිර්මාණයෙහි ඔබ බලවන්තයින්ද? නැතහොත් ඔහු උත්පාදනය කළ අහසද? ඔහුම එහි මුදුන ඔසවා එය සැලසුම් කළේය. එබැවින් එහි රාත්‍රිය අන්ධකාර කර, (සූර්යයා මගින්) දහවල එළියට ගෙන, (ආලෝකමත්) කළේය. මින්පසුව ඔහුම භූමිය දිග හැරියේය. ඔහුම එයින් ජලයද, තණ (බිම්)ද ඉකුත් කරන්නේය. කඳුද ඔහුම එහි ස්ථිරවත් කළේය. ඔබටද ඔබගේ සතුන්ටද ප්‍රයෝජනවත් විය හැකි දෑයද (එහි නිර්මාණය කළේය). (අල්කුර්ආන්:79:27-33)

13. තවද මිනිසා තමන්ගේ ආහාරය, (එය කොහි සිට, කෙසේ නම් පැමිණෙන්නේද යන්න මදක්) අවධානය කර බැලිය යුතුය. නියතවශයෙන්ම අපිම බොහෝ ජලය වසින්නට සලස්වා-පසුව භූමියද, පුපුරා (පැළෙන්නට සලස්වා)-පසුව එයින් බීජයන් පැළවී වැඩෙන්නට සලස්වන්නෙමු. (මෙසේ) මිදි (පලතුරු) ද (වෙනත්) එළවළුද, සෙයිතූන් (ඔලිව්) ද, ඉඳිද, ඝනට වැඩුණු අතුවලින් පිරි වතුද, පලතුරු වර්ගද, තණ, ගස්වැල් ආදියද, ඔබටද ඔබගේ සතුන්ටද, ප්‍රයෝජනවත් වන සේ ඉකුත් කරන්නෙමු. (අල්කුර්ආන්:80:24-32)

අරාබි ජාතික ආදේශක වරුන් ඇතුළුව සමස්තයක් ලෙස ගත් කළ ආදම්ගේ පුතුන් අතුරින්

සියල්ලන්ම දෙවියන්ගේ ආධිපත්‍ය තහවුරු කරන්නන් වෙති. එමෙන්ම ඔහු නිර්මාතෘ බව හා සියල්ලෙහි අධිපති බව විශ්වාස කරති. අරාබි ජාතික ආදේශක වරුන් එය පිළිගත් බව අල්ලාහ් ශුද්ධ වූ අල්කුර්ආනයේ බොහෝ අවස්ථාවල ප්‍රකාශ කර ඇත. ඒ පිළිබඳ අල්කුර්ආනීය වැකි කිහිපයක් පහත සඳහන් වේ.

1. මහපොළොවද, එහි අය ද කවරෙකුටදැ? යි නුඹලා දන්නහු නම් (මට කියවු)යි (නබි මුහම්මද්) කියනු. අල්ලාහ්ට යැයි ඔවුහු කියන්නෝය. එසේ නම්, නුඹලා මෙනෙහි නොකරන්නේ දැ (යි නබි මුහම්මද්) කියනු. අහස් සතෙහි රබ්(පරමාධිපති) ද අසිරිමත් අර්ෂ්හි රබ්(පරමාධිපති) ද කවුරුන් දැ? (යි නබි මුහම්මද්) කියනු. අල්ලාහ්ට යැයි ඔවුහු කියන්නෝය. එසේ නම්, නුඹලා (ඔහුට) බියබැතිමත් නොවන්නහු දැ? (යි නබි මුහම්මද්) කියනු. සියලු දැහි ආධිපත්‍යය කවරෙකු අතෙහි ද? ඔහු ආරක්ෂාව සලසන්නේය. ඔහුට ආරක්ෂාව සලසනු නොලබන්නේය. නුඹලා දන්නෙහු නම්, (යැයි නබි මුහම්මද්) කියනු. අල්ලාහ්ට යැයි ඔවුහු කියන්නෝය. එසේ නම්, නුඹලා වශී කරනු ලැබුවේ කෙසේ දැ? (යි නබි මුහම්මද්) කියනු. (අල්කුර්ආන්:23:84-89)
2. “අහස්ද, භූමියද උත්පාදනය කළේ කවරෙක්දැයි ඔබ ඔවුන්ගෙන් විමසන විට, (සියල්ලටම) ශ්‍රේෂ්ටයෙකු හා ඥානවන්තයෙකු (වන අල්ලාහ්) ම ඒවා උත්පාදනය කළේය යැයි නියත වශයෙන්ම ඔවුන් (පිළිතුරු) දෙනු ඇත. (අල්කුර්ආන්:23:43-09)

මෙම සංකල්පයෙහි පාර්ශවීය නොමඟ යැවීමක් විවිධ නිකායන් මඟින් සිදු වූ හේතුවෙන් අල්ලාහ්ගේ ආධිපත්‍යයෙහි ශිර්ක් හෙවත් ආදේශ කිරීමක් සිදු විය. ඒවා අතුරින් නිකායන් කිහිපයක විස්තර පහත සඳහන් වේ.

### 1.ද්වෛතවාදයේ අනුගාමිකයින්:

මෙම විශ්වය සඳහා මැවුම්කරුවන් දෙදෙනෙකු සිටින බව ඔවුන් පවසති. එම මැවුම්කරු දෙදෙනා නම් යහපත් දෑ නිපදවන්නෙකු වන ආලෝකය මැවූ මැවුම්කරු හා අයහපත් දෑ නිපදවන අන්ධකාරය මැවූ මැවුම්කරුවෙකි. එසේම අන්ධකාරයට වඩා ආලෝකය ඉතා විශිෂ්ට බව ඔවුන් ඒකමතිකව විශ්වාස කරන නමුත් අන්ධකාරය පැවතුණේද නැත්නම් කිසියම් අවස්ථාවකදී නිර්මාණය වී තිබේද යන්න පිළිබඳ ඔවුන් මත බේද වෙති.

### 2.කිතුනුවන්:

ත්‍රිත්වය විශ්වාස කරන උදවිය. පියාණන්, පුත්‍රයාණන් ශුද්ධාත්මයාණන් යන තිදෙනෙක් එක් ආත්මයක් තුළ වැඩ සිටි බව ඔවුහු විශ්වාස කරති. කෙසේ වෙතත්, විශ්වය සඳහා වෙන් වෙන්ව අධිපතිවරුන් තිදෙනෙකු සිටින බව ඔවුන් පවසන්නේ නැති අතර එකම මැවුම්කරුවෙකු සිටින බව ඔවුහු තහවුරු කරති.

### 3.පැරණි අරාබි  ප්‍රතිමා වන්දනාකරුවන් (ආදේශවාදීන්)

එනම්, ඔවුන් වන්දනා කරන පිළිම වලට යහපතක් හෝ හානියක් සිදු කළ හැකි බවත්,

කටයුතු පවත්වාගෙන යාමේ හැකියාවක් ඔවුනට තිබෙන බවත් ඔවුහු විශ්වාස කළහ. එමෙන්ම ඔවුන් නිමිති බලා කටයුතු කරන උදවිය වෙති.

### 4.කදරියියාවරුන්:

අල්ලාහ්ගෙන් ස්වාධීන වී මිනිසා තමන්ගේ සෙසු ක්‍රියාවන් ස්වකීයව තමා විසින්ම නිර්මාණය කරන බව මොවුන් විශ්වාස කරති. දෙවියන් අල්ලාහ් ඔහුගේ ආධිපත්‍යය හා ඔහුගේ නියෝග කිරීම විෂයෙහි ඒකීයත්වය සනාථ කරන මිනිසාගේ විවෘත මානව බුද්ධිය, තර්කණයන්, සහජ හැඟීම සහ දිව්‍යමය හෙළිදරව් යනාදී කරුණු තුළින් මේ සියලු නිකායවල් දරන විශ්වාසයන් නිෂ්ප්‍රභා කෙරේ.

උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි:

අල්ලාහ් (කිසිඳු) දැරුවෙකු නොගත්තේය. ඔහු සමඟ (කිසිඳු) දෙවියෙක් ද නොවූයේය. එය එසේ වූවා නම් සෑම දෙවියෙක්ම තමන් නිර්මාණය කළ දෑ රැගෙන යන්නේය. තවද, ඇතැමෙක් ඔවුන්ගේ ඇතැමෙකුගෙන් උත්කෘෂ්ට වන්නේය. ඔවුන් ආරෝපණය කරන දැයින් අල්ලාහ් සුවිශුද්ධය. (අල්කුර්ආන්:23:91)

සැබැවින්ම, සත්‍ය දෙවිඳාණන් වනාහි මහා නිර්මාපකයෙකු ලෙස හා ඔහු අභිමත කරන දෑ සිදු කරන්නෙකු ලෙස සිටිය යුතුය. ඔහුත් සමඟ වෙනත් හවුල්කරුවෙකු සිටියේ නම් ඔහුටද මැවීමට හා සියළු දෑ  සිදු කිරීමට හැකි වනු ඇත. එවැනි තත්ත්වයක් යටතේ, අවස්ථා දෙකක් පමණක් සිදු වේ.

* එකිනෙකා තම මිශ්‍ර දේවත්වයෙන් ඉවත් වී ස්වාධීනව කටයුතු කිරීම. විශ්වයේ පැවතිය යුතු ස්ථාවරත්වය සැලකිල්ලට ගත් කළ මෙම ස්ථාවරය අනුමත කළ නොහැක.
* දෙපිරිස අතර තරඟකාරිත්වයක් ඇති වී සෑම කෙනෙකුගේම උත්තරීතර භාවය තහවුරු කිරීමට උත්සාහ කිරීම. නිදසුනක් ලෙස: එක් දෙවියෙකු යම් ජීවයක මෘත ශරීරය චලනය කිරීමට තැත් කරන විට අනෙකා එය චලනය නොකර සිටීමට තැත් කරයි නම්, නැතහොත් කෙනෙකු යම් ජීවයක් ජීවත් කරවීමට තැත් කරන අතර අනෙකා එම ජීවය මරණයට පත් කිරීමට තැත් කරයි නම් පහත සඳහන් විකල්ප මාර්ග තුනකින් එකක් හෝ සිදු විය යුතුය.
* එම දෙදනාගේ අභිමතයන් සිදු විය යුතුයි.
* එසේත් නැතිනම් දෙනාගෙන් එක් අයෙකුගේ අභිමතය පමණක් සිදු විය යුතුයි.
* එසේත් නැතිනම් දෙදෙනාගේම අභිමතයන් සිදු නොවිය යුතුයි.

මෙම විකල්ප මාර්ගයන් අතුරින් පළවෙනි හා තෙවෙනි කරුණු කිසිදා සිදු විය නොහැක. මන්දයත් ඔවුන් එකිනෙකාට විරුද්ධාර්ථයක් හඟවන දේවල් දෙකක සම්මිශ්‍රණයක් එහිදී සිදු වන බැවිණි. එසේ නම් දෙවන විකල්පය පමණක් සිදු විය

යුතුයි. ඒ අනුව කවරෙකුගේ අභිමතය සිදු වන්නේද ඔහු බලවත් දෙවියෙකු වන අතර අනෙකා දේවත්වය උසුලා ගැනීමට සුදුසුකම් නොලබයි. මෙමඟින් සියල්ල නිර්මාණය කර අධීක්ෂණය කරන්නා එකම පරමාධිපතියෙකු බවට ස්ථිරව විශ්වාස කිරීමට සිදු වේ.

දෙවියන්ගේ ඒකීයභාවය තහවුරු කිරීමෙහි හා ඔහුගේ විවිධත්වය ප්‍රතික්ෂේප කිරීමෙහි වැදගත් මනෝවිද්‍යාත්මක සාධකයක් යනුවෙන් මෙය හඳුන් වනු ලබයි.

## 3.ඔහුගේ දේවත්වය පිළිබඳ විශ්වාසය

අල්ලාහ් පමණක් සත්‍ය දෙවියෙකු බව හා ඔහු හැර අන් කිසිවෙකු හෝ කිසිවක් නැමදුමට සුදුසු නොමැති බව ස්ථිර ලෙස විශ්වාස කිරීම මෙමඟින් පෙන්නුම් කරනු ලබයි.

මන්දයත් දෙවියන් යන්නෙහි අර්ථය නම් කවරෙකු පිළිබඳ සිත් තුළ නිර්මල ප්‍රේමයක් හා ගෞරවයක් ඇති වන්නේද එවන් වූ නැමදුමට ලක් වන්නා වේ. තවද වන්දනාවෙහි සාරය යනු වන්දනාමානයට ලක් වන තැනැත්තාට යටත් වීමත් සමඟ පූර්ණ ප්‍රේමය හා පූර්ණ නිහතමානිකම හෙළි දැක්වීමයි. මෙය එකම දෙවියන් සඳහා පමණක් මිස විය නොහැකි කරුණකි. මෙම විශ්වාසය පිළිබඳ ශ්‍රේෂ්ඨ ලෙස සාක්ෂි ලබා දෙන්නා විසින් සපයනු ලබන ශ්‍රේෂ්ඨතම සාක්ෂිය මෙසේ අල්කුර්ආනය තුළ සඳහන් වේ.

නියත වශයෙන්ම ඔහු හැර අන් දෙවියකු නොමැති බවට අල්ලාහ් සාක්ෂි දරයි. මලක්වරුද දැනුමෙන් පිරිපුන් අයද සර්ව බලධාරී, සර්වඥානී වූ අල්ලාහ් හැර අන් දෙව් කෙනකු නැති බවට සත්‍යයෙන් හා යුක්තියෙන් යුතුව සාක්ෂි දරති. (අල්කුර්ආන්:03:18)

තවද:

නුඹලාගේ දෙවියා එකම දෙවියෙකි. අපරිමිත දයාන්විත අසමසම කරුණාන්විත ඔහු (අල්ලාහ්) හැර වෙන දෙවියකු නැත. (අල්කුර්ආන්:02:163)

සැබැවින්ම සර්ව බලධාරී අල්ලාහ් මිනිසුන් හා ජින්වරුන් ඇතුළුව සියළු නිර්මාණයන් මවා ඇත්තේ, ඔහුට වන්දනාමාන කිරීම සඳහා පමණකි. ඒවා වෙත කිසිදු අවශ්‍යතාවයක් හෝ බලාපොරොත්තුවක් හෝ පූර්ණ වශයෙන් ඔහුට නොමැත.

ඒ පිළිබඳ උත්තරීතර අල්ලාහ් මෙසේ සඳහන් කරයි:

මා ඇදහීමට මිස මම ජින්වරුන් සහ මිනිසුන් නොමැව්වෙමි. ඔවුන්ගෙන් යැපීමක් බලාපොරොත්තු නොවෙමි. තවද ඔවුන් මා පෝෂණය කළ යුතු යැයි මම බලාපොරොත්තු නොවෙමි. (අල්කුර්ආන්:51:56/57)

මෙම විශ්වාසය තහවුරු කිරීම පිණිස මිනිසා වෙත අල්ලාහ් සියළු ධර්ම දූතයින් පහළ කළහ. එම ධර්ම දූතයින් අල්ලාහ්ට ආදේශ කිරීම හා සම කිරීම අත් හැර දමා ඔහුට පමණක් වන්දනාමාන කිරීම වෙත ඇරයුම් කළහ. උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි:

අල්ලාහ් අදහනු. තවද තාඝූත්(අල්ලාහ්ට විරුද්ධ) පිළිවෙතින් වැළකී සිටිනුයි ප්‍රකාශ කරන රසූල්වරයකු සියලූ ජන සමාජයන් වෙත නියතවශයෙන් අපි යැව්වෙමු. (අල්කුර්ආන්:16:36)

එම ධර්ම දූතයින් තම සමූහයා අතර පහත සඳහන් වාක්‍ය මඟින් තම මෙහෙවර ආරම්භ කළෝය.

මාගේ ජනයිනි, අල්ලාහ්ට ඉබාදත් කරනු. (කීකරු වනු.) නුඹලාට ඔහු හැර වෙනත් දෙවියකු නැත. (අල්කුර්ආන්:7:59)

තවද:

මා හැර වෙනත් දෙවියකු නැත. එහෙයින් මා නමදිනුයි ඔහුට වහී පහළ කොට මිස, නුඹට පෙර කිසිම රසූල්වරයකු නොඑව්වෙමු. (අල්කුර්ආන්:21:25)

මෙම විශ්වාසය තහවුරු කිරීමට හැකි වන්නේ වන්දනාමානය හා වත්පිළිවෙත් යනාදී සියල්ල අල්ලාහ් වෙත පමණක් යොමු කිරීමෙනි. කවරෙකු හෝ ඒවායින් ස්වල්පයක් හෝ අල්ලාහ් හැර අන් කිසිවෙකු වෙත යොමු කරන්නේ නම් ඔහු මුෂ්රික් හෙවත් දේවත්වයෙහි සම කරන්නෙකු හෝ කාෆිර් හෙවත් දේවත්වය ප්‍රතික්ෂේප කරන්නෙකු ලෙස පත් වේ.

**වන්දනාමාන හා වත් පිළිවෙත් විවිධය.**

ඒවා පහත අයුරිනි:

### 1. සිත හා සම්බන්ධ මානසික වත්පිළිවෙත්

ඒ සඳහා වූ නිදසුන් කිහිපයක්:

* අල්ලාහ් කෙරෙහි ආදරය හා ප්‍රේමය.

  ඒ පිළිබඳ උත්තරීතර අල්ලාහ් මෙසේ සඳහන් කරයි:

  අල්ලාහ්ට සමානයන් තබන අය මනුෂ්‍යයන් අතර වෙති. ඔවුහු අල්ලාහ්ට ප්‍රේම කරන්නන් මෙන් ඒවාට ප්‍රේම කරති. තවද විශ්වාස කරන්නන් අල්ලාහ්ට ප්‍රේම කිරීමෙහිලා ඉතා දැඩිය. (අල්කුර්ආන්:02:165)

* බියබැතිකම: උත්තරීතර අල්ලාහ් පාරිශුද්ධ අල්කුර්ආනයේ මෙසේ සඳහන් කරයි:

එබැවින් නුඹලා ඔවුනට බිය නොවනු. නුඹලා (සැබෑ) විශ්වාසවන්තයින් නම් මට බියබැතිමත් වනු. (අල්කුර්ආන්:03:175)

* අල්ලාහ් පිළිබඳ සිතෙහි ඇති වන අපේක්ෂාව හා බලාපොරොත්තුව:

උත්තරීතර අල්ලාහ් පාරිශුද්ධ අල්කුර්ආනයේ මෙසේ සඳහන් කරයි:

මා නුඹලා මෙන් මිනිසකු පමණි. නුඹලාගේ දෙවියා එකම දෙවියකු පමණක් බව මට හෙළි දරව් කරනු ලැබ ඇත. එම නිසා තම රබ්(පරමාධිපති) මුණ ගැසීමට බලාපොරොත්තු වන අය දැහැමි ක්‍රියාවන් කළ යුතුය. තවද තම රබ්(පරමාධිපති) නැමදීමේදී කිසිවකු ආදේශ නොකළ යුතු යැයි (නබි මුහම්මද්) පවසනු. (අල්කුර්ආන්:18:110)

සිත හා සම්බන්ධව ඉහත සඳහන් වූ එම වර්ග තුන යටතේ සියලු මානසික වත්පිළිවෙත් ඇතුළත් වේ. උත්තරීතර අල්ලාහ් මෙසේ සඳහන් කරයි:

ඔවුන් අයැදින අයම, ඔවුන්ගෙන් කවරකු තමන්ගේ රබ්(පරමාධිපති)වෙත ඉතා සමීප විය හැකිදැ?යි විධි සොයති. තවද ඔවුන් ඔහුගේ දයාව අපේක්ෂා කරති. ඔහුගේ දඬුවමටද බිය වෙති. නියතවශයෙන් නුඹගේ රබ්(පරමාධිපති)ගේ දඬුවම බියවිය යුතු දෙයකි. (අල්කුර්ආන්:17:57)

කෙසේ වෙතත්, මෙම වර්ග තුනම මිනිසා තුළ ඒකාබද්ධ විය යුතු අතර එම වර්ග තුනින් එක් වර්ගයක් හෝ ඔහුගෙන් බැහැරව කටයුතු කළ නොහැක. කවරෙකු හෝ බියබැතිකමින් පමණක් අල්ලාහ්ට වන්දනාමාන කළේ නම්, ඔහුට 'හරූරී' යනුවෙන් කියනු ලැබේ. කවරෙකු අපේක්ෂාව හා බලාපොරොත්තුවෙන් පමණක් අල්ලාහ්ට වන්දනාමාන කරන්නේද ඔහුට 'මුර්ජිඋ' යනුවෙන් කියනු ලැබේ. එමෙන්ම කවරෙකු ආදරයෙන් පමණක් අල්ලාහ්ට වන්දනාමාන කරන්නේද ඔහුට 'ᶻසින්දීක්' යනුවෙන් කියනු ලැබේ. කවරෙකු බියබැතිකම, බලාපොරොත්තුව හා ආදරය යන වර්ග තුනින්ම අල්ලාහ්ට වන්දනාමාන කරන්නේද අල්ලාහ්ව ඒකීයට පත් කර ඔහුට පමණක් වන්දනාමාන කරන්නා ඔහු ය.

හෘදයන්හි පරිණතභාවය සමස්ත ශරීරයෙහි පරිණතභාවය සඳහා මුල් වනු ඇත. එක්තරා නබි වදනක මෙසේ සඳහන් වේ:

අහෝ දැනගනු! නියත වශයෙන්ම ශරීරය තුළ එක් මස් කැබැල්ලක් ඇත. එය යහපත් වූයේ නම් මුළු ශරීරයම යහපත් වනු ඇත. එය අයහපත් වූයේ නම් මුළු ශරීරයම අයහපත් වනු ඇත.[6]

6. මූලාශ්‍ර: බුහාරි හදීස් අංක52 / සහීහ් අල් මුස්ලිම් වැකි අංක 1599

## 2.වාචික වත්පිළිවෙත්

ඒ සඳහා නිදසුන් කිහිපයක් පහත දැක්වේ.

* දුආ ප්‍රාර්ථනාව:

  අල්කුර්ආනයේ මෙසේ සඳහන් වේ:

  නියත වශයෙන්ම මස්ජිදයන් සියල්ල අල්ලාහ්ගේ (නැමදුම) වෙනුවෙන්ම ඇත්තේය. එබැවින් (ඒවායෙහි) අල්ලාහ් සමග වෙනත් කිසිවෙකු (නැමදීමට නාමය පවසා) ආරාධනා නොකරනු. (අල්කුර්ආන්:72:18)

* ආරක්ෂාව පැතීම:

  අල්කුර්ආනයේ මෙසේ සඳහන් වේ:

  පවසන්න අරුණෝදයහි රක්ෂිතයාගෙන් මම ආරක්ෂාව පතන්නෙමි. (අල්කුර්ආන්:113:01)

* උදවු උපකාර ඉල්ලා සිටීම:

  ඒ පිළිබඳ උත්තරීතර අල්ලාහ් මෙසේ සඳහන් කරයි:

  තවද නුඹලා නුඹලාගේ රබ්(පරමාධිපති)ගෙන් උදව් පතා ප්‍රාර්ථනා කළ කල්හි පසුපස ලුහුබැන්ද වූ මලක්වරු(සුරදූතයි)න් දහසකින් මම නුඹලාට උදව් කරන්නෙමියි ඔහු(අල්ලාහ්) නුඹලාට පිළිතුරු දුන් බව සිහිපත් කරනු. (අල්කුර්ආන්:08:09)

* විවිධ මෙනෙහි කිරීම්:

  උත්තරීතර අල්ලාහ් මෙසේ සඳහන් කරයි:

  විශ්වාසවන්තයිනි! (විටින් විට) අධික වශයෙන් අල්ලාහ්ව සුවි ශුද්ධ කරනු. (අල්කුර්ආන්:33:41)

* අල්කුර්ආන් පාරායනය:

  උත්තරීතර අල්ලාහ් මෙසේ සඳහන් කරයි:

  (නබිවරය!) වහී මගින් ඔබට දැනුම් දෙන ලද (මෙම) ග්‍රන්ථය ඔබ කියවන්න. (අල්කුර්ආන්:29:45)

* සියළු යහපත් වදන්:

  උත්තරීතර අල්ලාහ් මෙසේ සඳහන් කරයි:

  පිවිතුරු වදන් ආරෝහණය වන්නේ ඔහු (අල්ලාහ්) වෙතය. (අල්කුර්ආන්:35:10)

### 3.කායික වත්පිළිවෙත්

ඒ සඳහා නිදසුන් කිහිපයක් පහත දැක්වේ.

* සලාතය ස්ථාපනය කිරීම හා සත්වයින් කැප කිරීම:

  උත්තරීතර අල්ලාහ් මෙසේ සඳහන් කරයි:

  නියත වශයෙන්ම මාගේ සලාතය(නැමදුම) මාගේ පුද පූජාවන් මාගේ ජීවිතය හා මාගේ මරණය රබ්බුල් ආලමීන් (විශ්වයාධිපති) වූ අල්ලාහ්ටම යැයි (නබි මුහම්මද්) පවසන්න. (අල්කුර්ආන්:6:162)

  තවද අල්ලාහ් මෙසේ පවසයි:

  එබැවින් ඔබගේ රක්ෂිතයාට සලාතය ඉටු කර (පිළිම වෙනුවෙන් සතුන් බිලිදීමේ පාරම්පරික චර්යාවෙන් මිදී අල්ලාහ්ගේ තෘප්තිය බලාපොරොත්තුවෙන් පමණක් ඔහු වෙනුවෙන් සත්වයන්) බිලිදෙන්න. (අල්කුර්ආන්:108:02)

* තවාෆ් කිරීම (කඃබාව වටා සක්මන් කිරීම):

  ඒ පිළිබඳ උත්තරීතර අල්ලාහ් මෙසේ සඳහන් කරයි:

  පසුව පැරණි දේව ගෘහය තවාෆ් (සක්මන්) කරත්වා. (අල්කුර්ආන්:22: 29)

* ගමන් කරන පාදයෙහි තිබෙන හිංසාකාරී දේවල් ඉවත් කිරීම:

  නබි (සල්) තුමාණන් විශ්වාසයේ විශේෂ කරුණු පිළිබඳ විස්තර කිරීමේදී එහි අවම මට්ටම වනුයේ මාර්ගයේ තිබෙන හිංසාකාරී දේවල් ඉවත් කිරීම යනුවෙන් පවසා ඇත.

### 4.මූල්‍යමය වත්පිළිවෙත්

නැමදුමක් සඳහා පිරිනමනු ලබන සියලු ආකාරයේ වියදම් මෙහි ඇතුළත්ය. ඒ සඳහා නිදසුන් පහත දැක්වේ.

* අනිවාර්ය හා ස්වේච්ඡා පුණ්‍යාධාර, වසීයියත් හෙවත් ස්වෙච්ඡා මුදල් පරිත්‍යාග, වක්ෆ් හෙවත් දේව මාර්ගයේ දානය කිරීම හා වෙනත් කරුණු මෙයට අදාල වේ. උත්තරීතර අල්ලාහ් ඒවා පිළිබඳ පාරිශුද්ධ අල්කුර්ආනයේ මෙසේ සඳහන් කරයි:

  ඇත්ත වශයෙන්ම (එකතු කෙරෙන) සදකාත් (නොහොත් සᶻකාත්) අසරණයන්ටත් දිළින්දන්ටත් ඒවා (ᶻසකාත්-එකතු කිරීමට හා බෙදා දීම) සඳහා (පත්කර ඇති) සේවකයන්ටත් ඔවුන්ගේ සිත් (සත්‍යය කරා) එකඟ කරගනු ලබන අයටත් වහලුන්(මුදවා ගැනීම)ටත් ණයකරුවන්ට(උපකාර කිරීමට)ත් අල්ලාහ්ගේ මාර්ගය වෙනුවෙන් සහ මගීන්(සඳහා ආගන්තුක සත්කාර කිරීම)ටත් පමණක් අයත් වේ. (මෙය) අල්ලාහ්ගෙන් (නිර්ණය) වූ අනිවාර්ය(යුතුකම)කි. නියත

වශයෙන්ම අල්ලාහ් සර්වඥානීය, සර්ව ප්‍රාඥයය. (අල්කුර්ආන්:09: 60)

තවද මෙසේ සඳහන් කරයි:

එහෙත් මෙම ගැමි අරාබිවරුන් අතර අල්ලාහ් සහ අවසාන දිනය ගැන විශ්වාස කරන්නාවූද ඔවුන් (අල්ලාහ්ගේ මාර්ගයේ) වියදම් කරන දෑ අල්ලාහ්ට වඩාත් සමීප වීම සඳහාද රසූල්වරයාගේ ආශිර්වාදය ලැබීම සඳහාද එක් උපාය මාර්ගයක් බව පිළිගන්නා පිරිසක්ද සිටිති. සැබැවින්ම මෙය ඔවුන් (අල්ලාහ්ට වඩාත්) සමීප කරවන උපාය මාර්ගයකි. අල්ලාහ් තම ආශිර්වාදයට ඔවුන් ඇතුළත් කරනු ඇත. නියත වශයෙන්ම අල්ලාහ් ක්ෂමාශීලී හා අසීමිත කරුණාන්විත වේ. (අල්කුර්ආන්:09: 99)

* ආහර සැපයීම:

උත්තරීතර අල්ලාහ් මෙසේ සඳහන් කරයි:

අල්ලාහ් කෙරෙහි වූ ආදරයේ හේතුවෙන් දුප්පතුන්ටද, අනාථයින්ටද, සිර ගතවූ අයටද, ආහාර ලබා දෙමින්ම සිටියහ. (දානමාන ලබා ගන්නා අයට) “අපි ඔබට අහාර ලබා දෙන්නේ, අල්ලාහ්ගේ මුහුණ උදෙසාම මිස, ඔබ වෙතින් අපි කිසිම කුලියක් හෝ නැතහොත් (ඔබ අපට) කෘතඥ වීම හෝ අදහස් කළේ නැත” (යැයිද) ඔවුන් පවසති. (අල්කුර්ආන්:76: 08)

සර්ව බලධාරී අල්ලාහ්ගේ දේවත්වය විශ්වාස කිරීම යනු ඔහුගේ පරමාධිපත්‍යය හා එයට අදාල කරුණු සියල්ල විශ්වාස කිරීම අනිවාර්ය කරන්නකි. කවරෙකු හෝ අල්ලාහ් ඔහු නිර්මාපකයා බව හා ඔහු සකළ ලෝහි අධිපති හා අධීක්ෂණය කරන්නා බව ස්ථිර ලෙස තහවුරු කරන්නේ නම්, ඔහුට අල්ලාහ්ගේ දේවතවය පිළිගැනීමටත් නැමදුමෙන් ඔහුව ඒකීයභාවයට පත් කිරීමටත් සිදු වේ. මෙම පිළිගැනීම විෂයෙහි පාරිශුද්ධ අල්කුර්ආනයේ නොයෙකුත් ස්ථානයන්හි උත්තරීතර අල්ලාහ් ආදේශ කරුවන්ට එරෙහිව සාධක ගෙන හැර දක්වයි. එයට අදාල අල්කුර්ආන් වැකි පහත සඳහන් වේ:

1. මිනිසුනි, නුඹලාද නුඹලාට පෙර සිටියවුන්ද මැවූ නුඹලාගේ රබ් (පරමාධිපති) වෙත අවනත වනු. මෙලෙසිනි, නුඹලාට ආරක්ෂාව ලබාගත හැක්කේ. නුඹලාට මහපොළොව යහනාවක් හා අහස වියනක් කර තවද අහසින් වැසි වස්වා එමගින් නුඹලාගේ පෝෂණය සඳහා ඵල වර්ග හට ගැන්වූයේ ද ඔහුමය. එබැවින් (මේ සියල්ල) නුඹලා පැහැදිලිව දැන සිටියදීත් අල්ලාහ්ට (කිසිසේත්) ආදේශයන් නොතබනු. (අල්කුර්ආන්:02: 21/22)

2. (නබි තුමණි!) ඔබ (ඔවුන්ට) “අහස්වලින්ද, භූමියෙන්ද ඔබට ආහාර ලබා දෙන්නේ කවරෙක්ද? (ඔබගේ) සවණටද, බැල්මටද අයිතිකරුවා කවරෙක්ද? පණ නැති දැයෙන් පණ ඇති දැයද, පණ ඇති දැයෙන් පණ නැති දැයද ඉකුත්

කරන්නේ කවරෙක්ද? (ලොවෙහි) සියලුම කාරණාවන්ද සැලසුම් කර ක්‍රියාත්මක කරන්නේ කවරෙක්ද?''යි විමසනු මැනව! එයට ඔවුන් "අල්ලාහ්" යයි පවසනු ඇත. එසේ නම්, "(ඔහුට) ඔබ බිය විය යුතු නොවේද?''යි විමසනු. ඇත්තෙන්ම ඔහුම ඔබව උත්පාදනය කර, පෝෂණය කරන අල්ලාහ්ය! මෙම සත්‍යයෙන් පසුව, (ඔබ ඔහුට යටහත් පහත් නොවී සිටීම) දුර්මාර්ගය මිස, වෙන කිසිවක් නැත. (මෙම සත්‍යයෙන්) ඔබ කොහේට නම්, හැරෙනු ලබන්නෙහුද?" (යැයිද නබියවරය! ඔබ විමසනු. ) (අල්කුර්ආන්:10: 31/32)

3. සියලු ප්‍රශංසා අල්ලාහ්ටය. ඔහු තෝරා ගත් ඔහුගේ ගැත්තන් කෙරෙහි ශාන්තිය අත්වේවා! ශ්‍රේෂ්ට වනුයේ අල්ලාහ්ද එසේ නැතිනම් ඔවුන් ආදේශ කරන දෑ ද යැයි (නබිවරය!) ඔබ අසනු. (තවද) අහස්ද, භූමියද උත්පාදනය කර, වලාකුළෙන් ඔබ වෙනුවෙන් වැස්ස වසින්නට සලස්වන්නා කවරෙක්ද? අපිම එමගින් (ඇස් පිනා යාම පිණිස) අලංකාරවත් වතුද වැවෙන්නට සලස්වන්නෙමු. අපගේ (උදව්වෙන් තොර) එහි තිබෙණ ගස් වැවෙන්නට සැලැස්වීමට ඔබට නොහැකිය. එබැවින් අල්ලාහ් සමග නැමදුමට යුතු (වෙන කෙනෙකු) සිටින්නේද? නැත. (මෙසේ තිබියදී) මොවුන් (තමන්ගේ මනඃකල්පිත දෙවිවරුන්ව දෙවියන්ට) සම කරන ජනතාවක් වශයෙන් සිටින්නාහ. භූමිය ස්ථිර වූ වාසස්ථානයක් වශයෙන් නිර්මාණය කර එහි මධ්‍යයෙහි ගංගාවන්ද, ඒ සඳහා ස්ථිර වූ කඳු ද නිර්මාණය කළේ කවරෙක්ද? මුහුදු දෙකක් අතරේ බාධකයක් ඇති කළේ කවරෙක්ද? (මේවා කළ) අල්ලාහ් සමග නැමදුමට යුත්තෙකු (වෙන කෙනෙකු) සිටින්නේද? (ඇත්තෙන්ම) නැත. ඔවුන්ගෙන් වැඩි දෙනෙකු (මෙයද) නොදැනුවත් අය වශයෙන්ම සිටින්නාහ. (විපතක පැටළී) දඟලමින් සිටින අය (ආරක්ෂාව පතා) ආරාධනා කළහොත් (ඔවුන්ට) පිළිතුරු දී, ඔවුන්ගේ අමාරුකම් පහ කරන්නේ කවරෙක්ද? භූමියෙහි ඔබව (තමන්ගේ) නියෝජිතයින් වශයෙන් පත් කළේ කවරෙක්ද? (මෙවැනි) අල්ලාහ් සමග නැමදුමට යුතු (වෙන කෙනෙකු) සිටින්නේද? (ඇත්තේම නැත). ඔබ (මේ ගැන) සිතන්නේ ඉතාමත් අල්පයකි. මුහුදෙහි හෝ ගොඩ බිමෙහි හෝ අන්ධකාරයෙහි හෝ ඔබට මාර්ගය පෙන්වන්නේ කවරෙක්ද? ඔහුගේ වරප්‍රසාදයන්ට පෙර (සිසිල්) සුළඟ ශුභාරංචියක් වශයෙන් යවන්නා කවරෙක්ද? අල්ලාහ් සමග නැමදුමට යුතු (වෙන කෙනෙකු) සිටින්නේද? (ඇත්තේම නැත). ඔවුන් සමානයන් තැබීමෙන් අල්ලාහ් ඉතාමත් උසස්වන්තයෙකි. ආරම්භයේදී (කිසිම නිදසුනක් නොමැතිවම) නිර්මාණයන් උත්පාදනය කළේ කවරෙක්ද? (එසේම නැවත) නැවතත් උත්පාදනය කරමින් සිටින්නේ කවරෙක්ද? වලාකුළෙන් (වැස්ස පහළ කර) භූමියෙහි (ධාන්‍ය ආදිය වැඩීමට සලස්වා) ඔබට ආහාර ලබා දෙන්නේ කවරෙක්ද? අල්ලාහ් සමග නැමදුමට යුතු (වෙන කෙනෙකු) සිටින්නේද? "ඔබ සත්‍ය පවසන්නන් වශයෙන් සිටින්නෙහු නම්, (මෙයට) ඔබගේ සාධකයන් ගෙන එනු" යයි (නබිවරය) ඔබ පවසනු. (අල්කුර්ආන්:27: 59-64)

මෙහිදී ඔවුන් අල්ලාහ්ගේ පරමාධිපත්‍යය පිළිගත් හේතුවෙන් ඔහුගේ දේවත්වයද

පිළිගත යුතු බවට උත්තරීතර අල්ලාහ් සාධක ගෙන හැර දක්වා ඇත.

එමෙන්ම, දේව ආදේශකයන්ගේ පිළිමයන් පරමාධිපත්‍යයෙහි කිසිදු සංඛේතයක් හෝ නොඋසුලන හෙයින් දේවත්වයට ඒවා සුදුසු නොවන බව පවසා එම ක්‍රමවේදය නිෂ්ප්‍රභා කර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි:

1. කිසිම දෙයක් නොමවනද, තමන් පවා මවනු ලැබූවන් වන දෑ ඔවුහු (අල්ලාහ්ට) සමානයන් ලෙස ආදේශ කරන්නේද? තවද (එම සමානයන් තමන්ට ආදේශ කරන්නා වූ) ඔවුනට කිසිදු උපකාරයක් කළ නොහැකිය. තවද ඔවුනට තමන්ටද උපකාරයක් කළ නොහැකිය. නුඹලා ඔවුන් නිවැරදි මාර්ගය කරා (කැඳවූවත්) ආරාධනය කළත් ඔවුහු නුඹලා අනුගමනය නොකරති. නුඹලා ඔවුන් (කැඳවූවත්) ආරාධනය කළත් නිහඬව සිටියත් නුඹලාට (ලැබෙන ප්‍රතිඵලය) සමානය. අල්ලාහ් හැර නුඹලා (කැඳවන) ප්‍රාර්ථනා කරන අය නියතවශයෙන්ම නුඹලා වැනි ගැත්තෝය. එමනිසා නුඹලා ඔවුන්(කැඳවන්නන්)ට ප්‍රාර්ථනා කර බලනු. නුඹලා (ඔවුන් පිළිබඳ තබා ඇති විශ්වාසය) සත්‍යය නම් ඔවුන් නුඹලා(ගේ ප්‍රාර්ථනාවන්)ට පිළිතුරු දෙනු ඇත. ඔවුනට එමගින් ඇවිදීමට පාද තිබේද? නැතහොත් ඔවුනට එමගින් ඇල්ලීමට අත් තිබේද? නැතහොත් ඔවුනට එමගින් බැලීමට ඇස් තිබේද? නැතහොත් ඔවුනට එමගින් ශ්‍රවණය කිරීමට කන් තිබේද? නුඹලා (අල්ලාහ්ට සමාන කළ) නුඹලාගේ හවුල්කරුවන් කැඳවනු. පසුව නුඹලා මට විරුද්ධව කුමන්ත්‍රණය කරනු. මට කිසිම අවකාශයක් නොදෙනුයි (නබි මුහම්මද්) පවසනු. නියතවශයෙන්ම මාගේ ආරක්ෂකයා මෙම ධර්ම ග්‍රන්ථය පහළ කළ අල්ලාහ්ම වේ. තවද යහපත් දැහැමියන් ආරක්ෂා කරන්නේ ඔහුමය. නුඹලා ඔහු(අල්ලාහ්) හැර (කැඳවන) ප්‍රාර්ථනා කරන අයට නුඹලාට උපකාර කිරීමට නුපුළුවන. තවද ඔවුනට තමන්ටද කිසිදු උපකාරයක් කර ගත නොහැකිය. (එපමණක් නොවේ.) නුඹ ඔවුන් යහමඟට කැඳවූවත් ඔවුහු එය ශ්‍රවණය නොකරති. ඔවුන් නුඹ දෙස බලා සිටිතැයි නුඹ සිතුවත් නියතවශයෙන්ම ඔවුහු කිසිවක් නොදකිති. (අල්කුර්ආන්:07: 191-198)

2. නමුත් ඔවුහු ඔහු(අල්ලාහ්) හැර වෙනත් දෙවියන් ගත්හ. ඔවුහු(ඒ දෙවිවරු) කිසිවක් නිර්මාණය කළ නොහැක්කෝය. ඔවුහු නිර්මාණය කරන ලද්දෝය. තමන්ට විපතක් හෝ සැපතක් කරගන්නටද නොහැක්කෝය. මරණය හෝ ජීවිය දෙන්නටද මළවුන් කෙරෙන් නැගිටුවන්නටද නොහැක්කෝය. (අල්කුර්ආන්:25: 03)

3. (නබි තුමණි!) ඔබ මෙසේ පවසනු: “අල්ලාහ් හැර, කුමක් ඔබ (දෙවිවරුන් යයි) අදහස් කරමින් සිටියේද, ඒවා ඔබ ආරාධනා කර බලනු. අහස්හි හෝ භූමියෙහි හෝ ඒවාට එක් අනු ප්‍රමාණයකට හෝ බලයක් නැත. තවද ඒ දෙකෙන් (කිසිවක්) හෝ (ඒවා උත්පාදනය කිරීමෙහි) මේවාට කිසිම හවුලක් නැත. (මෙහි) ඔහුට උදව්කරුවන්ද ඔවුන්ගෙන් කිසිවෙකුත් නැත. ඔහුගේ අනුමැතිය ලබා ගත් අය හැර, (අන් කිසිම මලායිකාවරයෙකුට හෝ) ඔහු වෙත මැදිහත් වී කතා කිරීමෙහි

ප්‍රයෝජනයක් අත් වන්නේ නැත. (අල්ලාහ්ගේ යම් කිසි නියෝගයක් නික්මෙන විට, ඔවුන් බිය වී වෙව්ලන්නාහ). ඔවුන්ගේ හෘදයන්හි තිබී වෙව්ලීම පහ වී ගිය වහාම (ඔවුන්ගෙන් කෙනෙකු අනිත් අයට) "ඔබගේ දෙවියන් කුමන නියෝගයක් නිකුත් කළේද?" යි විමසන්නාහ. එයට අනිත් අය "(නිකුත් කළ යුතු) සත්‍යය (වූ නියෝගයන්)ම නිකුත් කළේය. ඔහු නම්, ඉතාමත් උසස්වන්තයෙකු හා ඉතාමත් විශාලවන්තයෙකුද වන්නේය" යයි පවසන්නාහ. (අල්කුර්ආන්:34: 23)

මෙම කාරණාවන් හේතු කොට ගෙන අල්ලාහ්ව වන්දනාමාන කිරීම විෂයෙහි ෂිර්ක් හෙවත් ආදේශ කිරීම හා සම කිරීම යනු:

* ඉමහත් වූ අපරාධයකි:

  ඒ පිළිබඳ අල්ලාහ් මෙසේ පවසයි:

  (මන්දයත්) නියත වශයෙන්ම සමානයන් තැබීම ඉමහත් වූ අපරාධයකි" (අල්කුර්ආන්:31: 13)

  එය සකළ ලෝහි අධිපතියාණන්ගේ තත්ත්වය පහකරන ක්‍රියාවක් හා හුදෙක් ඔහුට පමණක් අයිති දෑ අන් අයට ලබා දීමකි. එමෙන්ම අන් අයව ඔහුට සමාන කිරීමකි. ඒ බව උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි.

  එසේ නමුත් ප්‍රතික්ෂේප කළ අය ඔවුන්ගේ රබ්(පරමාධිපති)ට සමානයන් තබන්නෝය. (අල්කුර්ආන්:06: 01)

* තවද ආදේශ කිරීම යනු ඉමහත් පාපයන් අතුරින් විශාලම පාපය වේ.

  නබි (සල්) තුමාණන් 'අහෝ ජනයිනි, මා ඔබට පාපයන් අතුරින් ඉමහත් පාපය කුමක්ද? යන්න දන්වන්නදැ?'යි විමසා සිටියේය. එවිට එහි සිටි මිත්‍රවරුන් 'පවසා සිටිනු' යනුවෙන් ප්‍රකාශ කළ පසු නබි (සල්) තුමාණන් 'අල්ලාහ්ට ආදේශ කිරීම' යනුවෙන් පිළිතුරු දුන්හ. [7]

* එය මහා අකුසලකි.

  වරක් අල්ලාහ් අබියස බරපතල අකුසල කුමක්ද? යනුවෙන් නබි (සල්) තුමාණන්ගෙන් විමසන ලදී. එවිට නබි (සල්) තුමාණන් 'අල්ලාහ් නුඹව මවා සිටියදීත් ඔහුට සමානයන් උපකල්පනය කිරීම වේ.' යනුවෙන් ප්‍රකාශ කර සිටියහ. [8]

* ආදේශ කිරීම යනු මානව ස්වභාධර්මය විකෘති කිරීමක් හා නොමගෙහි ගැඹුරටම ඇද වැටීමකි.

7. මූලාශ්‍රය: බුහාරි හදීස් අංක 2654/ මුස්ලිම් හදීස් අංක 87
8. මූලාශ්‍රය: බුහාරි හදීස් අංක 4477/ මුස්ලිම් හදීස් අංක 86

උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි:

අල්ලාහ්ට ආදේශ කරන්නා අහසින් වැටුණෙක් මෙන්ය. එවිට පක්ෂීහු ඔහු ඩැහැගෙන යති. නැතහොත් සුළඟ දුර තැනකට ඔහු උසුලාගෙන යෑමෙන් (ඔහු කැබිලි බවට පත්වන්නේය. ) (අල්කුර්ආන්:22: 31)

ආදේශ කිරීම යනු මෙතරම් බරපතළ පාපයක් හෙයින් අල්ලාහ් ඒ සඳහා මෙලෝ ජීවිතයට සහ මතු ලොව ජීවිතයට අදාල වන අන්දමින් තීන්දු තීරණ කිහිපයක් ලබාදී ඇත. ඒවා පහත සඳහන් වේ:

1. ඒ සඳහා සමාව නොදීම:

   උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි:

   නියත වශයෙන්ම අල්ලාහ් ඔහුට කිසිවක් ආදේශ කිරීම (ෂිර්ක්) ක්ෂමා නොකරන්නේය. ඔහුට අභිමත වූ අයට (ෂිර්ක් හැර) අන් දෙය ක්ෂමා කරන්නේය. අල්ලාහ්ට ආදේශ කරන්නන් කවරෙක් වුවද ඔහු සැබැවින්ම මහ පාපයක් ගොතා ඉතා බරපතලම පාපය කරන්නා වෙයි. (අල්කුර්ආන්:4: 48)

2. ස්වර්ගය තහනම් වී අපාය සදාකාලික වීම

   අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි:

   නියත වශයෙන්ම කවරකු අල්ලාහ්ට ආදේශයක් තබන්නේද අල්ලාහ් ඔහුට ජන්නාහ්ව (ස්වර්ගය) තහනම් කළේය. ඔහුගේ නිවහන අපාය වේ. (මෙවැනි) පව්කාරයන්ට පිහිට වන්නන් කිසිවකු නැත. (අල්කුර්ආන්:5:72)

3. සියළු යහ ක්‍රියාවන් විනාශ වී යාම.

   අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි:

   (නබි තුමණි,) ඔබට, පෙර සිටි සෑම (දූත)යෙකුටම ඇත්තෙන්ම වහී මගින් දැනුම් දෙනු ලැබූ දැය කුමක්දයත් ඔබ සමානයන් තැබුවහොත්, ඔබගේ පින් (සියල්ල) විනාශ වී, නියත වශයෙන්ම ඔබ පරාජිතයින්ගෙන් වූ අය බවට පත් වන්නෙහුය" (යන්න වේ). (අල්කුර්ආන්:39:65)

4. දේපළ හා ප්‍රාණ අයිතියේ වටිනාකම පහවීම.

   අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි:

   (සටන් කිරීම) තහනම් මාස අවසන් වූවාට පසුව නුඹලා ඔවුන් (මුෂ්රික්වරුන්) දුටු තැන ඔවුන් මරා දමනු. තවද ඔවුන් අත් අඩංගුවට ගනු. ඔවුන් වටලනු. තවද ඔවුන් සැඟවී සිටින සෑම තැනකින්ම ඔවුන් හසුකර ගැනීමට ර"ක සිටිනු. නමුත් ඔවුන් පසුතැවිලිවී සලාත් ඉටුකර ᶻසකාත් ගෙවනවා නම් ඔවුනට ඔවුන්ගේ මාර්ගයහි ඉඩ හරිනු. නියත වශයෙන්ම අල්ලාහ් ක්ෂමාශීලී සහ අසීමිත කරුණාන්විතය. (අල්කුර්ආන්:09:05)

නබි (සල්) තුමාණන් මෙසේ වදාළහ:

මිනිසුන් නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර අන් කිසිවෙකු නොමැත යනුවෙන් පවසන තෙක් අරගල කරන මෙන් මා හට අණ කර තිබේ. කවරෙකු එය පවසන්නේද ඔහුගේ ධනය හා ඔහුගේ ප්‍රාණය මාගෙන් ඔහු ආරක්ෂා කර ගත්තේය. ඔහුගේ විනිශ්චය අල්ලාහ් සතුය.[9]

දෙවියන් අල්ලාහ්ව පමණක් වන්දනාමාන කිරීමෙන් මිනිසුන් අතුරින් විවිධ පිරිස් ඉවතට ගොස් ඇත.

ඔවුන් පිළිබඳ පහත සඳහන් වේ:

1. පිළිම වන්දනා කරුවන්.

   ෂෙයිතාන් විසින් වන්දනාමානය කිරීමට පොළඹවන ලද ගස්, ගල්, මිනිසුන්, ජින්වරුන්, සුර දූතයින්, ග්‍රහලෝක හා සත්වයින් වැනි නැමදුමට ලක්වන විවධ දෑ වන්දනා කරන අයවලුන්.

2. සොහොන් ගැබ් වන්දනා කරුවන්.

   මරණයට පත් වී සොහොන් තුළ භූමිදානය කරන ලද මළවුනට ආරාධනා කර, ඔවුන් සඳහා බිලි පූජා සිදු කර ප්‍රථිලාභ ලබා දීමේ හා හානියකින් වැළක්වීමේ හැකියාව ඔවුනට තිබෙන බව විශ්වාස කරන උදවිත්.

3. යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් කරන්නන් හා ජ්‍යොතිෂ  කරුවන්.

   එවැනි පුද්ගලයින් ජින්වරුන් ඔවුනට පවසන දෑ සඳහාත්, ඔවුන් ඔවුනට ගෙනවිත් දෙන දෑ සඳහාත් ඔවුන් වෙනුවෙන් කරනු ලබන දෑ සඳහාත් එම ජින්වරුන්ට වන්දනාමාන කරති.

වන්දනාව තුළ ඇති වන ෂිර්ක් හෙවත් ආදේශ කිරීමෙහි බරපතලකම හේතුවෙන් නබි (සල්) තුමාණන් ඒ වෙත තුඩු දෙන කරුණු පිළිබඳ අනතුරු අඟවා ඇති අතර එයට තුඩු දෙන මාර්ග සියල්ල වසා දමා ඇත. ඒ පිළිබඳ නිදසුන් කිහිපයක් පහත සඳහන් වේ:

1. යහපත් දැහැමි පුද්ගලයින් විෂයෙහි සීමාව ඉක්මවා කටයුතු කිරීම පිළිබඳ අවවාදය.

නබි (සල්) තුමාණන් මෙසේ ප්‍රකාශ කළේය:සීමාව ඉක්මවා කටයුතු කිරීමෙන් වැළකී සිටින්න. ඔබලාට පෙර සිටි උදවිය විනාශ වූයේ ධර්මයෙහි සීමාව ඉක්මවා කටයුතු කිරීම හේතුවෙනි.[10]

9. මූලාශ්‍රය:බුහාරි හදීස් අංක 1399/ මුස්ලිම් හදීස් අංක 20 අබූ හුරෙයිරා (රළි) තුමාගේ වාර්තාව යටතේ මෙය වාර්තා වේ. තවද බුහාරි හදීස් අංක 25/ මුස්ලිම් හදීස් අංක 22 ඉබ්නු උමර් (රළි) තුමාගේ වාර්තාව යටතේ වාර්තා වේ.

10. මූලාශ්‍රය: අහ්මද් හදීස් අංක 1851 හා 3248/ නසාඊ හදීස් අංක 3059/ඉබ්නු මාජාහ් හදීස් අංක 3029

තවද නබි (සල්) තුමාණන් මෙසේ ප්‍රකාශ කළේය: මර්යම්ගේ පුත් විෂයෙහි කිතුනුවන් සීමාව ඉක්මවා කටයුතු කළ මෙන් මා විෂයෙහිද කටයුතු නොකරනු. නියත වශයෙන්ම මා අල්ලාහ්ගේ එක් වහලෙකි. එබැවින් අල්ලාහ්ගේ වහලෙකු හා ඔහුගේ දූතයෙකු යැයි පවසන්න.[11]

යහපත් දැහැමි පුද්ගලයින් විෂයෙහි සීමාව ඉක්මවා කටයුතු කිරීම යන විෂයෙහි ඔවුන්ව මැදිහත්කරුවන් ලෙස ගැනීමද අඩංගු වේ.

මැදිහත්කරුවන් ලෙස ගැනීම යන සංකල්පය විවධ ආකාරයන්ගෙන් සමන්විතයි.

* පළවෙනි ආකාරය:

  දහමෙන් බැහැර කරවන දේව ආදේශ මැදිහත්වීම: එනම් තම අවශ්‍යතාවන් ඉටු කර දෙන මෙන් හා දුක්කරදර තමන්ගෙන් දුරු කර දෙන මෙන් අල්ලාහ් නොවන වෙනත් දෙයක් හරහා ඉල්ලා සිටීම මෙයට එක් උදාහරණයකි.

* දෙවැනි ආකාරය:

  නූතන ආකාරයේ මැදිහත්වීම. මෙයද එක් බරපතල වරදක් වන නමුත් දෙවියන්ට ආදේශ කිරීම යන සංකල්පයට ළඟා නොවන්නකි. එනම්, අල්ලාහ් ආගමානුගත කර නොමැති දෙයින් මැදිහත්වීමක් සිදු කිරීමයි. භක්තිවන්ත ජනයා හරහා හෝ ඔවුන්ගේ තත්ත්වයන්, අයිතිවාසිකම්, ශුද්ධත්වය ආදි කරුණු හරහා දෙවියන්ට ආයාචනා කරන අය වැනිය.

* තුන්වන ආකාරය: අනුමැතිය ලත් මැදිහත් වීම.

  එනම්, අල්ලාහ්ව විශ්වාස කිරීම, ඔහුට අවනත වීම, ඔහුගේ අලංකාර නාමයන් අතුරින් එක් නාමයක් මගින් හෝ ඔහුගේ ගුණාංග අතුරින් එක් ගුණාංගයක් මගින් හෝ දුආ ප්‍රාර්ථනා කිරීම හරහා හෝ තමන් සිදු කළ කුසලක් හරහා හෝ පොදු විෂයන්හි භක්තිවන්ත අයෙකුගෙන් දුආ ප්‍රාර්ථනා කරන මෙන් ඉල්ලා සිටීම හරහා මැදිහත්වීමක් සිදු කිරීම වේ.

  අහෝ දෙවියනි! අප නබි (සල්) තුමාණන් හරහා ඔබගෙන් වර්ෂාව පතා සිටියෙමු. දැන් අප ඔහුගේ මහප්පා වන අබ්බාස් (රළි) තුමා හරහා ඔබගෙන් වර්ෂාව පතා සිටින්නෙමු යන උමර් (රළි) තුමාගේ වදන වනාහි අබ්බාස් (රළි) තුමාණන් නබි (සල්) තුමාණන්ගේ ඥාතියෙකු හෙයින් ඔහුගේ ප්‍රාර්ථනාව මගින් කරනු ලබන එක් මැදිහත් වීමක් මිස ඔහු හරහා කරනු ලබන මැදිහත් වීමක් නොවේ. යම් යම් පුද්ගලයින් හරහා මැදිහත් වීම් සිදු කිරීම යනු ඉස්ලාමය තුළ අනුමැතිය ලත් ක්‍රියාවක් නම්, නබි (සල්) තුමාණන්ගේ අභාවයට පසුවද ඔහුගේ මිත්‍රයින් ඔහු හරහා මැදිහත්වීම් කරන්නට තිබුණි.

11. මූලාශ්‍රය: බුහාරි හදීස් අංක 3445

2. සොහොන් ගැබ් පිළිබඳ අනතුරු ඇඟවීම:

එහි ස්වරූප කිහිපයක් පහත දැක්වේ.

* එම සොහොන් ගැබ් මස්ජිදයන් ලෙස අර ගැනීම:

ආඉෂා (රළි) තුමිය මෙසේ ප්‍රකාශ කරයි: නබි (සල්) තුමාණන් අසනීප තත්වය නිසා ඔහු තම මුහුණට රෙදි කැබැල්ලක් තබමින් සිටියේය. හුස්ම ගැනීමේ අපහසුතාවය ඔහුට දැනුනු විට ඔහු එය ඉවත් කර මෙසේ පැසුවේය: යුදෙව්වන්ට හා කිතුනුවන්ට අල්ලාහ්ගේ ශාපය අත් වේවා! ඔවුන් ඔවුන්ගේ ධර්ම දූතවරුන්ගේ සොහොන් ගැබ් මස්ජිදයන් ලෙස අර ගත්තෝය. [12]

තවද නබි (සල්) තුමාණන් මෙසේ ප්‍රකාශ කළහ.

අහෝ දැනගනු. ඔබලාට පෙර සිටි ජනයින් ඔවුන්ගේ ධර්ම දූතවරුන්ගේ හා දැහැමි උදවියගේ සොහොන් ගැබ් මස්ජිදයන් ලෙස අර ගත්හ. අහෝ දැනගනු. මාගේ සොහොන මස්ජිදයක් ලෙස අර නොගනු. මා එයින් ඔබලා වළක්වමි.[13]

මස්ජිදයක් ලෙස අර ගැනීම යන්නෙන් අදහස් කරනු ලබන්නේ සොහොනක් ළඟ එහි මස්ජිදයක් නොතිබුණද යම් සලාතයක් ඉටු කිරීමයි. මන්දයත් මස්ජියදය යනු සුජූද් කරන ස්ථානය වේ.

* යම් සොහොනක් ඉදි කිරීම හා එහි තිබෙන වැලි වලට වඩා වෙනත් යමක් වැඩි කිරීම හෝ එය කපරාරු කිරීම.

අබුල් හයියාජ් (රහ්) තුමා මෙසේ ප්‍රකාශ කරයි: අලි ඉබ්නු අබී තාලිබ් (රළි) තුමා මා හට මෙසේ ප්‍රකාශ කළහ: නබි (සල්) තුමාණන් විසින් මා කුමන කාර්යයක් සඳහා එවනු ලැබුවේද එම කාර්යය සඳහාම මා ඔබ එවන්නෙමි. එම කාර්ය නම් ඔබ දකින ප්‍රතිමාවන් සියල්ල බිඳ දමන්න. තවද ඉහළට ගොඩ නැඟී ඇති සොහොන් ගැබ් සියල්ල පොළවත් සමඟ සමතලා කර දමන්න.[14]

ජාබිර් (රළි) තුමාණන් මෙසේ වාර්තා කරයි:

සොහොන් ගැබ් කපරාරු කිරීම, ඒ මත අසුන් ගැනීම හා ඒ මත ඉදි කිරීම යන විෂයන් නබි (සල්) තුමාණන් තහනම් කොට ඇත.[15]

මෙම තහනම් නියෝගය තුළ සොහොන් ගැබ් මත ගෝලාකාර හැඩැති ඉදි කිරීමක් තනා එය යම් ආකාරයකින් හෝ අලංකාර කිරීමද ඇතුළත් වේ.

12. මූලාශ්‍රය: බුහාරි හදීස් අංක 435/ 436/ 1390 - මුස්ලිම් හදීස් අංක 529/ 531
13. මූලාශ්‍රය:මුස්ලිම් හදීස් අංක 532
14. මූලාශ්‍රය: මුස්ලිම් හදීස් අංක 969
15. මූලාශ්‍රය: මුස්ලිම් හදීස් අංක 970

* සොහොන් ගැබ් බැහ දැකීම පිණිස ඒ වෙත සංචාරය කිරීම.

මන්දයත් පහත සඳහන් නබි (සල්) තුමාණන්ගේ පොදු කියමන එසේ සංචාරය කිරීම වළක්වයි:

මස්ජිදයන් තුනක් වෙත පමණක් සංචාරය කළ හැක. ඒවා නම්: පූජනීය මස්ජිදය වන මක්කාවෙහි පිහිටි කඃබතුල්ලාහ් දේවස්ථානය, මෙම මාගේ මස්ජිදය වන මදීනාවෙහි පිහිටි දේවස්ථානය හා අල් අක්සා දේවස්ථානය.[16] යනුවෙන් නබි (සල්) තුමාණන් ප්‍රකාශ කළහ.

* නබි (සල්) තුමාණන්ගේ සොහොන් ගැබ සැමරුමක් කර ගැනීම.

එනම් එය නිතර නිතර නිරීක්ෂණය කිරිමට පැමිණීම. නබි (සල්) තුමාණන් මෙසේ ප්‍රකාශ කළේය: මාගේ සොහොන් ගැබ සැමරුමක් බවට පත් කර නොගනු.[17]

3. ග්‍රන්ථ පහළ කරනු ලැබූවන්ගේ හා අදේශ කරුවන්ගේ විශ්වාසයන්, වත්පිළිවෙත් හා සිරිත් විරිත් වලට සමාන වීම පිළිබඳ අනතුරු ඇඟවීම.

නබි (සල්) තුමාණන් මෙසේ ප්‍රකාශ කොට ඇත: ඔබලා මුෂ්රික් වරුන් හෙවත් දෙවියන්ට සමානයන් උපකල්පනය කරන්නන්ගෙන් වෙනස්ව කටයුතු කරනු.[18]

තවද මෙසේ ප්‍රකාශ කොට ඇත:

ඔබලා ගින්නට නමදින්නන්ගෙන් වෙනස්ව කටයුතු කරනු.[19]

තවද මෙසේ පවසා ඇත:

ඔබලා යුදෙව්වන්ගෙන් වෙනස්ව කටයුතු කරන්න.[20]

4. රූප පිළිබඳ අනතුරු ඇඟවීම:

ආඉෂා (රළි) තුමිය මෙසේ ප්‍රකාශ කරයි: තමන් හබෂාවෙහි(ඉතියෝපියාවෙහි) එක් දේවස්ථානයක් හා එහි තිබෙන ඡායාරූප ස්වල්පයක් දැක ඇති බව උම්මු සලමාහ් (රළි) තුමිය නබි (සල්) තුමාණන් හට ප්‍රකාශ කළාය. එවිට ඔවුන් එක් ජනසමූහයකි. ඔවුන් අතුරින් යම් දැහැමි පුද්ගලයෙකු මිය ගියේ නම්, ඔහුගේ සොහොන මත දේවස්ථානයක් ඉදි කර එවැනි හැඩැති රූප එහි තබන්නෝ වෙති. ඔවුන් අල්ලාහ්ගේ මැවීම් අතුරින් වඩා නරක මැවීමකි යනුවෙන් නබි (සල්) තුමාණන් වදාළහ.[21]

16. මූලාශ්‍රය: බුහාරි හදීස් අංක 1189/ මුස්ලිම් හදීස් අංක 1397
17. මූලාශ්‍රය: අබූ දාවූද් හදීස් අංක 2042
18. මූලාශ්‍රය: බුහාරි හදීස් අංක 5792/ මුස්ලිම් හදීස් අංක 259
19. මූලාශ්‍රය: මුස්ලිම් හදීස් අංක 260
20. මූලාශ්‍රය: අබූ දාවූද් හදීස් අංක 652
21. මූලාශ්‍රය: බුහාරි හදීස් අංක 434/මුස්ලිම් හදීස් අංක 528

5. රූප වන්දනාවට අදාළ වාක්‍ය යොදා ගැනීම පිළිබඳ අනතුරු ඇඟවීම.

උදාහරණ කිහිපයක් පහත දැක්වේ:

* අල්ලාහ් නොවන යම් දෙයක් මත සපත කිරීම.

නබි (සල්) තුමාණන් මෙසේ ප්‍රකාශ කොට ඇත: කවරෙකු අල්ලාහ් නොවන යම් දෙයක් මත සපත කරන්නේ නම් ඔහු ප්‍රතික්ෂේප කරන්නෙකු විය. නැතහොත් ඔහු දේව ආදේශ කරන්නෙකු විය.[22]

* අල්ලාහ්ගේ අභිමතය සමඟ කෙනෙකුගේ අභිමතය සමාන කිරීම.

කෙනෙකු අල්ලාහ් හා ඔබගේ අභිමතයට අනුව සිදු වූවකි යනුවෙන් නබි (සල්) තුමාණන් දෙස බලා පැවසූ විට නබි (සල්) තුමාණන් නුඹ මාව අල්ලාහ්ට සමානයක් ලෙස පත් කළේදැ?යි විමසා අල්ලාහ් අභිමත කළ දෑ පමණක් සිදු වුණි යැයි පවසනු යනුවෙන් ඔහුට අවවාද කළේය.[23]

* යම් දෙයක් හේතුවෙන් වර්ෂාව ඇති වන බව ප්‍රකාශ කිරීම.

ඒ පිළිබඳ අල්ලාහ් හදීස් අල් කුද්සි හි මෙසේ ප්‍රකාශ කොට ඇත: මේ මේ දේවල් හේතුවෙන් අපට වර්ෂාව ඇති වූවා යැයි ප්‍රකාශ කරන්නා වනාහි ඔහු මාව ප්‍රතික්ෂේප කොට ග්‍රහලෝකයන් කෙරෙහි විශ්වාස තබන්නෙකු වන්නේය.[24]

සර්ව බලධාරී දෙවියන් අල්ලාහ් හැර වෙනත් ඕනෑම කෙනෙකුට ඕනෑම ස්වාභාවික ප්‍රපංචයක් ආරෝපණය කිරීම ඇතුළත් ප්‍රකාශ තහනම් බව ඉහත සඳහන් වදන සසඳා බැලීම තුළින් උපුටා ගනු ලැබේ.

* දෙවියන් අල්ලාහ් සමඟ යම් දෙයක් ආදේශ කිරීමට හේතු වන ක්‍රියාවන් පිළිබඳ අනතුරු ඇඟවීම.

මෙය විවිධ ආකාරවලින් ගත හැකිය:

* ආපදාවන් වලින් ආරක්ෂා වීම හෝ ඒවා දුරු වීම පිණිස එක් අතක හෝ ගෙලෙහි වළලු හැඩැති යමක් හෝ නූලක් පැළඳීම.

නබි (සල්) තුමාණන් තඹ පළඳනාවක් පැළඳ සිටි මිනිසෙකු දුටු විගස ඔබ මෙය පැළඳගෙන සිටින්නේ කුමක් දැ?යි ඔහුගෙන් විමසා සිටියේය. දුර්වල කමින් රැකගැනීම පිණිස මා එය පැළඳ ගත් බව එම මිනිසා ප්‍රකාශ කළේය. එවිට නබි (සල්) තුමාණන් එය ඔබට දුර්වල කම මිස වෙනෙකක් වැඩි නොකරන බව පවසා එය ඉවත් කරන මෙන් ඔහුට අණ කළේය. තවද ඔබ එය පැළඳ සිටි ආකාරයෙන්ම මිය යන්නේ නම්, ඔබ කිසිදා ජය නොලබන්නේය යනුවෙන්ද නබි

22. මූලාශ්‍රය: අබූ දාවූද් හදීස් අංක 3251/ තිර්මිදි හදීස් අංක 1535
23. මූලාශ්‍රය: අන්නසාඊ හදීස් අංක 10759
24. මූලාශ්‍රය: බුහාරි හදීස් අංක 846/ මුස්ලිම් හදීස් අංක 1535

(සල්) තුමාණන් ඔහුට ප්‍රකාශ කර සිටියහ.[25]

* ඇස්වහ වලින් ආරක්ෂා වීම පිණිස සුරයක් හෝ මැතිරීමක් හෝ සුරක්ෂාභරණයක් වැනි යමක් පැළඳීම.

නබි (සල්) තුමාණන් මෙසේ වදාල ඇත: කවරෙකු හෝ යම් අරමුණක් සඳහා සුරයක් හෝ යම් සුරක්ෂාභරණයක් පළඳින්නේ නම් ඔහුගේ අරමුණ අල්ලාහ් ඉටු නොකරන්නේය.[26]

වෙනත් ආකාරයකින්, නබි (සල්) තුමාණන් මෙසේ පවසයි: කවරෙකු සුරයක් පළඳින්නේද ඔහු අල්ලාහ්ට ආදේශ කරන්නෙකු වේ.[27]

වෙනත් වාර්තාවක මෙසේ සඳහන් වේ:

ඕනෑම ඔටුවකුගේ ගෙල වටා සවි කර ඇති මාල හෝ ආභරණ කපා ඉවත් කරනු.[28]

* දේව ආදේශ කිරීමකට අයත් මැතිරීම් හා යන්ත්‍ර මන්ත්‍ර.

නබි (සල්) තුමාණන් මෙසේ ප්‍රකාශ කොට ඇත:

සුර පැළඳීම, මැතිරීම හා තිවලා හෙවත් වශී මන්තර යනාදී කරුණු දේව ආදේශයකි.[29]

තිවලා යනු කාන්තාවක් තමා හට තම ස්වාමිපුරුෂයාගේ ආදරය හා සෙනෙහස අධිකව ලබා ගැනීම පිණිස එකල කරනු ලැබූ එක් මැතිරීම් ක්‍රමයකි.

* දේව ආදේශ සිදු වන ස්ථානයන් හි සත්වයින් කැප කිරීම.

මිනිසෙකු බුවානා නම් ස්ථානයක ඔටුවන් කිහිපයක් පූජා කිරීමට බාරයක් කළ බව නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන්ට පැවසීය. එවිට නබිඳුන් එහි අඥාන යුගයේ නැමදුමට ලක් වූ පිළිම තිබේදැ?යි විමසා සිටියේය. එවිට ඔවුන් නැත යැයි පිළිතුරු දුන්හ. ඉන්පසු එම ස්ථානයේ ඔවුන් සමරන උත්සවයන් කුමක් හෝ තිබෙනවාදැ?යි විමසා සිටියේය. එවිට ඔවුන් නැත යනුවෙන් පිළිතුරු දුන්හ. එසේ නම් ඔබේ බාරය ඉටු කරනු යනුවෙන් නබි (සල්) තුමාණන් ඔහුට ප්‍රකාශ කර සිටියහ.[30]

* පක්ෂි පොරන්දම් බැලීම හා දුර්නිමිති

25. මූලාශ්‍ර: අහ්මද් හදීස් අංක 20000/ඉබ්නු මාජා හදීස් අංක 3531/ඉබ්නු හිබ්බාන් හදීස් අංක 6085
26. මූලාශ්‍ර: අහ්මද් හදීස් අංක 17404/ ඉබ්නු හිබ්බාන් හදීස් අංක 6086/ හාකිම් හදීස් අංක 7708
27. මූලාශ්‍ර: අහ්මද් හදීස් අංක 17422/ හාකිම් හදීස් අංක 7720
28. මූලාශ්‍ර: බුහාරි හදීස් අංක 3005/ මුස්ලිම් හදීස් අංක 2115
29. මූලාශ්‍ර: අබූ දාවූද් හදීස් අංක 3883/ ඉබ්නු මාජාහ් හදීස් අංක 3530
30. මූලාශ්‍රය:අබූ දාවූද් හදීස් අංක 3313/ ඉබ්නු හිබ්බාන් හදීස් අංක 2130

නබි (සල්) තුමාණන් පක්ෂි පොරන්දම් බැලීම දේව ආදේශයකි. පක්ෂි පොරන්දම් බැලීම දේව ආදේශයකි යනුවෙන් වරක් ප්‍රකාශ කළේය.[31]

කෙටියෙන් පවසන්නේ නම්, සර්ව බලධාරී අල්ලාහ් සිය ආගම මඟින් හෝ බාහිර සාධක මඟින් යම් ප්‍රතිඵලයක් සඳහා හේතුවක් වශයෙන් පත් නොකළ යම් හේතුවක් කවරෙකු හෝ පිළිගෙන එය තහවුරු කරන්නේ නම්, ඔහු දේව ආදේශය තුළට ඇද වැටෙනු ඇත. එසේත් නැති නම් එම දේව ආදේශය වෙත ඔහු මඟ පාදා ගනු ඇත.

## 4.අල්ලාහ්ගේ නාමයන් හා ගුණාංග පිළිබඳ විශ්වාසය

මෙයින් අදහස් වන්නේ අලංකාර නාමයන් සහ උසස් ගුණාංගයන් දෙවියන් අල්ලාහ්ට තිබෙන බව ස්ථිරව විශ්වාස කිරීම වේ. තවද ශුද්ධ වූ අල්කුර්ආනය තුළ අල්ලාහ් තමාට තිබෙන බව තහවුරු කළ එමෙන්ම මුහම්මද් (සල්) තුමාණන් ඔහුගේ මාර්ගෝපදේශයෙහි අල්ලාහ් සතුව තිබෙන බව තහවුරු කළ, සර්ව සම්පූර්ණ ගුණාංග සහ ඉමහත් විශේෂ ගුණාංගයන් සියල්ල කිසියම් සසඳා බැලීමකින් තොරව හා ඒවා සඳහා හැඩයක් හෝ ආකෘතියක් හෝ ලබා නොදී තහවුරු කිරීම මෙමඟින් අදහස් වේ.

තවද ශුද්ධ වූ අල්කුර්ආනය තුළ අල්ලාහ් හා මුහම්මද් (සල්) තුමාණන් ඔහුගේ මාර්ගෝපදේශයෙහි අල්ලාහ් සතුව නොතිබෙන බව ප්‍රකට කළ අසම්පූර්ණ හා දෝෂ සහිත ගුණාංගයන් තහවුරු නොකට, ඒවා විකෘති කිරීමකින් හෝ සංශෝදනය කිරීමකින් තොරව මැවීම සමඟ සම නොකර සිටීමේ අර්ථය ද මෙම සංකල්පය තුළ අන්තර් ගත වේ.

උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි:

අල්ලාහ්ට ඉතා අලංකාර නාමයන් තිබේ එබැවින් ඔහුව එයි(අලංකාර නම්වලි)න් ආමන්ත්‍රණය කරනු. ඔහුගේ නාමයන්හි දෝෂාරෝපණය කරන අය නොසලකා හරිනු. ඔවුන් කරමින් සිටි දැයහි ඵලවිපාකය ඔවුනට දෙනු ලැබෙනු ඇත. (අල්කුර්ආන්:07:180)

තවද:

ඔහුට සම වන කිසිවක් නැත. ඔහු (සියල්ලට) සවන් දෙන්නෙකු හා අවධානයෙන් යුතුව බලන්නෙකු වශයෙන්ද සිටින්නේය. (අල්කුර්ආන්:42:11)

උත්තරීතර අල්ලාහ්ගේ නාමයන් හා ගුණාංග සීමා කරන ලද්දකි. හුදෙක් බුද්ධිය මඟින් පමණක් ඒවා තහවුරු කළ නොහැක. අල්ලාහ් හා ඔහුගේ දූතයාණන් විසින්

31. මූලාශ්‍රය:අබූ දාවූද් හදීස් අංක 3910/ ඉබ්නු හිබ්බාන් හදීස් අංක 3538

තමා සතුව තිබෙන බව විස්තර කළ ගුණාංග හැර වෙනත් ගුණාංග මඟින් ඔහුව වර්ණනා කළ නොහැකිය.

ඒවා සියල්ල අල්කුර්ආනය හා හදීස් යන මූලාශ්‍ර දෙක ඉක්මවා නොයන්නකි. අල්ලාහ් හා ඔහුගේ දූතයාණන් යම් ගුණාංගයක් පිළිබඳ ප්‍රකාශ නොකට නිහඬව සිටියේ නම් ඒ පිළිබඳ නිහඬව සිට ඒවා තහවුරු කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීමෙන් වැළකී සිටිය යුතුයි.

කවරෙකු හෝ අල්කුර්ආනයේ හා අල්හදීස් වල සඳහන් නොවූ එවැනි ගුණාංගයක් භාවිතා කරන්නේ නම්, ඔහු අදහස් කරන්නේ කුමක්දැයි ඔහුගෙන් විමසා එහි අර්ථය නිවැරදි හා පිළිගත හැකි නම්, එහි අර්ථය පිළිගෙන එම අර්ථය හඟවන වචනය ප්‍රතික්ෂේප කළ යුතුයි. අර්ථය වැරදියි නම්, අර්ථය හා වචනය යන දෙකම ප්‍රතික්ෂේප කළ යුතුයි.

උත්තරීතර අල්ලාහ් ශුද්ධ වූ අල්කුර්ආනයේ මෙසේ ප්‍රකාශ කරයි:

නුඹට ඒ ගැන දැනුමක් නැති දෑ නොපිළිපදිනු. නියතවශයෙන් ශ්‍රවණයද, දර්ශනයද, සිතද, ඒ සැම දෙයක් ගැනම ප්‍රශ්න කරනු ලබන්නේය. (අල්කුර්ආන්:17:36)

දෙවියන් අල්ලාහ්ගේ නාමයන් ඉතාමත් අලංකාර වේ. ඒවා ඔහු සඳහා තිබෙන නාමයන් හා ඔහු සතුව තිබෙන ගුණාංග වේ. ඔහුගේ ගුණාංගයන් සර්ව සම්පූර්ණ වන අතර කිසිඳු ආකාරයකින් එහි දෝෂයක් හෝ දුර්වලයක් දැක ගත නොහැක. උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි:

අහස්හිද, භූමියෙහිද ඉතාමත් උසස් උපමාවන් ඔහුටම අයිතිය. ඔහු (සියල්ලට) බලසම්පන්නයෙකු හා ඥානවන්තයෙකු වශයෙන් සිටින්නේය. (අල්කුර්ආන්:30:27)

ඔහුගේ නාමයන් සැබෑය. එහෙයින් කිසිදු විකෘති කිරීමකින් තොරව ඒවායේ පැහැදිලි සහ බාහිර අර්ථයෙන් ඒවා තේරුම් ගත යුතුය. ඒවායේ යෙදුම් අලුතින් නිර්මාණය කිරීම හෝ ඒවාට නිදසුන් හෝ ආකෘති සැකසීම මගින් ඒවා වැළක්වීමට උත්සාහ කිරීම තහනම් වේ. එසේත් නැතිනම්, ඔහුගේ නාමයේ තිබෙන යෙදුම් කිහිපයක් වෙන්කර ඒවා ප්‍රතිමාවන් සඳහා භාවිතා කිරීමද තහනම් වේ. ඉලාහ් යන නාමයෙන් ලාත් යනුවෙන් හා අ$^{Z}$සී$^{Z}$ස් යන නාමයෙන් උ$^{Z}$ස්$^{Z}$සා යනුවෙන්ද මන්නාන් යන නාමයෙන් මනාත් යනුවෙන්ද ප්‍රතිමාවන් සඳහා නම් තැබීම ඒ සඳහා කදිම නිදසුන් වේ.

දුආ (ආයාචනාව) යන පදය සමඟ භාවිතා කරනු ලබන ආයාචනාත්මක දුආවක් හෝ වන්දනාත්මක දුආවක් හෝ වේවා ඒ සියළු අවස්ථාවන් වල අල්ලාහ්ගේ නාමයන් මඟින් ආයාචනා කිරීම අනිවාර්ය වේ. ඒවා ඉගෙන ගැනීම, තේරුම් ගැනීම සහ ඒ ගැන අවධානය යොමු කිරීම මෙන්ම එහි ගැබ් වී ඇති අර්ථයට අනුව ක්‍රියා කිරීම අවශ්‍ය වේ. මෙය දැනුමෙහි ඉහළම ශාඛාවයි.

අල්ලාහ්ට අදාළ වන පරිදි, ඔහුගේ ගුණාංග වර්ග දෙකකි:

## 1.ආත්මික ගුණාංග

ජීවය, සවන් දීම, දැකීම, දැනුම, හැකියාව, කැමැත්ත, බලය හා ප්‍රඥාව වැනි ඔහුගෙන් වෙන නොවෙන ගුණාංග.

## 2.ක්‍රියාව හා සම්බන්ධ ගුණාංග

ඒවා අල්ලාහ්ගේ කැමැත්ත හා ප්‍රඥාව සමඟ සම්බන්ධ වේ. ඔහු ඒවා සිදු කරනු ලබන්නේ ඔහුගේ ප්‍රඥාවට අනුව ඔහු කැමති ආකාරයෙන් හා ඔහු කැමති වන අවස්ථාවේදීය. ආදරය, වෛරය, සතුට, පුදුමය, පැමිණීම සහ අර්ෂ්හි රුඳී සිටීම යනාදී අල්කුර්ආනයේ හා සම්මත නබි වදන් හි සඳහන් ගුණාංග එයට අදාළ වේ.

දෙවියන් අල්ලාහ්ගේ ඇතැම් ගුණාංග වර්ග ඉහත සඳහන් වර්ග දෙකටම අයත් විය හැකිය. නිදසුනක් ලෙස කතා කිරීම යන ගුණාංගය ගත් කළ එය සැම විටම අල්ලාහ්ට අයත් ගුණාංගයක් වන අතරම, ඔහුගේ ප්‍රඥාවට අනුව ඔහු කැමති අවස්ථාවක ඔහු කතා කරනු ඇත.

දෙවිඳුන්ගේ ඇතැම් ගුණාංග සඳහා බුද්ධි මාර්ගයෙන් නොව වාර්තාවන් මාර්ගයෙන් පමණක් තහවුරු වූ ගුණාංග යනුවෙන් පවසනු ලැබේ. අල්ලාහ්ගේ මුහුණ, අත් දෙක, ඇස් දෙක, පාද වැනි අල්කුර්ආන් හා හදීස් හරහා තහවුරු වූ වෙනත් අංගයන් මෙයට අදාළ වේ.

ඉස්ලාමීය විද්වතුන්ගේ ඒකමතික තීන්දුව හා අල්කුර්ආන් හා සුන්නාහ්ව මඟින් තහවුරු වූ උත්තරීතර අල්ලාහ්ගේ ගුණාංග කිහිපයක් පහත දැක්වේ.

## 1. උසස් ගුණාංගය:

එහි පදාර්ථයන් තුනක් ඇත.

1:1. තත්ත්වයෙන් උසස්වීම: සෑම ගුණාංගයකම සර්ව සම්පූර්ණ වූ එමෙන්ම, උතුම් හා උසස්වූ ගුණාංගය ඔහුට අදාළ වන බව මෙයින් අදහස් වේ. උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි:

උසස් උපමාවන් ඔහුටම අයිතිය. (අල්කුර්ආන්:16:60)

1:2 බලයෙන් උසස්වීම: මෙයින් සියළු මැවීම් වලට වඩා මහිමය, බලය හා ශක්තිය ඔහුට ඇති බව අදහස් කරනු ලැබේ. ශුද්ධ වූ අල්කුර්ආනයේ අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි:

ඔහුමය තම ගැත්තන් කෙරෙහි තේජෝ බලපරාක්‍රමාන්විත වන්නේ.(අල්කුර්ආන්:06:18)

1:3. ඔහුගේම උසස්වීම: අල්ලාහ් අහස් සියල්ලට ඉහළින් අර්ෂ් හෙවත් රාජධානියේ

ස්ථාපිත ව සිටියි. එමෙන්ම ඔහු ඔහුගේ මැවීම් වලින් තොරය. ඔහු තුළ මැවීම් වලට අදාළ කිසිවක් නැති අතර මැවීම් තුළද ඔහුට අදාළ කිසිවක් නොමැත. ඔහු ඉතා සුවිශුද්ධය. සියළු පැසසුම් ඔහුටම හිමිය. ශුද්ධ වූ අල්කුර්ආනයේ අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි:

අහස්හි සිටින ඔහු පිළිබඳ ඔබලා බිය නොවී සිටින්නෙහුද?. (අල්කුර්ආන්:67:16)

සහීහ් මුස්ලිම් හි මෙසේ සඳහන් වේ:

නබි (සල්) තුමාණන් වහල් කාන්තාකවගෙන් අල්ලාහ් සිටින්නේ කොහිදැ?යි විමසීය. එවිට අල්ලාහ් අහසෙහි බව ඇය ප්‍රකාශ කළාය. මා කවරෙකුදැ?යි ඇයගෙන් විමසීය. ඔබ අල්ලාහ්ගේ දූතයාණන් යැයි ඇය පිළිතුරු දුන්හ. ඉන්පසු නබි (සල්) තුමාණන් ඇයව නිදහස් කරනු, මන්දයත් ඇය දේව විශ්වාසවන්තියකු වූවාය යනුවෙන් ප්‍රකාශ කළේය.[32]

අල්කුර්ආන් හා සුන්නාහ් ව තුළ එමෙන්ම සහජ විශ්වාසය, විවෘත බුද්ධිය හා විද්වතුන්ගේ ඒකමතික තීන්දුව යනාදී සාධක තුළ අල්ලාහ් අහසට ඉහළින් සිටින බවට සාක්ෂි රැසක් පැමිණ ඇත. ඒවා බහුලව දක්නට ලැබේ. උසස්කම යනු අල්ලාහ් දෙවියන්ටම අයත් එක් ආත්මික ගුණාංගයකි.

## 2. ස්ථාපිත වීමේ ගුණාංගය.

උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි:

පසුව (අර්ෂ්) රාජාසනයෙහි ඔහු (අල්ලාහ්)ස්ථාපිත විය. (අල්කුර්ආන්:07:54)

උත්තරීතර අල්ලාහ් පාරිශුද්ධ අල්කුර්ආනයේ ස්ථානයන් හයකදී මේ අයුරින්ම ප්‍රකාශ කොට ඇති අතර හත්වන ස්ථානයෙහි මෙසේ ප්‍රකාශ කරයි:

අර්-රහ්මාන්(අපරිමිත දයාන්විතවූ අල්ලාහ්) අර්ෂ්හි (විශ්ව රාජධානියෙහි) ස්ථාපිත විය.

ඒ අනුව ස්ථාපිත වීම යනු අහස් හා භූමිය නිර්මාණය කළ පසු විශ්ව රාජධානියට ඉහළින් අල්ලාහ් ඔහුගේ ගෞරවයට හා මහත්භාවයට සුදුසු අයුරින් ස්ථාපනය වීම වේ. මෙම ස්ථාපනය පොදුවේ අල්ලාහ්ගේ නිර්මාණ වල ඇති ස්ථාපිත වීමේ ස්වභායට කිසිදා සමාන වන්නේ නැත. එමෙන්ම ස්ථාපිත වීම යනු ක්‍රියාකාරී ගුණාංගයකි.

## 3. කතා කිරීමේ ගුණාංගය:

උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි:

මාගේ රබ්(පරමාධිපති)ගේ වදන(ලිවීම)ට සමුද්‍ර(ජල)යම තීන්ත බවට පත් වුවද

32. මූලාශ්‍රය: මුස්ලිම් හදීස් අංක 537

මාගේ රබ් (පරමාධිපති)ගේ වදන් සිදීමට පෙර සමුද්‍ර(ජල)යම සිදී යනු ඇත. එවැනි සමුද්‍රයක් අපි උදව්වට ගෙන ආවාද (යනුවෙන් නබි මුහම්මද්) පවසනු. (අල්කුර්ආන්:18:109)

තවද:

තවද අල්ලාහ් මූසා සමඟ කෙළින්ම සම්භාෂණය කළේය. (අල්කුර්ආන්:04:164)

තවද:

අපගේ නියමිත ස්ථානයට මූසා පැමිණ ඔහු සමඟ ඔහුගේ රබ්(පරමාධිපති) සම්භාෂණය කළ කල්හි. . . (අල්කුර්ආන්:07:143)

කතා කිරීමේ ස්වභාවය යනු: නියත වශයෙන්ම අල්ලාහ් මැවීම් වලට සම නොවන අයුරින්, ශබ්ද හා අකුරු මඟින් ඇසෙන ශබ්දයක් හරහා සැබෑ වදනින් උත්තරීතර අල්ලාහ් කතා කරනු ඇත. ඔහු අභිමත කරන අවස්ථාවක ඔහු අභිමත කරන ආකාරයකින් සත්‍ය හා සාධාරණ දෑ ඔහු කතා කරනු ඇත. ඔහුගේ වදන් කිසිවිටක අවසන් වන්නේ නැත. ඔහු අතීතයේ හා අනාගතයේ කතා කරමින්ම සිටිනු ඇත.

එමනිසා, කතා කිරීම යන ගුණාංගය එහි ප්‍රභවයට අදාළව අල්ලාහ්ගේ සැබෑ ගුණාංගයක් මෙන්ම ඒ හා බැඳුනු න්‍යායයන්ට අදාළව ක්‍රියාකාරී ගුණාංගයක්ද වේ.

මෙම වර්ගයේ ගුණාංග සියල්ල සත්‍ය සහ සැබෑ ය. එහෙයින්, ඒවා වාර්තා වූ අයුරින්ම එහි ප්‍රදර්ශිත අර්ථය මත ඒවා යොදවා, සංශෝධනය නොකට කිසිදු අඩු වැඩි කිරීමකින් තොරව ඒවා සියල්ල තහවුරු කළ යුතු අතර ඒවා සඳහා ආකෘතියක් ලබා දීම හෝ ඒවා සඳහා සංසන්දනයන් ඇති කිරීම හෝ නොකළ යුතුයි.

මෙම න්‍යාය සියළු ගුණාංග සඳහා යොදවනු ලැබේ. මන්දයත් ගුණාංග කිහිපයක් පිළිබඳ යම් ප්‍රකාශයක් නිකුත් කිරීම යනු අන් සියළු ගුණාංග පිළිබඳ ප්‍රකාශයක් නිකුත් කිරීම වැනිය. සියල්ල එකහා සමානය. කවරෙකු හෝ ඒවා වෙන් කරන්නේ නම් ඔහු කිසිදු සාධකයක් නොමැතිව තීන්දු නිකුත් කරන්නෙකු වේ.

ඇතැම් මුස්ලිම් කණ්ඩායම් කිහිපයක් දෙවියන් අල්ලාහ්ගේ නාමයන් සහ ගුණාංග විෂයෙහි නොමඟ ගොස් ඇත. ඔවුන් අතුරින් කිහිප දෙනෙකු පිළිබඳ විස්තර පහත දැක්වේ.

* අල්ලාහ්ගේ ගුණාංග සඳහා ආකෘති ලබා දෙන අයවළුන්:

  මොවුන් අල්ලාහ්ගේ ගතිලක්ෂණ විෂයෙහි සීමාව ඉක්මවා යෑම හේතුවෙන් ඒවා සඳහා අල්ලාහ්ගේ නිර්මාණයන්ට අයත් ආකෘති ලබා දීමේ උගුලට හසුවූ උදවිය වෙති. අල්ලාහ්ගේ ගතිලක්ෂණ පිළිබඳ අල්කුර්ආන් හා අල්හදීස් හි සඳහන් වන පාඨයන් එසේ හඟවන බව ඔවුන් වැරදි ලෙස විශ්වාස කරති. මැවීම් පිළිබඳ අවබෝධ කළ හැකි දෑ පමණක් අල්ලාහ් මිනිසුන්ට දන්වනු ඇත යන හේතුව

පදනම් කරමින් ඔවුන් එසේ විශ්වාස කරති.

ඔවුන්ගේ එම තර්කය හේතු කාරණා රැසක් මාර්ගයෙන් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඒවා නම්:

පළමුවැන්න:

උත්තරීතර අල්ලාහ් ඔහුට සමානයන් හෝ ආදේශයන් කිසිවක් නොමැති බව ශුද්ධ වූ අල්කුර්ආනයේ ඉතා පැහැදිලිව සඳහන් කරයි. ඒවා පහත දැක් වේ:

ඔහුට සම වන කිසිවක් නැත (අල්කුර්ආන්:42:11)

තවද:

නුඹලා පැහැදිලිව දැන සිටියදීත් අල්ලාහ්ට (කිසිසේත්) ආදේශයන් නොතබනු. (අල්කුර්ආන්:02:22)

තවද:

තවද ඔහුට සමාන කිසිවෙකු නොමැත. (අල්කුර්ආන්:112:04)

දෙවැන්න:

සර්ව සම්පූර්ණ වූ නිර්මාපකයෙකු වන දෙවියන් අසම්පූර්ණ මිනිසෙකුට සමාන වේ යන්න විකෘති නොවූ බුද්ධිය, සදා ප්‍රතික්ෂේප කරනු ඇත. ඔහු අනෙකාට සමාන නොවන්නේ කෙසේද? එසේම ඔහුගේ ගුණාංගද අනෙකාගේ ගුණාංග සමඟ සමාන වන්නේ නැත.

තුන්වැන්න:

දෙවියන් ඔහුගේ මැවීම් සමඟ ඔවුන්ගේ අවබෝධයට අනුව කටයුතු කළේය යන්න සැබෑවකි. එසේ කටයුතු කළද ආකෘති හා යථාර්ථයන් එක හා සමාන වීම අනිවාර්ය නොවේ. මැවීම් සතුව තිබෙන ශ්‍රවනය, බැලීම, ශක්තිය, අත්, මුහුණු යනාදී විෂයන් ගත් කළ ඒවා සඳහා තබන ලද නාමයන් එක හා සමාන වුවද ඒවායෙහි ගුණාංග එක හා සමාන විය යුතුයි යන්න අනිවාර්ය නොවේ. මන්දයත් ඒවා එකිනෙකාට වෙනස් වන සුළු අංගයන් වේ. මැවීම් තුළම තත්ත්වය මෙසේ නම් මැවුම්කරු හා මැවීම් අතර කෙතරම් වෙනසක් තිබිය යුතුයි ද යන්න ඉතා පැහැදිලිය.

* නිෂේධකයෝ:

මොවුන් දෙවියන් අල්ලාහ්ගේ ගුණාංග සුවිශුද්ධ කිරීම විෂයෙහි සීමාව ඉක්මවා ගොස් නිෂේධනය හා ප්‍රතික්ෂේප කිරීමේ උගුලට හසුවූ උදවිය වෙති. ඔවුන්ගේ ගැටළුව නම්, දෙවියන්ගේ ගුණාංග තහවුරු කිරීම මඟින් නියතවශයෙන්ම ඔහුට සම කිරීමක් ඇති වේ. මන්දයත් එම ගුණාංග මැවීම සතුවද තිබෙන හෙයිනි. එහෙයින් ඒවා ප්‍රතික්ෂේප කිරීමට සිදු වේ. එබැවින් අල්ලාහ්ට පොදු පැවත්මක්

තිබෙන බව පවසන ඔවුන් කිසියම් ගුණාංගයකින් ඔහු වර්ණනා නොවන බවට විශ්වාස කරති. නිෂේධනය කරන්නන් අතුරින් ඉතා ප්‍රබලයින් වන්නේ ප්‍රතිවිරුද්ධ ස්වභාවයකින් යුතු සියල්ල ප්‍රතික්ෂේප කරන කරාමිතාවරුන්ය. ඉන්පසු අල්ලාහ්ගේ නාමයන් හා ගුණාංගයන් යන අංග දෙකම ප්‍රතික්ෂේප කරන ජහමියියා වරුන්ය. ඉන්පසු අල්ලාහ්ගේ නාමයන් පමණක් තහවුරු කර ඔහුගේ ගුණාංගයන් පමණක් ප්‍රතික්ෂේප කරන මුඃතසිලා වරුන්ය.

ඔවුන් විසින් නගන ලද එම තර්කය හේතු කාරණා රැසක් මාර්ගයෙන් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඒවා නම්:

පළමුවැන්න:

උත්තරීතර අල්ලාහ් ඔහුට යම් ගුණාංගයන් තිබෙන බව ශුද්ධ වූ අල්කුර්ආනයේ ඉතා පැහැදිලිව හා විස්තරාත්මකව සඳහන් කර ඇත. ඒවා සඳහන් කිරීමේදී ඒවාට සමානයන් නොමැති බවද පවසා ඇත. උදාරහරණයක් වශයෙන් පහත සඳහන් වාක්‍යය උපුටා දැක් විය හැක:

ඔහුට සම වන කිසිවක් නැත. ඔහු (සියල්ලට) සවන් දෙන්නෙකු හා අවධානයෙන් යුතුව බලන්නෙකු වශයෙන්ද සිටින්නේය. (අල්කුර්ආන්:42:11)

අල්ලාහ්ගේ වදන් තුළ කිසිදා විරුද්ධත්වයක් සිදු වන්නේ නැත.

දෙවැන්න:

යම් ගුණාංගයක් මඟින් වර්ණනා කළ නොහැකි පොදු පැවත්මක් තහවුරු කිරීම යනු ප්‍රත්‍යක්ෂයෙහි යථාර්ථයක් නැති මානසික අන්දමින් තහවුරු කිරීමකි. එසේ එය හුදෙක්ම මානසික පැවැත්මක් ලෙස පමණක් පවතී නම් ඔවුන්ගේ වාදය දෙවියන්ගේ පැවත්මක් නොමැති බවට ප්‍රදර්ශනය කරන එක් වාදයක් බවට පත් වේ.

තුන්වැන්න:

ව්‍යුහයක් විස්තර කිරීම සඳහා පොදු සහ සම්පූර්ණ වචනයක් භාවිතා කිරීම යනු එම ව්‍යුහය වෙනත් දෙයක් සඳහා භාවිතා කිරීමේදී එහි තිබෙන න්‍යායයන් එකම ආකාරයකින් එයටද අදාළ වන බව අදහස් වන්නේ නැත. ඒවා වෙනත් වෙනත් විස්තර සමග අදාළ වන ව්‍යුහයක් විය හැක. මන්දයත් යම් ගුණාංගයක සීමා කිරීමක් හෝ එකතු කිරීමක් සිදු කරන විට, මතුපිට තිබෙන පොදුත්වය තවදුරටත් අදාළ වන්නේ නැත.

* අර්ථකථකයින්:

මොවුන් ක්‍රියාකාරී සහ වාර්තාවන් මාර්ගයෙන් තහවුරු වූ ගුණාංග වැනි සමහර ගුණාංග දෙවියන්ගේ සැබෑ ගුණාංගවලට සම්බන්ධ නොවන බව විශ්වාස කරති. එමනිසා ඒවායේ අර්ථ නිරූපණය කිරීම සඳහා මොවුන් විසින් වෙනත් අර්ථකථන

ලබා දෙනු ඇත. පැහැදිලි අර්ථයක් ඇති නව අර්ථකථන ලබා දීම මිස එවන් පරිවර්ථනයන් සඳහා වූ ඔවුන්ගේ ප්‍රයත්නයන් සාධාරණීකරණය කිරීම සඳහා ඔවුනට කිසිදු පදනමක් තිබුණේ නැත. ඔවුන් මෙම විකෘති කිරීමේ උත්සාහය සඳහා තෑවීල් හෙවත් විවරණය කිරීම යනුවෙන් නම් යොදා ගත්හ.

හේතු කාරණා රැසක් මාර්ගයෙන් ඔවුන්ගේ මෙම සංකල්පය ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඒවා නම්:

පළමුවැන්න:

දෙවියන් අල්ලාහ් සර්ව ඥානීය. තවද ඔහු මැවීම් සියල්ලට වඩා සත්‍යවාදී හා වඩා හොඳින් යමක් ප්‍රකාශ කරන්නෙකි. එමෙන්ම, දෙවියන්ගේ දූතයා තම අධිපතියානන් පිළිබඳ හොඳින් දැන සිටි අතර, ඔහු අන් කිසිවෙකුටත් වඩා සත්‍යවාදී හා පැහැදිලිව කථා කරන්නෙකි. තම ප්‍රජාව සඳහා ඔහුගේ උපදෙස් වඩා අවංක ය. එසේ නම්, අල්ලාහ් සහ ඔහුගේ දූතයා අදහස් කරන දෙය සඳහා යමෙකු වැඩි විස්තර ලබා දීමටත් ඔවුන්ගේ වචන අවුල් සහගත වීමට හේතු වන බව යෝජනා කිරීමටත් උත්සාහ කළ හැක්කේ කෙසේද?

දෙවැන්න:

වචනයක් ගත් කළ එය සෑම විටම එයින් අපේක්ෂා කරන යථාර්ථය මත යොදවනු ලැබේ. පැහැදිලි සාක්ෂියක් නොමැතිව එම වචනය ප්‍රදර්ශිත අර්ථයෙන් වක්‍රාකාර අර්ථයක් සඳහා යොදවා ඒ සඳහා අර්ථකථනයක් ලබා දිය නොහැකිය.

තුන්වැන්න:

මුහම්මද් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණෝ තම දෙවියන්ගෙන් ලැබුණු පණිවිඩය පිළිබඳ පූර්ණ පැහැදිලි කිරීමක් සමාජය කෙරෙහි ලබා දී ඇති අතර, එතුමාගේ පැහැදිලි පණිවිඩය සම්පූර්ණයෙන්ම එතුමා තම සමාජයට දන්වා සිටියේය. ඒ අනුව අල්ලාහ්ගේ ගුණාංග පිළිබඳ මෙම අතිශය වැදගත් ප්‍රශ්නය පැහැදිලි නොකොට අතහැර දැමීම සඳහා ඔහු කිසි විටෙකත් ඉඩ නොතිබීය.

* අඥාන උදවීන්:

මොවුන් දෙවියන් තමන් ගැන පවසන දෙය හෝ නබිතුමා දෙවියන් ගැන පවසන දෙය හුදෙක්ම පැහැදිලි අර්ථයක් නොදන්නා පණිවිඩයක් බව හා එහි සැබෑ අර්ථය දෙවියන් පමණක් දන්නා අතර එහි සැබෑ දැනුම කිසිවෙකුටත් ලබාගත නොහැකි බව විශ්වාස කරන උදවිය වෙති. ඒ සඳහා ඒවා අල්ලාහ් වෙත පැවරීම යන අනු නාමය ඔවුන් භාවිතා කරති.

ඔවුන්ගේ මෙම තර්කය පහත දැක්වෙන හේතු නිසා පදනමක් නැති තර්කයන් ලෙසට පත් වේ:

පළමුවැන්න:

ඉස්ලාමීය විශ්වාස පද්ධතියේ ඉතා ගෞරවනීය ශාඛාවක් වන දෙවියන් පිළිබඳ දැනුම වනාහි සියලු දෙනා හට පැහැදිලිව අවබෝධ කිරීම සඳහා සංකීර්ණ වීම යනු සිදු විය නොහැකි කරුණකි. බුද්ධිය හෝ අල්කුර්ආන් සහ අල්හදීස් කිසිවක් එසේ සංකීර්ණ බව දන්වන්නේ නැත.

දෙවැන්න:

උත්තරීතර අල්ලාහ් පැහැදිලි අරාබි භාෂාවෙන් අල්කුර්ආනය හෙළි කර ඇති අතර එම අල්කුර්ආනය හා එහි තේරුම පර්යේෂණය කරන මෙන් ඔහුගේ වහලුන්ට අණ කර තිබේ. මෙයින් පැහැදිලිවම අල්කුර්ආනයෙහි තේරුම වටහා ගත හැකි ස්වභාවයෙන් තිබෙන බව අවබෝධ කළ හැක. එනමුත් ඒවායෙහි යථාර්ථයන් සහ ස්වරූප ගත් කළ, ඒ පිළිබඳ දෙවියන් කිසිවක් අපට පවසා නැති අතර, ඒවා දෙවියන්ගේම දැනුමට අයත් ගුප්ත විෂයන් වේ.

තුන්වැන්න:

මෙම උදවියගේ තර්කය මගින් මුස්ලිම් ප්‍රජාවගේ මුල් පරම්පරාව අනුවණ පරම්පරාවක් ලෙස චරිත ඝාතන කිරීමක් සිදු කරනු ලබයි. එමෙන්ම එම තර්කය අල්ලාහ්ගේ ග්‍රන්ථය හා අකුරු ශාස්ත්‍රය නොදත් ස්ථාවරයක එම මුල් පරම්පරාව පසු වූ බව වර්ණනා කිරීමකි. තවද ඔවුන්ගේ බැල්මෙන් අල්ලාහ්ගේ ගුණාංග පිළිබඳ විස්තර කරන අල්කුර්ආන් වැකි වනාහි ප්‍රෙහේලිකාවන් හා විචාරාත්මක අර්ථයන් ලබා නොදෙන අක්ෂර මෙන්ය.

# දේවදූතයින් පිළිබඳ විශ්වාසය

මුළුමනින්ම ඔහුට කීකරු වන ආකාරයේ මැවීම් වර්ගයක් අල්ලාහ් නිර්මාණය කර ඔවුන් සඳහා ඔහුගේ සමීපත්වය විශේෂයෙන් ලබා දී තවද ඔහුගේ අහස්හි ඔවුනට නිවහනක් ලබා දී ඔහු අණ කරන දෑ ක්‍රියාත්මක කිරීමේ බලය ඔවුනට ලබා දී ඇති බව ස්ථිරව විශ්වාස කිරීම මෙමඟින් අදහස් කෙරේ. ඔවුන් මලක්වරුන් හෙවත් දේව දූතයින් වේ.

පහත සඳහන් කරුණු විශ්වාස කිරීමෙන් මිස දේව දූතයන් විශ්වාස කිරීම සම්පූර්ණ වන්නේ නැත:

**1.ඔවුන් ගෞරවයට ප්‍රාප්ත වූ දැහැමි හා අල්ලාහ්ට ඉතා සමීප, සම්පූර්ණ වශයෙන් ඔහුට යටත් වන බියබැතිමත් ගැත්තන් වේ යනුවෙන් විශ්වාස කිරීම.**

ඔවුන් හට දේවත්වයෙහි හා ආධිපත්‍යයෙහි කිසිදු විශේෂාංගයක් නොමැත. උත්තරීතර අල්ලාහ් මෙසේ සඳහන් කරයි:

අර්-රහ්මාන්(අපරමිත දයාන්විතයා වූ අල්ලාහ්) දරු පරපුරක් ගත්තේ යැයි ඔවුහු(ප්‍රතික්ෂේප කරන්නෝ) කියති. (ඔවුහු පවසන මුසාවාදයෙන්) ඔහු(අල්ලාහ්) සුවිශුද්ධය. නොඑසේය, ඔවුහු (මලක්වරු) ගරු කරනු ලැබූ ගැත්තෝය. ඔවුහු වචනයෙන් හෝ ඔහු අභිබවා නොයති. තවද ඔවුහු ඔහු(අල්ලාහ්)ගේ අණ ක්‍රියාත්මක කරති. ඔවුන් ඉදිරිපස ඇති දෑද ඔවුන්ගේ පසුපස ඇති දෑද ඔහු(අල්ලාහ්) දනී. ඔහු සතුටුවූ කෙනකුට මිස ඔවුහු(මලක්වරු) මැදිහත් නොවෙති. තවද ඔවුහු ඔහු ගැන බියෙන් ගැහෙති. (අල්කුර්ආන්:21:26-28)

තවද මෙසේ ප්‍රකාශ කර ඇත:

ඔවුනට ඉහළින් සිටින රබ්(පරමාධිපති)ට ඔවුහු බිය වෙති. තවද තමන්ට නියම කරන ලද දෑ කරති. (අල්කුර්ආන්:60:50)

තවද:

එහි දැඩි හැකියාවන්ගෙන් පිරි ශක්තිසම්පන්නයන් වන මලායිකාවරුන්ව පත් කරනු ලැබ ඇත්තේය. අල්ලාහ් ඔවුන්ට නියෝග කර ඇති දැයෙන් (පොඩියක් හෝ) වෙනසක් නොකරනු ලබන්නාහ. ඔවුන්ට (දඬුවම් කරන මෙන්) තමන්ට දෙනු ලැබූ නියෝගයන්ම ඉටු කරමින් සිටින්නාහ. (අල්කුර්ආන්:66:06).

තවද:

ඔවුහු ගෞරවාන්විතය පිරිසිදුය. (අල්කුර්ආන්:80:16)

තවද:

(මලායිකාවරුන්ව නමදිමින් සිටි)ඔවුන් සියල්ලන්වම ඒකරාශී කරන දිනදී, මලායිකාවරුන්ට "මොවුන්ද ඔබව නමදිමින් සිටි අය" යයි විමසනු ලැබේ. එයට ඔවුන් "(අපගේ දෙවියනි,) ඔබ ඉතාමත් පරිශුද්ධවන්තයෙකි. ඔබමය අපගේ දෙවියන්. ඔවුන් නොව. (මොවුන් අපව) නොව, ජින්වරුන්වම නමදිමින් සිටියහ. ඔවුන්ගෙන් වැඩි දෙනෙකු ඔවුන්ව(එම ජින්වරුන්ව)ම විශ්වාස කරමින්ද සිටියහ" යයි පවසන්නාහ. (අල්කුර්ආන්:34:40-41).

තවද:

(එසේ දැන්වීමට නොහැකිව-මලක්වරු, අල්ලාහ්) ඔබ සුවිශුද්ධය. ඔබ අපට ඉගැන්වූ දේ හැර වෙනත් දැනුමක් අපට නැත. නියත වශයෙන්ම සර්වඥද, සර්ව ප්‍රඥාද වන්නේ ඔබ පමණක් යැයි කීහ. (අල්කුර්ආන්:02:32)

## 2. ඔවුනට ගෞරවාන්විත නාමයන් තිබේ.

ඔවුන් අතුරින් කවර දේව දූතයන්ගේ නාමයන් අප දන්නේද ඔවුන්ගේ එම නාමයන් සමගම අප ඔවුන් කෙරෙහි විශ්වාස කළ යුතු අතර නාමයන් නොදන්නා දේව දූතයින් පිළිබඳ සමස්තයක් ලෙස විශ්වාසය ගොඩ නගා ගත යුතුය. අල්කුර්ආන් හා සම්මත හදීස් තුළ සඳහන් වන ජිබ්රීල්, මීකායීල්, ඉස්රාෆීල්, මලකුල් මවුත්, මාලික්, රිද්වාන්, මුන්කර්, නකීර් වැනි නාමයන් එම ගෞරවාන්විත දූතයන්ගේ නාමයන් අතුරින් අප දැන ගත් ඒවා වේ.

## 3. ඔවුන් ආලෝකයෙන් මවනු ලැබූ අය වෙති. තවද ඔවුන් පිහාටු සහිත, විවිධ විශාල හැඩයෙන් යුතු නිර්මාණයකි.

උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි:

අහස්ද, භූමියද, උත්පාදනය කර දෙකක්, තුනක්, හතරක් අත් තටු වලින් යුත් මලායිකාවරුන්ව (තමන්ගේ) දූත මෙහෙවර ගෙන යන්නන් වශයෙන්ද, පත් කළ අල්ලාහ්ටම සියලු ප්‍රශංසා. ඔහු කැමති දැය (තම) නිර්මාණයෙන් (පසුද) වැඩි කරන්නේය. නියත වශයෙන්ම අල්ලාහ් සියල්ල කෙරෙහි ඉතාමත් බලසම්පන්නයෙකි. (අල්කුර්ආන්:35:01)

නබි (සල්) තුමාණන් මෙසේ ප්‍රකාශ කර සිටියේය:

මලාඉකාවරුන් ආලෝකයෙන් නිර්මාණය කර ඇත.[33]

බුහාරි හා මුස්ලිම්හි එක් වාර්තාවක මෙසේ සඳහන් වේ:

නියත වශයෙන්ම නබි (සල්) තුමාණන් දේවදූත ජිබ්රීල් (අලෛ) තුමාණන්ව ඔහුගේ සැබෑ ස්වරූපයෙන් දැක ඇත. ඔහුට අත් තටු හය සියයක් තිබුණි. ඒවායින් එක් අත්

33. මූලාශ්‍රය: මුස්ලිම් හදීස් අංක 2996

තටුවක් මුළු ක්ෂිතිජයම ආවරණය කළ හැකි පරිදි පිහිටා ඇත.[34]

තවද නබි (සල්) තුමාණන් මෙසේ ප්‍රකාශ කළේය:

අර්ෂය උසුලා ගනිමින් සිටින දේව දූතයන් අතුරින් එක් දේවතූයකු පිළිබඳ දනුවත් කිරීමට මා හට අනුමැතිය ලැබිණි. නියත වශයෙන්ම ඔහුගේ කන් පෙත්තක සිට උරහිස දක්වා වර්ෂ හත්සීයක් ගමන් කරන තරම ට ඔවුන් ගේ විශාලත්වය පිහිටා ඇත.[35]

එම මලක් වරුන් සැබෑ නිර්මාණයකි. ඇතැම් අය චෝදනා කර ඇති පරිදි අර්ථයට පමණක් සීමා වූ බලයක් නොවේ. එමෙන්ම ඔවුන් බොහෝමයක් සිටිති. ඔවුන්ගේ ප්‍රමාණය කොපමණදැ?යි ඔවුන්ගේ නිර්මාතෘ මිස අන් කිසිවෙක් ගණනය කළ නොහැක.

නබි (සල්) තුමාගේ මිඃරාජ් ගමන පිළිබද බුහාරි හා මුස්ලිම් හි වාර්තා වන හදීසයක මෙසේ සඳහන් වේ:

බයිතුල් මඃමූර් නම් ස්ථානය මට ඔසවා පෙන්වන ලදී. එවිට ජිබ්රීල්ගෙන් එය කුමක්දැ?යි විමසා සිටියෙමි. එයට ඔහු: මෙය බයිතුල් මඃමූර් ය. එහි සෑම දිනක ම හැත්තෑ දහසක් මලක්වරු සලාතය ඉටු කරති. ඔවුන් එයින් පිට ව ගියේ නම් ඔවුන් ගේ අවසානය දක්වා නැවත ඒ වෙත නොපැමිණෙති.[36]

### 4.ඔවුහු පෙළගස්වන ලද අයවලුන් හා සුවිශුද්ධ කරන්නෝ වෙති.

උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි:

ඔහුට නියමිත ස්ථානයක් ඇතිව මිස, අපෙන් කිසිවකු නැත. නියතවශයෙන් අපමය පෙළගස්වන ලද්දෝ. නියතවශයෙන් අපමය (අල්ලාහ්) සුවිශුද්ධ කරන්නෝ. (අල්කුර්ආන්:37:164-166)

තවද මෙසේ ප්‍රකාශ කරයි:

නබි තුමණි! නැවතත් මොවුන් උඩගු (වී දෙවියන්ට නොනැමද ඈත්) වන්නත් වුවහොත් (ඔවුන්ගෙන් ඔහුට කිසිම පාඩුවක් නැත). ඔබගේ දෙවියන්ගේ සන්නිධානයෙහි සිටින්නන් (වන මලායිකාවරුන්) රාත්‍රියේ හා දහවලේද (සුවිශුද්ධ කරමින්) ප්‍රශංසා කරමින්ම සිටිති. (මෙහි) ඔවුන් ආයාසයට පත් වන්නේම නැත. (අල්කුර්ආන්:41:38)

තවද එම දේව දූතයින් පිළිබඳ අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි:

ඔවුහු දිවා රාත්‍රියේ ගුණ ගායනා කරති. අත් නොහිටුවති. (අල්කුර්ආන්:21:20)

34. මූලාශ්‍ර: බුහාරි හදීස් අංක 3234/ මුස්ලිම් හදීස් අංක 177

35. මූලාශ්‍රය: අබූ දාවූද් හදීස් අංක 4727

36. මූලාශ්‍ර: බුහාරි හදීස් අංක 3207/ මුස්ලම් හදීස් අංක 162

හකීම් බින් හිසාම් (රළි) තුමාණන් මෙසේ වාර්තා කරයි: එනම් වරක් අප නබි (සල්) තුමාණන් සමඟ සිටියදී මට ඇසෙන දේ ඔබලාට ඇසෙනවාද? යනුවෙන් විමසා සිටියේය. එවිට ඔහුගේ සහගාමිකයින් "අපට කිසිවක් ඇසෙන්නේ නැතැයි" පිළිතුරු දුන්නෝය. නියත වශයෙන්ම මා අහසින් යම් ශබ්දයක් ශ්‍රවණය කරන්නෙමි. ශබ්දයක් නොතිබිය යුත්තේ මන්ද? නියත වශයෙන්ම, අහසෙහි සෑම අඟලක් මුල්ලක් නෑරම දේවදූතයෙකු අල්ලාහ්ට සුජූද් කරමින් හා සිටගෙන නැමදුම් කරමින්ම සිටිති.[37]

## 5.ඔවුන් අදෘශ්‍යමානයි

ඔවුන් ගුප්ත ලෝකයට අයිති එක් නිර්මාණයකි. අල්ලාහ් අභිමත කළ උදවිය හැර මෙම ලෞකික ජීවිතය තුළ මිනිසාගේ ඉන්ද්‍රියයන් මඟින් ඔවුන් පිළිබඳ ග්‍රහනය කළ නොහැක. උදාහරණයක් ලෙස දේව දූත ජිබ්රීල් (අලෛ) තුමාණන්ව අල්ලාහ් කුමන ස්වරූපයකින් මවා තිබේද එම ස්වරූපයින්ම නබි (සල්) තුමාණන් දැක ඇත. ඒ හැර පොදුවේ ගත් කළ එම දේව දූතයන්ව මතු ලොවෙහි දැක ගන්නට පුළුවණි. උත්තරීතර අල්ලාහ් පාරිශුද්ධ අල්කුර්ආනයේ මෙසේ සඳහන් කර ඇත.

ඔවුන් මලක්වරුන් දකින දිනයේ එදින පව්කාරයින්ට ශුභාරංචිය නැත. තවද (අල්ලාහ්) අප ආරක්ෂා කරන්වායි ඔවුහු කියති. (අල්කුර්ආන්:25:22)

තවද මලක්වරු (දේව දූතයෝ) සෑම දොරටුවකින්ම ඔවුන් වෙත ඇතුළු වෙති. (අල්කුර්ආන්:13:23)

කෙසේ වෙතත්, දෙවියන් අල්ලාහ් දේවදූතයන්ට මානව ස්වරූපයක් බවට පත්වීමේ හැකියාව ලබා දී ඇත. මර්යම් තුමිය ගැන සඳහන් කිරීමේදී අල්ලාහ් මෙසේ පවසයි:

පසුව ඇය වෙත අපේ රූහ් (මලක්වරයා) යැව්වෙමු. එවිට ඔහු(මලක්වරයා) සම්පූර්ණ මිනිස් වෙසින් ඇයට (ඉදිරියෙන්) පෙනී සිටියේය. (අල්කුර්ආන්:19:17)

තවද මෙසේ සඳහන් වේ:

තවද නියතවශයෙන්ම අපගේ සුරදූතයෝ ශුභාරංචි රැගෙන ඉබ්‍රාහීම් වෙත පැමිණියහ. ඔවුහු ශාන්ති වේවා යැයි පැතුහ. එවිට ඔහු (ඉබ්‍රාහීම්) ද ශාන්ති වේවා (යැයි පැතීය.) ඉන්පසු වැඩි වේලාවක් ගතවීමට මත්තෙන් ඔහු (ඉබ්‍රාහීම්) බැදපු වසු පැටවකු ගෙන ආවේය. නමුත් ඔවුන්ගේ දෑත් ඒ වෙත නොගිය බව ඔහු (ඉබ්‍රාහීම්) දුටු කල්හි ඔහු ඔවුන් අනුමාන කළේය. තවද, ඔවුන් පිළිබඳ බියක් ද හටගත්තේය. (එවිට) බිය නොවනු! අපි ලූත්ගේ ජනයා වෙත එවනු ලද්දේ වෙමුයි ඔවුහු (සුරදූතයෝ) පැවසූහ. (අල්කුර්ආන්:11:69-70)

37. මූලාශ්‍ර: තබරානී හදීස් අංක 3122/ අල්බානි (රහ්) තුමාගේ අස් සිල්සිලතුස් සහීහා ග්‍රන්ථයෙහි හදීස් අංක 752 බලන්න.

තවද:

අපගේ සුරදූතයින් ලූත් වෙත පැමිණි විට (ඔවුන්ගේ පැමිණීම නිසා) ඔහු ඉමහත් සිත් කැලැඹීමකට පත් විය. තවද ඔහු දෙමිනස් විය. තවද මෙය විපත්තිදායක දිනයකැයි ඔහු (ලූත්) කීවේය. (අමුත්තන් ඔහු වෙත පැමිණි විගසම) ඔහුගේ ජනයා (කාමාශාවෙන්) ඔහු වෙත දුව ආහ. මින් පෙරද ඔවුහු දුසිරිත්හී යෙදී සිටියහ. මාගේ ජනයිනි, මේ මාගේ දූවරුන්ය. ඔවුන් නුඹලාට අතිශයින් පිවිතුරුය. එනිසා අල්ලාහ්ට බියවනු. මාගේ අමුත්තන් ගැන මා ලැජ්ජාවට පත් නොකරනු. නුඹලා අතර එකම ඍජු මිනිසකුවත් නැද්දැයි ඔහු (ලූත්) කීවේය. (අල්කුර්ආන්:11:77/78)

මේ සෑම අවස්ථාවකදීම දේවදූතයන් මිනිස් ස්වරූපයෙන් පැමිණියෝය. ඒ ආකාරයෙන්ම නබි (සල්)තුමා තම මිතුරන් සමඟ සිටියදී ඔහු වෙත දේව දූත ජිබ්රීල් (අලෛ)අඳුරු කළු හිසකෙස් සහිතව ඉතා සුදු පැහැති ඇඳුමින් සැරසී පැමිණියේය. ඇතැම් අවස්ථාවන්හිදී දේව දූත ජිබ්රීල් දහියියා අල් කල්බී (රළි) තුමාගේ ස්වරූපයෙන් පැමිණෙනු ඇත.

## 6.ඔවුනට විවිධ ක්ෂේත්‍රයන්හි රාජකාරීන් පවරා ඇත

එය ඔවුන්ගේ අඛණ්ඩ රාජකාරිය වන තම පරමාධිපතිට වන්දනා කර ඔහුව සුවිශුද්ධ කිරීම වැනි විෂයන්ට අමතරවයි. ඒවා අතුරින් කිහිපයක් පහත සඳහන් වේ:

### 1. දේව පණිවුඩ දන්වා සිටීමේ වගකීම.

මෙය ජිබ්රීල් (අලෛ) තුමාගේ වගකීම වේ. ඒ බව උත්තරීතර අල්ලාහ් මෙසේ සඳහන් කරයි:

විශ්වාස කරන අය තහවුරු කිරීමටද ඍජු මාර්ගයක් ලෙසද (අල්ලාහ්ට) අවනතවන අයට ශුභාරංචියක් ලෙසද නුඹගේ රබ්(පරමාධිපති)ගෙන් රූහුල් කුද්ස්(පිවිතුරු ආත්මය)එය සත්‍යය සමග (නුඹ වෙත) පහළ කළේ යැයි (නබි මුහම්මද්) කියනු. (අල්කුර්ආන්:16:102)

තවද:

නියතවශයෙන් මෙය(අල්කුර්ආනය) විශ්වයේ පරමාධිපතිගෙන් පහළ වූවකි. විශ්වාසදායී මහා ආත්මය එය සමගින් පහළ විය. නුඹගේ හදවත වෙතට (එය පහළ කළේය. ) නුඹ (අල්ලාහ් විසින් පත් කරන ලද) අනතුරු අඟවන්නන්ගෙන් කෙනකු වනු පිණිස. (අල්කුර්ආන්:26:192-193)

### 2. වර්ෂාව, ගහ කොළ හා පැළෑටි සම්බන්ධ වගකීම.

මෙය මීකාර්ල් (අලෙයි) තුමා වෙත භාර කරන ලද වගකීම වේ. හදීසයක මෙසේ

සඳහන් වේ:

යුදෙව්වන් නබි (සල්) තුමාණන් වෙත පැමිණ දයාව, වෘක්ෂලතා හා වර්ෂාව ගෙන එන්නේ මීකාඊල් බව ඔබ කීවා නම් අපි එය පිළිගනු ඇත යනුවෙන් පැවසීය. [38]

තවත් හදීසයක 'නබි (සල්) තුමාණන් ජිබ්රීල් (අලෛ) තුමාගෙන් "මීකාඊල් සඳහා භාර වූ වගකීම කුමක්දැ?යි විමසා සිටියේය. එවිට"වෘක්ෂලතාව හා වර්ෂාව" යනුවෙන් ඔහු පවසා සිටියේය.[39]

## 3. හොරණෑව පිඹීම ට භාරව කටයුතු කරන දේව දූතයා.

මෙය මුළු ලෝ වාසී සියල්ලන්ම සිහිසුන් වී මැරී වැටීම සඳහාත් ඔවුන් සියල්ල නැවත නැගිටුවීම සඳහාත් ඉස්රාෆීල් (අලෛ) තුමා වෙත භාර කරන ලද වගකීම් වේ.

සූර් (නමැති හොරණෑව කවදා හෝ) පිඹිනු ලැබුවහොත් අහස්හි සිටින්නන්ද, භූමියෙහි සිටින්නන්ද, -අල්ලාහ් අදහස් කරන්නන් හැර හුස්ම සිර වී (සිහිසුන් වී මැරී වැටී) යන්නෙහුය. අනිත් වර සූර් පිඹිනු ලැබුවහොත් එවෙලේම ඔවුන් සියල්ලන්ම (පණ ලැබී) නැගිට ඉදිරිය බලා සිටිනු ඇත. (අල්කුර්ආන්:39:68)

මොවුහු ඉතා ප්‍රධාන මලක් වරුන් වෙති. මන්දයත් මොවුන් ජීවිතයේ සාධකයන් පිළිබඳ ව වගකීම් පවරනු ලැබූවන් ය.

ඒ අනුව ජිබ්රීල් (අලෛයිහිස් සලාම්) තුමා හදවත් ජීවමාන කරවන දෑ සම්බන්ධයෙන් භාර ව කටයුතු කළ අයෙකි. මීකාඊල් (අලෛයිහිස් සලාම්) තුමා මහපොළොව ජීවමාන කිරීම සම්බන්ධයෙන් භාර ව කටයුතු කරන අයෙකි. එමෙන් ම ඉස්රාෆීල් (අලෛයිහිස් සලාම්) තුමා ශරීර යළි ජීවමාන කරවීමේ වගකීම දරන අයෙකි. ඔවුන් අතුරින් ඉතා විශිෂ්ටතම දේව දූතයා ජිබ්රීල් (අලෛයිහිස් සලාම්) තුමාය. පරිශුද්ධ ආත්මයද ඔහු වේ.

## 4. ආදම්ගේ පුතුන් වන මිනිසුන් ආරක්ෂා කිරීමේ වගකීම.

උත්තරීතර අල්ලාහ් මෙසේ සඳහන් කරයි:

(සෑම කෙනකුටම) ඔහුගේ ඉදිරිපසින්ද ඔහුගේ පසුපසින්ද අල්ලාහ්ගේ අණ පරිදි අණුපිළිවලින් ඔහු ආරක්ෂා කරන්නෝ(මලක්වරු) වෙති. නියත වශයෙන් තමන් සතුව ඇති දැය තමන්ම වෙනස් කරගන්නා තුරු, ජනතාවක් සතුව ඇති දැය අල්ලාහ් වෙනස් නොකරන්නේය. තවද යම් ජනකොටසකට අල්ලාහ් (නපුරක්) අදහස් කළේ

38. මූලාශ්‍රය: අහ්මද් හදීස් අංක 2483

39. මූලාශ්‍රය: තබරානී හදීස් අංක 12061/ මජ්මඋස් සවාඉද් යන ග්‍රන්ථයෙහි හදීස් අංක 14212 දරන අංකය යටතේ ඉමාම් හයිසමී තුමාණන් මෙම නබි වදන වාර්තා කර පසුව මෙම හදීසයේ වාර්තා කළ වාර්තාකරුවෙකු වන මුහම්මද් බින් අබී ලයිලා නැමැත්තාගේ මතන ශක්තිය දුර්වල බව හා ඒ හැර අන් සියල්ලන් විශ්වාසවන්තයින් ලෙස සඳහන් කර ඇත.

නම්, එයට වැළක්වීමක් නැත. තවද ඔහු හැර ඔවුනට ආරක්ෂකයකුද නැත. (අල්කුර්ආන්:13:11)

## 5. මිනිසුන් සිදු කරන ක්‍රියාවන් සටහන් කිරීමේ වගකීම.

උත්තරීතර අල්ලාහ් මෙසේ සඳහන් කරයි:

(අපගේ මෙම සෘජු දැනුමට අමතර වශයෙන් ඔහුගේ) දකුණු පසින්ද වම් පසින්ද ලියන්නන් දෙදෙනෙක් ඉඳ සිටිමින් (සෑම දෙයක්ම) සටහන් කරති. අවධානයෙන් නිරීක්ෂණය කරන ඔහු ළඟ ඉඳ (එය සටහන් කර) මිස ඔහු වචනයක් හෝ උච්චාරණය නොකරන්නේය. (අල්කුර්ආන්:50:17/18)

## 6. සැබෑ විශ්වාසවන්තයින් ස්ථාවරව තබා ගැනීම සඳහාත් ඔවුනට සහාය ලබා දීම සඳහා භාරව කටයුතු කරන දේව දූතයින්.

උත්තරීතර අල්ලාහ් අල්කුර්ආනයේ මෙසේ සඳහන් කරයි:

නුඹේ රබ්(පරමාධිපති) මලක්වරුන්(සුරදූතයන්)ට නියතවශයෙන්ම මම නුඹලා සමඟ සිටිමි. එනිසා ඊමානය (විශ්වාසය) ඇති අය ස්ථාවරව තබා ගනු. ප්‍රතික්ෂේප කරන්නන්ගේ හදවත්හි මම බිය ඇති කරන්නෙමි. එමනිසා ඔවුන්ගේ ගෙළ ඉහළින් ගසා දමනු. ඔවුන්ගේ සෑම ඇඟිල්ලකම සන්දි කපා තුඩු තළා දමන්නැයි දැන්වූ බව සිහිපත් කරනු. (අල්කුර්ආන්:08:12)

## 7. මරණ අවස්ථාවේ ප්‍රාණයන් අත්පත් කර ගැනීමේ වගකීම.

මෙය මලකුල් මවුත් හෙවත් මරණයේ මලක් වරයාගේ වගකීම වේ. උත්තරීතර අල්ලාහ් ඒ පිළිබඳ ශුද්ධ වූ අල්කුර්ආනයේ මෙසේ සඳහන් කර ඇත.

එබැවින් (නබි තුමණි,) ඔබ මෙසේ පවසනු: “ඔබ කෙරෙහි ඔබගේ දෙවියන් විසින් පවරනු ලැබ ඇති මලකුල් මවුත් (නමැති මලායිකාවරයා)ම ඔබගේ පණ අත්පත් කරන්නේය. පසුව (නැවතත් පණ දෙනු ලැබ), ඔබගේ දෙවියන් වෙතම ඔබව ගෙන එනු ලබන්නෙහුය. (අල්කුර්ආන්:32:11)

තවද මෙසේ සඳහන් කර ඇත:

තවද ඔහු (නුඹලාගේ මරණය පැමිණෙන විට) නුඹලාට ආරක්ෂකයින් (මලක්වරුන්) පහළ කරන්නේය. (එවිට නුඹලාගෙන් කෙනකුට මරණය පැමිණිය හොත්) අපගේ (සුර)දූතයෝ ඔහුව මරුමුවට පත් කරන්නෝය. ඔවුහු (තම කාර්යය ඉටු කිරීමෙහිලා අල්ප මාත්‍ර වූද) අතපසු කිරීමක් සිදු නොකරති. (අල්කුර්ආන්:06:61)

## 8. මිනිසා මිය ගිය පසු ව ඔහු ගේ මිණී වළ තුළ ඔහු ගේ පරමාධිපති ගැන ද ඔහු ගේ දහම ගැන ද ඔහු ගේ නබි වරයා ගැන ද විමසා සිටීමේ වගකීම.

මෙය මුන්කර් හා නකීර් යන දේව දූත දෙදෙනා සඳහා පවරන ලද වගකීමකි. අනස් (රළි) තුමාණන් විසින් නබි (සල්) තුමාණන් පැවසූ බව මෙසේ වාර්තා කර ලදී:

නියත වශයෙන්ම කිසියම් පුද්ගලයෙකු මිය ගිය පසු ඔහුව මිනී වළෙහි තබා ඔහුගේ සහායකයියන් ඔහුගෙන් වෙන් වී ගිය පසු ඔවුන්ගේ පාදවල හඬ එම මිනිසා ශ්‍රවනය කරනු ඇත. පසුව මලක් වරුන් දෙදෙනෙකු ඔහු වෙත පැමිණ ඔහුව අසුන් ගන්වා ඔහුගෙන් මෙම මිනිසා වන මුහම්මද් (සල්) පිළිබඳ නුඹ කුමක් පවසන්නේද? යනුවෙන් ප්‍රශ්න කරනු ඇත. ඔහු සැබෑ විශ්වාසවන්තයෙකු නම් එතුමා අල්ලාහ්ගේ සේවකයා හා ඔහුගේ දූතයා යනුවෙන් සාක්ෂි දරන්නෙමි යැයි පවසයි. පසුව ඔහුට මෙසේ කියනු ලැබේ: නුඹ හිමි වීමට තිබුණු අපායෙහි ළැඟුම් ස්ථානය දෙස බලනු. නියත වශයෙන්ම අල්ලාහ් ඒ වෙනුවට ස්වර්ගයේ ළැඟුම් ස්ථානයක් හිමි කර දුන්නේය. එවිට එම මිනිසා එම ස්වර්ගය හා අපාය යන දෙකම දකිනු ඇත. මිනී වළෙහි සිටින පුද්ගලයා මුනාෆික් හෙවත් කුහකයකු හෝ කාෆිර් හෙවත් දේව ප්‍රතික්ෂේපකයකු නම් ඔවුන්ගෙන්ද මෙම පුද්ගලයා පිළිබඳ නුඹ කුමක් පවසන්නේද යනුවෙන් විමසනු ලබයි. ඔහු කවුරුන්දැයි මා නොදනිමි යනුවෙන් ඔහු ප්‍රකාශ කරනු ඇත. එමෙන්ම මිනිසුන් ඔහු පිළිබඳ කුමක් ප්‍රකාශ කරමින් සිටියේද එලෙසම මා ප්‍රකාශ කරමින් සිටියෙමි යැයිද ඔහු පවසයි. ඔබට කිසිදාක දැනගත නොහැකිය යනුවෙන් ඔහුට පවසනු ලැබේ. ඉන්පසු ඔහුට යකඩ මිටියක් මඟින් එක් වරක් පහර දෙනු ලැබේ. ජින් හා මිනිස් වර්ගයා හැර ඔහුට පිටුපසින් සිටින සියලු දෙනා එහි ශබ්දයට සවන් දෙනු ඇත.[40]

තිර්මිදී හි වාර්තා වන වෙනත් වාර්තාවක මෙසේ සඳහන් වේ:

නුඹලාගෙන් කෙනෙකු මිනී වළෙහි තැන්පත් කළ පසු නිල් කළු පැහැති මලක් වරුන් දෙදෙනෙකු පැමිණෙනු ඇත. ඔවුන් අතුරින් කෙනෙකුට මුන්කර් යනුවෙන්ද අනෙකාට නකීර් යනුවෙන්ද කියනු ලැබේ. පසුව මොහු පිළිබඳ නුඹ කුමක් පවසමින් සිටියේද යනුවෙන් විමසනු ඇත.[41]

## 9. ගර්භාෂයන් හි ඇති කළලය ආරක්ෂා කිරීමේ වගකීම.

මිනිසාට ආත්මය ලබා දීම, ඔහුගේ රිස්ක් හෙවත් පෝෂණ සම්පත් ඔහු ගේ ක්‍රියාවන් ඔහු ගේ ආයුෂ කාලය ඔහු භාග්‍යවන්තයෙක් ද අභාග්‍යවන්තයෙක් ද යන වග අල්ලාහ් ගේ නියෝගය පරිදි සටහන් කිරීමේ වගකීම ඔවුන් සතුය.

40. මූලාශ්‍රය: බුහාරි හදීස් අංක 1374/ මුස්ලිම් හදීස් අංක 2870

41. මූලාශ්‍රය: තිර්මිදී හදීස් අංක 1071

සත්‍යවාදී විශ්වාය කළ හැකි නබි මුහම්මද් (සල්) තුමාණන් පැවසූ බව අබ්දුල්ලාහ් ඉබ්නු මස්ඌද් (රළි) තුමාණන් මෙසේ වාර්තා කරයි:

ඔබගෙන් කෙනෙකු දින සතළියක් මවගේ කුස තුළ බීජ ස්වරූපයෙන් එකට එක් කරනු ලබයි. පසුව එයට සමාන කාල පරිච්ඡේදයක් රුධිර කැටියක් මෙන්වනු ඇත. පසුව එයට සමාන කාල පරිච්ඡේදයක් විකන ලද ද්‍රව්‍යයක් මෙන් වනු ඇත. පසුව අල්ලාහ් වදන් සතරක් ලියන මෙන් අණ කර එක් දේව දූතයකු යවනු ඇත. ඒවා නම්, ඔහුගේ ක්‍රියාවන් ඔහුගේ රිස්ක් හෙවත් පෝෂණ සම්පත් ඔහුගේ ආයුෂ කාලය හා ඔහු භාග්‍යවන්තයෙක් ද අභාග්‍යවන්තයෙක් ද යන ඒවා වේ. ඉන්පසු ඔහුට ආත්මය ලබා දෙනු ලැබේ.[42]

## 10. නිරය ආරක්ෂා කිරීමේ වගකීම.

උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි:

නිරයෙහි ආරක්ෂකයින් වශයෙන් මලායිකාවරුන්වම මිස, (වෙන කිසිවෙකුත්) අපි නියම කළේ නැත. ප්‍රතික්ෂේප කරන්නන්ව පිරික්සීම සඳහාම (මෙසේ) මොවුන්ගේ ගණනය (දහනව දෙනෙකු වශයෙන්) අපි ඇති කළෙමු. ධර්මය හිමි අය, (මෙය) ස්ථිර වශයෙන් විශ්වාස කළ යුතුය. මෙය, විශ්වාසය තැබූවන්ගේ විශ්වාසය, වැඩි කරනු ඇත. ධර්මය හිමි අයද, විශ්වාසවන්තයින්ද, (මේ ගැන) සැක සිතිය නොයුතුය. එහෙත් කවුරුන්ගේ හෘදයන්හි අසනීපය ඇත්තේද, ඔවුන්ද, ප්‍රතික්ෂේප කරන්නන්ද, “මෙම උදාහරණය මගින් අල්ලාහ් කුමක් (දැනුම් දීමට) අදහස් කළේද?”යි පවසන්නාහ. (නබිවරය,) මෙසේම අල්ලාහ් තමන් අදහස් කරන අයව දුර්මාර්ගයෙහි අත්හැර දමන්නේය. තමන් අදහස් කරන අයව ඍජු මාර්ගයෙහි ඇතුළු කරන්නේය. ඔබ දෙවියන්ගේ සේනාවන්, ඔහු හැර වෙන කිසිවෙකුත් දැන ගන්නේ නැත. මේවා මිනිසුන්ට හොඳ ඔවදනම මිස, වෙන කිසිවක් නැත. (අල්කුර්ආන්:74:31)

තවද මෙසේ ප්‍රකාශ කරයි:

(මෙසේ තිබියදී ඔවුන් නිරයේ අධිපතිට) “ඕ මාලික්! ඔබගේ දෙවියන් අපගේ කාරණාව අවසන් කර දමත්වා! (මරණය මගින් හෝ අපට නිදහස ලැබෙත්වා!)” යයි ශබ්ද නගන්නාහ. එයට ඔහු “(නොහැක), නියත වශයෙන්ම ඔබ (මේ තත්වයටම දඬුවම විඳිමින්ම නොමැරී) ස්ථිරව සිටිය යුතුය” යයි පවසනු ඇත. (අල්කුර්ආන්:43:77)

තවද මෙසේ සඳහන් කරයි:

විශ්වාසවන්තයිනි! මිනිසුන් හා ගල් ඉන්දන බවට පත් කරන නිරා ගින්නෙන් ඔබ, ඔබ හා ඔබගේ පවුලේ උදවිය ආරක්ෂා කර ගනු. එහි දැඩි හැකියාවන්ගෙන් පිරි ශක්තිසම්පන්නයන් වන මලායිකාවරුන්ව පත් කරනු ලැබ ඇත්තේය. අල්ලාහ් ඔවුන්ට නියෝග කර ඇති දැයෙන් (පොඩියක් හෝ) වෙනසක් නොකරනු ලබන්නාහ.

42. මූලාශ්‍ර: බුහාරි හදීස් අංක 3208/ මුස්ලිම් හදීස් අංක 2643

ඔවුන්ට (දඬුවම් කරන මෙන්) තමන්ට දෙනු ලැබූ නියෝගයන්ම ඉටු කරමින් සිටින්නාහ. (අල්කුර්ආන්: 66:06)

## 11. සැබෑ විශ්වාසවන්තයින් සඳහා පාපොච්චාරණයේ නියැලීම, ඔවුන් වෙනුවෙන් ප්‍රාර්ථනාවන් සිදු කිරීම, ඔවුනට ශුභාරංචි ලබා දීම හා ස්වර්ගයේදී ඔවුනට ගෞරවය කිරීම.

උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි:

අර්ෂ් උසුළාගෙන සිටින්නන්ද, එය වටා සිටින්නන්ද, තමන්ගේ දෙවියන්ගේ ප්‍රශංසාව මගින් (ඔහුව) සුවිශුද්ධ කරන්නාහ. ඔහුව විශ්වාස කරන්නාහ. විශ්වාසය තැබූවන්ගේ වැරදි වලට සමාව දෙන මෙන්ද ඉල්ලා සිටින්නාහ. “අපගේ දෙවියනි, ඔබ (ඔබගේ) ඥානයෙන්ද, දයාවෙන්ද සියල්ල වට කරගෙන සිටින්නෙහිය. එබැවින් (පාපයන්ගෙන්) ඈත් වී ඔබගේ මාර්ගය අනුගමනය කරන්නන්ට සමාව දී ඔවුන්ව නිරා දඬුවමෙන් ඔබ බේරා ගනු මැනව!”“අපගේ දෙවියනි! ඔබ ඔවුන්ට පොරොන්දු වන ලද, ස්ථිර වූ ස්වර්ගයන්හි ඔවුන්ගෙන්ද, ඔවුන්ගේ මුතුන් මිත්තන්ගෙන්ද, ඔවුන්ගේ භාර්යයාවන්ගෙන්ද, ඔවුන්ගේ පරම්පරාවේ දරුවන්ගෙන්ද වූ යහපත් අය ඇතුලු කරනු මැනව! නියත වශයෙන්ම ඔබම (සියල්ලන්ටම) බලසම්පන්නයෙකු හා (සියල්ල දන්නා) ඥානවන්තයෙකු වශයෙන් සිටින්නෙහිය”. “(සියලූ) විපත්වලින්ම ඔවුන්ව බේරා ගනු මැනව! එදින කවුරුන් ඔබ (සියලූ) විපත්වලින් බේරා ගත්තෙහිද, ඔහු කෙරෙහි නියත වශයෙන්ම ඔබ ඉමහත් වූ වරප්‍රසාදයන් ලබා දුන්නෙහිය. මෙයම ඉමහත් වූ භාග්‍යයක් වන්නේය.” (යැයි ප්‍රාර්ථනා කරන්නාහ). (අල්කුර්ආන්: 40:7-9)

තවද:

(එහෙත්) නියත වශයෙන්ම කවුරුන් “අපගේ දෙවියන් අල්ලාහ්ය” යයි පවසා (ඒ මත) ස්ථිරව සිටියේද, ඔවුන් වෙත මලායිකාවරුන් පැමිණ (ඔවුන්ට) “ඔබ (කිසි දැයකට) බිය නොවනු. දුක් නොවනු. ඔබට පොරොන්දු දෙන ලද ස්වර්ගය මගින් සතුටු වනු” (අල්කුර්ආන්:41:30)

තවද:

සදා සැපතින් යුත් ස්වර්ගයන්ට ඔවුන් හා ඔවුන්ගේ පියවරුන්ගෙන්ද ඔවුන්ගේ අඹුවන්ගෙන්ද, ඔවුන්ගෙන් පැවතෙන්නන්ගෙන්ද දැහැමියෝ ඇතුළු වෙති. තවද මලක්වරු(සුරදූතයෝ) සෑම දොරටුවකින්ම ඔවුන් වෙත ඇතුළු වෙති. නුඹලා (ලෞකික) ජීවිතයේදී ඉවසිලිවන්තව සිටි දැයින් නුඹලාට සාමය වේවා! (නුඹලාගේ) අවසාන (යහඑලදායී මේ) නිවහන කෙතරම් වාසනාවන්ත(දැයි මලක්වරු කියති. ) (අල්කුර්ආන්: 13:23)

# වේද ග්‍රන්ථ විශ්වාස කිරීම

වේද (දේව) ග්‍රන්ථ විශ්වාස කිරීම යනු සැබැවින් ම උත්තරීතර අල්ලාහ් තම ගැත්තන් ට මහ පෙන්වීමක් වශයෙන් හා ඔවුනට පෙන්වූ දයාවක් වශයෙන් හා ඔවුනට උපදෙසක් හා සැම කරුණක් සඳහා පැහැදිලි කිරීමක් වශයෙන් ඔහු ගේ නබි වරුන් වෙත ට වේද ග්‍රන්ථ පහළ කළ බව ස්ථිර ලෙස විශ්වාස කිරීම වේ.

පහත සඳහන් කරුණු විශ්වාස කිරීමෙන් මිස දේව ග්‍රන්ථ විශ්වාස කිරීම සම්පූර්ණ වන්නේ නැත.

### 1.ඒවා සත්‍ය ලෙස අල්ලාහ් වෙතින් පහළ වූ බව විශ්වාස කිරීම:

උත්තරීතර අල්ලාහ් මෙසේ සඳහන් කරයි:

සත්‍යයෙන් යුතු වූද, ඊට පෙර පැවති ශුද්ධ ලියවිලි තහවුරු කරන්නා වූද, (මෙම) ධර්ම ග්‍රන්ථය ඔහු (අල්ලාහ්) නුඹ වෙත පහළ කළේය. තවද (මූසාට) තව්රාතය ද, (ඊසාට) ඉන්ජීලය ද පහළ කළේය. (අල්කුර්ආන්:03:03)

ඒවා අල්ලාහ්ගේ සිය වදන් හා වේද ග්‍රන්ථ වේ. ඒවා අල්ලාහ්ට ඉතා සමීප මලක් වරුන්ගේ හෝ එවනු ලැබූ ධර්ම දූතයෙකුගේ හෝ වදන් නොවේ. එමෙන්ම ඒවා සමඟ පරිශුද්ධභාවය හා දේව ආරක්ෂාව බැඳී ඇත.

### 2.ඒවා අතුරින් නම් සඳහන් වූ වේද ග්‍රන්ථ විශේෂයෙන් විශ්වාස කළ යුතු අතර, නම් සඳහන් නොවූ ග්‍රන්ථ සමස්තයක් ලෙස පොදුවේ විශ්වාස කළ යුතුයි. ඒවායින් ඉතා ප්‍රබල ග්‍රන්ථ තුනකි. ඒවා නම්:

#### 1. මූසා (අලෛ) තුමාණන් හට පහළ කරන ලද තෝරාහ්ව:

උත්තරීතර අල්ලාහ් මෙසේ සඳහන් කරයි:

ඕ! මූසා, මාගේ පණිවුඩය (දේශනා කිරීම) ටත් මා සමඟ සම්භාෂණයටත් නියතවශයෙන්ම මිනිසුන් අතුරින් මම නුඹ තෝරා ගන්නෙමි. එනිසා මා නුඹට පිරිනමන දෑ භාරගනු. තවද ගුණගරුකයන්ගෙන් (කෙනකු) වනුයි ඔහු (අල්ලාහ්) පැවසුවේය. තවද, ඔහු(මූසා) ට (ජීවිතයේ) සෑම කොටසකටම අදාළ අවවාදානුශාසනා සහ එක් එක් කොටසේ (සියලු අංශවලට) අදාළ විස්තර අපි ලව්හ් (ඵලකයන්)හි ලීවෙමු. එය දැඩිව ග්‍රහණය කරගනු. තවද එය හොඳින් තේරුම් ගෙන ග්‍රහණය කරන ලෙස නුඹගේ ජනතාවට අණ කරනු. මම නුඹලාට පාපිෂ්ටයන්ගේ නිවහන ඉක්මණින් පෙන්වන්නෙමි (යි අල්ලාහ් මූසාට පැවසීය.) (අල්කුර්ආන්: 07:144/145)

තවද:

සැබැවින්ම අපි තව්රාතය පහළ කළෙමු. එහි යහමඟ ද ආලෝකය ද ඇත. (අල්ලාහ්ට) ඉඳුරා අවනත වූ (සියලුම) නබිවරුන් යුදෙව්වන් බවට පත් වූවන්ට තඩු විසඳුවේ ඒ අනුවය. රබ්බානිවරු(ධර්ම විශාරදයෝ)ද අහ්බාර්වරු(ආගමික නීතිවේදීහු)ද එසේම කළහ. ඒ ඔවුන් අල්ලාහ්ගේ ධර්ම ග්‍රන්ථයේ ආරක්ෂකයින් හා ඊට සාක්ෂිකරුවන් ලෙස සිටි හෙයිනි. ඒ නිසා (යුදෙව්වරුනි,) මිනිසුන්ට බිය නොවනු. මට බිය වනු. තවද මාගේ වචන සුළු මිලක් වෙනුවෙන් නොවිකුණනු. අල්ලාහ් විසින් එවන ලද දෑ (නීතිය) අනුව තීන්දු නොදෙන්නේ කවරෙක්ද ප්‍රතික්ෂේප කරන්නෝ ඔවුහුමය. (අල්කුර්ආන්:05: 44)

## 2. ඊසා (අලෛ) තුමා හට පහල කරන ලද ඉන්ජීල්:

උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි:

එබැවින් ඉකුත්ව ගිය නූහ්, ඉබ්රාහීම්ගෙන් පසු ඔවුන්ගේ මාර්ගය අනුගමනය කර, (කටයුතු කරන) දූතයින්ව කෙනෙකුගෙන් පසු කෙනෙකු වශයෙන් අපි යැව්වෙමු. එසේම මර්යම්ගේ පුත් ඊසාවද, (ඔවුන්ගෙන් පසු, ඔහුව අනුගමනය කර කටයුතු කරන මෙන්) අපි යැව්වෙමු. ඔහුට ඉන්ජීල් (නමැති ධර්මයද) අපි දුන්නෙමු. (අල්කුර්ආන්:57:27)

තවද මෙසේ ප්‍රකාශ කරයි:

තවද එයට ඉදිරියෙහි වූ තව්රාතයේ (වෙනස් නොකර) ඇති දෑ සත්‍ය කරමින්ද බැතිමතුන්ට යහමඟක් හා උපදේශයක් වශයෙන්ද එහි මඟපෙන්වීම හා ආලෝකය ඇති ඉන්ජීලය අපි ඔහුට පිරිනැමුවෙමු. (අල්කුර්ආන්:05:46)

## 3. මුහම්මද් (සල්) තුමාණන් හට පහල කරන ලද අල්කුර්ආනය. මෙය වේද ග්‍රන්ථ අතුරින් ශ්‍රේෂ්ටතම ග්‍රන්ථය වේ.

උත්තරීතර අල්ලාහ් මෙසේ සඳහන් කරයි:

එයට ඉදිරියෙහි වූ දහම් ග්‍රන්ථය සත්‍ය කරමින්ද එය ආරක්ෂා කරමින්ද (නබි මුහම්මද්!) සත්‍යයෙන් පදනම් වූ දහම් ග්‍රන්ථය (අල්-කුර්ආනය) අපි නුඹ වෙත පහළ කළෙමු. (අල්කුර්ආන්:05:48)

තවද මෙසේ සඳහන් කරයි:

සමස්ත මානව සංහතියටම අනතුරු අඟවන්නක් ලෙස සිය ගැත්තා වෙත අල්-ෆුර්කාන් (සත්‍ය හා අසත්‍ය වෙන් කර පැහැදිලි කරන ග්‍රන්ථය) පහළ කර ඇති ඔහු(අල්ලාහ්) අති උත්කෘෂ්ටය. (අල්කුර්ආන්:25:01)

අල්ලාහ්ගේ වේද ග්‍රන්ථ අතුරින් දාවූද් (අලෛ) තුමා හට පහළ කරන ලද Zසබූර් ග්‍රන්ථයද එකකි. ඒ පිළිබඳ අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි:

තවද දාවූද්ට ᶻසබූර් ග්‍රන්ථය ප්‍රදානය කළෙමු. (අල්කුර්ආන්:17:55)

තවද ඉබ්රාහීම් (අලෛ) තුමා හට පහළ කරන ලද ලේඛණද අල්ලාහ්ගේ ග්‍රන්ථ අතුරින් එකකි. උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි:

නියත වශයෙන්ම මෙය (මෙහි සඳහන් අනුශාසනාවන් අල්-කුර්ආනයේ පමණක් නොව) පෙර (පහළවූ) පුස්තකයන්හිද (සඳහන්ව) ඇත. (එනම්) ඉබ්‍රාහීම්ගේ හා මූසාගේ පුස්තකයන්හි. (මෙලෙස සඳහන් වී ඇත. ) (අල්කුර්ආන්:87:18)

### 3.එම දේව ග්‍රන්ථ වල සඳහන් විකෘති නොකරන ලද කරුණු තහවුරු කිරීම.

උත්තරීතර අල්ලාහ් ඉස්රාඊල් පරම්පරාව වෙත පහළ කරන ලද වේද ග්‍රන්ථ තුළ අක්ෂර හා අර්ථ විකෘති කිරීම් සිදු වී ඇති බව පවසයි. එය අල්කුර්ආනයේ මෙසේ සඳහන් වේ:

(ඔවුන් දැන් කෙතරම් පිරිහී ඇත්ද යත් ශුද්ධ ලියවිලිවල) වචන ඒ ඒ තැන්වලින් ඉඳුරා වෙනස් කරති. (අල්කුර්ආන්:05:13)

තවද මෙසේ සඳහන් වේ:

නියත වශයෙන්ම ඔවුන්ගෙන් එක් සමූහයක් ඇත්තාහ; ඔවුන් ධර්මය කියවන විට, (ඒ සමග බොහොමයක් වෙනත් වගන්තීන්ද කළවම් කර), ඒවාද ධර්මයෙහි ඇත්තේය යයි ඔබ අදහස් කර ගැනීම පිණිස තමන්ගේ දිව (කට) ඇද කරමින් කියවන්නාහ. එහෙත් ඒවා ධර්මයෙහි ඇති දැය නොව. තවද ඔවුන් “එය අල්ලාහ් වෙතින් පැමිණ ඇත” යයිද පවසන්නාහ. එය අල්ලාහ් වෙතින් පැමිණි දැයද නොව. ඔවුන් හොඳින් දැන දැනම අල්ලාහ් මත (මෙසේ) බොරු ගොතා කියන්නාහ. (අල්කුර්ආන්:03:78)

එනමුත් අල්කුර්ආනය ගත් කළ, එය ආරාක්ෂා කිරීමේ වගකීම අල්ලාහ් භාර ගෙන ඇත. ඒ පිළිබඳ ශුද්ධ වූ අල්කුර්ආනයේ මෙසේ සඳහන් කරයි:

නියතවශයෙන් අපමය (මෙම) අᶻස් ᶻසික්ර් (ධර්මෝපදේශය / අල්කුර්ආනය) පහළ කළේ. තවද එය ආරක්ෂා කරන්නෝද අපිමය. (අල්කුර්ආන්:15:09)

තවද මෙසේ සඳහන් වේ:

නියත වශයෙන්ම කවුරුන් තමන් වෙත හොඳ ඔවදන් පැමිණෙන විට, ප්‍රතික්ෂේප කරන්නෝද, (ඔවුන් විනිශ්චය දිනදී තමන්ගේ තත්වය වටහා ගනු ඇත. මන්දයත්) නියත වශයෙන්ම මෙය ඉමහත් ගෞරවණීය ග්‍රන්ථයක් වන්නේය. මීට කළින් හෝ මීට පසුව හෝ (පරිශුද්ධ වූ කුර්ආනය වන) මෙයට බොරු (කිසි සේත්) ළඟා වීමට නොහැකිය. ඉතාමත් ප්‍රශංසාවට අයත් කෙනා හා ඥානවන්තයා විසින් (මෙය) පහළ කරන ලදී. (අල්කුර්ආන්:41:41/42)

එයට අදාළව, වේද ග්‍රන්ථ පහළ කරන ලැබූ වැසියන්ගේ ග්‍රන්ථ වල සඳහන් ඉස්රාඊලියියාත් හෙවත් එම සමාජයට අයත් තොරතුරු හා ඉතිහාසයන්හි ස්ථාවරය වනාහි පහත සඳහන් ස්ථාවරයන් තුන අතුරින් එකක් විය යුතුය:

ප්‍රථම ස්ථාවරය:

එම තොරතුරු හා ඉතිහාසයන් අල්කුර්ආනයේ සඳහන් වූ දැයට සමානව තිබිය යුතුය.

එසේ තිබේ නම්, අපගේ වේද ග්‍රන්ථය වන අල්කුර්ආනය ඒ පිළිබඳ සාක්ෂි දරන හෙයින් අප එහි නිවැරදිභාවය විශ්වාය කළ යුතුයි. ගංවතුර ගැලීම පිළිබඳ ප්‍රකාශය හා ඉබ්රාහීම්, යූසුෆ්, මූසා (අලෛ) තුමාණන් වැනි නොයෙකුත් ධර්ම දූතයින් පිළිබඳ ප්‍රකාශ හා ෆිර්අවුන්ගේ සමූහය දියේ ගිලීම හා ඊසා (අලෛ) තුමාණන්ගේ සංඥාවන් වැනි මාතෘකාවන් නිදසුනක් ලෙස ඉදිරිපත් කළ හැක. එනමුත් එම සිදුවීම් වල සවිස්තරාත්මක කරුණු පැහැදිලි කිරීම් සම්බන්ධයෙන් එම දේව ග්‍රන්ථ වල සඳහන් වූ දෑ විශ්වාස නොකළ යුතුයි.

දෙවැනි ස්ථාවරය:

එම තොරතුරු අල්කුර්ආනයේ සඳහන් තොරතුරු වලට පටහැනිව තිබීම.

එසේ තිබේ නම් අප ඒවායෙහි අවලංගුභාවය තහවුරු කළ යුතුය. ඒවා සියල්ල එම වේද ග්‍රන්ථ පහළ කරන ලැබූ සමූහයා විසින් අලුතින් අසත්‍ය ලෙස ලියන ලද තොරතුරු වේ. ලූත් (අලෛ) තුමාණන් මත්පැන් පානය කළ බව හා ඔහු සිය දියණියන් දෙදෙනෙකු සමඟ දුරාචාරයේ යෙදුනු බව ඔවුන් විශ්වාස කරති. එමෙන්ම ඊසා (අලෛ) තුමාණන් ඔහු දෙවියන් අල්ලාහ් බව හෝ ඔහු අල්ලාහ්ගේ පුත්‍රයාණන් බව හෝ තුන්වැන්නාගෙන් තුන්වැන්නා යනුවෙන් ඔවුන් විශ්වාස කරති. මෙය අල්කුර්ආනයෙහි සඳහන් තොරතුරු වලට පටහැනි ස්ථාවරය සඳහා නිදසුන් කිහිපයකි.

තුන්වැනි ස්ථාවරය:

ඒවායේ සඳහන් තොරතුරු අල්කුර්ආනයට එකඟව හෝ පටහැනිව නොතිබීම.

එසේ තිබේ නම් අප ඒවා තහවුරු නොකළ යුතු අතරම ඒවා අසත්‍ය බවද නොපැවසිය යුතුයි. එය නබි (සල්) තුමාණන්ගේ විසින් ප්‍රකාශ කරන ලද පහත සඳහන් එක් වදනවක් පදනම් කරමිනි. එනම්: වේද ග්‍රන්ථ දෙනු ලැබූ සමූහයක් නුඹලා හට යමක් පිළිබඳ පැවසුවේ නම් එය සත්‍ය බව තහවුරු නොකරන්න. එමෙන්ම එය අසත්‍ය බවද නොපවසන්න. අප අල්ලාහ් පිළිබඳ හා ඔහුගේ වේද ග්‍රන්ථ හා ඔහුගේ ධර්ම දූතයන් පිළිබඳ විශ්වාස කරන්නෙමු යැයි පවසන්න. එය සත්‍යයක් නම් එය අසත්‍ය යැයි නොපවසන්න. එය අසත්‍යයක් නම් එය සත්‍යය යැයි තහවුරු නොකරන්න.[43]

43. මූලාශ්‍ර: අහ්මද් හදීස් අංක 17225/ අබූ දාවූද් හදීස් අංක 3644

එනමුත් ඒවා පිළිබඳ කතා කිරීමට හෝ වාර්තා කිරීමට අනුමැතිය ඇත. මන්දයත් නබි (සල්) තුමාණන් වරක් මෙසේ වදාළහ: නුඹලා ඉස්රාඊල් පරම්පරාව පිළිබඳ කතා කරනු. එයින් කිසි වරදක් නොමැත. [44]

කෙසේ නමුත් ඒවා අතුරින් බහුතරයක් වන්නේ කිසිදු ප්‍රයෝජනයක් හෝ අවශ්‍යතාවයක් නොමැති තොරතුරු වේ.

## 4.අල්කුර්ආනයේ සඳහන් ව්‍යවස්ථාවට අනුව විනිශ්චය කළ යුතුයි.

අල්ලාහ්ගේ ශ්‍රේෂ්ට කෘතිය වන අල්කුර්ආනය ඊට පෙර තිබූ ග්‍රන්ථ සියල්ල සඳහා ආරක්ෂාවක් ලෙස එනම් ඒවායෙහි තිබෙන කරුණු සඳහා සාක්ෂියක් ලෙස අල්ලාහ් පහළ කර ඇත. ඒවායෙහි අඩංගු මිනිස් ජීවිත සඳහා ඵලදායී දේ අල්කුර්ආනය තුළද අඩංගු වී ඇත. තවද ඒවායෙහි තීන්දු කිහිපයක් අවලංගු කර අනෙකුත් තීන්දු කිහිපයක් තහවුරු කර අවශ්‍ය දෑ අලුතින් එකතු කර ඇත. එබැවින් අල්කුර්ආනය හැර වෙනත් කිසිම නීතියක් අනුගමනය කිරීම නුසුදුසුය. තෝරාහ්ව හා ඉන්ජීල් පිළිබඳ අල්ලාහ් සිහි කර පසු උත්තරීතර අල්ලාහ් ශුද්ධ වූ අල්කුර්ආනයේ මෙසේ සඳහන් කරයි:

එයට ඉදිරියෙහි වූ දහම් ග්‍රන්ථය සත්‍ය කරමින්ද එය ආරක්ෂා කරමින්ද (නබි මුහම්මද්!) සත්‍යයෙන් පදනම් වූ දහම් ග්‍රන්ථය (අල්කුර්ආනය) අපි නුඹ වෙත පහළ කළෙමු. එබැවින් නුඹ අල්ලාහ් පහළ කළ දෑ අනුව ඔවුන් අතර විනිශ්චය කරනු. නුඹට පහළ වූ සත්‍යයෙන් හැරී ඔවුන්ගේ දුර්මත අනුගමනය නොකරනු. නුඹලාගෙන් එක් එක් ජන කොටස් වෙනුවෙන් නීතියක් හා දිවි පිළිවෙතක් අපි නියම කළෙමු. අල්ලාහ් අභිමත වුවහොත් නුඹලා සියල්ලම එකම සංහතිය කරන්නට (ඔහුට) පුළුවන. එහෙත් (නුඹලාගෙන් එක් එක් ජනකොටස් වෙනුවෙන් නීතියක් හා දිවි පිළිවෙතක් අප නියම කළේ) නුඹලාට දුන් දැයෙහි නුඹලා පරීක්ෂා කරනු පිණිසය. එබැවින් සත් ක්‍රියාව මගින් එකිනෙකාට වඩා උසස් වීමට නුඹලා තැත් කරනු. අවසානයේදී නුඹලා සියල්ලන්ම යා යුත්තේ අල්ලාහ් වෙතයි. එවිට නුඹලාගේ මතභේද වලට තුඩුදුන් දෑ පිළිබඳ (සත්‍යය) ඔහු නුඹලාට දන්වනු ඇත.

(නබි මුහම්මද්!) අල්ලාහ් පහළ කළ දෑ අනුව ඔවුන් අතර විනිශ්චය කරනු. ඔවුන්ගේ දුර්මත අනුගමනය නොකරනු. අල්ලාහ් නුඹ වෙත පහළ කළ දැයින් (මඟ පෙන්වීමෙන්) කිසිම දෙයකින් ඔවුන් නුඹ ඉවත් නොකරන්නට වග බලාගනු. ඔවුන් (එම මඟපෙන්වීමෙන්) බැහැර වනවා නම් ඔවුන්ගේ ඇතැම් පව් හේතුවෙන් ඔවුන් දුක් කරදරවල පටලැවීමටය අල්ලාහ් අභිමත වී ඇත්තේ යැයි දැන ගනු. නියත වශයෙන්ම මෙම ජනයාගෙන් වැඩිදෙනා පව්කාරයෝ වෙති.

(ඔවුන් දේව නීතියෙන් බැහැර යන්නේ) ජාහිලිය්යත් (අඥාන) කාලයේ නීති අනුව විනිශ්චය කරනු ලැබීමට කැමැති නිසාද? (නමුත්) ස්ථිර විශ්වාසික ජනයාට

44. මූලාශ්‍ර: බුහාරි හදීස් අංක 3461

අල්ලාහ්ට වඩා යහපත් විනිශ්චයකාරයකු කවරකුද? (අල්කුර්ආන්: 5:48-50)

තවද මෙසේ ප්‍රකාශ කරයි:

(නබි මුහම්මද්!) අල්ලාහ් විසින් නුඹට දක්වන ලද සත්‍ය (මාර්ගය) අනුව ජනයා අතර විනිශ්චයකට එළැඹීමට නුඹට හැකි වනු පිණිස සත්‍යය අන්තර්ගත මේ ග්‍රන්ථය නියත වශයෙන්ම අප විසින් නුඹ වෙත එවන ලදී. එබැවින් වංක වූ මිනිසුන්ට නුඹ ආයාචනය කරන්නකු නොවනු. (අල්කුර්ආන්: 04:105)

## 5.දේව ග්‍රන්ථය කොටස් වශයෙන් වෙන් නොකර මුළුමණින්ම විශ්වාස කිරීම.

උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි:

නුඹලා ධර්ම ග්‍රන්ථයෙහි කොටසක් විශ්වාස කර තවත් කොටසක් විශ්වාස නොකරන්නහු ද? නුඹලා අතරින් එය කරන්නවුනට මෙලොව ජීවිතයේ ඔවුන්ට නින්දාව හැර (වෙනත්) විපාකයක් නැත. තවද, පරමාන්ත දිනයේ දී ද, ඉතා තදබල වේදනාව කරා ඔවුහු හරවා යවනු ලබන්නාහුය. තවද, නුඹලා කරන දේ ගැන අල්ලාහ් නැකීමක් නැත්තෙකු නොවේ. (අල්කුර්ආන්: 02:85)

තවද මෙසේ ප්‍රකාශ කරයි:

නුඹලා නම්, ඔවුනට ආදරය කරන්නෙහුය. නමුත් ඔවුහු නුඹලාට ආදරය නොකරනු ඇත. නුඹලා සියලුම දේව ග්‍රන්ථයන් විශ්වාස කරති. (අල්කුර්ආන්:03:119)

## 6.ඒවා වසන් කිරීම, විකෘති කිරීම, ඒවායෙහි මතභේද ඇති කිරීම හෝ ඒවායෙහි වදන් කිහිපියක් අනෙකුත් වදන් සමඟ කාවැද්දීම තහනම් ය.

උත්තරීතර අල්ලාහ් ශුද්ධ වූ අල්කුර්ආනයේ මෙසේ සඳහන් කරයි:

ධර්ම ග්‍රන්ථය දෙනු ලැබූ අයගෙන්, නුඹලා එය මිනිසුන්ට විස්තර කළ යුතු යැයිද එය නොසැඟවිය යුතු යැයිද අල්ලාහ් ප්‍රතිඥා ගත් බව සිහි කරනු. නමුත් ඔවුහු එය ඔවුන්ගේ පිටුපසට විසි කළහ. තවද (ඔවුහු) ඒ වෙනුවට සුළු මිළක් ගත්තෝය. ඔවුහු ලබා ගත් දැය ඉතා නපුරුය. (අල්කුර්ආන්:3:187)

තවද මෙසේ ප්‍රකාශ කරයි:

නියත වශයෙන්ම අල්ලාහ් (තමාගේ නබිවරුන් මගින්) පහළ කළ ධර්ම ග්‍රන්ථයෙහි එන (අණ පනත් ආදී) දෑ සඟවමින්, එය සුළු මිළකට විකුණන්නන් ඔවුන්ගේ උදරය පුරවා ගන්නේ ගින්නෙන් මිසක් වෙනත් දෙයකින් නොවේ. තවද කියාමත් (මළවුන් කෙරෙන් නැගිටුවන) දිනයේදී අල්ලාහ් ඔවුන්ට කථා නොකරනු ඇත. තවද ඔවුන් පාරිශුද්ධ නොකරනු ඇත. ඔවුනට වේදනාකාරී දඬුවම් ඇත. යහමඟ විකුණා දුර්මඟද (අල්ලාහ්ගේ) සමාව විකුණා දඬුවමද ලද්දෝ ඔවුහුමය. අපා ගින්න (විඳ දරා ගැනීම) කෙරෙහි ඔවුන්ගේ ඉවසීම කෙතරම් ආශ්චර්යමත් දෙයක්ද? එය (ඔවුන්

වේදනාවට භාජනය කිරීමට හේතුව) නියත වශයෙන්ම අල්ලාහ් සත්‍යයෙන් යුත් ග්‍රන්ථය පහළ කෙළේය. නමුත් ග්‍රන්ථය සම්බන්ධයෙන් මතභේද වූ අය තර්කයේ නියැළී (සත්‍යයෙන්) බොහෝ ඈතට යෑමයි. (අල්කුර්ආන්:02:174-176)

තවද මෙසේ සඳහන් කරයි:

තමන්ගේ අත්වලින්ම (ධර්ම) ග්‍රන්ථය ලියා ඉන්පසුව සුළු මිලක් ලබා ගැනීමේ අරමුණ ඉටුකර ගැනීම සඳහා මෙය අල්ලාහ්ගෙන් යැයි පවසන්නන් හට විනාශය වේ. තවද ඔවුන්ගේ අත් ලියූ දේ නිසාද ඔවුනට විනාශය වේ. (අල්කුර්ආන්:02:79)

නබි (සල්) තුමාණන් වරක් යම් පිරිසක් ආරවුල් ඇති කරමින් සිටින ආකාරය දැක මෙසේ පැවසීය:

නුඹලාට පෙර සිටි සමූහයන් විනාශ වූයේ මේ හේතුවෙනි. ඔවුන් අල්ලාහ්ගේ ග්‍රන්ථයෙහි සඳහන් සමහර කරුණු එහි සඳහන් වෙනත් සමහර කරුණු සමග කාවාද්දා ගත්තෝය. නියත වශයෙන්ම, අල්ලාහ්ගේ ග්‍රන්ථය පහළ වූයේ එහි සඳහන් කරුණු එකිනෙක සත්‍ය යැයි තහවුරු කරමිනි. එහෙයින් ඒවා එකිනෙක අසත්‍ය යැයි නොපවසනු. එමගින් ඔබලා දැනුගත් දෑ පවසනු. නොදැනුවත් දෑ ඒ පිළිබඳ නුවණක් ඇති පුද්ගලයෙකු වෙත යොමු කරනු. [45]

45. මූලාශ්‍රය: අහ්මද් හදීස් අංක 6741

# ධර්ම දූතයින් පිළිබඳ විශ්වාසය

ධර්ම දූතියින් පිළිබඳ විශ්වාසය යනු, අල්ලාහ් ඉදිරියේ නිදහසට කරුණු කියා පෑමට ජනයාට සාධකයක් නොවනු වස් නියත වශයෙන්ම අල්ලාහ් ඔහුගේ කරුණාව හේතුවෙන් ඔවුන් අතුරින් කිහිප දෙනෙකු තෝරා, ඔවුනට දිව්‍යමය මඟ පෙන්වීම ලබා දී ශුභාරංචි පවසන්නන් ලෙස හා අනතුරු අඟවන්නන් ලෙස මිනිසා වෙත යවා තැබූ බව ස්ථිරව විශ්වාස කිරීමයි. එමෙන්ම ඔවුන් අල්ලාහ්ට පමණක් වන්දනාමානය කළ යුතුයි යන පණිවිඩය හා පිළිම වන්දනාවෙන් ඈත් වී සිටිය යුතුයි යන පණිවිඩය මිනිසුන්ට දන්වනු ඇත. උත්තරීතර අල්ලාහ් පාරිශුද්ධ අල්කුර්ආනයේ මෙසේ අවධාරණය කරයි:

අල්ලාහ් (සිය තීන්දු ප්‍රකාශ කිරීම සඳහා) මලක්වරුන්ගෙන්ද මිනිසුන්ගෙන්ද දූතයින් තෝරා ගන්නේය. නියතවශයෙන් අල්ලාහ් සර්ව ශ්‍රාව්‍යය. සර්ව දෘෂ්ටිකය. (අල්කුර්ආන්:22:75)

තවද මෙසේ පවසයි:

(නබි මුහම්මද්!) අප ඔවුනට වහී පහළ කළ පුරුෂයින් මිස නුඹට පෙර අපි (රසූල්වරුන් ලෙස) නොඑව්වෙමු. නුඹලා මෙය නොදන්නෙහි නම් (දහම්) දැනුම ඇති අයගෙන් විමසනු. (අල්කුර්ආන්:16:43)

තවද මෙසේ පවසයි:

(මෙවැනි) රසූල්වරුන් පැමිණි පසු අල්ලාහ් ඉදිරියේ කියා සිටීමට කිසිදු නිදහසට කරුණක් ජනයාට නැතිවනු පිණිස ශුභාරංචි ගෙනෙන්නන් වශයෙන්ද අනතුරු අඟවන්නන් වශයෙන්ද රසූල්වරුන් අපි පහළ කළෙමු. අල්ලාහ් සැබැවින්ම සර්ව බලධාරිය, සර්වප්‍රාඥය. (අල්කුර්ආන්:04:165)

තවද මෙසේ සඳහන් කරයි:

අල්ලාහ් අදහනු. තවද තාඝූත් (අල්ලාහ්ට විරුද්ධව කැරලි ගැසීමේ) පිළිවෙතින් වැළකී සිටිනුයි ප්‍රකාශ කරන රසූල්වරයකු සියලු ජන සමාජයන් වෙත නියතවශයෙන් අපි යැවීමු. එවිට ඔවුන්ගෙන් සමහරුන්ට අල්ලාහ් මඟ පෙන්වීය. ඔවුන්ගෙන් ඇතමකුට නොමඟ යෑම තහවුරු විය. එනිසා මහපොළොවෙහි සැරිසරනු. (රසූල්වරුන්) බොරු යැයි කී අයගේ අවසානය කෙසේ වීදැ?යි බලනු. (අල්කුර්ආන්: 16:36)

පහත සඳහන් කරුණු විශ්වාස කිරීමද ඒ තුළ අන්තර්ගත වේ.

## 1. එම ධර්ම දූතයින් ගෙනා පණිවිඩය අල්ලාහ් වෙතින් හුදෙක් ඔහුගේ අභිමතය හා සියුම් ඥානයට අනුව සිදු වුණු බව විශ්වාස කිරීම.

උත්තරීතර අල්ලාහ් ඒ බව මෙසේ ප්‍රකාශ කරයි:

ඔවුන් වෙත ආයතය(අල්ලාහ්ගේ සංඥාව)ක් පැමිණි විට අල්ලාහ්ගේ රසූල්වරුන්ට දෙනු ලැබූ දෙය වැනි දෑ අපටද දෙනු ලබන තෙක් අපි විශ්වාස නොකරන්නෙමුයි ඔවුහු කීවෝය. තම ධර්ම දූත මෙහෙවරය කෙසේ පැවරිය යුතුද යන්න අල්ලාහ් ඉතා හොඳින් දනී. (අල්කුර්ආන්:06:124)

තවද මෙසේ ප්‍රකාශ කරයි:

මෙම කුර්ආනය (ප්‍රධාන) නගර දෙකෙහි ප්‍රභූ පුරුෂයකුට පහළ නොකළේ මන්දැ?යි ඔවුහු කීහ. (නබිවරය) ඔබගේ දෙවියන්ගේ වරප්‍රසාදයන් බෙදා දෙන අය ඔවුන් වන්නෙහුද? මෙලොව ජීවිතයෙහි ඔවුන්ගේ ජීවනෝපායට අවශ්‍යතාවයන් ඔවුන් අතරේ අපිම බෙදා දී, ඔවුන්ගේ සමහරකගේ පදවීන් සමහරෙකුට වඩා අපිම උසස් කළෙමු. ඔවුන්ගෙන් සමහරෙක්, සමහරෙකුව (සේවකයින් වශයෙන්) එක්කාසු කර ගැනීම සඳහා (නබිත්වය යන) ඔබගේ දෙවියන්ගේ වරප්‍රසාදයන් නම්, ඔවුන් එක්කාසු කර ඇති වස්තූන්ට වඩා ඉතා උසස්ය. (එය ඔහු කැමති තම වහලුන්ටම ලබා දෙන්නේය). (අල්කුර්ආන්:43:31-32)

ඇතැම් සූෆිවරුන් විශ්වාස කරන පරිදි දිව්‍යමය මඟ පෙන්වීම හා දේව පණිවිඩය යම් ආධ්‍යාත්මික ව්‍යායාමයක් හෝ දැඩි උත්සහ කිරීමක් මඟින් කිසිදා ලබා ගත නොහැක. එමෙන්ම ඇතැම් දාර්ශනිකයින් විශ්වාස කරන පරිදි පරිශුද්ධ, පරිකල්පනීය හා බලගතු බලවේග රාශියක් එක්රුැස් වීමෙන් ද ඒවා සාක්ෂාත් කරගත නොහැකිය. එය හුදෙක් දෙවියන්ගේ තෝරා ගැනීමක් වන අතර, ඔහුගේ මැවීම් අතුරින් එම කර්තව්‍යයට සුදුස්සෙකු බව ඔහු දන්නා අයට ඔහුගේ කරුණාව පිරිනැමීමකි.

## 2. ඔවුන් අතුරින් නම් සඳහන් වූ ධර්ම දූතයින් විශේෂයෙන් විශ්වාස කළ යුතු අතර නම් සඳහන් නොවූවන් සමස්තයක් ලෙස පොදුවේ විශ්වාස කළ යුතුයි.

අප විසින් දැන ගත් දූතයින් පිළිබඳ පහත දැක්වෙන ශුද්ධ වූ අල්කුර්ආන් වැකියෙහි ඉබ්රාහීම් (අලෛ) තුමාණන් පිළිබඳ සඳහන් වූ පසු මෙසේ සඳහන් වේ:

අපි ඔහු(ඉබ්‍රාහීම්)ට ඉස්හාක්ද යකූබ්ද ප්‍රදානය කළෙමු. (ඔවුන්) දෙදෙනාම අපි යහමඟ කළෙමු. මෙයට පෙර අපි නූහ්ද යහමඟ කළෙමු. තවද ඔහුගේ සංහතියෙන් වූ දාවූද් ද සුලෙයිමාන් ද අය්යූබ් ද යූසුෆ් ද මූසා ද හාරූන් ද (යහමඟ කළෙමු. ) ධාර්මික ජනයාට මෙලෙස අපි තිළිණ පිරිනමමු. සකරිය්යා ද යහ්යා ද ඊසා ද ඉල්යාස් ද (යහමඟ කළෙමු. මේ) සියල්ලන්ම යහකම් කරන්නවුන්ගෙන්ය. ඉස්මායීල් ද අල් යසඃ ද යූනුස් ද ලූත් ද (යහමඟ කළෙමු. ) මේ සියල්ලන්ම ලෝ වැසියන් අතර උසස් කළෙමු. (අල්කුර්ආන්:06:84-86)

තවද මෙසේ සඳහන් වේ:

(නබිවරය,) නියත වශයෙන්ම අපි ඔබට පෙරද දූතයින් (බොහොමයක් දෙනා) යවා ඇත්තෙමු. ඔවුන්ගෙන් සමහරෙකුගේ ඉතිහාසයන් ඔබට පවසා ඇත්තෙමු. ඔවුන්ගෙන් බොහොමයක් දෙනාගේ ඉතිහාසයන් අපි ඔබට නොපැවසුවෙමු. (මෙම දෙකොට්ටාශයෙන්) කුමන දූතයින් වුවද කම් නැත, අල්ලාහ්ගේ අනුමැතියෙන් තොරව යම්කිසි ප්‍රාතිහාර්යයක් ගෙන ඒම ඔවුන්ට හැකි දැයක් නොවේ. අල්ලාහ්ගේ නියෝගය පැමිණෙන අවස්ථාවේදී, (ඔවුන්ට) සාධාරණ ලෙසටම තීන්දු ලබා දෙනු ඇත. (එය) බොරු කරන්නන් ඒ අවස්ථාවේදී පරාජයටම ඇතුළු වනු ඇත. (අල්කුර්ආන්: 40:78)

ඒ අනුව ඔවුන් සියල්ලන් පිළිබඳ විශ්වාස කිරීම අනිවාර්ය වේ. මන්දයත් ඔවුන්ගේ පණිවුඩය එකකි. උත්තරීතර අල්ලාහ් මෙසේ සඳහන් කරයි:

(විශ්වාසවන්තයිනි,) නූහ්ට ඔහු කුමක් දේශනා කළේද එයම ඔබටද ඔහු ධර්මයක් බවට කර ඇත්තේය. එබැවින් (නබිවරය,) අපි ඔබට වහී මගින් දැනුම් දුන් දෑ හා ඉබ්රාහීම්, මූසා, ඊසා ආදීන්ට අපි දේශනා කළේ කුමක්ද යත් "(ඔබ එකම දෙවියන් යන ප්‍රතිපත්තියෙන් යුතු සත්‍ය වූ) ධර්මය ස්ථිරව අත් කර ගනු. එහි (විවිධ කොටස් වලට) බෙදා වෙන් කර නොගනු" යන්නම වන්නේය. (අල්කුර්ආන්:42:13)

ඔවුන් අතුරින් එක් ධර්ම දූතයකු ප්‍රතික්ෂේප කිරීම යනු ධර්ම දූතයින් සියල්ලන්ම ප්‍රතික්ෂේප කිරීමක් මෙන්ය. නූහ් (අලෛ) තුමාණන් දූතයන් අතුරින් ප්‍රථම ධර්ම දූතයා ඔහු වූවද, ඔහුව සිය ජනයා ප්‍රතික්ෂේප කළ හේතුවෙන් උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි:

නූහ්ගේ ජනයා රසූල්වරුන් බොරු යැයි කීහ. (අල්කුර්ආන්:26:105)

එබැවින් ධර්ම දූතයින් අතර බේදයක් ඇති නොකළ යුතු අතර ඔවුන් අතුරින් සමහරෙක්ව විශ්වාස කර තවත් සමහරෙක්ව ප්‍රතික්ෂේප කිරීමද නොකළ යුතුය. කවරෙකු හෝ එසේ කරන්නේ නම් ඔහු කාෆිර් වරයෙකි. උත්තරීතර අල්ලාහ් ශුද්ධ වූ අල්කුර්ආනයේ මෙසේ සඳහන් කරයි:

අල්ලාහ් සහ ඔහුගේ ධර්ම දූතයින් ප්‍රතික්ෂේප කර, අල්ලාහ් සහ ඔහුගේ ධර්ම දූතයින් අතර වෙනසක් හුවා දැක්වීමට අදහස් කරමින් අපි ඇතැම් අය පිළගෙන සෙසු අය ප්‍රතික්ෂේප කරමුයි පවසා (විශ්වාස හා අවිශ්වාස වන) ඒ අතර මැදි පිළිවෙතක් සොයන අය (නම්)සැබැවින්ම ප්‍රතික්ෂේප කරන්නෝ මොවුහුමය. ප්‍රතික්ෂේප කරන්නන් සඳහා අප අවඥා සහගත දඬුවමක් පිළියෙළ කොට ඇත. අල්ලාහ් සහ ඔහුගේ ධර්ම දූතයින් විශ්වාස කරමින් ඔවුන්ගෙන් කිසිවකු අතර වෙනසක් නොකළ අය(ට නම්) ඔවුනට ඔහු (අල්ලාහ්) ඔවුන්ගේ නිසි ත්‍යාගය මතුවට පිරිනමයි. අල්ලාහ් අතිශය ක්ෂමාශීලීය, අතිශය දයාන්විතය. (අල්කුර්ආන්:04:150-152)

### 3. ඔවුන් සත්‍ය බව තහවුරු කිරීම හා අල්ලාහ්ගෙන් ඔවුන් වාර්තා කළ දෑ පිළිගැනීම.

උත්තරීතර අල්ලාහ් ශුද්ධ වූ අල්කුර්ආනයේ මෙසේ සඳහන් කරයි:

මිනිසුනි! රසූල්වරයා නුඹලාගේ පරමාධිපතිගෙන් සත්‍යය රැගෙන නියත වශයෙන්ම නුඹලා වෙත පැමිණ ඇත. එබැවින් (ඔහු) විශ්වාස කරනු. එය නුඹලාට වඩාත් යහපත් වනු ඇත. එහෙත් නුඹලා ප්‍රතික්ෂේප කළහොත් අහස්වල හා මහපොළොවෙහි ඇති සියලු දෙයක්ම අල්ලාහ්ට හිමිය. අල්ලාහ් සර්වඥය, සර්වප්‍රාඥය. (අල්කුර්ආන්:04:170)

තවද මෙසේ සඳහන් කරයි:

සත්‍යය ගෙන ආ අය (වන අපගේ දූතයා)ද, එය සත්‍යය යැයි ස්ථිර කරන්නන්ද, ආදී මෙවැන්නන්ම භය භක්තිකයින් වේ. (අල්කුර්ආන්:39:33)

තවද:

තාරකා අස්තගතවන කල්හි, ඒ මත දිවුරමින්. නුඹලාගේ සහචරයෝ නොමඟ නොගියේය. තවද මුලාවීද නැත. ඔහු (සිය) මනෝ ඉච්ඡාව අනුව කතා නොකරන්නේය. එය ඔහු වෙත පහළ කරන ලද වහී(හෙළිදරව්ව) මිස නැත. ඉමහත් ප්‍රඥාවෙන් යුක්ත බලගතු තැනැත්තෙකු (එය) ඔහුට ඉගැන්වූයේය. (අල්කුර්ආන්:51:01)

පෙර වක්තෘවරුන්ගේ සියලු අව්‍යාජ කථාන්දර ගත් කළ අල්ලාහ් ඔහුගේ ග්‍රන්ථයෙහි ඒවා තහවුරු කර තිබුණේ නම් හෝ මුහම්මද් (සල්) තුමාණන්නගේ වදන් මඟින් ඒවා තහවුරු වී තිබුණේ නම් ඒවා සත්‍ය බව විශ්වාස කිරීම අනිවාර්ය වේ.

වෙනත් වේද ග්‍රන්ථ වල සඳහන් කර ඇති වාර්තාවන් හා තොරතුරු ගත් කළ, දේව ග්‍රන්ථ පිළිබඳ විශ්වාසය යන ඉහත සඳහන් පාඩමෙහි විස්තර කර ඇති කොන්දේසි වලට ඒවා යටත් වේ.

මුහම්මද් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණන් විසින් අනාවරණය කර ඇති වාර්තා(හදීස්) ගත් කළ, ඒවායෙහි සම්මතභාවය දැනගැනීම පිණිස විද්වතුන් විසින් සකස් කරන ලද නීතිවලට ඒවා යටත් වේ. ඒ අනුව යම් නබි වදනක් සම්මත වූයේ නම් එය පිළිගෙන විශ්වාස කිරීම අනිවාර්ය වේ.

### 4. ධර්ම දූතයන්ට කීකරු වීම, ඔවුන්ව අනුගමනය කිරීම හා විනිශ්චයකරුවන් වශයෙන් ඔවුන්ව පත් කිරීම.

උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කොට ඇත:

අල්ලාහ්ගේ අවසරයෙන් ඔහුට කීකරුවීම පිණිස මිස කිසිම රසූල්වරයකු අපි නොඑව්වෙමු. (අල්කුර්ආන්:04:64)

තමන් වෙත එවනු ලැබූ ධර්ම දූතයාට අවනත වීම හා ඔහුව අනුගමනය කිරීම

සෑම සමූහයක් සඳහාම අනිවාර්ය වේ. ඒ අනුව ඔවුන් අතුරින් අවසාන හා මුද්‍රාව ලෙස පැමිණියේ මුහම්මද් (සල්) තුමාණන් හෙයින් ඔහුට පෙර තිබූ සියළු දහම් ඔහුගේ දහම මඟින් අහෝසි කරන ලදී. එතුමාණන් පිළිබඳ ආරංචි වූ සියල්ලන් හටම එතුමාණන්ට අවනත වී එතුමාණන්ව අනුගමනය කිරීම අනිවාර්ය වේ. ඒ පිළිබඳ උත්තරීතර අල්ලාහ් මෙලෙස අවධාරණය කරයි:

(මාගේ දයානුකම්පාව පිරිනමන ලද අය නම්) තමන් ළඟ ඇති තව්රාත් සහ ඉන්ජීල්හි සඳහන් කරනු ලැබ ඇති (මේ) උම්මි (අකුරු ශාස්ත්‍රය නොදත්) නබි වන මේ රසූල් (වක්තෘ) වරයාව අනුගමනය කරන්නෝය. ඔහු (රසූල්වරයා) යහපත් දෑ (පිළිපදින ලෙස) ඔවුනට අණ කරයි. තවද අයහපත් දැයින් ඔවුන් වළක්වාලයි. තවද පිරිසිදු දේවල් ඔවුනට අනුමත කරයි. අපිරිසිදු දේවල් ඔවුනට තහනම් කරයි. ඔහු ඔවුන් මත පටවන ලද බරද ඔවුන් කෙරෙහි වූ විලංගුද පහ කරයි. එබැවින් ඔහු විශ්වාස කර ඔහුට ගෞරව කර ඔහුට උදව් කර ඔහු සමඟ පහළ වූ ආලෝකය අනුගමනය කරන්නාවූ ඔවුහුමය ජයග්‍රාහකයෝ. ජනයිනි! නියත වශයෙන්ම මම නුඹලා සියල්ලන් වෙත, අහස් හා මහපොළොවෙහි ආධිපත්‍යය හිමි වූ අල්ලාහ්ගේ රසූල් (වක්තෘ) වරයාය. ඔහු හැර වෙනත් දෙවියකු නැත. ඔහු ජීවය දෙන්නේය. මරණයද පමුණුවන්නේය. එබැවින් නුඹලා අල්ලාහ් ගැන විශ්වාස කරනු. තවද අල්ලාහ් ගැනද ඔහුගේ අණපනත් ගැනද විශ්වාස කරන්නා වූ උම්මි නබි වූ ඔහුගේ රසූල් (වක්තෘ) වරයා ගැනද විශ්වාස කරනු. තවද නුඹලා ඔහු අනුගමනය කරනු. නුඹලා යහමඟ වනු පිණිස (යැයි නබි මුහම්මද්) පවසනු. (අල්කුර්ආන්: 07:157-158)

තවද මෙසේ සඳහන් කරයි:

තමන් කර ඇති යහපත් දේද තමන් කර ඇති වැරදි දේද තමන් ඉදිරියේ දිස්වෙන දිනය පැමිණි විට ඔහුට සිතෙනු ඇත්තේ, එය (නරක දේ) හා තමන් අතර දීර්ඝ පරතරයක් වී නම්, (කෙතරම් අගේද) යනුයි. තමාට බියවන ලෙස අල්ලාහ් නුඹලාට අනතුරු ඇඟවීමක් කරයි. අල්ලාහ් සිය ගැත්තන් කෙරෙහි සානුකම්පිතය. අල්ලාහ්ට කීකරු වනු. තවද රසූල්ටද කීකරු වනුයි (නබි මුහම්මද්!) පවසනු. (මෙසේ පැවසීමෙන් පසුවත්) ඔවුහු පිටුපැවාහු නම්, නියත වශයෙන්ම අල්ලාහ්, ප්‍රතික්ෂේප කරන්නන් ඇලුම් නොකරයි. (අල්කුර්ආන්:03:31/32)

තවද:

නැත, ඔවුන් තමන් අතර ඇතිවූ ආරාවුල (විසඳීම)ට විනිශ්චයකරු වශයෙන් නුඹ (මුහම්මද්) පිළිගෙන නුඹගේ තීරණය ගැන ඔවුන්ගේ සිත්වල කිසිදු කනස්සල්ලක් නොමැතිව මුළුමනින්ම එයට අවනත වනතුරු ඔවුහු විශ්වාස කරන්නෝ නොවෙති. (අල්කුර්ආන්:04:65)

## 5. ඔවුන්ව සහායෙකු ලෙස ගැනීම, ඔවුනට ආදරය හා ගෞරවය කිරීම, ඔවුනට සලාම් පැවසීම.

උත්තරීතර අල්ලාහ් මෙසේ සඳහන් කරයි:

නුඹලාගේ සහායකයෝ අල්ලාහ් ද ඔහුගේ රසූල්වරයා ද විශ්වාසිකයෝ ද සලාත්හි නිරතවන්නෝ ද ᶻසකාත් ඉටු කරන්නෝ ද (අල්ලාහ්ට) රුකූඋ (නැමී නමස්කාරය) කරන්නෝ ද වෙති. අල්ලාහ්ද ඔහුගේ රසූල්වරයා ද විශ්වාසිකයන් ද තමන්ගේ සහායකයන් කරගන්නේ කවුරුන්ද? නියත වශයෙන්ම ජයග්‍රහකයෝ වන්නේ අල්ලාහ්ගේ පක්ෂය (ට අයත් වූවෝයෑ)යි (ඔවුහු දැනගනිත්වා). (අල්කුර්ආන්:05:55-56)

තවද මෙසේ ප්‍රකාශ කරයි:

ඊසා ඔවුන් (ඉස්රාඊල් පුත්‍රයින්)ගේ ප්‍රතික්ෂේප කිරීම වටහාගත් කල්හි, අල්ලාහ්ගේ මාර්ගයෙහි මට උදව්කරන්නෝ කවරහුදෑ?යි ඇසීය. අපි අල්ලාහ්ගේ මාර්ගයෙහි උදව් කරන්නෝ වෙමු. අපි අල්ලාහ් විශ්වාස කළෙමු. එබැවින් අපි මුස්ලිම්වරුන් (අල්ලාහ්ට සම්පූර්ණයෙන්ම අවනත වූ අය) බවට ඔබ සාක්ෂි දරණු යැයි හවාරිය්යූන්හු (අනුගාමිකයෝ) කීහ. (අල්කුර්ආන්:03:52)

තවද:

නුඹලාගේ පියවරුන් නුඹලාගේ පුත්‍රයින් නුඹලාගේ සහෝදරයින් නුඹලාගේ භාර්යාවන් නුඹලාගේ නෑදෑ හිතවතුන් සහ නුඹලා ඉපැයූ ධනයත් පිරිහේවී යැයි නුඹලා බියවන වෙළඳාමත් නුඹලා ප්‍රමෝදයට පත් කරන නිවෙස් (යන මේ සියලු දේවල්) අල්ලාහ්ටත් ඔහුගේ රසූල්වරයාටත් ඔහුගේ මාර්ගයේ ජිහාද් (ඉස්ලාමීය යුද්ධය) කිරීමටත් වඩා බෙහෙවින් නුඹලාට ප්‍රිය නම් අල්ලාහ් ඔහුගේ විනිශ්චය (නුඹලා වෙතට) ගෙනෙන තෙක් බලා සිටිනුයිද අල්ලාහ් දුෂ්ට ජනයා යහමඟට යොමු නොකරන්නේ යැයිද (නබි මුහම්මද්) කියනු. (අල්කුර්ආන්:09:24)

තවද:

තවද රසූල්වරුන් කෙරෙහි සාමය වේවා! (අල්කුර්ආන්:37:181)

උත්තරීතර අල්ලාහ් තම දූතයාණන් වන මුහම්මද් (සල්) තුමාණන් පිළිබඳ මෙසේ පවසයි:

(ඔහු එසේ කළේ) නුඹලා අල්ලාහ් සහ ඔහුගේ රසූල්වරයා කෙරෙහි විශ්වාසය තැබීමටත් ඔහු (රසූල්වරයා) ට උදව් කිරීමටත්, ඔහුට ගරු කිරීමටත් නුඹලා උදේ සවස ඔහු(අල්ලාහ්) සුපිවිතුරු කිරීමටත්ය. (අල්කුර්ආන්:48:09)

තවද උත්තරීතර අල්ලාහ් මෙසේ සඳහන් කරයි:

නියත වශයෙන්ම අල්ලාහ් ද ඔහුගේ මලායිකාවරුන් ද නබි කෙරෙහි සලවාත්

පවසන්නාහ. (එබැවින්) විශ්වාසවන්තයිනි! ඔබත් ඔහු කෙරෙහි සලවාත් පවසා සලාම්ද පවසමින් සිටිනු. (අල්කුර්ආන්:33:56)

නබි මුහම්මද් (සල්) තුමාණන් මෙසේ වදාලහ:

නුඹලාගෙන් කෙනෙකු සිය දෙමාපියන් හා දූදරුවන් ඇතුළු මුළු මිනිස් සමාජයට වඩා මා හට ආදරය නොකරන තෙක් සම්පූර්ණ ලෙස විශ්වාසය තහවුරු කරන්නෙකු නොවේ.[46]

46. මූලාශ්‍රය: බුහාරි හදීස් අංක 15/ මුස්ලිම් හදීස් අංක 44

# අවසන් දිනය පිළිබඳ විශ්වාසය

අවසන් දිනය පිළිබඳ විශ්වාසය යනු අල්ලාහ් විසින් මිනිසුන් මිනීවලවල්වලින් නැවත නැගිටුවනු ලැබූ පසු ඔවුන්ගේ ක්‍රියාවන් විනිශ්චය කර ස්වර්ගය හෝ අපාය ප්‍රතිඵලයක් ලෙස ලබා දෙන දිනයක් දක්වා මිනිසාට ඔහු අවකාශයක් ලබා දී ඇති බවට ස්ථිර ලෙස විශ්වාස කිරීමයි. උත්තරීතර අල්ලාහ් ශුද්ධ වූ අල්කුර්ආනයේ මෙසේ සඳහන් කරයි:

(අල්ලාහ්) ඔවුන් පමා කරනුයේ (භීතියෙන්) ඇස් උඩ හිඳෙන දිනය දක්වාය. (අල්කුර්ආන්:14:42)

තවද මෙසේ ප්‍රකාශ කරයි:

(මරණයෙන් පසු නියත වශයෙන්ම පණ දී) නැගිට්ටවනු නොලබන්නෙමු යැයි ප්‍රතික්ෂේප කරන්නන් ස්ථිර වශයෙන් අදහස් කරමින් සිටින්නාහ. (නබිවරය!) ඔබ මෙසේ පවසනු: “නොඑසේය! මගේ දෙවියන් මත දිවුරමින්! ඇත්තෙන්ම ඔබ නැගිට්ටවනු ලබන්නෙහුය. ඔබ කරමින් සිටි දැය ගැන පසුව ඔබ නියත වශයෙන්ම දැනුවත් කරනු ලබන්නෙහුය. මෙය (මෙසේ කිරීම) අල්ලාහ්ට ඉතාමත් පහසු දැයකි”. (අල්කුර්ආන්:64:07)

තවද:

විනිශ්චය කාලය සිදු වන දින, ඔවුන් (හොඳ අය, නපුරු අය යනුවෙන්) බෙදා වෙන් කර හරිනු ලබන්නෝය. නමුත් කවුරුන් විශ්වාසය තබා දැහැමි කාරණාවන් කරන්නෝද, ඔවුන් (පරලොව ස්වර්ගයෙහි ඇති) උසස් උයන් වතුවල සතුටින් ගැලී යාමට සලස්වනු ලබන්නෝය. කවුරුන් (අපව) ප්‍රතික්ෂේප කර, අපගේ ආයාවන්ද, පරලොව හමුවීමද බොරු කරන්නෝද, ඔවුන් (විනිශ්චය දිනදී) දඬුවම් දීමට ගෙන එනු ලබන්නෝය. (අල්කුර්ආන්: 30:14-16)

පහත සඳහන් කරුණු විශ්වාස කිරීමද එහි ඇතුළත් වේ:

## 1. මරණයට පසු සිදු වන දෑ පිළිබඳ විශ්වාස කිරීම.

මරණ ආසන්නයේ සිටින අවස්ථාවෙදී මලක් වරුන් දැක බලා ගැනීම හා මිනී වළෙහි මලක් වරුන් දෙදෙනෙකු ඇවිත් තම දෙවියන්, තම ආගම හා තම ධර්ම දූතයා පිළිබඳ ප්‍රශ්න විමසීම හා සොහොනෙහි වේදනාව හෝ සෞභාග්‍ය වැනි සොහොන් ජීවිතයේ සිදු වන ඇතැම් අර්බුධයන් මෙයින් අදහස් කෙරේ. උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි:

ප්‍රතික්ෂේප කරන්නන් (ගේ ආත්ම) දැන් පිළිස්සීමේ පීඩාවේ රස විඳිනුයි කියමින්

ඔවුන්ගේ මුහුණටට හා ඔවුන්ගේ උකුලට පහර දෙමින් මලක්වරුන් පැහැර ගෙන යන විට (එය කුමන ආකාර වේද යන්න) නුඹට දැකිය හැකි වූවා නම්. (අල්කුර්ආන්:08:50)

තවද මෙසේ ප්‍රකාශ කරයි:

එබැවින් ඔවුන් කළ කුමන්ත්‍රණයන්ගෙන් (රහසින් විශ්වාසය තබා තිබූ) ඔහුව අල්ලාහ් බේරා ගත්තේය. ෆිර්අව්න්ගේ ජනතාව නපුරු දඬුවමෙන් වට කර ගත්තේය. උදේ සවස ඔවුන් නිරා ගින්න බලා යනු ලබන්නාහ. (විනිශ්චය) කාලය සිදු වන දිනදී නම්, "ෆිර්අව්න්ගේ ජනතාව දරුණු දඬුවමෙහි ඇතුළු කරනු" (යයි කියනු ලැබේ). (අල්කුර්ආන්:40:45/46)

අනස් ඉබ්නු මාලික් (රළි) තුමාණන් නබි (සල්) තුමාණන් ප්‍රකාශ කළ බව මෙසේ වාර්තා කරයි:

නියත වශයෙන්ම කිසියම් පුද්ගලයෙකු මිය ගිය පසු ඔහුව මිනී වළෙහි තබා ඔහුගේ සහායකයියන් ඔහුගෙන් වෙන් වී ගිය පසු ඔවුන්ගේ පාදවල හඬ එම මිනිසා ශ්‍රවණය කරනු ඇත. පසුව මලක් වරුන් දෙදෙනෙකු ඔහු වෙත පැමිණ ඔහුව අසුන් ගන්වා ඔහුගෙන් මෙම මිනිසා වන මුහම්මද් (සල්) පිළිබඳ නුඹ කුමක් පවසන්නේද යනුවෙන් ප්‍රශ්න කරනු ඇත. ඔහු සැබෑ විශ්වාසවන්තයෙකු නම් එතුමා අල්ලාහ්ගේ සේවකයා හා ඔහුගේ දූතයා යනුවෙන් සාක්ෂි දරන්නෙමි යැයි පවසයි. පසුව ඔහුට මෙසේ කියනු ලැබේ: නුඹට හිමි වීමට තිබුණු අපායෙහි ලැගුම් ස්ථානය දෙස බලනු. නියත වශයෙන්ම අල්ලාහ් ඒ වෙනුවට ස්වර්ගයේ ලැගුම් ස්ථානයක් නුඹට හිමි කර දුන්නේය. එවිට එම මිනිසා එම ස්වර්ගය හා අපාය යන දෙකම දකිනු ඇත. මිනී වළෙහි සිටින පුද්ගලයා මුනාෆික් හෙවත් කුහකයකු හෝ කාෆිර් හෙවත් ප්‍රතික්ෂේපකයකු නම් ඔවුන්ගෙන්ද මෙම පුද්ගලයා පිළිබඳ නුඹ කුමක් පවසන්නේද යනුවෙන් විමසනු ලැබේ. ඔහු කවුරුන්දැයි මා නොදනිමි යනුවෙන් ඔහු ප්‍රකාශ කරනු ඇත. එමෙන්ම මිනිසුන් ඔහු පිළිබඳ කුමක් ප්‍රකාශ කරමින් සිටියේද එලෙසම මා ප්‍රකාශ කරමින් සිටියෙමි යැයිද ඔහු පවසයි. ඔබට කිසිදාක දැනගත නොහැකිය යනුවෙන් ඔහුට පවසනු ලැබේ. ඉන්පසු ඔහුට යකඩ මිටියක් මඟින් එක් වරක් පහර දෙනු ලැබේ. ජින් හා මිනිස් වර්ගයා හැර ඔහුට පිටුපසින් සිටින සියලු දෙනා එහි හඬට සවන් දෙනු ඇත.[47]

ඉබ්නු අබ්බාස් (රළි) තුමාණන් මෙසේ වාර්තා කරයි:

වරක් නබි (සල්) තුමාණන් මිනී වළවල් දෙකක් හරහා ගමන් කළේය. මෙහි සිටින පුද්ගලයින් දෙදෙනා දඬුවමට භාජනය වෙමින් සිටියි. ඔවුන් මහා පාපයක් හේතුවෙන් දඬුවමට භාජනය වී නැත. ඔවුන් අතුරින් කෙනෙකු මුත්‍රා කළ පසු පිරිසිදු නොකරමින් සිටියේය. අනෙකා කේළම් කියමින් සිටියේය යනුවෙන් පසවා නොවියළුණු රට ඉඳි අත්තක් දෙකට වෙන් කර ඔවුන් එකිනෙකාගේ මිනී වළ මත තැබීය. නබි (සල්) තුමාණන්ගේ සහගාමීන් ඔබ මෙසේ කළේ මන්දැ?යි විමසා සිටියෝය. එවිට නබි

47. මූලාශ්‍ර: බුහාරි හදීස් අංක 1374 / මුස්ලිම් හදීස් අංක 2870

(සල්) තුමාණන් ඒවා වියළී නොයන තාක්කල් ඔවුන් සඳහා දඬුවම ලිහිල් වීමට හැක යනුවෙන් ප්‍රකාශ කළේය.[48]

## 2. අවසන් දින පිළිබඳ හා එහි සළකුණු පිළිබඳ විශ්වාස කිරීම.

උත්තරීතර අල්ලාහ් ශුද්ධ වූ අල්කුර්ආනයේ මෙසේ සඳහන් කරයි:

සම්පූර්ණයෙන්ම සත්‍යය හා සාධාරණ වූ මෙම ධර්මය අල්ලාහ්ම පහළ කළේය. (නබිවරය, විනිශ්චය) කාලය ළඟා වී ඇත යන්න ඔබ දන්නෙහිද? එය විශ්වාස නොකළ අය, ඒ ගැන ('කවදා එන්නේද? කවදා එන්නේද?'යි) ඉක්මන් කරති. එහෙත් කවුරුන් (එය) විශ්වාස කරමින් සිටින්නෝද, ඔවුන් ඒ ගැන බිය වෙමින් සිටින අතර, නියත වශයෙන්ම එය (පැමිණීම) ඇත්ත යැයිද, (ස්ථීර වශයෙන්ම) දනිති. කවුරුන් (විනිශ්චය) කාලය ගැන සැක සිතන්නෝද, ඔවුන් නියත වශයෙන්ම ඉතාමත් ඈත එපිට දුර්මාර්ගයෙහිම සිටිති යන්න (නබිවරය ඔබ) දැන ගනු. (අල්කුර්ආන්: 42:17/18)

තවද:

මළවුන් කෙරෙන් නැගිටවනු ලබන දිනය ඔවුන් වෙත හදිසියේම එළැඹිය යුතු යැයි මිස ඔවුහු බලාපොරොත්තුවෙන් සිටිත්ද? එහි පෙරනිමිති දැනටමත් නියතවශයෙන් පැමිණ තිබේ. නමුත් එය ඔවුන් වෙත පැමිණි විට ඔවුනට අනුශාසනය පිළිගැනීමට කිසියම් අවස්ථාවක් තිබේද? (අල්කුර්ආන්:47:18)

නබි (සල්) තුමාණන් පැවසූ පහත සඳහන් කරුණුද අවසන් දිනයෙහි මහා සළකුණු අතුරින් වූවකි.

නියත වශයෙන්ම අවසන් දිනය වනාහි එයට පෙර සළකුණු දහයක් ඔබලා දකින තෙක් එය හට ගන්නේ නැත. ඒවා නම්: මහා දුමාරය, දජ්ජාල්, කතා කරන මෘගයා, බස්නාහිරෙන් හිරු උදා වීම, මර්යම්ගේ පුත් ඊසා පහළ වීම, යඃජූජ් මඃජූජ් සමූහය පැමණීම, සූර්ය ග්‍රහණ තුන: නැගෙනහිරෙන් පළමුවැන්න, බස්නාහිරෙන් දෙවැන්න හා අරාබි අර්ධද්වීපයෙන් තුන්වැන්න වේ. මෙයින් අවසන් සළකුණ නම් ර්'ස්වන තැනට ගෙන යන යේමනයේ ආරම්භ වන ගින්නකි.[49]

අවසන් දිනය සීඝ්‍රයෙන් පැමිණෙනු ඇත. උත්තරීතර අල්ලාහ් ශුද්ධ වූ අල්කුර්ආනයෙහි මෙසේ සඳහන් කරයි:

(නබි මුහම්මද්! මළවුන් කෙරෙන් නැගිටුවන) අන්තිම දිනය එළඹෙන්නේ කවදාද? (ඒ ජනයා) නුඹෙන් අසති. ඒ පිළිබඳ දැනුම ඇත්තේ මාගේ රබ්(පරමාධිපති)ට පමණි. එය සිදුවන නිසි කාලය ඔහු හැර අන් කවරකුට හෝ හෙළිදරව් කිරීමට නොහැකිය. එය (සිදුවන කාලය) අහස්වලට සහ මහපොළොවට ඉතා තදින් බලපායි. ක්ෂණිකයෙන් මිස එය නුඹලා වෙත නොපැමිණෙන්නේ යැයි පවසනු. නුඹ ඒ ගැන

48. මූලාශ්‍ර: බුහාරි හදීස් අංක 2127/ මුස්ලිම් හදීස් අංක 292

49. මූලාශ්‍රය: මුස්ලිම් හදීස් අංක 2901

ස්ථිරව දන්නකු මෙන් නුඹගෙන් ඔවුහු අසති. නියතවශයෙන්ම ඒ පිළිබඳ ඥානය අල්ලාහ් වෙතය. නමුත් මිනිසුන්ගෙන් බොහෝ දෙනෙක් එය නොදනිතියි (නබි මුහම්මද්) පවසනු. (අල්කුර්ආන්:07:187)

තවද මෙසේ පවසයි:

අහස්හි සහ මහපොළොවෙහි ගුප්ත(ඥානය) අල්ලාහ්ටය. අස්සාඅත්(විනිශ්චය දිනය එළැඹීමේ කාලය) ඇසපිය හෙළෙන සැනකින් හෝ ඊට වඩාත් සමීප (කාලයක්) මිස නැත. (අල්කුර්ආන්:16:77)

හොරණෑව පිඹීම මඟින් එදින එළඹෙනු ඇත.

සූර් (නමැති හොරණෑව කවදා හෝ) පිඹිනු ලැබුවහොත් අහස්හි සිටින්නන්ද, භූමියෙහි සිටින්නන්ද, - අල්ලාහ් අදහස් කරන්නන් හැර හුස්ම සිර වී (සිහිසන් වී මැරී වැටී) යන්නෙහුය. අනිත් වර සූර් පිඹිනු ලැබුවහොත් එවෙලේම ඔවුන් සියල්ලන්ම (පණ ලැබ්) නැගිට ඉදිරිය බලා සිටිනු ඇත. (අල්කුර්ආන්:39:68)

## 3. නැවත නැගිටුවීම පිළිබඳ විශ්වාස කිරීම.

උත්තරීතර අල්ලාහ් ඔහුගේ ගැත්තන් වන මිනී වළෙහි සිටින මිනිසුන් හට නැවත ජීවය ලබා දී නිරුවස්ත්‍රව, පාවහන් නොපැළඳ හා චර්ම ඡේදය නොකළ අයුරින් කිසිවක් නොමැතිව නැවත නැගිටු වනු ඇත යන්න මෙයින් අදහස් කෙරේ. මෙය සූර් නැමැති හොරණෑව දෙවන වතාවට පිඹීමෙන් පසුව සිදු වේ. ඒ පිළිබඳ අල්ලාහ් ශුද්ධ වූ අල්කුර්ආනයේ මෙසේ සඳහන් කරයි:

අනිත් වර සූර් පිඹිනු ලැබුවහොත් එවෙලේම ඔවුන් සියල්ලන්ම (පණ ලැබ්) නැගිට ඉදිරිය බලා සිටිනු ඇත. (අල්කුර්ආන්:39:68)

තවද මෙසේ සඳහන් කරයි:

අනතුරුව සූර් (හොරණෑව) පිඹිනු ලබයි. එවිට (තම) මිනිවලවලින් (නැගිට) තම රබ් (පරමාධිපති) වෙත ඔවුහු වේගයෙන් යති. (අල්කුර්ආන්:36:51)

නබි (සල්) තුමාණන් මෙසේ වදාළහ:

මළවුන් කෙරෙන් නැගිටුවීමේ දිනයෙහිදී, ජනතාව චර්මඡේදය නොකළ අයුරින් පාවහන් නොමැතිව හා නිර්වස්ත්‍රව රැස් කරනු ලැබේ.[50]

## 4. විනිශ්චය දිනයේ ප්‍රධාන අවස්ථාවන් පිළිබඳ විශ්වාස කිරීම.

උත්තරීතර අල්ලාහ් මෙසේ සඳහන් කරයි:

එදිනදී මිනිසුන් සියල්ලන්ම ලෝකයන්හි දෙවියන් ඉදිරියේ (විනිශ්චය සඳහා) සිටගෙන සිටිනු ඇත. (අල්කුර්ආන්: 83:06)

50. මූලාශ්‍රය: බුහාරි හදීස් අංක 3349/ මුස්ලිම් හදීස් අංක 2860

සියලු මිනිස් වර්ගයා දිගු කාලයක් සකළ ලෝ දෙවියන් ඉදිරියෙහි පෙනී සිටුනු ඇත. එහිදී කැඳවුම්කරුගේ කැඳවීමට ඔවුන් සවන් දෙනු ඇත. එවිට අල්ලාහ්ගේ බැල්ම අනාවරණය වේ. එමෙන්ම සූර්යයා ඔවුනට සමිප වනු ඇත. ඒ හේතුවෙන් ඔවුන් දහඩියෙන් ගිලෙනු ඇත. විශ්වාසවන්තයින් සඳහා හවුල් හෙවත් පොකුණ එහි ගෙන එනු ලැබේ. තවද එහිදී මිනිසාගේ සියළු කරුණු සටහන් කරන ලද ලේඛණයන් බෙදා හරිනු ලැබේ. තවද මිනිසුන්ගේ ක්‍රියාවන් කිරා බැලීම සඳහා තරාදීන් තබනු ලැබේ. එසේම සිරාත් හෙවත් පාලම පිහිටවනු ලැබේ. මේ සියල්ල බරපතල හා දුෂ්කර අවස්ථා වේ.

### 5. විනිශ්චය පිළිබඳ විශ්වාසය.

උත්තරීතර අල්ලාහ් මෙසේ සඳහන් කරයි:

නියත වශයෙන්ම අප වෙතමය ඔවුන්ගේ (මරණින් පසු) නැවත පැමිණීම (සිදු වනුයේ). (නැවත පැමිණීමෙන්) පසුව නියත වශයෙන්ම අප වගකීම වනුයේ ඔවුන් ප්‍රශ්න කිරීමය. (අල්කුර්ආන්:88:25)

තවද මෙසේ සඳහන් කරයි:

එබැවින් (එදිනදී) කවුරුන්ගේ දකුණු අතෙහි ඔහුගේ ක්‍රියාකාරම් සටහන ලබා දෙනු ලැබ ඇත්තේද, ඔහුගෙන් ඉතාමත් පහසුවෙන් ප්‍රශ්න විමසනු ලබන්නේය. (අල්කුර්ආන්:84:7-8)

තවද මෙසේ සඳහන් වේ:

එබැවින් කවරෙකු පරමාණුවක තරම් යහපතක් සිදු කර ඇත්ද ඔහු එය දැක ගනී. තවද කවරෙකු පරමාණුවක තරම් අයහපතක් සිදු කර ඇත්ද ඔහු එය(ද) දැක ගනී. (අල්කුර්ආන්:99:7-8)

තවද මෙසේ සඳහන් වේ:

කියාමත් (මළවුන් කෙරෙන් යළි නැගිටුවනු ලබන) දිනයේ අපි සාධාරණ තුලාවන් තබමු. එනිසා කිසිම කෙනෙකුට සුළුවෙන් හෝ වරදක් සිදු කරනු නොලැබේ. එය අබ ඇටයකට සමාන බරක් වුවද අපි එය ගෙන හැර පාන්නෙමු. තවද ගණන් ගැනීමට අප ප්‍රමාණවත්ය. (අල්කුර්ආන්:21:47)

## මනුෂ්‍ය වර්ගයාට අයත් විනිශ්චය වර්ග දෙකකි:

### 1. විශ්වාසවන්තයින්ගේ විනිශ්චය

එම විනිශ්චය හුදෙක් ඔවුන්ගේ ලේඛන ඉදිරිපත් කිරීමක් හා යම් සාකච්ඡාවක ස්වරූපයෙන් වනු ඇත. අල්ලාහ්ගේ පෙර ඥානයෙහි කවරෙකු යහපතෙකු ලෙස සටහන් වී තිබේද ඔහු සඳහා ලේඛන ඉදිරිපත් කිරීමක් සිදු වේ. ඉබ්නු උමර් (රළි) තුමාගේ හදීසය එය මෙසේ පැහැදිලි කරයි:

නියත වශයෙන්ම නබි (සල්) තුමාණන් වරක් මෙසේ ප්‍රකාශ කළේය: විශ්වාසවන්තයෙකු ගත් කළ අල්ලාහ් බෙහෙවින්ම සමීප වී ඔහුව ආවරණය කරනු ඇත. පසුව නුඹ කළ මෙම පාපය නුඹ දන්නෙහිද යනුවෙන් අල්ලාහ් ඔහුගෙන් විමසනු ඇත. එවිට ඔහු එසේය, මා එය දනිමි යනුවෙන් පවසනු ඇත. ඔහු තම සියළු පාපයන් පිළිගෙන තමන් විනාශයට පත් වනු ඇතැයි සිතනු ඇත. පසුව අල්ලාහ් ලෝකයෙහි මා නුඹගේ පාපයන් ආවරණය කර තැබුවෙමි. එසේම අද දින මා ඒවා ක්ෂමා කරන්නෙමි යනුවෙන් ඔහුට ප්‍රකාශ කර ඔහුගේ යහපත් කාර්ය සටහන් ලේඛනය ඔහුට භාර දෙනු ඇත.[51]

සාකච්ඡාවක් අයුරින් සිදු වන විනිශ්චය ගත් කළ ඒක දේවවාදය තහවුරු කළද මහා පාපයන් සිදු කළ උදවිය සඳහා මේ ආකාරයෙන් සිදු වේ. ඔවුන් අතුරින් කවරෙකුව අල්ලාහ් අභිමත කරන්නේද ඔහු කළ පාපයන් හේතුවෙන් දඬුවම් හිමි වන අතර එනමුත් (ඔහු දෙවියන් පිළිබඳ විශ්වාස කළ හේතුවෙන්) අවසාන වශයෙන් ඔහුට හිමිවන ස්ථානය ස්වර්ගය වේ. ඒ පිළිබඳ ආඉෂා (රළි) තුමිය නබි (සල්) තුමාණන් විසින් වාර්තා කරන පහත සඳහන් වාර්තාව එක් සාධකයකි.

අවසන් දිනයෙහි කවරෙකු හෝ විනිශ්චය කරනු ලබන්නේ නම්, ඔහු විනාශ වනවා මිස නැත යනුවෙන් නබි (සල්) තුමාණන් ප්‍රකාශ කළහ. එවිට මා අහෝ අල්ලාහ්ගේ දූතයාණනි! උත්තරීතර අල්ලාහ් මෙසේ පවසා නැතිද?

එබැවින් (එදිනදී) කවුරුන්ගේ දකුණු අතෙහි ඔහුගේ ක්‍රියාකාරම් සටහන ලබා දෙනු ලැබ ඇත්තේද, ඔහුගෙන් ඉතාමත් පහසුවෙන් ප්‍රශ්න ගණනය විමසනු ලබන්නේය. (අල්කුර්ආන්:84:07)

එවිට නබි (සල්) තුමාණන්: එය හුදෙක් ලේඛන ඉදිරිපත් කිරීමක් පමණි. විනිශ්චය දිනයෙහි කවරෙකු හෝ සාකච්ඡාවක ස්වරූපයෙන් විනිශ්චය කරනු ලබන්නේ නම් ඔහු දඬුවමට භාජනය වනු මිස නැත යනුවෙන් ප්‍රකාශ කළේය.[52]

## 2. කාෆිර් හෙවත් දේව ප්‍රතික්ෂේපකයින්ගේ විනිශ්චය.

මොවුන් සතුව කිසිඳු කුසලක් නොමැති හෙයින් මොවුන්ගේ කුසල් හා අකුසල් කිරා බැලීම මඟින් විනිශ්චය කරනු නොලබයි. උත්තරීතර අල්ලාහ් මෙසේ සඳහන් කරයි:

එවිට (මෙලොව) ඔවුන් කළ දෑ වෙත අපි යොමුවෙමු. තවද ඒවා විසුරුණු දූවිලි බවට පත් කරන්නෙමු. (අල්කුර්ආන්:25:23)

එසේ නම් විනිශ්චය සිදු වන්නේ ඔවුන් සිදු කළ ක්‍රියාවන් ඔප්පු කර පෙන්වනු ලබන ආකාරයෙනි. ඒවා ඔවුන් පිළිගැනීමට කැඳවනු ලැබේ. ඉබ්නු උමර් (රළි) තුමාණන් වාර්තා කරන හදීසයක මෙසේ සඳහන් වේ:

51. මූලාශ්‍ර: බුහාරි හදීස් අංක 2441/ මුස්ලිම් හදීස් අංක 2768

52. මූලාශ්‍රය: බුහාරි හදීස් අංක 6537/ මුස්ලිම් හදීස් අංක 2876

වංචනිකයින් හා ප්‍රතික්ෂේප කළවුන් ගත් කළ එදින මැවීම් සියල්ල ඉදිරියේ ඔවුන් කැඳවා පසුව මෙසේ පවසනු ලැබේ:

තමන්ගේ රබ්(පරමාධිපති) ගැන බොරු ගෙතුවන් මොවුන් යැයි සාක්ෂිකරුවෝ කියති. දැනගනු! අපරාධ කළවුනට අල්ලාහ්ගේ ශාපය වේවා! (අල්කුර්ආන්:11:18)

## 6. වේතනය ලබා දීම පිළිබඳ විශ්වාසය.

එනම් ස්වර්ගය හා අපාය කෙනෙකුට හිමි වීම යනු සත්‍ය බව විශ්වාස කිරීම වේ. ස්වර්ගය යනු තම දැහැමි ගැත්තන් සඳහා වේතනයක් ලෙස අල්ලාහ් සූදානම් කර ඇති නිවහනයි. එහි කිසිදු ඇසකින් දැක නැති, කිසිදු කණකින් මෙතෙක් අසා නොමැති, කිසිදු සිතකින් ග්‍රහනය නොකළ විවිධ භෞතික හා මානසික සැප පහසුව ඇත. අපාය යනු ප්‍රතික්ෂේපකළවුන් සඳහා වේතනයක් ලෙස අල්ලාහ් සූදානම් කර ඇති නිවහන වේ. එහිද විවිධ භෞතික හා මානසික දඬුවම් ඇත. උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි:

ඉන්පසු අපගේ ගැත්තන් අතුරින් අප තෝරා ගත් අයට (මෙම) ධර්ම ග්‍රන්ථය අපි උරුම කළෙමු. ඔවුන්ගෙන් ඇතැමෙක් තමන්ටම වරද කර ගත්තෝය. තවද ඔවුන්ගෙන් ඇතැමෙක් මධ්‍යම පිළිවෙත අනුගමනය කරන්නෝය. තවද ඔවුන්ගෙන් ඇතැමෙක් අල්ලාහ්ගේ අවසරය ඇතිව යහකම් හි පෙරමුණෙහි සිටින්නෝය. මෙය අතිමහත් වරප්‍රසාදයයි. ඔවුහු (සදාකාලිකවූ) ස්වර්ගයට පිවිසෙති. එහිදී ඔවුනට රන් ආභරණද මුතුද පළඳවනු ලබන්නෝය. එහි ඔවුන්ගේ වස්ත්‍ර මෘදු සේදය. තවද අපගෙන් දුක පළවා හැරිය අල්ලාහ්ටය සියලු ප්‍රසංශා. නියතවශයෙන්ම අපගේ රබ් (පරමාධිපති) සර්ව ක්ෂමාශීලීය. අති කෘතඥ යැයි ඔවුහු කියති. ඔහුගේ වරප්‍රසාදයෙන් සදාකාලික ගෘහයෙහි අප පදිංචි කළේ (ඔහුය) එහි අපට පරිශ්‍රමය නොවන්නේය. තවද එහි ආයාසයකුදු අපට නොවන්නේය.

ප්‍රතික්ෂේප කළවුනට නිරයේ ගින්න ඇත. මැරී මියැදෙන්නට ඔවුනට තීන්දු නොකරනු ලැබේ. තවද ඔවුනට එම (නිරයේ) දඬුවම සැහැල්ලු කරනු නොලැබේ. ප්‍රතික්ෂේප කරන්නන් සියලු දෙනාට එලෙසමය අප දඬුවම් දෙන්නේ. අපගේ රබ් (පරමාධිපතියාණෙනි,) අප කලින් කරමින් සිටි දෑට වඩා යහපත් දෑ කිරීම පිණිස අප මෙතැනින් නිදහස් කරනු මැනවයි ඔවුහු එහිදී විලාප නගති. අවවාදයක් පිළිපදින අයට එසේ කළ හැකි වන පරිදි, ප්‍රමාණවත් දීර්ඝ ජීවිත අපි නුඹලාට නොදුන්නෙමුද? තවද අනතුරු අඟවනන්නෙකු නුඹලා වෙත පැමිණියේය. එනිසා (දඬුවමේ) රස විඳිනු. පවුකාරයින්ට උදව් කරන්නෙක් නැත. (අල්කුර්ආන්:35:32-37)

# දිව්‍යමය නියමයන් පිළිබඳ විශ්වාසය

දෙවියන්, ඔහුගේ පරිපූර්ණ දැනුමෙන්, ඔහුගේ මැවීම් හි ඉරණම නියම කර ඇති අතර, එය සටහන් පොතෙහි සටහන් කර ඒවා තම අභිමතයට අනුව යොදවා ඒවා තම ශක්තියෙන් ප්‍රත්‍යක්ෂයට ගෙන එනු ඇත යනුවෙන් ස්ථිර ලෙස විශ්වාස කිරීම මෙයින් අදහස් කරනු ලැබේ. උත්තරීතර අල්ලාහ් මෙසේ පවසයි:

නියතවශයෙන් අපි සෑම දෙයක්ම නියමයක් අනුව මැව්වේමු. (අල්කුර්ආන්:54:49)

තවද මෙසේ පවසයි:

සෑම දෙයක්ම මවා ඊට ඉරණම නියම කළේ ඔහුය. (අල්කුර්ආන්:25:02)

දිව්‍යමය නියමයන් පිළිබඳ විශ්වාසය තුළ පහත සඳහන් කරුණුද ඇතුළත් වේ.

## 1.අල්ලාහ්ගේ නුවන පිළිබඳ විශ්වාසය

දෙවියන් අල්ලාහ්ගේ දැනුම යනු පරිපූර්ණ හා ස්ථිර ස්වභාවකින් යුත්තකි. එය සෑම දෙයක් පිළිබඳවම සම්පූර්ණ ව හා විස්තරාත්මක ව ආවරණය කරන්නකි. එය ජීවනෝපාය හෝ ආයු කාලය නිර්ණය කිරීම වැනි තමන් හා සම්බන්ධ ක්‍රියාවන් වුවද නැතහොත් ඔහුට අවනත වීම හෝ පාපයන් සිදු කිරීම වැනි ඔහුගේ ගැත්තන් හා සම්බන්ධ ක්‍රියාවන් වුවද ඒ සියල්ල ඔහුගේ දැනුම ආවරණය කරනු ඇත. උත්තරීතර අල්ලාහ් මෙසේ සඳහන් කරයි:

තවද ඔහු (අල්ලාහ්) සියලු දේ කෙරෙහිම සර්වඥ වන්නේය. (අල්කුර්ආන්:02:29)

මේ (සියල්ල) සර්ව බලධාරී හා සර්වප්‍රාඥයන්ගේ නියමය වේ. (අල්කුර්ආන්:06:96)

උත්තරීතර අල්ලාහ් තමන් හට අවනත වන හා අවනත නොවන උදවිය කවුරුන්ද යන්න පිළිබඳ මනා දැනුවත්ය. වයස් ගතවන කෙනෙකු වයස්ගත වන්නේ කෙසේද යන්නත් ඔහුගේ වයසින් යමක් අඩුවන්නේ කෙසේද යන්නත් අල්ලාහ් ඒ අයුරින්ම දැනුවත්ය.

## 2.දිව්‍යමය නියමයන් ලව්හුල් මහ්ෆූල් හෙවත් සටහන් පොතෙහි ලියා ඇති බව විශ්වාස කිරීම.

උත්තරීතර අල්ලාහ් ශුද්ධ වූ අල්කුර්ආනයේ මෙසේ සඳහන් කොට ඇත.

(සාමාන්‍යයෙන්) භූමියෙහි හෝ නැතහොත් (පෞද්ගලිකව) ඔබට හෝ ඇති විය හැකි කුමන අපහසුතාවයක් හෝ (පාඩුවක් හෝ) ඒවා අපි උත්පාදනය කිරීමට පෙරම (ලව්හුල් මව්ෆූල් නමැති) පොතෙහි (සටහන් කරනු) මිස නැත. නියත වශයෙන්ම මෙය අල්ලාහ්ට ඉතාමත් ලෙහෙසි දෙයකි!. (අල්කුර්ආන්:57:22)

තවද:

ඔහු ගුප්ත දැය සියල්ල දන්නෙකි. ඔහු නොදැනුවත් ව අහස්හි හෝ භූමියෙහි හෝ ඇති දැයෙන් එක් අනු ප්‍රමාණයක් හෝ බේරී යන්නේ නැත. ඊටත්වඩා කුඩා හෝ ලොකු හෝ (සෑම දැයක්ම ලව්හුල් මව්ෆූල් නමැති)පැහැදිලි (සටහන්) පුස්තකයෙහි සටහන් නොවී මිස නැත. (අල්කුර්ආන්:34:03)

අබ්දුල්ලාහ් ඉබ්නු අම්ර් ඉබ්නු ආස් (රළි) තුමා මෙසේ වාර්තා කරයි:

දෙවියන් අල්ලාහ් අහස් හා භූමිය නිර්මාණය කිරීමට අවුරුදු පනස් දහසකට පෙරම නිර්මාණයන්හි දෛවයන් සියල්ල සටහන් කළේය. එවිට ඔහුගේ අර්ෂය ජලය මත තිබුණි. [53]

උබාදාහ් ඉබ්නු සාමිත් (රළි) තුමා මෙසේ වාර්තා කරයි:

නියත වශයෙන්ම අල්ලාහ් ප්‍රථමයෙන් නිර්මාණ කළේ පෑනය. පසුව අල්ලාහ් එයට සටහන් කරන මෙන් අණ කළේය. එවිට මා කුමක් සටහන් කරන්නද යනුවෙන් එය විමසූ විට අවසන් දින දක්වා පැමිණෙන සියළු විෂයන්හි දෛවය සටහන් කරන මෙන් අල්ලාහ් එයට අණ කළේය. [54]

නුවන හා සටහන් කිරීම යන සංකල්ප දෙකම අල්ලාහ් එක් වාක්‍යයක එකට එකතු කර මෙසේ ශුද්ධ වූ අල්කුර්ආනයේ සඳහන් කරයි:

අහස්හී සහ මහපොළොවෙහි (සියලු) දෑ ගැන අල්ලාහ් දන්නේ යැයි නුඹ නොදන්නෙහිද? නියතවශයෙන්ම ඒ සියල්ල ග්‍රන්ථයෙහි(සටහන්)ය. නියතවශයෙන් එය අල්ලාහ්ට පහසුය. (අල්කුර්ආන්:22:70)

## 3.අල්ලාහ්ගේ ක්‍රියාත්මක වන අභිමතය පිළිබඳ විශ්වාසය.

අල්ලාහ් කුමක් අභිමත කරන්නේද එය සිදු වනු ඇති අතර ඔහු අභිමත නොකළ දෑ සිදු නොවනු ඇත. ඔහු ලබා දුන් දෑ වළක්වන කවරෙකු හෝ නොමැති අතර ඔහු වළක්වපු දෑ ලබා දීමටද කිසිවකු හෝ නොමැත. ඔහුගේ පාලනයෙහි ඔහු අභිමත නොකරන කරුණක් සිදු නොවන්නේය. ඔහුගේ කරුණාව හේතුවෙන් ඔහු අභිමත කළ අයට යහමඟ දෙනු ඇත. ඔහුගේ යුක්තිය හේතුවෙන් ඔහු අභිමත කළ අයව නොමඟ යවනු ඇත. ඔහුගේ තීන්දුව වෙනස් කරන්නෙකු නොමැත. උත්තරීතර අල්ලාහ් මෙසේ සඳහන් කරයි:

අල්ලාහ්ට අභිමත වූයේ නම්, ඔවුන්ට පැහැදිලි සංඥාවන් ආවායින් පසුවද ඔවුන් අතුරින් පසුව පැමිණි අය එකිනෙකාට විරුද්ධව සටන් නොකරගන්නෝය. එහෙත් ඔවුහු මතභේද වූහ. ඔවුනතුරින් පිරිසක් විශ්වාස කළහ. ඔවුනතුරින් තවත් පිරිසක්

53. මූලාශ්‍රය: මුස්ලිම් හදීස් අංක 2653

54. මූලාශ්‍රය: අබූ දාවූද් හදීස් අංක 4700/ අත් තිර්මිදි හදීස් අංක 2155

ප්‍රතික්ෂේප කළහ. අල්ලාහ්ට අභිමත වූයේ නම්, ඔවුන් (එකිනෙකා) ඇණ කොටා නොගනිති. නමුත් අල්ලාහ් (ඔහු) කැමති දේ කරයි. (අල්කුර්ආන්: 02:253)

තවද:

දෙවියන් වන අල්ලාහ් අදහස් කළහොත් මිස, ඔබ (හොඳ වැටහීමක් ලබා ගැනීමට) කැමති නොවන්නෙහුය. (අල්කුර්ආන්:81:29)

## 4. වස්තූන් සියල්ල අල්ලාහ් නිර්මාණය කළ බව විශ්වාස කිරීම:

ඒ අනුව අල්ලාහ් යනු මැවුම්කරු වන අතර ඔහු හැර අන් සියල්ල මැවීමට ලක් වූ ඒවා වේ. සෑම වස්තුවකටම අදාල ආකෘති හා ගුණාංග, ඒවායෙහි චලනයන් යනාදී සියල්ලම මැවීමට ලක් වූ ඒවා වේ. ඒවා සියල්ල නිර්මාණය කළේද අල්ලාහ්ය. උත්තරීතර අල්ලාහ් මෙසේ සඳහන් කරයි:

අල්ලාහ්ම සියලු වස්තූන් උත්පාදනය කළේය. ඔහුම සියල්ලෙහි ආරක්ෂකයාය. (අල්කුර්ආන්:39:62)

තවද:

නුඹලාද නුඹලා කරන දෑද මැව්වේ අල්ලාහ්ය. (අල්කුර්ආන්:37:96).

ගැත්තන්ගේ ක්‍රියාවන් සියල්ල මවන ලද්දේ අල්ලාහ් විසින් වන අතරම ඒවා සියල්ල ඔවුන් විසින් උපයාගත් ඒවා වේ. උත්තරීතර අල්ලාහ් මෙසේ සඳහන් කරයි:

(සෑම කෙනකුටම) ඔහු කරන හොඳ දෙය (සඳහා යහපත් ප්‍රතිඵල) ඔහුටය. ඔහු කරන නරක දේ (සඳහා අනිශ්ට විපාකද) ඔහුටමය. (අල්කුර්ආන්: 02:286).

## 5.අල්ලාහ්ගේ අභිමතය ඔහුගේ ආදරය මත පදනම් වන්නේ නැති බව විශ්වාස කිරීම.

ඇතැම් විට අල්ලාහ් ඔහුගේ සියුම් ඥානය හා යම් බලවත් අරමුණක් හේතුවෙන් තමන් ආදරය නොකරන දෑ අභිමත කර, තමන් අභිමත නොකරන දෑ ආදරයද කරනු ඇත. උත්තරීතර අල්ලාහ් මෙසේ සඳහන් කරයි:

අපි කැමති වී තිබුණේ නම්, (මොවුන්ගෙන් වූ) සෑම මිනිසෙකුටම ඍජු මාර්ගයෙහි යා හැකි බුද්ධිය දී ඇත්තෙමු. එහෙත් “ජින්වරුන්ගෙන්ද මිනිසුන්ගෙන්ද (වූ පාපතරයින්) සියල්ලන් මගින් නියත වශයෙන්ම මා නිරය පුරවන්නෙමි” යන මගේ පොරොන්දුව සත්‍ය වූවකි. (අල්කුර්ආන්:32:13)

තවද:

(ඔහුව) ඔබ ප්‍රතික්ෂේප කර දැමුවද, (ඔහුට කිසි පාඩුවක් නැත. මන්දයත්) නියත වශයෙන්ම අල්ලාහ් ඔබගේ අවශ්‍යතාවයක් නොමැත්තෙකු වශයෙන් සිටින්නේය.

එහෙත් තම වහලුන් (තමන්ව) ප්‍රතික්ෂේප කිරීම ඔහු කැමති වන්නේ නැත. ඔබ (ඔහුට) කෘතඥ වන්නෙහු නම්, ඔබ ගැන ඔහු තෘප්තියට පත් වන්නේය. (අල්කුර්ආන්: 39:07)

## 6.ආගම හා දිව්‍යමය නිර්නයන් අතර කිසිදු ඝට්ටනයක් නොමැති බව විශ්වාස කිරීම.

උත්තරීතර අල්ලාහ් මෙසේ සඳහන් කරයි:

නියත වශයෙන්ම ඔබලාගේ වෑයම් (ක්‍රියාවන්) විවිධාකාරය. එබැවින් (ඔබගෙන්) කවුරුන් දානමාන කර, (අල්ලාහ්ට) බිය වී (මෙම ධර්මයෙහි ඇති) හොඳ කාරණාවන්ද (හොඳ යයි) සත්‍යය කර තබන්නේද ඔහුට (ස්වර්ගයට අයත් ඍජු) මාර්ගය අපි පහසුවෙන් ලබා දෙන්නෙමු. කවුරුන් මසුරුකම් කර, (අල්ලාහ්වද) නොසලකා (මෙම ධර්මයෙහි ඇති) හොඳ කාරණාවන්ද බොරු කර තබන්නේද ඔහුට අමාරුකමට අයත් (නිරයෙහි) මාර්ගයම අපි පහසු කර තබන්නෙමු. (අල්කුර්ආන්:92:04-10)

කෙසේදයත්, ආගම හා එහි නීති විවෘත පොතක් වන නමුත් දිව්‍යමය නියමයන් ගුප්ත වූ දෙයකි. නියත වශයෙන්ම අල්ලාහ් ගැත්තන්ට අයත් නිර්ණයන් සියල්ල නිර්ණය කළ ඇති නමුත් ඔවුන්ගෙන් ඒවා සඟවා තබා ඇත. එමෙන්ම ඔවුනට අල්ලාහ් ආඥා දී තහනම් නියෝගද ගෙනහැර දැක්වීය. එමෙන්ම ඔහුගේ ආඥා පනත් ඉටු කිරීම සඳහාත් ඔහුගේ තහනම් නියෝග වලින් වැළකී කටයුතු කිරීම සඳහාත් ඔහු ඔවුන්ව සූදානම් කර ඔවුන්ට අවශ්‍ය දේ ලබා දුන්නේය. එවැනි නීති වලංගු වීමේ බාධාවන් අතුරින් යම් බාධාවක් ඔවුනට සිදු වූයේ නම් ඒවායින් ඔවුන්ව නිදහස් කර ඇත. එහෙයින් කවරෙකුට හෝ අල්ලාහ්ගේ පෙර නිර්ණය හේතු කොට ගෙන පාපයන් සිදු කිරීමට හෝ ආඥාවක් මඟ හැරීමට හෝ කිසිඳු සාක්ෂියක් නොමැත. උත්තරීතර අල්ලාහ් මෙසේ සඳහන් කරයි:

අල්ලාහ් අභිමත වේ නම් අපිද අපගේ මුතුන්මිත්තන්ද (අල්ලාහ්ට කිසිවක්) ආදේශ කර නොසිටිමු. තවද අපි කිසි දෙයක් තහනම් නොකර සිටිමු යැයි ආදේශ කරන්නන් කියනු ඇත. ඔවුනට පෙර විසූ අය අපගේ දඬුවම ඔවුන් විඳින තෙක් මෙසේම (සත්‍යය) බොරු යැයි කීවෝය. නුඹලා වෙත යම් දැනුමක් තිබේද එසේ නම් එය අපට හෙළි කරනු. නුඹලා සිතුවිලි මිස අනුගමනය නොකරන්නෙහුය. තවද නුඹලා බොරු නිගමනවලට එළැඹෙන්නන් මිස නැතැයි (නබි මුහම්මද්) පවසනු. තීරණාත්මක තර්කය අල්ලාහ්ටමය. අල්ලාහ්ට අභිමත වී නම් ඔහු නිසැකවම නුඹලා සියල්ලන්ටම මඟපෙන්වීම සලසනු ඇතැයි (නබි මුහම්මද් නුඹ) පවසනු. (අල්කුර්ආන්: 06:148-149)

මෙම වැකියෙහි අල්ලාහ් ආරම්භයෙන් ඔවුන්ගේ වාදය අසත්‍ය බව පැහැදිලි කළ පසු දෙවනුව ඔවුනට ඔහුගේ දඬුවම විඳවන්නට කටයුතු කළේය. ඒ අනුව එම සමාජයට අල්ලාහ්ගේ නිර්ණයන් විෂයෙහි යම් පිළිගත හැකි සාක්ෂියක් හෝ තිබුණේ නම් අල්ලාහ් ඔවුනට එසේ තම දඬුවම විඳවන්නට නොසලස්වයි. අල්ලාහ් ඔවුන්ගේ තර්කය තුළ අන්තර්ගත වූ අසත්‍යභාවය හෙළි කළේය. තෙවනුව ඔවුන්ගේ එම

තර්කය යම් සාක්ෂියක් මත පදනම් වීම සඳහා ඔවුන් තමන්ගේ තීර්ණයන් සටහන් වන ග්‍රන්ථ නිරීක්ෂණය කර ඒ නුවණ මඟින් තම තර්කයන් ගොඩ නැගුවේද නැත. එම තර්ක සියල්ල හුදෙක් මනඃකල්පිත කරුණු මත පදනම් වූ ඒවා මිස වෙනකක් නොවීය. සැබැවින්ම බලවත් සාක්ෂිය දෙවියන් අල්ලාහ්ගේ තර්කය සනාථ කරයි.

මෙම දිව්‍යමය නිර්ණයන් විෂයෙහි දෙපිරසක් නොමඟ ගියෝය. ඔවුන් පිළිබඳ පහත සඳහන් වේ:

## 1. කදරියියා වරුන්:

මොවුන් ගැත්තන්ගේ ක්‍රියාවන් ඔවුන් විසින්ම මවන ලද්දක් බව තහවුර කර පෙර දිව්‍යමයම නිර්ණයන් සියල්ල ප්‍රතික්ෂේප කරන්නන් වෙති. ඔවුන් වර්ග දෙකකි:

### 1. සීමාව ඉක්මවූවන්:

නබි (සල්) තුමාගේ අනුගාමිකයන්ගේ පරම්පරාවෙහි අවසාන භාගය තුළ පැමිණි කදරියියා වරුන්ගේ මුල්ම කණ්ඩායම මෙයයි. මොවුන් අල්ලාහ්ගේ නුවණ, සටහන් කිරීම, අභිමතය හා නිර්මාණය කිරීම යන විශේෂාංග ප්‍රතික්ෂේප කරති. මොවුනට ඉබ්නු අබ්බාස්, ඉබ්නු උමර් වැනි නබි (සල්) තුමාගේ අනුගාමිකයින් ප්‍රතිපිළිතුරු ලබා දුන්නෝය.

### 2. මධ්‍යස්ථවාදීන්:

අල්ලාහ්ගේ නුවණ හා සටහන් කිරීම යන ගුණාංග තහවුරු කර ඔහුගේ අභිමතය හා නිර්මාණය කිරීම යන ගුණාංගය ප්‍රතික්ෂේප කරන මුඃතzසිලා වරුන්. මිනිසා තම ක්‍රියාකාරකම් සියල්ල තමා විසින්ම මවා ගත් බව මොවුන් විශ්වාස කරති.

## 2. ජබරියියා වරුන්:

මොවුන් කවුරුන්දයත්: සියළු ක්‍රියාකාරකම් සිදු කරන්නේ අල්ලාහ් බව තහවුරු කිරීම විෂයෙහි සීමාව ඉක්මවා ගිය පිරිසයි. කෙතරම්දයත් මිනිසාට අභිමත කිරීමට හෝ යම් දෙයක් සිදු කිරීම සඳහා කිසිඳු හැකියාවක් හෝ නොමැති බව මොවුන් පවසති. සීතල අධික වීම හේතුවෙන් කෙනෙකුගේ ශරීරය වෙව්ලනවාක් මෙන් මිනිසාගෙන් සිදු වන ක්‍රියාකාරකම් සියල්ලද ස්ව කැමැත්තෙන් තොරව සිදු වන්නෙකි යනුවෙන් මොවුන් විශ්වාස කරති. දෙවියන් අල්ලාහ්ගේ ක්‍රියාවන් ඔහුගේ ප්‍රඥාව හා නිශ්චිත අරමුණක් මත පදනම් වූවක් යන විෂය ඔවුහු ප්‍රතික්ෂේප කරති. මොවුන් වර්ග දෙකකි:

### 1. සීමාව ඉක්මවූවන්:

මොවුන් වනාහි නොඇදහිලිකාරී සූෆිවරුන් වෙති. මිනිසා කරන ක්‍රියාවන් සියල්ල සාධාරණ බවත් දෙවියන්ගේ ආඥාවට අනුව එය සම්පූර්ණ ලෙස සිදු වන බවත් ඔවුන් කියා සිටිති. දෙවියන් අමතමින්, ඔවුන්ගේ ප්‍රමුඛ කවියන්ගෙන් එක් අයෙකු

මෙසේ පවසයි:

ඔබ මා වෙනුවෙන් තෝරාගත් දෙය මා කරමින් සිටිමි. එබැවින්, මා කරන ඕනෑම දෙයක් ඔබට කීකරු වීමකි. '

2. මධ්‍යස්ථවාදීන්:

මොවුන් කවුරුන්ද යත් "උපයා ගැනීම" යන න්‍යායට අනුග්‍රහය දක්වන අෂ්අරියියා වරුන් වේ. මොවුන් මිනිසාට හැකියාවක් තිබෙන බව පිළිගන්නා නමුත් එමගින් කිසිදු බලපෑමක් නැති බව පවසති.

ආගමික ග්‍රන්ථ සහ සැබෑ ජීවිතය පැහැදිලිව පෙන්නුම් කරන සාක්ෂි මගින් මෙම කණ්ඩායම් දෙකම වැරදි බව පැහැදිලි වේ:

1. දිව්‍යමය නිර්ණයන්හි තරාතිරම් සතර වන අල්ලාහ්ගේ නුවණ, සටහන් කිරීම, ඔහුගේ අභිමතය හා නිර්මාණය කිරීම යනාදී ගුණාංග ප්‍රතික්ෂේප කරන්නන් ගත් කළ, එම ගුණාංග සනාථ කරමින් පැමිණෙන ආගමික පෙළපොත් වලට එරෙහිව ඔවුන්ගේ මත වාදය ගොඩ නැඟී ඇත. එපමණක්ද නොව, යම් පුද්ගලයෙකු යම් දෙයක් කිරීමට අදහස් කරයි නම් එසේ කිරීමෙන් ඇතැම් විට ඔහු වළක්වනු ලැබේ යන්න සැබෑ ජීවිතය තුළින් ඉදිරිපත් කළ හැකි එක් කදිම නිදසුනකි.

2. හුදෙක් දිව්‍යමය නිර්ණයන් පමණක් තහවුරු කරන සීමාව ඉක්මවා කටයුතු කරන ජබරියියාවරුන් ගත් කළ, මිනිසාගේ කැමැත්ත සහ ක්‍රියාවන් සනාථ කරමින් පැමිණෙන ආගමික පෙළපොත් වලට එරෙහිව ඔවුන්ගේ මත වාදය ගොඩ නැඟී ඇත. එපමණක්ද නොව, මිනිසා ස්වෙච්ඡාවෙන් කරන ක්‍රියාවන් අතර හා ඔහුගේ කිසිදු සහභාගිත්වයකින් තොරව සිදුවන ක්‍රියාවන් අතර ඇති වෙනස් කර බැලීම යනු සැබෑ ජීවිතය තුළින් ඉදිරිපත් කළ හැකි උදාහරණයකි. එමෙන්ම අල්ලාහ්ගේ ක්‍රියාවන් සඳහා හේතුවක් හා යම් අරමුණක් තිබෙන බව ආගමික පෙළපොත් තහවුරු කරයි.

# අල්කුර්ආනය

අල්කුර්ආනය යනු අල්ලාහ්ගේ වදන වේ. උත්තරීතර අල්ලාහ් ශුද්ධ වූ අල්කුර්ආනයේ මෙසේ සඳහන් කරයි:

මුෂ්රික්වරුන්(ආදේශ තබන්නන්)ගෙන් කෙනකු නුඹගෙන් ආරක්ෂාව පතනවා නම්, ඔහු අල්ලාහ්ගේ වදන්ට සවන් දෙන තුරු ඔහුට ආරක්ෂාව සලසා දෙනු. ඉන්පසුව ඔහුගේ ආරක්ෂක ස්ථානය වෙත ඔහුව ගෙන යනු. මන්දයත් ඔවුන් නියත වශයෙන්ම (සත්‍යය) නොදන්නා ජනයින් වන නිසාය. (අල්කුර්ආන්:09:06)

වන්දනා සමයේදී අරාබි ගෝත්‍ර ආමන්ත්‍රණය කළ අවස්ථාවේදී, නබි තුමාණන් ඔවුන්ගෙන් මෙසේ ඇසුවේය: මාගේ ජනයා වෙත මා ගෙන යාමට කිසිවෙකු හෝ නැතිද? නියත වශයෙන්ම කුරෙයිෂි වරුන් මාගේ පරමාධිපතිගේ වදන ඔවුනට දන්වා සිටීමෙන් මා වළක්වා ඇත. [55]

අල්කුර්ආනය, එහි අක්ෂර, වචන සහ අර්ථ සියල්ල සැබැවින්ම උත්තරීතර අල්ලාහ්ගේ වදන්ය. එය ජීවීන්ගේ කථාවට හා වදනට සම නොවන අතර නිර්මාණය නොකරන ලද, ඉහළින් පහළ කරන ලද වදනකි. ප්‍රථමයෙන් දෙවියන් කතා කර ඉන්පසු එය දේව දූත ජිබ්රීල් වෙත දන්වා ඉන්පසු ඔහු එය මුහම්මද් (සල්) තුමාගේ හදවතට ගෙනැවිත් කොටස් කොටස් වශයෙන් ලබා දුන්නේය. පසුව එය ජනයා වෙත මුහම්මද් (සල්) තුමාණන් කියවා පෙන්වීය. උත්තරීතර අල්ලාහ් මෙසේ සඳහන් කරයි:

කුර්ආනය අපි කොටස් කළෙමු, නුඹ එය ජනයාට ක්‍රමක්‍රමයෙන් පාරායනය කරනු පිණිස, තවද අපි එය කඩින් කඩ පහළ කළෙමු. (අල්කුර්ආනය:17:106)

එම අල්කුර්ආනය ජනයා පාරායනය කිරීම මඟින් හෝ එය ග්‍රන්ථ වල ලියා තැබීම මඟින් හෝ හදවත් තුළ එය පාඩම් කර ගැනීම මඟින් හෝ එම අල්කුර්ආනය අල්ලාහ්ගේ සැබෑ වදන යන ස්ථාවරයෙන් බැහැර වන්නේ නැත. මන්දයත් යථාර්ථයෙන් වදනක් සම්බන්ධ කරනු ලබන්නේ එය ප්‍රථමයෙන් ප්‍රකාශ කළ තැනැත්තා සමඟ මිස එය දන්වන්නා සමඟ නොවේ. ක්‍රියාව යනු එය පාරායනය කරන්නාට, ලේඛකයාට හා මතක තබා ගත් තැනැත්තාට අදාල වන නමුත් එම වචන දෙවියන් අල්ලාහ් සතුය. උත්තරීතර අල්ලාහ් මෙසේ සඳහන් කරයි:

විශ්වාස කරන අය තහවුරු කිරීමටද ඍජු මාර්ගයක් ලෙසද (අල්ලාහ්ට) අවනතවන අයට ශුභාරංචියක් ලෙසද නුඹගේ රබ්(පරමාධිපති)ගෙන් රූහුල් කුද්ස්(පිවිතුරු ආත්මය)එය සත්‍යය සමග (නුඹ වෙත) පහළ කළේ යැයි (නබි මුහම්මද්) කියනු.

55. මූලාශ්‍ර: අහ්මද් හදීස් අංක 15192/ අබූ දාවූද් හදීස් අංක 4734/ තිර්මිදී හදීස් අංක 2825/ නසාඊ හදීස් අංක 7680/ ඉබ්නු මාජාහ් හදීස් අංක 201

ඔහුට එය(අල්-කුර්ආනය) උගන්වන්නේ මිනිසෙකුම යැයි ඔවුහු ප්‍රකාශ කරන වග අපි නියත වශයෙන්ම දනිමු. ඔවුන් එසේ ආරෝපණය කරන ඔහුගේ භාෂාව පරදේශීය. එනමුත් මෙය(අල්-කුර්ආනය) පැහැදිලි අරාබි භාෂාවෙන්ය. (අල්කුර්ආන්: 16:102-103)

සැබැවින්ම උත්තරීතර අල්ලාහ් එම අල්කුර්ආනය මිනිසෙකු වෙත සම්බන්ධ කරන්නන් ප්‍රතික්ෂේපකයන් බවට පත් කර ඇති අතර ඔවුනට කුරිරු අපාය හිමි වන බව සපත කරයි: ඒ පිළිබඳ අල්ලාහ් මෙසේ පවසයි:

එබැවින් මා ඔහුව නිරයෙහි වීසි කර දමන්නෙමි. (අල්කුර්ආන්:74:26)

අල්කුර්ආන් විෂයෙහි දෙපිරිසක් නොමඟ ගියෝය. ඔවුන් පිළිබඳ විස්තර පහත දැක්වේ:

## 1. ජහමියියා වරුන් හා මුඃතzසිලා වරුන්

මොවුන් අල්ලාහ්ගේ වදන් ඇතුළුව ඔහුට අයත් ගුණාංග ප්‍රතික්ෂේප කරන උදවිය වේ. අල්ලාහ් වෙත කථා කිරීම යන ගුණාංගය සම්බන්ධ කිරීම යනු අල්ලාහ්ගේ ගැත්තා, අල්ලාහ්ගේ නිවහන, අල්ලාහ්ගේ ඔටුවා යැයි පවසන අයුරින් මැවීමට ලක් වූ දෙයක් මැවුම්කරු වෙත සම්බන්ධ කිරීමට අයත් භාවිතාවක් මිස එම ගුණාංගය ඔහු වෙතට සම්බන්ධ කිරීමක් නොවේ යනුවෙන් ඔවුන් විශ්වාස කරති.

ඔවුන්ගේ එම වාදය සඳහා ප්‍රතිඋත්තර:

අල්ලාහ් වෙත සම්බන්ධ කරනු ලබන දෙය වර්ග දෙකකි.

පළමුවැන්න: ස්වාධීනව නැගී සිටිමට හැකි යම් වස්තුවක් අල්ලාහ් වෙත සම්බන්ධ කිරීම. මෙමඟින් මැවීමට ලක් වූ දෑ මැවුම්කරු වෙත සම්බන්ධ කිරීමක් සිදු වේ.

දෙවැන්න: ස්වාධීනව නැගී සිටීමට නොහැකි ජීවය, ශ්‍රවනය කිරීම, දැකීම, අවබෝධය කිරීම හා කතා කිරීම වැනි යම් ගුණාංගයක් අල්ලාහ් වෙත සම්බන්ධ කිරීම. මෙමඟින්ද එම ගුණාංගය එම ගුණාංගය මඟින් පිරිපුන් කෙනෙකු වෙත සම්බන්ධ කරනු ලැබේ. එපමණක්ද නොව ඔවුන් ගොඩ නැඟූ එම තර්කය සහමුලින්ම අල්කුර්ආනයට, නබි (සල්) තුමාගේ ජීවන මඟට හා ඉජ්මා හෙවත් විද්වතුන්ගේ ඒකමතික තීන්දුවටද පටහැනිය.

## 2. අල්කුල්ලාබියියාහ්, අල්අෂ්අරීයියා, අල්මාතුරූදීයියා මතවාදයට අයත් උදවීන්.

දෙවියන් අල්ලාහ් කතා කළ වචනයේ අර්ථය දෙවියන් සමගම සැමදා පසු වූ බවත් අක්ෂර හා ශබ්දය එම අර්ථය ප්‍රකාශ කිරීමට හෝ අනුමාන කිරීම සඳහා නිර්මාණය කර ඇති එක් නිර්මාණයක් බවත් මොවුන් පවසති.

මේ අනුව, අල්ලාහ්ගේ වදන යනු ශබ්දයක් හෝ අක්ෂරයක් නොව එහි අර්ථය

සඳහා පමණක් සීමා කරන ලද්දකි යනුවෙන් මොවුන් විශ්වාස කරති. තවද ස්වර්ගයේ ආදම් හා ඒවා සවන් දුන් දෑ, ගසක් අසල මූසා සවන් දුන් දෑ අල්ලාහ්ගේ වදන නොව නිර්මාණය කිරීමට ලක් වූ දෙයක් ලෙස මොවුන් පත් කරති.

ඔවුන්ගේ එම වාදය සඳහා ප්‍රතිඋත්තර:

නියත වශයෙන්ම වදනක් යනු ඒ සඳහා අර්ථයක්, ශබ්දයක් හා අක්ෂර ද තිබිය යුතුයි. හුදෙක් මනස තුළ ඇති වන දෑ සඳහා වදනක් යනුවෙන් කියනු නොලැබේ. එමෙන්ම ඔවුන් ගොඩ නැගූ එම තර්කය සහමුලින්ම අල්කුර්ආනයට, නබි (සල්) තුමාගේ ජීවන මඟට හා ඉජ්මා හෙවත් විද්වතුන්ගේ ඒකමතික තීන්දුවටද පටහැනිය.

# අල්ලාහ්ව දර්ශනය කිරීම

අල්ලාහ් පිළිබඳ හා අවසන් දිනය පිළිබඳ විශ්වාස කිරීම යන සංකල්පය තුළ විශ්වාසවන්තයින් ඔවුන්ගේ පරමාධිපති වන අල්ලාහ්ව එදින තම පියවී ඇසෙන් විවෘතව අවස්ථාවන් දෙකකදී දැක ගනු ඇත යන්නද අන්තර්ගත වේ.

**පළමුවැනි අවස්ථාව:**

විනිශ්චය කරනු ලබන අවස්ථාවන්හිදී ඔවුන් අල්ලාහ්ව දකිනු ඇත.

**දෙවැනි අවස්ථාව:**

ඔවුන් ස්වර්ගයට ඇතුල් වූ පසු.

ඒ පිළිබඳ උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි:

එදින ඇතැම් මුහුණු ඉතාමත් සතුටින් පිරී ඒවා බවට (පත් වී) තමන්ගේ දෙවියන් දෙස බලන්නන් වශයෙන්ම (දීප්තිමත්ව) තිබෙණු ඇත. (අල්කුර්ආන:75:22/23)

තවද මෙසේ පවසයි:

(ආකර්ශණීය ඇතිරිලි මගින් අලංකාරමත් කළ) යහන් මත සිට (අල්ලාහ්ව) නරඹමින් සිටිති. (අල්කුර්ආන:83: 23)

තවද:

යහපත කරන අයට (ඵලවිපාක) පින්ය! (ඔවුන් කළ දැයට වඩා) අධික වශයෙන්ද ලැබෙනු ඇත. (අල්කුර්ආන:10: 26)

අධික වශයෙන් ලැබෙනු ඇත යන්නෙහි අර්ථ විවරණය අල්ලාහ්ගේ මුහුණ දැක බලා ගැනීම වේ යනුවෙන් නබි (සල්) තුමාණන් පැහැදිලි කළේය.[56]

නබි (සල්) තුමාණන් වරක් පූර්ණ චන්ද්‍රයා දෙස බලමින් මෙම චන්ද්‍රයාව නුඹලා දකිනවාක් මෙන් නුඹලාගේ පරමාධිපතිවද මතුවට දකිනු ඇත. ඔහුව දැකීම සඳහා නුඹලාට කිසිදු බාධාවක් ඇති නොවේ.[57]

අල්ලාහ්ව දර්ශනය කිරීම යන සංකල්පය අවබෝධ කර ගැනීමේ විෂයෙහි දෙපිරිසක් නොමඟ ගියහ.

ඔවුන් පිළිබඳ විස්තර පහත සඳහන් වේ:

56. මූලාශ්‍රය: මුස්ලිම් හදීස් අංක 181. තවද තෆ්සීර් තබරී බලන්න (12:155)

57. මූලාශ්‍රය: බුහාරි හදීස් අංක 554/ මුස්ලිම් හදීස් අංක 633

## 1.අල්ලාහ්ගේ ගුණාංග ප්‍රතික්ෂේප කරන ජහමියියා වරුන් හා මුඃතසිzලා වරුන් හා ඔවුනට සමාන වූ රාෆිලා හා ඉබාළියියා වරුන්.

ඔවුන් අල්ලාහ්ව දැක ගැනීම යන සංකල්පය ප්‍රතික්ෂේප කරති. මෙම මතය සඳහා පහත සඳහන් අල්ලාහ් මූසා (අලෛයිහිස් සලාම්) තුමාට ප්‍රකාශ කළ අල්කුර්ආන් වැකිය සාක්ෂියක් ලෙස උපුටා දක්වති.

ඔබට කිසිදා මා දැකිය නොහැක. (අල්කුර්ආන්:07:143)

ඔවුන් සාක්ෂියක් ලෙස උපුටා දක්වන තවත් වදනක් නම්:

(කිසිදු) දෘෂ්ඨිය(න්) ඔහු ග්‍රහණය නොකරයි. (අල්කුර්ආන්:06:103)

ඔවුන්ගේ එම වාදය සඳහා ප්‍රතිඋත්තර:

ඔබට කිසිදා මා දැකිය නොහැක. (අල්කුර්ආන්: 07:143) යන වදනෙන් අදහස් කරනු ලබන්නේ එතුමාගේ ඉල්ලීම පරිදි මෙම ලෝකයේදී ඔහුව දැක ගැනීමට නොහැකි බවයි. දැකිය නොහැක යන්නෙන් මතු ලොවේද සදා දැක ගැනීමට නොහැකි බව අදහස් නොකෙරේ.

ග්‍රහණය නොකරයි යන්නෙන් ඔහුව දැක ගැනීමට නොහැකි බව අදහස් නොකෙරේ. මන්දයත් අපට හිරු, සඳු, කඳු ආදී දෑ ග්‍රහණය කළ නොහැකි නමුත් ඒවා දැකිය හැකි වන්නේ කෙසේද එසේම අල්ලාහ්ව ග්‍රහණය කළ නොහැකි නමුත් ඔහුව දැක ගත හැක.

එමෙන්ම, අල්ලාහ්ව දැක ගත හැකි බව තහවුරු කරන සාධකයන් රාශියක් අල්කුර්ආන් හා නබි (සල්) තුමාගේ ජීවන මඟෙහි ඇත.

## 2.මිථ්‍යා සූෆි වරුන් හා නූතන කණ්ඩායම්.

මොවුන් වනාහි අල්ලාහ්ව දැක ගැනීම යන සංකල්පය තහවුරු කිරීම විෂයෙහි සීමාව ඉක්මවා ගිය අය වෙති. එම සංකල්පය මෙම ලෝකයේදීද ඔවුන් අව්ලියාවරුන් (දැහැමි පුද්ගලයින්) ලෙස ගත් උදවිය සඳහා සිදු විය හැකි බව පවසති. ඒ සඳහා ගොතන ලද නබි වදන් රාශියක්ද ඔවුන් වාර්තා කරති. එනමුත් නබි (සල්) තුමාණන් මෙසේ වර්තා කර ඇත: නුඹලා මරණයට පත් වන තෙක් නුඹලාගේ පරමාධිපති වන අල්ලාහ්ව දැක ගන්නේ නැත.[58]

58. මූලාශ්‍ර: අහ්මද්: හදීස් අංක 22864 /නසාඊ හදීස් අංක 7716/ අල් ආජුරි (රහ්) තුමාණන් ෂරීආ යන ග්‍රන්ථයෙහි 881 වෙනි අංකය යටතේ වාර්තා කරයි.

# ඊමාන් හෙවත් දේව විශ්වාසයෙහි යථාර්ථය

## 1.ඊමාන් හෙවත් දේව විශ්වාසය යනු ප්‍රකාශය හා ක්‍රියාව යන විෂයන් දෙකම එහි අන්තර්ගත වේ.

ප්‍රකාශය මඟින් මානසික හා වාචික ප්‍රකාශය අදහස් කරනු ලැබෙන අතර ක්‍රියාවෙන් මානසික, වාචික හා ශාරීරික අවයවයන්හි ක්‍රියාව අදහස් කරනු ලැබේ.

ඒ අනුව:

* මානසික ප්‍රකාශය යනු: එමඟින් විශ්වාස කිරීම, සත්‍ය බව තහවුරු කිරීම හා පිළිගැනීම වේ.

* වාචික ප්‍රකාශය යනු: ඉස්ලාම්හි පණිවිඩය මුවෙන් ප්‍රකාශ කිරීම හා සාක්ෂීන් දෙක පිළිබඳ දැනුවත් කිරීම.

* මානසික ක්‍රියාව යනු: අල්ලාහ්ට ආදරය කිරීම, ඔහුට බිය වීම, අපේක්ෂා කිරීම හා ඔහු මත බාර කිරීම වැනි චේතනාවන් හා අපේක්ෂාවන් වැනි සිතෙන් සිදු වන කරුණු.

* වාචික ක්‍රියාව යනු: අල්කුර්ආන් පාරායනය, මෙනෙහි කිරීම් හා දුආ ප්‍රාර්ථනා කිරීම් වැනි ප්‍රකාශයට පත් කරන කරුණු වේ.

* ශාරීරික අවයවයන්හි ක්‍රියාව යනු: ශාරීරක වත්පිළිවෙත් මාර්ගයෙන් ශරීරය හා සම්බන්ධ කරුණු වේ.

උත්තරීතර අල්ලාහ් ශුද්ධ වූ අල්කුර්ආනයේ මෙසේ සඳහන් කරයි:

(සැබෑ) මුඃමීන්වරු(විශ්වාසිකයා)න් කවරෙකු නම්, අල්ලාහ් ගැන සඳහන් කරන සෑම විටකම ඔවුන්ගේ සිත් බියෙන් වෙවුළයි. ඔහු(අල්ලාහ්)ගේ ආයාත්(වදන්) ඔවුනට පාරායනය කරනු ලබන විට එය ඔවුන්ගේ විශ්වාසය වැඩි කරවයි. තවද ඔවුහු (සියලු කටයුතු) තම රබ්(පරමාධිපති) කෙරෙහි බාර කරති. ඔවුහු සලාතය තහවුරු කරති. අප ඔවුනට පිරිනමා ඇති දෙයින් (අප මාර්ගයේ) වියදම් කරති. සැබෑ මුඃමීන්වරු නියතවශයෙන් ම ඔවුහුමය. ඔවුනට තම රබ්(පරමාධිපති) වෙත උසස් තරාතිරම්ද සමාවද, උදාර අවශ්‍යතා සැපයීමද ඇත. (අල්කුර්ආන්:08:02-04)

තවද මෙසේ සඳහන් වේ:

සැබෑ විශ්වාසවන්තයින් වන්නේ අල්ලාහ් සහ ඔහුගේ රසූල්වරයා විශ්වාස කර, ඉන්පසුව (ඒ ගැන) සැක නොකර තම ධනයෙන්ද තම දිරියෙන්ද අල්ලාහ්ගේ මාර්ගයේ සටන් කළ අයයි. ඔවුහුමය සත්‍යවාදීහු. (අල්කුර්ආන්:49:15)

නබි (සල්) තුමාණන් මෙසේ වදාලහ:

ඊමානය යනු ඒ සඳහා ශාකාවන් හැත්තෑවක් - හෝ හැටක්- ඇත. ඒවා අතුරින් ඉතා විශිෂ්ට දෑ වන්නේ නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර අන් කිසිවෙකු නොමැත යන ප්‍රකාශයයි. ඒවා අතුරින් ඉතා බාලම දෑ වන්නේ මාර්ගයේ ඇති අවහිර කරන දෑ ඉවත් කිරීමයි. ලැජ්ජාවද විශ්වාසයෙන් එක් ශාකාවකි. [59]

ඊමාන් හෙවත් විශ්වාසය යනු ක්‍රියාව සහ ප්‍රකාශය යන සංකල්ප යුවල මඟින් බැඳුනු යථාර්ථයකි. එමෙන්ම එය ක්‍රියාව හා ප්‍රකාශය අනිවාර්ය කරන එක් සත්‍ය ප්‍රකාශයකි. ඒ අනුව එම විශ්වාසයෙහි ක්‍රියාව හා ප්‍රකාශය පහ වී යාම මඟින් සත්‍ය ප්‍රකාශයද පහ වී යනු ඇත.

**2.ඊමාන් යන පදය හා ඉස්ලාම් යන පදය තුළ සම්පූර්ණ දහම යන අර්ථය ගම්‍ය වේ. එනමුත් ඒ පද එකට සඳහන් කරනු ලබන විට ඊමාන් යන පදයෙන් අභ්‍යන්තර විශ්වාසය සහ ඉස්ලාම් යන පදයෙන් බාහිර ක්‍රියාකලාපයන් යන අර්ථයන් ගම්‍ය වේ.**

ඒ අනුව මූඃමින් වූ සියල්ලන්ම මුස්ලිම් වන අතර මුස්ලිම් වූ සියල්ලන්ම මූඃමින් වරයෙකු වන්නේ නැත. උත්තරීතර අල්ලාහ් මෙසේ සඳහන් කරයි:

අපි විශ්වාස කළෙමු'යි කාන්තාර අරාබිවරු කියති. නුඹලා විශ්වාස කර නැත. නමුත් අපි අවනත වූයෙමු යැයි කියනු. විශ්වාසය තාමත් නුඹලාගේ හදවත් තුළට පිවිස නැත. නුඹලාගේ අල්ලාහ්ටත් ඔහුගේ රසූල්වරයාටත් කීකරු වනවා නම්, ඔහු නුඹලාගේ කටයුතුවලට (අදාළ තිළිණයෙන්) කිසිවක් අඩු නොකරනු ඇත. අල්ලාහ් නියතවශයෙන්ම සර්ව ක්ෂමාශීලීය. අසමසම කරුණාන්විත යැයි (නබි මුහම්මද්) කියනු. (අල්කුර්ආන්:49:14)

**3.විශ්වාසය යනු අඩු වැඩි වීමේ ස්වභාවයෙන් යුත්තකි.**

විශ්වාසය දියුණු කරවන සාධක කිහිපයක් පහත දැක් වේ.

* අල්ලාහ් පිළිබඳ අවබෝධ කර ගැනීම
* ඔහුගේ විශ්වීය සංඥාවන් පිළිබඳ සිතීම.
* ඔහුගේ ධාර්මික සංඥාවන් පිළිබඳ අධ්‍යනය කිරීම.
* කුසල් සිදු කිරීම.
* අකුසලින් ඉවත් වීම.

විශ්වාසය අඩු කරවන සාධක කිහිපයක් පහත දැක් වේ:

* අල්ලාහ් පිළිබඳ අනවබෝධයෙන් පසු වීම.
* ඔහුගේ විශ්වීය සංඥාවන් පිළිබඳ නොසිතීම

59. මූලාශ්‍ර: බුහාරි හදීස් අංක 9/ මුස්ලිම් හදීස් අංක 35

* ඔහුගේ ධාර්මික සංඥාවන් වලට පිටුපෑම.
* කුසල් හිමි කර දෙන යහපත් දෑ අපතේ යැවීම.
* අකුසල් සිදු කිරීමට ධෛර්යමත් වීම.

විශ්වාසය අඩු වැඩි වන බව හඟවන අල්කුර්ආන් වැකි කිහිපයක් පහත දැක් වේ.

1. (සැබෑ) මුඃමීන්වරු(විශ්වාසිකයා)න් කවරකු නම්, අල්ලාහ් ගැන සඳහන් කරන සෑම විටකම ඔවුන්ගේ සිත් බියෙන් වෙවුළයි. ඔහු(අල්ලාහ්)ගේ ආයාත්(වදන්) ඔවුනට පාරායනය කරනු ලබන විට එය ඔවුන්ගේ විශ්වාසය වැඩි කරවයි. තවද ඔවුහු (සියලු කටයුතු) තම රබ්(පරමාධිපති) කෙරෙහි බාර කරති. (අල්කුර්ආන්:08:02)
2. (අලුතින්) සූරතයක් පහළ වන සෑම විටෙකම ඔවුන්ගෙන් සමහරෙක් (මුස්ලිම්වරුන්ගෙන්-සමච්චලයට) මේ නිසා නුඹලා අතුරින් කවරකුගේ විශ්වාසය වැඩි වුනාදැ?යි විමසති. නියත වශයෙන්ම විශ්වාසිකයින්ගේ විශ්වාසය එමගින් වැඩි විය. තවද ඔවුහු සතුටටද පත් වූහ. (අල්කුර්ආන්:09:124)
3. ඔවුන් විශ්වාසය සමඟ (තව තවත්) විශ්වාසය වැඩි කරනු පිණිස මුඃමීන්වරුන්ගේ සිත තුළට සැනසීම පහළ කළේ ඔහුය. (අල්කුර්ආන්: 48:04)

### 4.විශ්වාසය යන සංකල්පය තුළ විවිධ අදියරයන් ඇත. එහි විශේෂාංග කිහි-පයක් එහි ඇති අනෙකුත් විශේෂාංග වලට වඩා ඉකා උසස් ය.

නබි (සල්) තුමාණන් මෙසේ පවසා ඇත:

ඊමානය යනු ඒ සඳහා ශාඛාවන් හැත්තෑවක් - හෝ හැටක්- ඇත. ඒවා අතුරින් ඉතා විශිෂ්ට දෑ වන්නේ නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර අන් කිසිවෙකු නොමැත යන ප්‍රකාශයයි. ඒවා අතුරින් ඉතා බාලම දෑ වන්නේ මාර්ගයේ ඇති අවහිර කරන දෑ ඉවත් කිරීමයි. ලැජ්ජාවද විශ්වාසයෙන් එක් ශාඛාවකි.[60]

### 5.විශ්වාසවන්තයින්ද එම විශ්වාසය යන සංකල්පය තුළ විවිධ අදියරයන් මත පසු වෙති.

ඔවුන් අතුරින් ඇතැම් උදවියගේ විශ්වාසයේ ස්ථාවරය අනෙකුත් උදවියගේ විශ්වාසයේ ස්ථාවරයට වඩා පරිපූර්ණ වනු ඇත. ඒ පිළිබඳ අල්ලාහ් මෙසේ සඳහන් කර ඇත:

ඉන්පසු අපගේ ගැත්තන් අතුරින් අප තෝරා ගත් අයට (මෙම) ධර්ම ග්‍රන්ථය අපි උරුම කළෙමු. ඔවුන්ගෙන් ඇතැමෙක් තමන්ටම වරද කර ගත්තෝය. තවද ඔවුන්ගෙන් ඇතැමෙක් මධ්‍යම පිළිවෙත අනුගමනය කරන්නෝය. තවද ඔවුන්ගෙන් ඇතැමෙක් අල්ලාහ්ගේ අවසරය ඇතිව යහකම් හි පෙරමුණෙහි සිටින්නෝය. මෙය අතිමහත්

60. මූලාශ්‍ර: බුහාරි හදීස් අංක 9/ මුස්ලිම් හදීස් අංක 35

වරප්‍රසාදයයි. (අල්කුර්ආන්: 35:32)

නබි (සල්) තුමාණන් මෙසේ ප්‍රකාශ කොට ඇත:

විශ්වාසවන්තයින් අතුරින් පරිපූර්ණමත් විශ්වාසවන්තයා කවරෙකුද යත් ඔවුන් අතරින් යහපත් ගුණධර්ම වලින් අලංකාරමත් වූ පුද්ගලයා වේ.[61]

ඒ අනුව කවරෙකු ඉස්ලාමයේ සාක්ෂි දෙකෙහි අර්ථය මනා ලෙස විශ්වාස කර ඒවායෙහි ගැබ් වී ඇති අරමුණ සමඟ බැඳී සිටින්නේද ඔහු විශ්වාසයේ මූල බීජය නිරූපණය කරනු ඇත. කවරෙකු දහම තුළ අනිවාර්ය වූ දෑ ඉටු කර තහනම් කොට ඇති දැයින් ඉවත් ව කටයුතු කරන්නේද ඔහු අනිවාර්ය විශ්වාසය නිරූපණය කරනු ඇත. කවරෙකු දහම තුළ අනිවාර්ය වූ දෑ හා අනිවාර්ය නොවූ වෛකල්පිත දෑ ඉටු කර තවද තහනම් කොට ඇති දැයින් හා පිළිකුල් දැයින් ඉවත් ව කටයුතු කරන්නේද ඔහු පරිපූර්ණ විශ්වාසය නිරූපණය කරනු ඇත.

## 6.විශ්වාසය සමඟ ව්‍යතිරේක යෙදුමක් ඇතුළත් කිරීම.

එනම් ඉන්ෂා අල්ලාහ් (අල්ලාහ් අභිමත කළේ නම්) මා මූඃමින්වරයෙකු වෙමි යනුවෙන් ප්‍රකාශ කිරීමයි. මේ සඳහා ස්ථාවරයන් තුනක් තිබේ:

* පළමුවැන්න:

  විශ්වාසය කෙරෙහි යම් සැකයක් ඇතුව මේ ආකාරයෙන් පැවසුවේ නම්, මෙසේ ව්‍යතිරේක යෙදුමක් යෙදීම හරාම් වේ. එපමණක්ද නොව එය තවත් ආකාරයකින් කුෆ්ර් හෙවත් දේව ප්‍රතික්ෂේපයකි. මන්දයත් විශ්වාසය යනු සැකයෙන් තොර වූ නිශ්චිත ලෙස තිබිය යුත්තකි.

* දෙවැන්න:

  එසේ තමා විශ්වාසවන්තයෙකු යැයි පැවසීම යනු තමා විසින්ම තම ආත්මය පරිශුද්ධ කිරීමක් යැයි බියවී පරිපූර්ණ හා අනිවාර්ය විශ්වාසය සාක්ෂාත් කර ගැනීමේ අරමුණින් එසේ පවසන්නේ නම්, එය අනිවාර්ය ලෙස සිදු විය යුතු කාර්යයකි.

* තෙවැන්න:

  ඉන්ෂා අල්ලාහ් යන පදයෙන් යම් අභිවෘධියක් බලාපොරොත්තු වේ නම්, එසේ ඉන්ෂා අල්ලාහ් යැයි කීමට අනුමැතිය ඇත.

## 7.සාමාන්‍යයෙන් මහා පාපයක් හෝ කුඩා පාපයක් සිදු කිරීම මඟින් විශ්වාසය යන ස්වභාවය පහ වී නොයයි.

එනමුත් විශ්වාසයේ මූල බීජය ඉතිරිව තිබෙනු ඇති අතර එම විශ්වාසයේ යම්

61. මූලාශ්‍ර: අහ්මද් හදීස් අංක 7402 /අබූ දාවූද් හදීස් අංක 4682 / තිර්මිදි වැකි අංක 1162

අඩුවීමක් සිදු වේ. ඒ අනුව මහා පාපයක් සිදු කරන්නා වනාහි විශ්වාසය අඩු වී ගිය විශ්වාසවන්තයෙකි. එසේම ඔහුගේ විශ්වාසය මුල් කර ගෙන ඔහු විශ්වාස වන්තයකු වන අතර ඔහු කළ පාපය හේතුවෙන් ඔහු පව්කාරයෙකු ද වනු ඇත. තවද එම පාපය මඟින් මෙම ලොවේදී ඔහු දහමින් බැහැර නොයන අතර මතු ලොවෙහි සදා අපායෙහි පසු වන්නේද නැත. එනමුත් අල්ලාහ්ගේ අභිමතය යටතෙහි ඔහු පසු වේ. අල්ලාහ් අභිමත කළේ නම් ඔහුගේ දයාව මඟින් ඔහුට සමාව ලබා දී ස්වර්ගයට ඇතුල් කරනු ඇත. එසේත් නැතිනම් ඔහුගේ පාපයෙහි තත්වයට අනුව දඬුවම් ලබා දී අවසාන වශයෙන් ඔහුගේ නිවහන ලෙස ස්වර්ගය පත් කරයි. එසේත් නැතිනම් ඔහු කළ පාපයන් අතුරින් සුළු ප්‍රමාණයක් සඳහා දඬුවම් ලබා දී මැදිහත්කරුවන් විසින් කරනු ලබන මැදිහත්වීම මඟින් හෝ දයාවන්තයින් අතුරින් අතිමහත් දයාවන්තයා වන ඔහුගේ දයාව මඟින් අපායෙන් බැහැර කරනු ලබයි. ඒ පිළිබඳ උත්තරීතර අල්ලාහ් මෙසේ සඳහන් කරයි:

නියත වශයෙන්ම අල්ලාහ් ඔහුට කිසිවක් ආදේශ කිරීම (ෂිර්ක්) ක්ෂමා නොකරන්නේය. ඔහුට අභිමත වූ අයට (ෂිර්ක් හැර) අන් දෙය ක්ෂමා කරන්නේය. අල්ලාහ්ට ආදේශ කරන්නන් කවරෙක් වුවද ඔහු සැබැවින්ම මහ පාපයක් ගොතා ඉතා බරපතලම පාපය කරන්නා වෙයි. (අල්කුර්ආන්:04:48)

නබි (සල්) තුමාණන් මෙසේ ප්‍රකාශ කර ඇත: ස්වර්ග වාසීන් ස්වර්ගයට ඇතුල් වනු ඇත. අපා වාසීන් අපායට ඇතුල් වනු ඇත. පසුව අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි: අබ ඇටයක ප්‍රමාණයක් තරම් විශ්වාසයක් කවරෙකුගේ සිතෙහි තිබුණේද ඔහුව නරකාදියෙන් බැහැර කරනු. පසුව කළුවී ගිය ඔවුන් නරකාදියෙන් බැහැර කර අල් හයාත් හෙවත් ජීවන ගඟක දමනු ලැබේ.[62]

තවද නබි (සල්) තුමාණන් මෙසේ ප්‍රකාශ කොට ඇත.

නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර අන් කිසිවෙකු නැති බව ප්‍රකාශ කළ පුද්ගලයාගේ සිතෙහි බාර්ලි ධාන්‍යක තරම් යහපතක් තිබේද ඔහු අපායෙන් බැහැර වනු ඇත. නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර අන් කිසිවෙකු නැති බව ප්‍රකාශ කළ පුද්ගලයාගේ සිතෙහි තිරිඟු ධාන්‍යක තරම් යහපතක් තිබේද ඔහු අපායෙන් බැහැර වනු ඇත. නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර අන් කිසිවෙකු නැති බව ප්‍රකාශ කළ පුදගලයාගේ සිතෙහි ඉරිඟු ධාන්‍යක තරම් යහපතක් තිබේද ඔහු අපායෙන් බැහැර වනු ඇත.[63]

62. මූලාශ්‍රය: බුහාරි හදීස් අංක 22

63. මූලාශ්‍රය: බුහාරි හදීස් අංක 44. වෙනත් වාර්තාවක යහපත යන ස්ථානයට විශ්වාසය යන පදය භාවිතා වී ඇත.

## විශ්වාසය අඩුවැඩි වීම යන සංකල්පය විෂයෙහි දෙපිරිසක් නොමඟ ගියහ

### 1.අල්වර්දියියාහ්:

මොවුන් වනාහි දෙවියන්ගේ අනතුරු ඇඟවීම් ක්‍රියාත්මක වනු ඇති බව හා අල්ලාහ්ව ඒකියත්වයට පත් කළ උදවිය අතරින් මහා පාපයන් සිදු කළ පුද්ගලයින් වෙනුවෙන් මැදිහත්වීමක් සිදු නොවන බව ප්‍රකාශ කරන්නන් වේ. මොවුන් වර්ග දෙකකි.

1. හවාරිජ්වරුන්:

මහා පාපයන් සිදු කරන්නා විශ්වාසයෙන් බැහැර වී දේව ප්‍රතික්ෂේපයට ඇතුල් වනු ඇත යනුවෙන් හා එම පුද්ගලයා මෙම ලෝකයෙහි කාෆිර් වරයෙකු වන අතර මතු ලොවෙහි සදා අපාගත ජීවිතයක් ගත කරනු ඇත යනුවෙන් මොවුන් පවසති.

2. මුඃතzසිලාවරුන්:

මහා පාපයක් සිදු කරන්නාගේ ස්ථාවරය යනු ඔහු විශ්වාසයෙන් බැහැර වුවද කුෆ්ර් හෙවත් දේව ප්‍රතික්ෂේපයට ඔහු ඇතුල් නොවනු ඇත. ඔහු මෙම ලෝකයේ මුඃමින්වරයෙකු හෝ කාෆිර්වරයෙකු නොවන අතර ඒ දෙක අතරමැද ඔහු සිටින බව ඔවුන් පවසති. එනමුත් ඔහු මතු ලොවෙහි අපායෙහි සදා රැඳී සිටුනු ඇත.

අල්වර්දියියා වරුන් විසින් ගොඩ නඟන ලද මතය සඳහා ප්‍රතිඋත්තර:

පළමුවැන්න: නියත වශයෙන්ම උත්තරීතර අල්ලාහ් මහා පාපයක් සිදු කරන්නාගේ විශ්වාසය හා ඊමානීය සහෘදත්වය මේ ලෝකයේ ඔහු සඳහා තහවුරු කර ඇත. ඒ පිළිබඳ පහත සඳහන් අල්කුර්ආනය පාඨයේ පැහැදිලිව සඳහන් වේ:

විශ්වාසවන්තයිනි, මිනිමැරුම් සම්බන්ධයෙන් පළිගැනීම (නීතිය) නුඹලාට පනවා ඇත්තේය. නිදහස් මිනිසකු (මැරූ) නිදහස් මිනිසාද වහලකු (මැරූ) වහලාද ගැහැණියක (මැරූ) ගැහැණියද (ඝාතනය කළ යුතු වන්නේය. ) එහෙත් (පීඩාවට පත්) ඔහුගේ සොහොයුරා (එනම් ලේ ඥාතීන්) විසින් ඔහු(මිනීමරුවා)ට බුරුලක් දක්වන්නට කැමැත්තේ නම් යුක්ති සහගතව (නිර්නය වූ වන්දිය) ඔහුට ඉටු කරමින් යහපත අනුගමනය කරන්න. (අල්කුර්ආන්:02:178)

මෙම අල්කුර්ආන් වැකියෙහි ඝාතනය කළ තැනැත්තා ඝාතනය කිරීමට ලක් වූ තැනැත්තාගේ සාහෝදරයෙකු බව අල්ලාහ් සඳහන් කරයි. එමෙන්ම පහත සඳහන් වාක්‍යයෙහිද මෙසේ සඳහන් වේ:

විශ්වාසිකයින් අතුරින් දෙපක්ෂයක් එකිනෙකා සමග සටන් කෙරෙත් නම් ඔවුන් දෙගොල්ලන් අතර සමගිය ඇති කරනු. දෙපක්ෂයෙන් එක් පක්ෂයක් සීමාව ඉක්මවා යන්නේ නම්, අල්ලාහ්ගේ අණට කීකරු වනතුරු සීමාව ඉක්මවා ඇති පක්ෂයට විරුද්ධව සටන් කරනු. ඉන්පසුව ආපසු (ඍජු මඟට) පැමිණෙයි නම් ඔවුන් දෙගොල්ලන් අතර සමගිය ඇති කරනු. තවද යුක්තිය ඉටු කරනු. නියතවශයෙන්

යුක්තිය ඉටු කරන අය අල්ලාහ් ප්‍රිය කරයි. මුඃමින්වරු එකිනෙකාට සහෝදරයෝ වෙති. එනිසා නුඹලාගේ සහෝදරයින් අතර සම්භන්ධතාවය තහවුරු කරනු. නුඹලාට දයාලුභාවය ලැබෙනු පිණිස අල්ලාහ්ට බියබැතිමත් වනු. (අල්කුර්ආන්:49:09)

මෙම වාක්‍ය තුළ උත්තරීතර අල්ලාහ් සටන් කරන දෙපිරිස ඊමානය වෙත සම්බන්ධ කර ඇති අතර ඔවුන් සඳහා ඊමානයේ සහෘදත්වයද ස්ථාපිත කර ඇත.

දෙවැන්න: ෂිර්ක් හෙවත් සමානයන් උපකල්පනය කිරීම යන පාපය හැර අල්ලාහ් අභිමත කරන උදවිය සඳහා ඔහු සමාව දෙනු ඇත. දේව විශ්වාසය යම් ධාන්‍යයක බරට වඩා අඩුවෙන් පසු වූ කල්හිද ඔහුව අපායෙන් බැහැර කරනු ඇත. ඒ පිළිබඳ නබි වදන් රාශියක් වාර්තා වීද ඇත.

## 2.මුර්ජිආවරුන්:

මොවුන් විශ්වාසයේ යථාර්ථය හා එහි හැඳින්වීම තුළ ක්‍රියාව යන සංකල්පය අන්තර්ගත නොවන බව පවසන්නන් වේ. මොවුන් විවිධ කණ්ඩායම් වෙති:

1. අල් ජහමියියාවරුන්: විශ්වාසය යනු සිතෙන් සත්‍ය බව තහවුරු කිරීම හෝ සිතෙන් අවබෝධ කිරීම වේ යනුවෙන් පවසති. කුෆ්ර් හෙවත් දේව ප්‍රතික්ෂේපය සමඟ යම් කුසලක් ප්‍රයෝජනවත් නොවන්නේ කෙසේද එසේම දේව විශ්වාසය සමඟද යම් අකුසලක් ප්‍රයෝජනවත් නොවනු ඇත යනුවෙන් මොවුන් විශ්වාස කරති.

2. අල්කර්රාමියියාහ් වරුන්: විශ්වාසය යනු හුදෙක් වාචික ප්‍රකාශයක් පමණි යනුවෙන් විශ්වාස කරති.

3. මෙම කණ්ඩායම් වලට අයත් විද්වතුන්: විශ්වාසය යනු සිතෙන් සත්‍ය බව තහවුරු කර වාචිකව එය ප්‍රකාශ කිරීම පමණකි යනුවෙන් මොවුන් විශ්වාස කරති. ක්‍රියාවන් ගත් කළ ඊමානයේ යථාර්ථය හා එහි සීමාව තුළ අන්තරගත නොවේ. එම ක්‍රියාවන් එම විශ්වාසයෙහි ඵල වේ යනුවෙන් මොවුන් පසවති.

මොවුන් සඳහා ප්‍රතිඋත්තර:

1. නියත වශයෙන්ම අල්ලාහ් ක්‍රියාවන් සඳහා ඊමාන් යනුවෙන් සඳහන් කොට ඇත. සලාතය සඳහා දිශාව වෙනස් කිරීමට පෙර බයිතුල් මක්දිස් වෙත හැරී සලාතය කළ උදවිය පිළිබඳ අල්ලාහ් මෙසේ සඳහන් කරයි:

   නුඹලාගේ විශ්වාසය එනම් සලාතය අල්ලාහ් අපතේ නොයවනු ඇත. (අල්කුර්ආන්: 02:143)

2. නබි (සල්) තුමාණන් කෙනෙකු බරපතළ පාපයක් සිදු කිරීමේදී ඔහු කුෆ්ර් හෙවත් දේව ප්‍රතික්ෂේපයට අදාල නොවන බව හා සාමාන්‍යය විශ්වාසයෙන් ඔහු බැහැරව කටයුතු කරන බව මෙසේ දන්වා සිටියි:

> කෙනෙකු දුරාචාරයේ යෙදෙන විට ඔහු මූඃමින් වරයෙකු වශයෙන් දුරාචාරයේ නොයෙදෙයි. තවද කෙනෙකු සොරකම් කරන විට ඔහු මූඃමින් වරයෙකු වශයෙන් ඔහු සොරකම් නොකරයි. කෙනෙකු මත්පැන් පානය කරන විට ඔහු මූඃමින් වරයෙකු වශයෙන් මත්පැන් පානය නොකරයි. මිනිසුන් ඉතා අගය කරන වටිනාකමින් යුතු යමක් කෙනෙකු පැහැර ගන්නා විට ඔහු මූඃමින් වරයෙකු වශයෙන් පැහැර නොගනී.[64]

මෙම කණ්ඩායම් දෙවර්ගය මෙවන් විකෘතිමත් අදහසක් ගොඩ නැගීමේ ප්‍රභවය නම් විශ්වාසය යනු එක් විෂයක් හේතුවෙන් එකී විෂය සම්පූර්ණයෙන්ම පැවතිය යුතුයි නැතහොත් එය සම්පූර්ණයෙන්ම නොපැවතිය යුතුයි යනුවෙන් ඔවුන් විශ්වාස කරති.

මුර්ජිආවරුන් ගත් කළ ඔවුන් විශ්වාසය යනු කිසිඳු ක්‍රියාවක් නොකර මානසිකව හෝ වාචිකව එසේත් නැතිනම් ඒ දෙකින්ම ස්ථිර ලෙස තහවුරු කිරීම වේ යනුවෙන් විශ්වාස කරති. මෙමඟින් මොවුන් විශ්වාසයේ වැදගත් අංග නොසලකා හරිනු ඇත.

වඊදියියාවරුන් ගත් කළ ඔවුන් මහා පාපයන් අතුරින් සාධාරණ පාපයන් කළද එමඟින් විශ්වාසය පහ වී යන බව ප්‍රකාශ කරති. මෙමඟින් මොවුන් විශ්වාසය පිළිබඳ සීමාව ඉක්මවා යන්නන් වෙති. මෙම කණ්ඩායම් දෙකෙහිම ප්‍රවිශ්ටය එකක් වූ නමුත් ඔවුන් විවිධ නිගමනවලට එළැඹ ඇත.

64. මූලාශ්‍ර: බුහාරි හදීස් අංක 2475/ මුස්ලිම් හදීස් අංක 57

# නායකත්වය සහ සමාජය

මුස්ලිම්වරු ඒකීය සමූහයකි. පහත සඳහන් කරුණු මඟින් මිස ඔවුන්ගේ කටයුතු නිවැරදි කර ගැනීමටත් ඔවුන්ගේ මෙහෙයුම ඉටු කිරීමටත් නොහැකි වනු ඇත.

## 1.නායකයා ඉදිරියේ බයිඅත් හෙවත් දිවුරුම ප්‍රකාශ කර සිටීම.

නබි (සල්) තුමාණන් මෙසේ ප්‍රකාශ කොට ඇත: කවරෙකු දිවුරුම් නොදී මිය යන්නේද ඔහු අඥාන යුගයක මරණයක් මෙන් මිය යන්නේය.[65]

## 2.පාලකයාට සවන් දී කීකරු වීම.

ඔහු භක්තිවන්තයෙකු වුවද නැතහොත් නපුරෙකු වුවද හජ් ඉටු කිරීම, ජුම්ආ සලාතයන් හා අවුරුදු සලාතයන් වැනි ආගමික වතාවත් ඔහු සමඟ ඉටු කිරීම අනිවාර්ය වේ. තවද ඔවුනට අවංක උපදෙස් ලබා දීම හා යම් ආරවුලක් සිදු වූයේ නම් දෙවියන් අල්ලාහ්ගේ ග්‍රන්ථය වන අල්කුර්ආනය හා නබි (සල්) තුමාගේ ජීවන මඟ වෙත යොමු වීම. උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි:

විශ්වාසවන්තයිනි! අල්ලාහ්ට කීකරු වනු. තවද රසූල්(ධර්ම දූත)වරයාටද නුඹලා අතුරින් බලතල පවරා ඇති අයටද කීකරු වනු. ඉක්බිති යමක් පිළිබඳව යම් මතභේදයක් නුඹලා අතර පැන නැගුණහොත් නුඹලා සත්‍ය වශයෙන්ම අල්ලාහ් සහ පරමාන්ත දිනය විශ්වාස කරන්නේ නම්, එම (ආරවුල) අල්ලාහ් සහ රසූල්(ධර්ම දූත)වරයා වෙත යොමු කරනු. මෙයයි ඉතා හොඳ මාර්ගය. (අවසානය සලකන විට) ප්‍රසංශනීය මාර්ගයද එයයි. (අල්කුර්ආන්: 04:59)

නබි (සල්) තුමාණන් මෙසේ ප්‍රකාශ කොට ඇත:

මුස්ලිම්වරයෙකු ඔහුට කැමති හෝ අකැමති දෑ හි (පාලකයාට) කීකරු වීම අනිවාර්යය වේ. එනමුත් පාපයක් සිදු කරන මෙන් අණ කළේ නම් මිස. එසේ අණ කළේ නම් කීකරු වීම අනිවාර්යය නොවේ.[66]

තවද නබි (සල්) තුමාණන් මෙසේ ප්‍රකාශ කොට ඇත:

(පාලකයාට) කීකරු වීමෙන් තමාව ඉවත් කර ගන්නා අවසන් දිනයෙහි ඔහු සඳහා කිසිඳු සාධකයක් නොමැතිව අල්ලාහ්ව හමු වනු ඇත.[67]

65. මූලාශ්‍රය: මුස්ලිම් හදීස් අංක 1751
66. මූලාශ්‍රය: බුහාරි හදීස් අංක 7144/ මුස්ලිම් හදීස් අංක 1739
67. මූලාශ්‍රය:මුස්ලිම් හදීස් අංක 1851

## 3.පාලකයන්ට එරෙහිව පෙළ ගැසීම සහ විරෝධය පෑම තහනම් ය.

ඔවුන් අපරාධයන් සිදු කළ ද එසේ ඔවුනට එරෙහිව පෙළ ගැසීම තහනම් ය. එනමුත් පාලකයන් විසින් කුෆ්ර් හෙවත් දේව ප්‍රතික්ෂේපය හා සම්බන්ධ ක්‍රියාවක් සිදු වන්නේ නම්, එවිට අල්ලාහ් ඉදිරියේ අප හට පැහැදිලි සාධකයක් තිබෙන හෙයින් ඔවුනට එරෙහිව කටයුතු කළ හැක. ඒ සඳහා පහත සඳහන් නබි වදන එක් සාක්ෂියකි.

උබාදාහ් ඉබ්නු සාමිත් (රළි) තුමාණන් මෙසේ වාර්තා කරයි:

වරක් නබි (සල්) තුමාණන් අප සියල්ල කැඳෙව්වේය. පසුව අප සියල්ල ඔහුට දිවුරුම් දුනිමු. ඔහු පොරොන්දු වූ සමහර දේවල්ද ඔහු මෙසේ සඳහන් කළේය:

අපි කැමැත්තෙන් හෝ අකැමැත්තෙන්, සැපපහසු හෝ දුෂ්කර අවස්ථාවන්හිදී, පාලකයින්ට සවන් දී කීකරු වන බවට හා පැහැදිලි දේව ප්‍රතික්ෂේපයක් දුටුවේ නම් මිස පාලනයට සුදුස්සන්ගෙන් එය උදුරා ගැනීමට උත්සාහ නොකරන බවටත් අපි දිවුරුම් දුනිමු. එවිට අල්ලාහ් ඉදිරියේ ඔබලාට පැහැදිලි සාධකයක් තිබෙනු ඇත.[68]

පාලකයින්ට එරෙහිව පෙළ ගැසීමට අනුමැතිය ඇත්තේ පහත සඳහන් බලවත් කොන්දේසි තිබේ නම් පමණි:

1. පාලකයෝ කුෆ්ර් හෙවත් දේව ප්‍රතික්ෂේපයට අයත් යමක් සිදු කළ බවට ඇස්වලින් දැකීමෙන් හෝ නිශ්චිතව දැන ගැනීමෙන් තහවුරු වීම. මන්දයත් ඉහත සඳහන් නබි වදනෙහි (නුඹලා දුටුවේ නම්) යන පදය නබි (සල්) තුමාණන් භාවිතා කර ඇති හේතුවෙනි. ව්‍යාජ තොරතුරු මඟින් එය තහවුරු කළ නොහැක.
2. එය දේව ප්‍රතික්ෂේපය හා සම්බන්ධ දෙයක් විය යුතුයි. ඔවුන් යම් පාපයක් හෝ වරදක් කිරීම හේතුවෙන් ඔවුනට එරෙහිව කටයුතු කළ නොහැක.
3. එම දේව ප්‍රතික්ෂේපයට අයත් දෑ පැහැදැලි ව හා විවෘතව සිදු විය යුතුයි. එය අපහැදිලි හෝ රහසිගතව සිදු කරන ක්‍රියාවක් නම්, ඔවුනට එරෙහිව කටයුතු කළ නොහැක.
4. නොබිඳිය හැකි සාක්ෂි සමග එම දේව ප්‍රතික්ෂේපය තහවුරු විය යුතුය. මත භේදාත්මක කරුණක් හෝ ස්ථිර නොවන කරුණක් සඳහා ඔවුනට එරෙහිව කටයුතු කළ නොහැක.
5. ප්‍රමාණවත් බලය. ඉහත සඳහන් කොන්දේසි සියල්ල ම සපුරා තිබියදෑ, දුර්වල තත්ත්වයක් තුළ කැරලිගැසීමට ඉඩ නොලැබේ. එවන් තත්ත්වයක් තුළ කැරලි ගැසීම ඉස්ලාමය හා මුස්ලිම් ජනයා සමූලඝාතනය කිරීමට තුඩු දෙනු ඇත. උත්තරීතර අල්ලාහ් මෙසේ සඳහන් කරයි:

68. මූලාශ්‍රය: බුහාරී වැකි අංක 7055 / මුස්ලිම් වැකි අංක 1709

(සටන් කිරීමෙන් මදකට) නුඹලාගේ අත් ඉවතට ගනු. සලාත් ඉටු කරනු. සකාත් ගෙවනුයි අමතනු ලැබූ අය ගැන නුඹ සලකා බැලූවෙහිද? සටන් කිරීමට ඔවුනට අණ කරනු ලැබූ විට ඔවුන්ගෙන් පිරිසක් අල්ලාහ්ට බියවන තරම් හෝ ඊටත් වඩා ජනයාට බියවෙති. (අල්කුර්ආන්:04:77)

මෙම අල්කුර්ආන් වැකිය තුළ දුර්වල තත්තවයක පසු වන විට යුද්ධ කිරීමෙන් වැළකී සිටිය යුතු බව අල්ලාහ් අණ කර ශක්තිමත් තත්වයක සටන් කිරීම අනිවාර්ය කර ඇත.

# සහාබා වරුන් හෙවත් සහගාමීන්

සහාබි වරයෙකු යනු: නබි (සල්) තුමාණන්ව හමු වී ඔහු පිළිබඳ විශ්වාස කර එම විශ්වාසය තුළ මිය ගිය පුද්ගලයා වේ. සහාබා වරුන් (ඔවුන් සැමට අල්ලාහ්ගේ තෘප්තිය ලැබේවා!) ධර්ම දූතයින්ට පසු ඉතා ශ්‍රේෂ්ඨමත් උදවිය වෙති. එමෙන්ම ඔවුන් ජීවත් වූ යුගය අති ශ්‍රේෂ්ඨතම යුගයකි. නබි (සල්) තුමාණන් ඒ පිළිබඳ මෙසේ පැවසීය:

මිනිසුන් අතුරින් ශ්‍රේෂ්ඨතම ජන සමාජය වනුයේ මාගේ යුගයේ විසූවන් යැයි නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ ප්‍රකාශ කළහ. [69]

තවද මෙසේ පවසා ඇත:

මා ජීවත් වූ යුගයෙහි සිටි ජන සමූහය ඉතා විශිෂ්ඨය.[70]

ඔවුන් සියළු දෙනා ඉතා අවංකය. මන්දයත්, උත්තරීතර අල්ලාහ් ඔහුගේ ධර්ම දූත මුහම්මද් (සල්) තුමාණන්ගේ සහගාමිත්වය ඔවුනට පිරිනැමූ අතර ඔවුන්ව පවිත්‍ර කර ඔවුන් පිළිබඳ තෘප්තියට පත් වී තවද ඔවුනට පාපක්ෂමාව ලබා දී ඇත. එමෙන්ම අල්ලාහ් ගෞරවණීය ගුණාංග මඟින් ඔවුන්ව වර්ණනා කළ අතර විශේෂ පොරොන්දු ඔවුන් සඳහා ලබා දුන්හ. උත්තරීතර අල්ලාහ් ශුද්ධ වූ අල්කුර්ආනයේ මෙසේ සඳහන් කරයි:

මුහම්මද් අල්ලාහ්ගේ දූතයාය. ඔහු සමග සිටින්නන් ප්‍රතික්ෂේප කරන්නන් සම්බන්ධයෙන් දැඩි (මතධාරීන්) වශයෙන්ද, තමන් තුළ ඉතාමත් ආදර කරුණාවෙන් යුතු අය වශයෙන්ද, සිටින්නාහ. නැවී නළල බිම තබා සුජූද් කර, (නමදින්නන්) වශයෙන් ඔබ දකින්නෙහිය. අල්ලාහ්ගේ වරප්‍රසාදයද, (ඔහුගේ) ශුද්ධ වූ සොම්නසද (සැම විටම) කැමැත්තන් වශයෙන් සිටින්නාහ. ඔවුන්ගේ සළකුණු නම්, ඔවුන්ගේ මුහුණුවල සුජූද් කර (නැමදීමේ) සළකුණු තිබෙනු ඇත. මෙයම තව්රාත් (නමැති ධර්මයෙහි) ඇති ඔවුන්ගේ වූ වර්ණනාවයි. ඉන්ජීල්හි ඔවුන් කෙරෙහි වූ උපමාව නම්, එක් භෝගයකට සම වන්නේය. එය (සශ්‍රීකව කොළ පැහැ ගැන්වී) අතු විහිදෙන්නේය. (වැඩී) ස්ථිරවත් වන්නේය. පසුව එය (මහත් වී) ඝන වන්නේය. පසුව ගොවියාට (සතුටට පත් වී ඉතාමත්) පුදුම ගෙන දෙන අන්දමට (වැඩී) එය තමන්ගේ කඳෙහි දිග හැරී සිටින්නේය. - මෙමගින් ප්‍රතික්ෂේප කරන්නන්ව ඔහු කෝපයට පත් කරන්නේය. (මෙසේම විශ්වාසවන්ත - යින්වද ක්‍රම - ක්‍රමයෙන් සංවර්ධනයට ගෙන එන්නේය). ඔවුන්ගෙන් කවුරුන් (ඇත්තෙන්ම) විශ්වාසය තබා, දැහැමි ක්‍රියාවන් කරන්නෝද, ඔවුන්ට අල්ලාහ් සමාවද, ඉමහත් වූ ඵලවිපාකද, පොරොන්දු වී ඇත්තේය. (අල්කුර්ආන්:48:29)

69. මූලාශ්‍රය: බුහාරි හදීස් අංක 2652 / මුස්ලිම් හදීස් අංක 2532

70. මූලාශ්‍රය: බුහාරි හදීස් අංක 3650 / මුස්ලිම් හදීස් අංක 2535

එනමුත්, පිරිසකට සීමා වූ විශේෂ මහිමයන් හා තරාතිරම් ද පුද්ගල වශයෙන් සීමා වූ විශේෂ මහිමයන් හා තරාතිරම් ද ඇත.

පිරිසකට සීමා වූ විශේෂ මහිමයන් හා තරාතිරම්

## 1.අන්සාරිවරුන්ට වඩා මුහාජිර්වරු විශිෂ්ඨය.

මන්දයත් හිජ්රත් කිරීම සහ උදවු උපකාර කිරීම යන කරුණු දෙක ඔවුන් තුළ එක්රුස් වීම හේතුවෙනි. එමෙන්ම උත්තරීතර අල්ලාහ් සහාබාවරුන් පිළිබඳ ප්‍රකාශ කිරීමේදී ඔවුනට ප්‍රමුඛස්ථානය ලබාදී ඇත. ඒ පිළිබඳ ශුද්ධ වූ අල්කුර්ආනයේ මෙසේ සඳහන් වේ:

තමන්ගේ නිවෙස්වලින්ද, තමන්ගේ වස්තූන්වලින්ද, (අසාධාරණ ලෙස) පිටමං කරනු ලැබ, (මක්කාවේ සිට) හිජ්රත් කර පැමිණි (මුහාජිර්වරුන්ගෙන් වූ) දුප්පතුන්ටද, (එයින් කොටසක් ඇත). ඔවුන් අල්ලාහ්ගේ වරප්‍රසාදයන්ද, (ඔහුගේ) ශුද්ධ වූ සොම්නසද අත්කර ගැනීමේ අදහසින් (තමන්ගේ පණද, වස්තුවද පරිත්‍යාග කර) අල්ලාහ්ටද ඔහුගේ දූතයාටද, උදව් කරමින් සිටින්නාහ. මොවුන්ම සාදිකූන් (නමැති සත්‍ය විශ්වාසවන්තයින්) වෙති.

ඔවුන්(මුහාජිරීන්වරුන්)ට පෙර (මදීනා නගරය තම) වාසස්ථානය කර ගත්තවුන් හා විශ්වාසය ලැබූවන් තමන් වෙත දේශාන්තරණය කර පැමිණියවුන් ව ප්‍රිය කරති. ඔවුන්(මුහාජිරීන්වරුන්)ට දෙනු ලැබූ දැයින් තම හදවත්හි කිසිදු ඊර්ෂ්‍යාවක් ඔවුහු නොදකිති. තමන්ට (දැඩි) අවශ්‍යතාවක් තිබියදී තමන්ට වඩා (මුහාජිරීන්වරුන් හට) ප්‍රමුඛත්වය ලබා දෙති. තවද කවරෙකු තමන්ගේ හදවතෙහි ඇතිවන මසුරුකමින් වළක්වනු ලබන්නේද ඔවුහුමය ජය ලද්දෝ. (අල් කුර්ආන් 59: 08-09)

තවද:

මුහාජිරූන් (සංක්‍රමණිකයින්) සහ අන්සාර්වරුන්(ඔවුනට උදව් කළවුන්) අතුරින් (ඊමාන්-විශ්වාසය පිළිබඳ ඇරයුමට) මුලින්ම ප්‍රතිචාර දැක්වූ අය ගැනද සිල්වත් කමින් ඔවුන් පිළිපැදි අය ගැනද අල්ලාහ් ප්‍රසාදයට පත් විය. ඔවුහුද අල්ලාහ් ගැන සතුටට පත් වූහ. යටින් දියදහර ගලාබස්නා ස්වර්ගයන් ඔහු(අල්ලාහ්) ඔවුනට පිළියෙළ කර ඇත. ඔවුහු එහි සදාකල් වෙසෙති. ශ්‍රේෂ්ඨතම ජයග්‍රහණය මෙයයි. (අල් කුර්ආන් 09: 100)

තවද:

නබිවරයාටත්, විපත්තිදායක අවස්ථාවේදී ඔහු අනුගමනය කළ මුහාජිර්වරුන්ටත්, අන්සාර්වරුන්ටත් ඔවුන් අතුරින් සමහරුන්ගේ සිත් ඉදුරා වෙනත් අතකට හැරී තිබුණ නමුත් (ඔහු එසේ කළේ ඔවුන් වක් මග නොගොස් නබිවරයාණන් අසල සිටි නිසා) අල්ලාහ් ඔවුනට සමාව දුන්නේය. නියත වශයෙන්ම අල්ලාහ් ඔවුන් කෙරෙහි සානුකම්පිතය, දයාන්විතය. (අල් කුර්ආන් 09: 117)

### 2.හුදෙයිබියියා ගිවිසුමට පෙර විය පැහැදම් කළ අය හා අරගල කළ උදවිය, ඔවුනට පසු විය පැහැදම් කළ අය හා අරගල කළ උදවියට වඩා විශිෂ්ඨයි.

මෙම විශිෂ්ටත්වය පෙන්වන සාධකයක් වශයෙන් උත්තරීතර අල්ලාහ් ශුද්ධ වූ අල්කුර්ආනයේ මෙසේ සඳහන් කරයි:

ජයග්‍රහණයට පෙර විය පැහැදම් කොට සටන් කළවුන්ට නුඹලාගෙන් කිසිවෙකු සම නොවන්නේය. ඉන් පසුව වියදම් කර සටන් කළවුන්ට වඩා ඔවුන් තරාතිරමින් අති උතුම්ය. තවද සියල්ලන්ටම අල්ලාහ් යහපත ප්‍රතිඥා දී ඇත. (අල් කුර්ආන් 57:10)

### 3.බද්ර් සහාබාවරුන්ට හිමි විශේෂ මහිමය

නබි (සල්) තුමාණන් පහත අයුරින් උමර් (රළි) තුමාට හාතබ් ඉබ්නු අබී බල්තආ නැමැති සහාබිවරයාගේ සිදුවීම පිළිබඳ පැවසීමේදී: ඔහු බද්ර් සටනට සහභාගී වූ කෙනෙකි. එබැවින් ඔවුන් වෙත 'නුඹලා කැමති දෑ කරනු. සැබැවින්ම නුඹලාට සමාව දෙනු ලැබීය' යැයි අල්ලාහ් විශේෂ කොට ප්‍රකාශ කර ඇත.[71]

### 4.බයිඅතුර් රිල්වානයට සහභාගී වූ අය

උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කොට ඇත:

ගස යට සිට ඔවුන් නුඹට ප්‍රතිඥා දුන් අවස්ථාවේ එම විශ්වාසවන්තයින් ව සැබැවින්ම අල්ලාහ් පිළිගත්තේය. (අල් කුර්ආන් 48:18)

තවද නබි (සල්) තුමාණන් මෙසේ වාර්තා කර ඇත:

ගස යට සිට ප්‍රතිඥා දුන් කිසිවකු නිරයට ඇතුළු නොවෙයි.[72]

## පුද්ගල වශයෙන් සීමා වූ විශේෂ මහිමයන් හා තරාතිරම්

### 1. කුලෆාඋර් රාෂිදීන් හෙවත් යහමඟ ලැබූ සිව් මහා පාලකයින්.

අහ්ලුස් සුන්නා වල් ජමාආත් අයගේ ඒකමතික තීරණයට අනුව මෙම සමාජයේ නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ට පසු ශ්‍රේෂ්ඨ වනුයේ අබූ බක්කර් (රළි) තුමාය. එතුමාණන්ට පසු උමර් (රළි) තුමාය. අලි (රළි) තුමාණන් වේදිකාව මත සිටියදී ප්‍රකාශ කළ බව අසූවකටත් වඩා අධික වාර්තාකරුවන්ගෙන් වාර්තා වූ වදනක මෙසේ සඳහන් වේ:

මෙම සමාජයේ නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ට පසු ශ්‍රේෂ්ඨ වනුයේ අබූ බක්කර් (රළි) තුමාය. එතුමාණන්ට පසු උමර් (රළි) තුමාය.

මූලාශ්‍රය: අහ්මද් (රහ්) තුමාණන් හා ඉබ්නු අබිල් ආසිම් (රහ්) තුමාණන් සම්මත වූ විවිධ මාර්ගයන් හරහා මෙම වාර්තාව සඳහන් කර ඇත. ඉමාම් අල්බානි (රහ්)

71. මූලාශ්‍ර: බුහාරි හදීස් අංක 3007 / මුස්ලිම් හදීස් අංක 2494

72. මූලාශ්‍රය: මුස්ලිම් හදීස් අංක 2496

තුමාණන් මෙය පූර්ව සාධක සහිත වාර්තාවක් යනුවෙන් සඳහන් කර ඇත. අලි (රළි) තුමාණන් මෙම පුවත ස්ථිර ලෙස තහවුරු කරන්නේ මනා අවබෝධයකිනි.

ඔවුන් දෙදෙනාට පසු ශ්‍රේෂ්ඨත්වය හිමි වන්නේ උස්මාන් (රළි) තුමාට වේ. බුහාරි ග්‍රන්ථයේ සඳහන් අබ්දුල්ලාහ් ඉබ්නු උමර් (රළි) තුමාගේ වාර්තාව එයට සාක්ෂියකි:

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ කාලයේ අපි ජනයා අතර ශ්‍රේෂ්ඨයින් තෝරන්නන් ලෙස සිටියෙමු. ඒ අනුව අපි අබූ බක්ර් තුමා ද පසුව උමර් ඉබ්නු කත්තාබ් තුමා ද පසුව උස්මාන් ඉබ්නු අෆ්ෆාන් තුමා ද (රළියල්ලාහු අන්හුම්) තෝරා ගතිමු.[73]

ඒ පිළිබඳ නබි (සල්) තුමාණන් වෙත දැනුවත් කරනු ලැබේ. එතුමාණන් එය ප්‍රතික්ෂේප නොකරයි[74] යනුවෙන් වෙනත් වාර්තාවක සඳහන් වේ.

සුෆ්යාන් අස්සව්රී (රහ්මතුල්ලාහි අලෙයිහි) මෙසේ පවසයි: කවරෙකු අබූ බක්ර් හා උමර් (රළියල්ලාහු අන්හු) තුමාට වඩා අලි (රළියල්ලාහු අන්හු) තුමාට ප්‍රමුඛත්වය ලබා දෙන්නේ ද සැබැවින්ම ඔහු මුහාජිර්වරුන් හා අන්සාර්වරුන්(ගේ අදහස) පහත් කොට සලකනු ඇත.[75]

## 2. ස්වර්ගය සතු යැයි ශුභාරංචි දෙනු ලැබූ දස දෙනා

ඔවුන් වනුයේ:

කුලෆාඋර් රාෂිදීන් හෙවත් යහමඟ ලැබූ සිව් මහා පාලකයින්, අබ්දුර් රහ්මාන් ඉබ්නු අවුෆ් (රළියල්ලාහු අන්හු), සඃද් ඉබ්නු අබී වක්කාස් (රළියල්ලාහු අන්හු), තල්හා ඉබ්නු උබෙයිදුල්ලාහ් (රළියල්ලාහු අන්හු), සුබෙයිර් ඉබ්නු අල් අවාම් (රළියල්ලාහු අන්හු), අබූ උබයිදා ආමිර් ඉබ්නු අල් ජර්රාහ් (රළියල්ලාහු අන්හු), සඊද් ඉබ්නු සෙයිද් (රළියල්ලාහු අන්හු) යනාදී සහාබ්වරුන්ය. මෙම දස දෙනා ස්වර්ගය සතු යැයි නබි (සල්) තුමා විසින් ශුභාරංචි දැන් වූ අය වෙති.

ඔවුනට අමතරව බිලාල්, සාබිත් ඉබ්නු කයිස් හා අබ්දුල්ලාහ් ඉබ්නු සලාම් (රළියල්ලාහු අන්හුම්) යනාදී සහාබ්වරුන් සඳහාද එම ශුභාරංචිය ඇති බව නබි වදන් අවධාරණය කරයි.

## 3. නබි (සල්) තුමාණන්ගේ පවුලේ සාමාජකයින්.

මොවුන් සදකාවන් හෙවත් පරිත්‍යාග කරන ලද දෑ ගැනීමට තහනම් වූ පවුල් ශාඛා පහකි. ඔවුන් නම්:

අලීගේ පවුල් සාමාජිකයන්, ජඃෆර්ගේ පවුල් සාමාජිකයන්, අකීල්ගේ පවුල්

73. මූලාශ්‍ර: බුහාරි හදීස් අංක 3655

74. මූලාශ්‍රය: සුන්නාහ් නැමැති ග්‍රන්ථයෙහි ඉබ්නු අබිල් ආසිම් අංක 1193 දරන අංකය යටතේ එය වාර්තා කර ඇත.

75. මූලාශ්‍ර: ඉබ්නු මුජ්න් හදීස් අංක 775

සාමාජිකයන්, අබ්බාස්ගේ පවුල් සාමාජිකයන්, අල්හාරිස් ඉබ්නු අබ්දුල් මුත්තලිබ්ගේ පවුල් සාමාජිකයන් යනාදී අය වේ.

නබි (සල්) තුමාණන් මෙසේ ප්‍රකාශ කොට ඇත:

නියත වශයෙන්ම අල්ලාහ් කිනානා ගෝත්‍රය ඉස්මාඊල් (අලෛයිහිස්සලාම්) ගේ පෙලපතින් තෝරා ගත්තේය. තවද කුරයිෂි ගෝත්‍රය කිනානා ගෝත්‍රයෙන් තෝරා ගත් අතර හාෂිම් ගෝත්‍රය කුරයිෂ් ගෝත්‍රයෙන් තෝරා ගත්තේය. එමෙන්ම හාෂිම් ගෝත්‍රයෙන් මාව අල්ලාහ් තෝරා ගත්තේය.[76]

මාගේ පවුල් සාමාජිකයන් විෂයෙහි අල්ලාහ්ව මා ඔබලාට සිහිපත් කරන්නෙමි. මාගේ පවුල් සාමාජිකයන් විෂයෙහි අල්ලාහ්ව මා ඔබලාට සිහිපත් කරන්නෙමි යනුවෙන් නබි (සල්) තුමාණන් ප්‍රකාශ කළේය.[77]

කුරයිෂ් වරුන් අතුරින් කිහිප දෙනෙකු හාෂිම් ගෝත්‍රයෙන් දුරස්ව කටයුතු කරන බව අබ්බාස් ඉබ්නු අබ්දුල් මුත්තලිබ් (රළි) තුමාණන් නබි (සල්) තුමාණන් වෙත පැමිණ පැමිණිලි කළේය. එවිට අල්ලාහ් හා මාගේ ඥාති සම්බන්ධතාවය වෙනුවෙන් ඔබලාට ආදරය නොකරන කෙනෙකුගේ සිත තුළ ඊමානය ඇතුල් වන්නේ නැත යැයි නබි (සල්) තුමාණන් ප්‍රකාශ කර සිටියේය.[78]

නබි (සල්) තුමාණන්ගේ පවුල් සාමාජිකයන් අතුරින් එතුමාගේ දැහැමි බිරින්දෑවරුන්ද ඇතුළත් වේ. උත්තරීතර අල්ලාහ් ශුද්ධ වූ අල්කුර්ආනයේ මෙසේ අවධාරණය කරයි:

(නබිවරයාගේ) නිවැසියනි! ඔබගෙන් සියලු අපිරිසිදු දැය පහ කර, ඔබව සම්පූර්ණයෙන්ම පරිශුද්ධ කර හැරීමට අල්ලාහ් කැමති වන්නේය. (අල්කුර්ආන්:33:33)

උත්තරීතර අල්ලාහ් එම කාන්තාවන් නබි (සල්) තුමාණන් සඳහා තෝරා ගත් අතර, මෙලොවෙහි පමණක් නොව මතු ලොවෙහිද එතුමාගේ භාර්යාවන් ලෙස පත් කර ඇත. එමෙන්ම එම කාන්තාවන් සඳහා (උම්මහාතුල් මූඃමිනීන්) විශ්වාසවන්තයින්ගේ මව්වරුන් යනුවෙන් අල්ලාහ් නම් තැබුවේය. ඔවුන් අතුරින් ඉතා ශ්‍රේෂ්ඨතම කාන්තාව නම් කදීජා (රළි) තුමිය වේ. ඉන්පසු ආඉෂා (රළි) තුමිය වේ.

ඔවුන් ඇතුළුව අනෙකුත් සියළු භාර්යාවන්ගේ නම් පහත සඳහන් වේ:

සව්දහ් බින්ත් ᶻසඃමහ්, හෆ්සා බින්ති උමර්, උම්මු සලමාහ්, උම්මු හබීබා බින්ති අබී සුෆ්යාන්, සෆීයියා බින්ති හුයයි, ᶻසයිනබ් බින්ති ජහෂ්, ජුවයිරියියාහ්, මයිමූනාහ්, ᶻසයිනබ් බින්ති හුᶻසයිමාහ් (ඔවුන් සියල්ල කෙරෙහි අල්ලාහ්ගේ තෘප්තිය ලැබේවා!)

සහාබාවරුන්ගේ තරාතිරම් හා මහිමයන් තුළ පැවති විවධත්වය මත ඔවුන් සම්බන්ධයෙන් පැවරී ඇති යුතුකම් හා වගකීම්

76. මූලාශ්‍රය: මුස්ලිම් හදීස් අංක 2276

77. මූලාශ්‍රය: මුස්ලිම් හදීස් අංක 2408

78. මූලාශ්‍රය: අහ්මද් හදීස් අංක 1777

1. හදවතින් ඔවුන් ව ඇලුම් කොට ඔවුන් වෙත ආදරය දක්වා ඔවුන් වෙනුවෙන් පාප ක්ෂමාවේ නිරත වී (ඔවුන් තනි පුද්ගලයින් වුවද නැතහොත් සමූහයක් වුවද) ඔවුනට පැසසුම් කිරීම.

   උත්තරීතර අල්ලාහ් මෙසේ සඳහන් කරයි:

   විශ්වාස කරන පුරුෂයෝද විශ්වාස කරන ස්ත්‍රීහුද ඔවුන්ගෙන් ඇතැමෙක් ඇතැමකුට ආරක්ෂකයෝය. (අල්කුර්ආන්:09:71)

   තවද මෙසේ සඳහන් කර ඇත:

   අපගේ දෙවියනි! අපවද, අපට පෙර විශ්වාසය තැබූ අපගේ සහෝදරයින්වද, ඔබ ක්ෂමා කර හරිනු මැනව! විශ්වාසය තැබූවන් ගැන අපගේ හෘදයන්හි ක්‍රෝධය ඇති නොකරනු මැනව! (අල්කුර්ආන්:59:10)

   නබි (සල්) තුමාණන් මෙසේ වාර්තා කොට ඇත:

   ඊමානයේ සංඛේතයක් නම් අන්සාරිවරුන්ට ආදරය කිරීමයි. කුහකත්වයේ සංඛේතයක් නම් අන්සාරිවරුන්ට වෛර කිරීමයි.[79]

   අලී (රළි) තුමාණන් මෙසේ ප්‍රකාශ කර ඇත:

   බීජ හටගන්වන, මිනිසා නිර්මාණය කරන අල්ලාහ් මත දිවුරා කියමි. නියත වශයෙන්ම මෙය නූගත් නබි (සල්) තුමාණන් මා හට දුන් පොරොන්දුවකි. එය නම් මුඃමින්වරයෙකු මිස අන් කිසිවෙකු මා වෙත ආදරය නොකරයි. කුහකයකු මිස අන් කිසිවෙකු මා වෙත වෛර නොකරයි.[80]

2. ඔවුනට බැණ වැදීමෙන් හා ශාප කිරීමෙන් මෙන්ම ඔවුන් පිළිබඳ සැක සිතින් හා ක්‍රෝදයෙන් පසු වීමෙන් වැළකී සිටීම.

   උත්තරීතර අල්ලාහ් ශුද්ධ වූ අල්කුර්ආනයේ මෙසේ සඳහන් කොට ඇත.

   විශ්වාසය තැබූවන් ගැන අපගේ හෘදයන්හි ක්‍රෝධය ඇති නොකරනු මැනව! (අල්කුර්ආන්:59:10)

   නබි (සල්) තුමාණන් ඒ පිළිබඳ මෙසේ ප්‍රකාශ කොට ඇත.

   මාගේ මිතුරන්ට නුඹලා බැණ නොවදිනු. මාගේ ආත්මය කවුරුන් සතු වන්නේ ද ඔහු මත දිවුරා පවසමි. ඔබ අතුරින් කිසිවකු හෝ උහද් කන්ද තරම් රන් වියදම් කළ ද ඔවුන් කිසිවකුගේ ප්‍රමාණයට හෝ ඉන් කොටසකට හෝ ළං විය නොහැක.[81]

3. ඔවුන් අතර මතු වූ ගැටලු සම්බන්ධයෙන් තර්ක විතර්ක කොට ගිලී සිටීමෙන්

79. මූලාශ්‍රය: බුහාරි හදීස් අංක 17
80. මූලාශ්‍රය: මුස්ලිම් හදීස් අංක 78
81. මූලාශ්‍රය: බුහාරි හදීස් අංක 3673 / මුස්ලිම් හදීස් අංක 2540

වැළකී සිටිය යුතුය.

සැබැවින්ම ඔවුන් මුජ්තහිදූන් හෙවත් කාර්යක්ෂම ලෙසින් කරුණු සොයා එමගින් තිළිණ ලබා ගත් උදවිය වෙති. යමෙකු එසේ සෙවීමෙන් නිවරදි දේ ලැබුවේ නම් ඔහුට තිළිණ දෙකක් හිමි වේ. එය වැරදුණු විට එක් තිළිණයක් හිමි වේ. ඔවුන්ගෙන් යම් අකුසලක් සිදු වූයේ නම් ඒවා සමාව ලබා දෙන ඉමහත් කුසල් හා විශේෂත්වයන් ඔවුන සතුව තිබේ.

4. නබි (සල්) තුමගේ පවුල් සාමාජිකයින් විෂයෙහි සීමාව ඉක්මවා කටයුතු කරන ෂීආවරුන්ගේ ක්‍රමවේදයෙන් මිදීම හා නබි (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණන්ගේ අතිකුත් මිතුරන් නින්දා කිරීමෙහි සීමාව ඉක්මවා කටයුතු නොකරීම. එමෙන්ම නබිඳුන්ගේ පවුල් සාමාජිකයන් කෙරෙහි අකමැත්තක් දක්වන සහ විවේචනය කරන අයගේ ක්‍රියාවන්ගෙන් ද අප වැළකී සිටිය යුතුයි.

# අල්ලාහ්ගේ ස්නේහයට ලක් වූවන්

සැබෑ විශ්වාසවන්තයින් සියලු දෙනා අල්ලාහ්ගේ ස්නේහයට ලක් වූවන් වෙති. උත්තරීතර අල්ලාහ් මෙසේ සඳහන් කරයි:

විශ්වාසවන්තයින් වෙනුවෙන් අල්ලාහ් පිහිට වන්නාය. (අල්කුර්ආන්:02:257)

ඔවුන් අතුරින් අල්ලාහ් ඉදිරියේ ඉතා ගෞරවනීය වන්නේ අධික බිය බැතිමත් පුද්ගලයාය. ඒ පිළිබඳ අල්ලාහ් මෙසේ සඳහන් කරයි:

අල්ලාහ් හමුවේ නුඹලාගෙන් ඉතා ගෞරවනීය වන්නේ (දෙවියන්ට) අධික ව බිය බැතිමත් වන්නා ය. (අල්කුර්ආන්:49:13)

කවුරුන් අධික බිය බැතිමත් වන්නේද ඔවුහු අල්ලාහ්ගේ ස්නේහයට ලක් වන්නන් වෙති. ඔවුහු එම ස්නේහය ප්‍රදර්ශනය කළ යුත්තේ නිසි අයුරින් ඔහුට අවනත වී ඔහුට ආදරය කිරීම මඟින් හා අල්ලාහ් තම ස්නේහය ඔවුන් වෙත ප්‍රදර්ශනය කරන්නේ ඔවුනට තම ආදරය හා කරුණාව ප්‍රදානය කිරීම මඟිනි.

## 1. අල්ලාහ්ගේ ස්නේහයට ලක් වූවන්

විශ්වාසවන්ත බිය බැතිමත් සෑම පුද්ගලයෙක්ම අල්ලාහ්ගේ ස්නේහයට ලක් වූ පුද්ගලයන් වෙති. උත්තරීතර අල්ලාහ් මෙසේ සඳහන් කර ඇත:

දැන ගන්න. අල්ලාහ්ගේ ස්නේහයට ලක් වූවන්ට කිසිදු බියක් නැත. ඔවුන් දුක් වන්නේ ද නැත. ඔවුහු (දෙවියන්) ගැන විශ්වාස කරති. (ඔහුට) බිය බැතිමත් ව සිටිති. (අල්කුර්ආන්:10:62/63)

එම ස්නේහයේ තරාතිරම විශ්වාසය හා බිය බැතිකම මත පදනම් වන අතර යම් තර්කයන් මත හෝ යම් සම්බන්ධතාවයන් මත පදනම් නොවේ. උත්තරීතර අල්ලාහ් මෙසේ සඳහන් කර ඇත:

අල්ලාහ් හමුවේ නුඹලාගෙන් ඉතා ගෞරවනීය වන්නේ (දෙවියන්ට) අධික ව බිය බැතිමත් වන්නා ය. අල්ලාහ් සර්වඥයෙකි, ප්‍රවීණයෙකි. (අල්කුර්ආන්:49:13)

## 2.කරාමත් හෙවත් විශේෂ සංඥාවන්

අල්ලාහ් ඔහුගේ යහපත් ගැත්තන් අතුරින් කෙනෙකු සඳහා ගෞරවය දැක්වීමේ සලකුණක් වශයෙන් සහ ඔහු අනුගමනය කරන වක්තෘවරයාගේ සත්‍යතාව තහවුරු කිරීම පිණිස ඔහුගේ අවසරයෙන් සමඟ සිදු වන අසාමාන්‍ය හෝ ආශ්චර්යමත් සිද්ධීන් සඳහා කරාමත් නොහොත් විශේෂ සංඥාවන් යැයි කියනු ලැබේ. එය වර්ග දෙකකි:

1. නොරතුරු අනාවරණය කිරීම හා මානසික පිබිදුම් හා ඥානාන්විත දැනුම් විෂයෙහි යම් විශේෂ සලකුණක් ඇති වීම.
2. යමක් සිදු කිරීමේ හැකියාවෙහි හා බලපෑම් කිරීමෙහි යම් විශේෂ සලකුණක් ඇති වීම.

මෙවැනි විශේෂ සිදුවීම් පෙර පසු වූ ජන සමූහයේ සිටි අල්ලාහ්ගේ ස්නේහයට ලක් වූවන් සඳහා ඇති වුණු අතර නබි (සල්) තුමාණන්ගේ අනුගාමිකයන් කිහිපදෙනෙකු වෙත හා ඔවුනට පසු පැමිණි පරම්පරාවෙහි සිටි ඇතැමුන් වෙතද, එවැනි ගෞරවණීය සලකුණු සිදුවුණි. තවදුරටත් අවසන් දින දක්වා අල්ලාහ්ගේ ස්නේහයට ලක් වූවන් සඳහා එවැනි විශේෂ සිදුවීම් සිදු වනු ඇත.

# ඉස්ලාමීය ප්‍රධාන මූලාශ්‍රයන්

## 1. මූලාශ්‍රයන්

ඉස්ලාමීය නීති, හැසිරීම් රටාවන් හා විශ්වාසයන් සඳහා මූලික වන්නේ අල් කුර්ආනය, සුන්නාහ්ව සහ විද්වතුන්ගේ නිසි ඒකමතිකත්වය වේ. කවර පුද්ගලයෙකු වුව ද ඔහුගේ ප්‍රකාශයන්, ඔහුගේ ස්වාධීන අදහස්, ඔහුගේ මනෝ ඉච්ඡාව හෝ ඔහුගේ සසඳා බැලීම් යනාදී කරුණු මෙම මූලාශ්‍ර වලට පටහැනි වීම අනුමත කළ නොහැක.

## 2.අල්කුර්ආනය හා සුන්නාහ්ව අවබෝධ කර ගැනීමේ මාර්ගය

ඒවා අවබෝධ කර ගැනීමේ විධිමත් ක්‍රමවේදය නම් මුහාජිරීන් හා අන්සාර් වැනි අය සහ ඔවුන්ව අනුගමනය කළ දැහැමි ආරම්භක යුගයේ වැජඹූ මුස්ලිම්වරුන්ගේ ක්‍රමවේදය මත අඛණ්ඩව ක්‍රියා කර, ග්‍රීක දාර්ශනිකයන් සහ සූෆිවරුන් විසින් නිකුත් කරන ලද නූතන ක්‍රමවේද අත්හැර දැම්මයි. උත්තරීතර අල්ලාහ් ශුද්ධ වූ අල්කුර්ආනයේ ඒ පිළිබඳ මෙසේ අවධාරනය කර ඇත.

යමෙක් යහ මග තමාට පැහැදිලි වූ පසුත් මෙම දූතයාට(මුහම්මදට) පටහැනි වී විශ්වාස කළ අයගේ මාර්ගය නොවන වෙනත් මාර්ගයක් අනුගමනය කරන්නේ ද අපි ඔහු ගමන් කරන මාර්ගයේ ම ඔහු අත්හැර දමන්නෙමු. ඔහු නිරයෙහි දැවීමට සලස්වන්නෙමු. එය ඉතා නරක නවාතැනකි. (අල්කුර්ආන්:4:115)

## 3.විවෘත බුද්ධිය

සැකයන් හෝ ආශාවන් වලින් බලපෑමක් නොමැති විවෘත බුද්ධිය වනාහී වාර්තාකරණයේ අඩුපාඩු වලින් තොර වූ විශ්වාසදායක ආගමික පෙළපොත් සමග විරුද්ධ නොවනු ඇත. ඇතැම් අය සඳහා ඒවා බුද්ධියට විරුද්ධ යැයි පෙනෙන්නට ඇතත්, ඒවා තර්කානුකූලව ඉදිරිපත් කිරීමට කිසිසේත්ම නොහැකි වනු ඇත. ආගමික වදන් හා තර්කානුකූල අදහස් අතර පරස්පර විරෝධතාවයක් ඇති බව යමෙකු සිතන්නේ නම් එය ඔහුගේ බුද්ධියෙහි යම් දෝෂාවක් මගින් ඇති වන්නෙකි. එවිට ඔහු කළ යුත්තේ තම බුද්ධියට වඩා ආගමික වදන් වලට ප්‍රමුකත්වය දීමයි.

## 4.බිද්අත් හෙවත් නූතන කාර්යයන්

බිද්අත් යනු ධර්මය තුළ යමක් අලුතින් බිහි කිරීමයි. නබි (සල්) තුමාණන් මෙසේ ප්‍රකාශ කොට ඇත:

කවරෙකු අප ධර්මය තුළ නැති යමක් අලුතින් ඇති කරන්නේද එය ප්‍රතික්ෂේපයට ලක් වේ.[82]

82. මූලාශ්‍ර: බුහාරි හදීස් අංක 2697 / මුස්ලිම් හදීස් අංක 1718

බුහාරි ග්‍රන්ථයේ සඳහන් වන වෙනත් වාර්තාවක මෙසේ සඳහන් වේ:

කවරෙකු අප දහමෙහි නොමැති දෙයක් සිදු කරන්නේද එය ප්‍රතික්ෂේපයට ලක් වේ[83].

එම බිද්අත් හෙවත් නූතන කාර්යයන් විවධාකාරය.

1. ශීආ, කවාරිජ්, කදරියියා හා මුර්ජිආ වරුන් මෙන් විශ්වාසයන් තුළ නූතන මතයන්.
2. වන්දනාමාන කිරීම සඳහා කැප වී සමාජයෙන් දුරස් වී තපස් ජීවිතයක් ගත කිරීම හෝ වන්දනාමාන සඳහා විවධ ක්‍රම භාවිතා කිරීම වැනි ක්‍රියාවන් හා සම්බන්ධ නූතන ක්‍රම.
3. භක්තිවන්ත පුද්ගලයන්ගේ උපන්දින සැමරීම වැනි හෝ නූතන පද මඟින් දෙවියන් මහිමවත් කිරීම වැනි මූලික කරුණු සම්බන්ධව නූතන ක්‍රම.
4. වන්දනාමානයක හේතු, වර්ගය, ආකෘතිය, ප්‍රමාණය, කාලය හෝ ස්ථානය හා සම්බන්ධ ක්‍රියාකාරකම්වලට එකතු කරනු ලබන අතිරේක නූතන භාවිතයන්.
5. ෂිර්ක් හෙවත් දේව ආදේශ කිරීම හා එහි විවිධ දරුණු හා බරපතළ නූතන කරුණු.
6. සාමූහිකව දෙවියන් මහිමවත් කිරීම වැනි සාමාන්‍ය නූතන කරුණු.
7. අල්ලාහ්ගේ ගුණාංග ප්‍රතික්ෂේප කිරීම වැනි දේව ප්‍රතික්ෂේපයට අයත් නූතන කරුණු.
8. තහනම් කර ඇති දේ සවන් දීම වැනි අකුසල් නූතන කරුණු.

83. මූලාශ්‍රය: බුහාරි හදීස් අංක 2142

# විශ්වාසය සර්ව සම්පූර්ණ කරවන ක්‍රියාවන්

## 1. යහපත අණ කොට අයහපත වැළක්වීම.

ඒ පිළිබඳ උත්තරීතර අල්ලාහ් ශුද්ධ වූ අල්කුර්ආනයේ මෙසේ සඳහන් කරයි:

යහපත අණ කොට අයහපත වළක්වා යහ මාර්ගය දෙස කැඳවන පිරිසක් නුඹලා අතර සිටිය යුතුය. ජය ලද්දෝ ඔවුහු ම ය. (අල්කුර්ආන්:03:104)

නබි (සල්) තුමාණන් කළ ප්‍රකාශයකට තමන් සවන් දුන් බව අබූ සඊද් අල් කුද්රී (රළි) තුමාණන් මෙසේ වාර්තා කරයි:

කවරෙකු අයපතක් දකින්නේද එය තම දෑතින් ඉවත් කරනු. එයට ශක්තිය නැතිනම් ඔහුගේ මුඛයෙන් එය ඉවත් කරනු. එයටත් ශක්තිය නැතිනම් ඔහුගේ හදවතින් එය ඉවත් කරනු. මෙය විශ්වාසයේ අවම ස්ථාවරය වේ.[84]

යහපත අණ කොට අයහපත වැළක්වීමට පෙර හොඳ අවබෝධයකින් පසු විය යුතුයි. තවද එම කාර්යය සිදු කිරීමේදී ඉතා ලිහිල්ව කටයුතු කළ යුතු අතර එය සිදු කළ පසු ඉවසිලිමත්ව කටයුතු කළ යුතුයි.

## 2.එක්සත්කම වෙනුවෙන් කැපවීම හා අසමිගයෙන් ඈත් වීම.

ඒ පිළිබඳ උත්තරීතර අල්ලාහ් ශුද්ධ වූ අල්කුර්ආනයේ මෙසේ සඳහන් කරයි:

නුඹලා සියල්ලන්ම අල්ලාහ්ගේ රැහැන තරයේ ග්‍රහණය කරගනු. තවද (කිසිවකින් නුඹලා) භේද නොවනු. නුඹලා (එකිනෙකාට) සතුරුව සිටි අවස්ථාවේදී අල්ලාහ් නුඹලාට දැක්වූ අනුග්‍රහය සිහිපත් කරනු. ඔහු එම අවස්ථාවේදී නුඹලාගේ හෘදයන් එක්සත් කළේය. එවිට ඔහුගේ දයාවෙ (මහිමයෙ)න් නුඹලා සොහොයුරන් මෙන් වූවෙහුය. තවද නුඹලා (නිරයේ) අග්නි ප්‍රපාතයට වැටෙන්නට ආසන්නව සිටි කල ඔහු නුඹලා එයින් මුදවා ගත්තේය. නුඹලා යහමඟ වනු පිණිස අල්ලාහ් ඔහුගේ වදන් නුඹලාට මෙසේ පැහැදිලි කරන්නේය. යහපත් දෙය කරා කැඳවන්නා වූත් හොඳ දෙය අණ කරන්නාවූත් නරක දෙය වළක්වන්නාවූත් පිරිසක් නුඹලා අතර සිටිය යුතුය. ඔවුහුමය ජය ලද්දෝ. තවද තමන්ට පැහැදිලි ආයාත් (අණපනත්, සංඥාවන්, වදන්) ලැබීමෙන් පසුව පවා මතභේද ඇති කර ගනිමින් (නිකායවලට) බෙදුනු අය මෙන් නුඹලා නොවනු. (භේද ඇති කළ) ඔවුන්ට ඉමහත් දඬුවම් අත්වනු ඇත. (අල්කුර්ආන්:103-105)

තවද මෙසේ සඳහන් කරයි:

“ධර්මය පිහිටුවන්න. එහි භේද නොවන්න. (අල්කුර්ආන්:42-14)

84. මූලාශ්‍රය: මුස්ලිම් හදීස් අංක 49

නබි (සල්) තුමාණන් මෙසේ ප්‍රකාශ කළේය:

‘විශ්වාසවන්තයෝ ඔවුන් එකිනෙකා වෙනුවෙන් වූ ශක්තිමත් ගොඩනැගිල්ලක් මෙන් වෙති.[85] එතුමාණන් ඒ බව පැවසූ විට, එතුමාණන්ගේ ඇඟිලි එකට එක ගොතමින් ඒ සඳහා එක් උදාහරණයක් ඉදිරිපත් කළේය.

තවද මෙසේ පවසා ඇත:

ආදරය, දයානුකම්පාව හා අන්‍යෝන්‍යවිෂයෙහි, විශ්වාසවන්තයෝ එකම ශරීරයක් මෙන් වෙති. එහි කිසියම් කොටසකට යමක් ඇති වූ විට, ශරීරයේ ඉතිරි කොටස අවදියෙන් සහ උණ ගතියෙන් පසු වේ.[86]

### 3.යහපත් සදාචාරයන් සහ කාරුණික ක්‍රියාදාමයන්.

ඒවා නම්: ඉවසීම, ත්‍යාගශීලීබව, නිර්භීතකම, සමාව දීම සහ නිහතමානිකම යනාදි කරුණු ය. එමෙන්ම මෙම ගුණාංගයන්හි විරුද්ධ ගුණාංග වලින් වැළකී සිටිය යුතුය. තවද දෙමව්පියන්ට ඇප උපස්තාන කිරීම, ඥාතීන් සමඟ සම්බන්ධකම් පැවැත්වීම, යහපත් අසල්වැසියෙකු වීම සහ අනාථයන්, දිළින්දන් හා මගියන් සඳහා කරුණාව දැක්වීම යනාදී කරුණු මෙම ඝනයට අයත් වේ. උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි:

(නබි මුහම්මද්!) සමාව (දීම) යොදා ගනු. යහපත් දේ පතුරුවනු. අනුවණයන්ගෙන් වැළකී සිටිනු. (අල්කුර්ආන්:07:199)

නබි (සල්) තුමාණන් පැවසූ බව අබූ දර්දා (රළි) තුමාණන් මෙසේ වාර්තා කරයි: හොඳ පුරුදු වලට වඩා වෙනත් යමක් තරාදියහි බරින් වැඩි නොවේ.[87]

මුහම්මද් (සල්) තුමාණන් පැවැසූ බව අබූ හුරෙයිරා (රළි) තුමා මෙසේ වාර්තා කරයි. “මෙලොවෙ හි මූඃමින් වරයෙකුගේ දුක් වේදනාව ඉවත් කරන්නේ කවරෙක්ද, එලොවෙහි ඔහුගේ දුක් වේදනාව අල්ලාහ් ඉවත් කරයි. ණය පියවීමට නොහැකි අසීරු තත්ත්වයක සිටින දුප්පත් කෙනෙකුගේ අමාරුකම සැහැල්ලු කරන්නේ කවරෙක්ද අල්ලාහ් ඔහුගේ එලොව හා මෙලොව කටයුතු සැහැල්ලු කරයි. මුස්ලිම් කෙනෙකුගේ අඩුපාඩුකම් (ප්‍රසිද්ධ නොකර) ආරක්ෂා කරන්නේ කවරෙක්ද ඔහුගේ අඩුපාඩු එලොව හා මෙලොවෙ හි අල්ලාහ් ආරක්ෂා කරයි. අල්ලාහ්ගේ ගැත්තෙකුට උදව් කරන තාක්කල් ඔහුට අල්ලාහ් උදව් කරමින් සිටියි. කවරෙකු අධ්‍යාපනය හැදෑරීමේ මාර්ගයෙ හි යෙදී සිටින්නේද අල්ලාහ් ඔහුට ස්වර්ගයට ඇතුළු වීමේ මග පහසු කරයි. අල්ලාහ්ගේ මස්ජිදය තුළ ජනයා එක රැස් වී අල්ලාහ්ගේ අල් කුර්ආනය කියවීමට හා එය එකිනෙකා අතර ඉගැන්වීමට කටයුතු කරන්නේ නම් ඔවුන්

85. මූලාශ්‍රය: බුහාරි හදීස් අංක 2446 / මුස්ලිම් හදීස් අංක 2585

86. මූලාශ්‍රය: මුස්ලිම් හදීස් අංක 2586

87. මූලාශ්‍ර: අබූ දාවූද් හදීස් අංක 4799 / තිර්මිදි හදීස් අංක 2002

අතරට අල්ලාහ්ගේ ශාන්තිය පහළ නොවූ කිසිවෙක් නැත. අල්ලාහ්ගේ ආශීර්වාදය ඔවුන් වටා වෙළා ගනී. මලක්වරුන් ඔවුන් පිරිවරා ගෙන සිටිති. අල්ලාහ්, ඔහු අබියස සිටින මලාඉකා වරුන් ඉදිරියේ මෙම පිරිස ගැන විශේෂයෙන් සඳහන් කරයි. යහකම් කිරීමෙහි ලා ප්‍රමාද කරන තැනැත්තා සිය පෙළපතේ කීර්ති නාමය නිසා යහකම් කිරීමෙහි ලා කඩිනම් කරනු නොලබන්නේය.[88]

88. මූලාශ්‍රය: මුස්ලිම් හදීස් අංක 2699

# ආගම සහ මාර්ගය

අල්ලාහ් පහළ කළ ආගම එකකි. එය ඉස්ලාම් දහම වේ. ඒ පිළිබඳ උත්තරීතර අල්ලාහ් මෙසේ සඳහන් කරයි:

අල්ලාහ් හමුවේ ධර්මය යනු ඉස්ලාම් ය. (අල්කුර්ආන්:03:19)

එය ආරම්භක හා අවසාන අය සඳහා වූ අල්ලාහ්ගේ දහම වේ. ශුද්ධ වූ අල්කුර්ආනයේ අල්ලාහ් මෙසේ අවධාරණය කරයි:

සැබැවින්ම අපි තව්රාතය පහළ කළෙමු. එහි යහමඟ ද ආලෝකය ද ඇත. (අල්ලාහ්ට) ඉඳුරා අවනත වූ (සියලුම) නබිවරුන් යුදෙව්වන් බවට පත් වූවන්ට නඩු විසඳුවේ ඒ අනුවය. (අල්කුර්ආන්:05:44)

ෂිර්ක් හෙවත් සමානයන් උපකල්පනය කිරීමෙන් වැළකී සිටීම, අල්ලාහ්ට කීකරු වීම හා ඔහුව ඒකියට පත් කිරීම මඟින් ඔහුට යටහත් වීම යනාදී කරුණු ඉස්ලාම් යන පදය සඳහා වූ සාමාන්‍ය අර්ථය වේ.

එනමුත් විශේෂාර්ථයෙන් ඉස්ලාමය යනු දෙවියන් අල්ලාහ් මුහම්මද් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන්ට හට දුන්, නිවැරදි විශ්වාසයන්, යුක්තිසහගත නීති, යහපත් ක්‍රියාවන්, ආචාර ධර්මයන් යනාදී කරුණු අන්තර්ගත වන සත්‍ය ආගම සහ මාර්ගෝපදේශය වේ. එම දහම මඟින් එයට පෙර තිබූ සියළු දහම් අහෝසි කරන ලදී. එම දහම හැර අන් කිසි දහමක් අල්ලාහ් පිළිගන්නේද නැත. ඒ පිළිබඳ උත්තරීතර අල්ලාහ් මෙසේ අවධාරණය කරයි:

යමෙක් ඉස්ලාම් නොවන දහමක් ප්‍රිය කරන්නේ නම් ඔහුගෙන් එය කිසිවිටකත් පිළි ගනු නොලැබේ. (අල්කුර්ආන්:03:85)

මා පිළිබඳ යුදෙව්වෙකු හෝ කිතුනුවෙකු ආරංචි වී මා ගෙන ආ දෑ පිළිබඳ විශ්වාස නොකර මිය යන්නේ නම් ඔහු අපායට අයත් වන්නෙකු වේ යනුවෙන් නබි (සල්) තුමාණන් ප්‍රකාශ කළේය.[89]

අතීත ප්‍රජාවන් තුළ හොඳ ඇදහිලිවන්ත, දෙවියන් විශ්වාස කළ ඔහුගේ සේවකයන්ව ඔහු මුස්ලිම්වරුන් ලෙස අමතයි. එය පහත අයුරිනි:

නුඹලාගේ පියාණන් වූ ඉබ්‍රාහීම්ගේ ධර්මය වන මෙම ධර්මයේ ඔහු නුඹලාට කිසිඳු අපහසුතාවක් ඇති නොකළේය. මීට පෙර ද මෙහි ද නුඹලාට මුස්ලිම්වරු යැයි නම් කළේ ඔහුමය. (අල්කුර්ආන්:22:78)

එනමුත් භේද වී යෑම අල්ලාහ්ගේ සියුම් ඥානයට අයත් නීතියක් වන හේතුවෙන් ඔවුන් සියල්ල භේද වී ගියහ. නබි (සල්) තුමාණන් මෙසේ ප්‍රකාශ කර ඇත:

ඔබලාට පෙර සිටි දේව ග්‍රන්ථ හිමි සමූහයන් කණ්ඩායම් හැත්තෑ දෙකක් වශයෙන්

89. මූලාශ්‍රය: මුස්ලිම් හදීස් අංක 153

වෙන් වී ගියහ. එනමුත් මාගේ සමූහය කණ්ඩායම් හැත්තෑ තුනක් වශයෙන් වෙන් වී යනු ඇත. ඔවුන් අතුරින් කණ්ඩායම් හැත්තෑ දෙකක් අපායෙහි සිටිනු ඇති අතර ඔවුන් අතුරින් එක් කණ්ඩායමක් ස්වර්ගයෙහි සිටිනු ඇත. එයයි (ජයගත්) සමූහය වන්නේ.[90]

මෙම ජයගත් සමූහය වන්නේ අල්කුර්ආනය උසුලා ගත්, සුන්නාහ්ව අනුගමනය කරන නූතන කරුණු හා මනෝ ඉච්ඡාවට යටත් නොවී ඒවායින් ඉවත්ව කටයුතු කරන අහ්ලුස්සුන්නාහ් වල්ජමාආවරුන් වේ. සෑම විටම පවතින එකම කණ්ඩායම මෙයයි. ඒ පිළිබඳ නබි (සල්) තුමාණන් මෙසේ අවධාරණය කරයි:

මාගේ ජන සමූහයෙන් අල්ලාහ්ගේ අණ ක්‍රියාත්මක කරවන පිරිසක් සැමදා සිටිනු ඇත.[91]

ඔවුන් ප්‍රතිවිරුද්ධ පැති දෙකක් අතර මධ්‍යස්ථව සිටිනු ඇත. අයහමගවල් දෙකක් අතර ඔවුන් යහමගෙහි පසු වනු ඇත. ඒ සඳහා උදාහරණයක් නම්:

1. අල්ලාහ්ගේ ගුණාංග විෂයයෙහි ඒවා සංසන්දනය කරන පිරිස හා ඒවා අක්‍රිය කරවන පිරිස අතර මධ්‍යස්ථව මොවුන් සිටිනු ඇත.
2. අල්ලාහ්ට අයත් ක්‍රියාවන් විෂයෙහි ජබරියියා හා කදරියියාවරුන් අතර මධ්‍යස්ථව මොවුන් සිටිති.
3. අල්ලාහ්ගේ අනතුරු ඇඟවීම් හා විශ්වාස විෂයෙහි, මොවුන් අල්මුර්ජිආ සහ අල්වර්දියියාවරුන් අතර මොවුන් මධ්‍යස්ථව පසු වන කණ්ඩායම වේ.
4. නබි (සල්) තුමාණන්ගේ සහගාමීන් විෂයෙහි කවාර්ජ් හා රාෆිළා වරුන් අතර මධ්‍යස්ථව කටයුතු කරන කණ්ඩායම මොවුන් වේ.

සියලුම දුර්වල හා නීච විශ්වාසයන්ගෙන් ඔවුන් දුරස් ව කටයුතු කරනු ඇත. අල්ලාහ් පිළිබඳ විශ්වාසය ඔවුන්ගේ සිත් තුළ අලංකාරමත් කර ඒ කෙරෙහි ඇල්මක් ඇති කර තවද කුෆ්ර් හෙවත් ප්‍රතික්ෂේප කිරීම, අකීකරු වීම යනාදී පාපයන් පිළිබඳ අකැමත්තක් ඇති කළ එම අල්ලාහ්ගේ භාග්‍ය පිළිබඳ ඔවුන් සතුටින් පසු වෙති.

මෙය අල්ලාහ් වෙතින් ලත් දයාවක් ද භාග්‍යයක් ද වේ. අල්ලාහ් සර්වඥයෙකි, ප්‍රඥාවන්තයෙකි. (අල්කුර්ආන්:49:08)

අල්ලාහ්ගේ ශාන්තිය හා සමාදානය ඔහුගේ සේවකයා හා වක්තෘවරයා වන මුහම්මද් (සල්) තුමාණන් හටත් එතුමාණන්ගේ පවුල් සාමාජිකයින් හා සහගාමීන් හටත් අත් වේවා!

90. මූලාශ්‍රය: අහ්මද් හදීස් අංක 16937 / අබූ දාවූද් හදීස් අංක 4597/ තිර්මිදි හදීස් අංක 2640/ ඉබ්නු මාජාහ් හදීස් අංක 3991

91. මූලාශ්‍රය: බුහාරි හදීස් අංක 3641 / මුස්ලිම් හදීස් අංක 1037

الجمعية العلمية السعودية للدراسات الإسلامية
Saudi Association for Islamic Studies

## Vision

Achieve international leadership in consolidating and disseminating Islamic studies.

## Mission

Contribute to serving the religion of Islam through qualified cadres, through a moderate and contemporary approach.

+966 11 8236708    ca-sais@pnu.edu.sa    sais_pnu


مركز أصول
Osoul Center
www.osoulcenter.com

حاصل على جائزة التميز في العمل الخيري
ISO 9001
حاصل على شهادة الاعتماد من الأيزو

عرض تعريفي عن مركز أصول
ومجالاته ووحداته.. مشاهدة ممتعة لك

osoulcenter
+966504442532
www.osoulcenter.com

SINHALA 6




# අභිමානවත් අල්කුර්ආනය හා පාරිශුද්ධ නබි වදන් ඇසුරින් ඉස්ලාමීය ප්‍රතිපත්ති විග්‍රහය

මුස්ලිම්වරුන් අතර ඇති විවිධ හේතූන් නිසා ඔවුන් මතභේද වී සිටීම අල්ලාහ්ගේ ප්‍රඥාවේ නියමයකි. විටෙක නොදැනුවත්කම එයට හේතුවකි. තම මනෝ ආශාවන් පිළිපැදීම තවත් හේතුවකි. මෙවැනි දහම තුළ ඇති වන මතභේදයන්හිදී සත්‍යයේ අනුකූලතාවට උත්සුක වන මුස්ලිම්වරයකුට අනිවාර්ය වන ක්‍රියාදාමය නම්, ක්‍රියාවන් හා දැනුම යන කාරණාවන් තුළ නබි සල්ලල්ලාහු අලය්හි වසල්ලම් තුමාණන් හා ඔහුගේ කල්‍යාණ මිත්‍රයන් දැරූ ස්ථාවරය කුමක්ද යන්න සොයා බලා ඔවුන්ව අනුගමනය කිරීමයි.

මාගේ සහෝදරය,ඔබ ඉදිරියේ ඇත්තේ එක් සාරාංශගත කෘතියකි. එහි නබි සල්ලල්ලාහු අලය්හි වසල්ලම් තුමා කවර කරුණක් මත සිටියේද එය ඔබට දන්වා සිටීමට කතෘ විසින් වෙහෙස දරා ඇති අතර දහම තුළ ඇති වඩාත් වැදගත් මාතෘකාව වන විශ්වාස පද්ධතිය පිළිබඳ ඇති අවදාතම කොතෙක්දැයි ඔහු විසින් පැහැදිලි කර ඇත. එමෙන්ම ව්‍යාජ ප්‍රකාශයන් අතුරින් එයට විරුද්ධව පවතින දෑද ඔහු විසින් පැහැදිලි කර ඇත. එය ඔබේ කරුණු පැහැදිලි සාධක මත පිහිටානු පිණිසය.

මෙම කෘතිය ලියූ මෙහි කතෘට නොමසුරු හා පූර්ණ ප්‍රතිඵල ලැබෙත්වා යැයිද මෙය පරිවර්තනය කිරීමේදීද එය පතුරුවාලීමෙහිදීද එය සංස්කරණය කිරීමේදීද දායකත්වය ලබා දුන් සැමටත් මහත් ප්‍රතිඵල හා පූර්ණ ප්‍රතිඵල ලැබෙත්වා යැයි ද මෙය ලබන අපගේ මුස්ලිම් සහෝදරයින්ටත් පූර්ණ ප්‍රයෝජන අත්වේවා යැයිද අපි අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කර සිටින්නෙමු.

Osoul Center
www.osoulcenter.com

Rabwah

islamic-faith.com

osoulstore.com